
කොවිඩ් ව්‍යාප්තිය




★

# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின




සදාතනික පත්තර තාරුණ්‍යය අද පත්‍රය සමඟ


ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ අධි වප් අව අටවක ලත් ශනි දින | කාණ්ඩය 111 පත්‍රය 254 පිටු 20 මිල රු.30 web: www.dinamina.lk ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 ඔක්තෝබර් 10 සෙනසුරාදා


# ශ්‍රී ලංකාවේ සංවර්ධනයට අඛණ්ඩව උදවු කරනවා

## මහජන චීන සමූහාණ්ඩුවේ ඉහළ පෙළේ දූත පිරිසේ ප්‍රධානි කියයි

මහින්ද අලුත්ගෙදර

ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා අඛණ්ඩව උදවු කරන බව ශ්‍රී ලංකාවට පැමිණ සිටින මහජන චීන සමූහාණ්ඩුවේ ඉහළ පෙළේ දූත පිරිසේ ප්‍රධානි යැං ජියෙචි මහතා (Yang Jiechi) ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා හමු වී ඊයේ (10) සහතික විය.

චීන- ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික සබඳතා දැනටමත් බෙහෙවින් සතුටුදායක මට්ටමක පවතින බවත් මේ මිත්‍රත්වය පවත්වා ගැනීමත්, වර්ධනය කර ගැනීමත් චීන ජනාධිපති ෂී ජිං පිං මහතාගේ ප්‍රමුඛතාවක් බවත් අවධාරණය කළ ඒ මහතා, චීනය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය ඇතුළු අන්තර්ජාතික වේදිකාවලදී ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය, ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් නොසැලී පෙනී සිටින බව ද ප්‍රකාශ කෙළේය.

චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ දේශපාලන මණ්ඩල සාමාජික සහ චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ විදේශ කටයුතු කොමිසමේ කාර්යාල අධ්‍යක්ෂ යැං ජියෙචි මහතා (Yang Jiechi) ප්‍රමුඛ සත් පුද්ගල දූත පිරිස ඊයේ (9) පෙරවරුවේ ජනාධිපති කාර්යාලයේ දී ජනාධිපති රාජපක්ෂ මහතා හමු වී මේ බව කියා සිටියේය.

මහ පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ගණනාවකට චීනය දායක වුණා. හම්බන්තොට වරාය, වරාය නගර ව්‍යාපෘතිය, දක්ෂිණ අධිවේගී මාර්ගය ඉන් කිහිපයක්. හම්බන්තොට වරායක් ඉදි කිරීම චීනයේ නොව ශ්‍රී ලංකාවේ අදහසක්. එය ඉහළ ආදායම් සහ රැකියා උත්පාදන විභවතාවක් සහිත ව්‍යාපෘතියක් බව අප තේරුම් ගත්තා. ඊට අරමුදල් සම්පාදනය කිරීමට චීනය ඉදිරිපත් වුණා. බොහෝ භූ දේශපාලන විශ්ලේෂණවල මේ ව්‍යාපෘති අර්ථකථනය කරන්නේ ශ්‍රී ලංකාව චීනය ඇටවූ 'ණය උගුලක' සිර වීමක් ලෙස. එය එසේ නොවන බවත්, මේ මහා පරිමාණ ව්‍යාපෘති ජනතාවගේ

පිට 06

# හිටපු ඇමැති රාජිත

## හිරුණිකාට කළුතර ප්‍රා. සභා මන්ත්‍රීවරුන්ට

# රජයේ මුදලින් පඩි ගෙවුවා

රෝෂන් තුෂාර

හිටපු ඇමැති රාජිත සේනාරත්න මහතා ධීවර ඇමැතිවරයාව සිටියදී අත්තනෝමතිකව හා හිතුවක්කාරී ලෙස හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රිනී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර, කළුතර නගර සභා සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට රැකියා හා තනතුරු දී රජයේ මුදල් මිලියන ගණනින් වියදම් කළ බව ධීවර වරාය නීතිගත සංස්ථාවේ හිටපු සභාපති උපාලි ලියනගේ මහතා දේශපාලන පළි ගැනීම් විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසම හමුවේ සාක්ෂි දෙමින් ඊයේ (9) පැවසීය.

පිට 06

## ධීවර වරාය නීතිගත සංස්ථාවේ හිටපු සභාපති දේශපාලන පළි ගැනීම් පිළිබඳ ජනපති කොමිසම හමුවේ කියයි

# රජයේ මුදල් රෙගුලාසි චක්‍රලේඛ ඉවත දමා

# යහපාලන ආණ්ඩුව කදිරගාමර් ආයතනයේ මුදල් අවභාවිත කරලා

## විශේෂ විමර්ශනයක් ආණ්ඩුව අරඹයි

මහින්ද අලුත්ගෙදර

රජයේ මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ නොසලකා හරිමින් පසුගිය යහපාලන ආණ්ඩුව සමයේදී ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයේ සිදුව ඇති රුපියල් මිලියන ගණනක මූල්‍ය අවභාවිතාව සම්බන්ධයෙන් විශේෂ විමර්ශනයක් කිරීමට ආණ්ඩුව තීරණය කර තිබේ.

ඒ අනුව විදේශ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි යූ.ජී.සී. අබේරත්න මහතා වෙත මේ සම්බන්ධයෙන් බලය පවරා තිබෙන අතර විදේශ ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී එළඹුණ තීරණයක් අනුව මෙම පියවර ගෙන තිබේ.

මේ අනුව ඉකුත් 5 වැනි දා සිට ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයේ සියලු විගණන කටයුතු හා මූල්‍ය කටයුතු විදේශ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරිවරයා යටතට පත් කොට තිබේ.

පිට 06


# මිනුවන්ගොඩ පොකුරේ කොවිඩ් ආසාදිතයෝ 1069ක්

## 8,000ක් නිරෝධායනයට

සන්ධ්‍යා කරුණාරත්න

මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් කර්මාන්ත ශාලාව ආශ්‍රිත කොවිඩ් පොකුරේ ආසාදිතයින් සංඛ්‍යාව 1069ක් දක්වා ඊයේ (9) වන විට ඉහළ ගොස් ඇති බව වසංගත රෝග විද්‍යා අංශය වාර්තා කරයි.

පිට 06





මෙරටට පැමිණ සිටින චීන සමූහාණ්ඩුවේ ඉහළ පෙළේ දූත පිරිසේ ප්‍රධානී යැං ජියෙචිං මහතා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරු ජනාධිපති කාර්යාලයේ දී හා අරලියගහ මන්දිරයේදී ඊයේ (10) හමු වූ අයුරු.

# ඇඳිරි නීතිය ඇති සියලු ප්‍රදේශවලට කඩිනමින් භාණ්ඩ සපයනවා

## ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන

මානෙල් පුෂ්ප කුමාරි

ඇඳිරි නීතිය බලපැවැත්වෙන සියලු ප්‍රදේශවලට කඩිනමින් භාණ්ඩ සැපයීමේ කටයුතු සිදු කරන ලෙස වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන අදාළ නිලධාරීන්ට උපදෙස් දී තිබේ.

ඒ අනුව සියලු සතොස ශාඛා, සමූපකාර, කෝප් සිටි මිනි කෝප් සිටි, වැලිසර විශේෂ ආර්ථික මධ්‍යස්ථානය මඟින් පාරිභෝගිකයන්ට භාණ්ඩ සපයන ලෙස ද වෙළෙඳ ඇමැතිවරයා එම ආයතන වෙතින් ඉල්ලා සිටියි.

පිට 06

## නිරෝධායන ඇඳිරි නීතිය ඇති ප්‍රදේශවල අත්‍යවශ්‍ය සේවාවලට අවසර

මහින්ද අලුත්ගෙදර

නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක ප්‍රදේශවල අත්‍යවශ්‍ය සේවා හා නිෂ්පාදන කටයුතු පවත්වාගෙන යෑමට අවසර ලබාදී තිබේ.

පිට 06

# මෛත්‍රී-ගෝඨාභය ඝාතන තැත හෙළි කළ නාමල් කුමාර කුලියට ගත් පුද්ගලයෙක්

## - පූජිත කියයි

සුභාෂිණී සේනානායක

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සහ හිටපු ආරක්ෂක ලේකම් වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඝාතන තැත හෙළි කළ නාමල් කුමාර යන පුද්ගලයා ජනාධිපති ලේකම් කාර්යාලය කුලියට ගත් පුද්ගලයෙක් බවත් ඔහු ජනාධිපති ලේකම් කාර්යාලයෙන් වැටුප් ගත් අයකු බවත් හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතා ඊයේ (9) පාස්කු කොමිසම හමුවේ කියා සිටියේය

ජනාධිපති ලේකම් කාර්යාලයේ මත්ද්‍රව්‍ය කාර්ය සාධක බළකායේ නාමල් කුමාර දේශන පවත්වා ඇති බවත් ඔහු වවුචර් පත් මඟින් මුදල් ගත් බවත් එහි අධ්‍යක්ෂ දොස්තර සමන්ත කිතලගම මහතා පැවැසූ බවත් හිටපු පොලිස්පතිවරයා

පිට 06

# නිරෝධායන ඇඳිරි නීතිය කඩ කළ පුද්ගලයෝ 91ක් අත්අඩංගුවට

මහින්ද අලුත්ගෙදර

නිරෝධායන ඇඳිරි නීතිය කඩකළ පුද්ගලයින් 91 දෙනෙකු පොලීසිය අත්අඩංගුවට ගෙන තිබේ.

පිට 06

## මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු නඩු දිනයේ උසාවි ගෙන්න බැරි වීම ගැන

# බන්ධනාගාර කොමසාරිස් සමාව ගනී

කුමුදු හෙට්ටිආරච්චි

මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම සම්බන්ධ විත්තිකරුවකු නියමිත නඩු දිනයේදී අධිකරණයට ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් ඊයේ (9) ලිඛිතව අධිකරණයෙන් සමාව ඉල්ලා සිටි බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතා මින් ඉදිරියට එවැනි සිදුවීමක් නොවීමට වග බලා ගන්නා බවටද කොළඹ මහාධිකරණයට ලිඛිත පොරොන්දුවක් දුන්නේය.

පිට 06

# වත්මන් ආණ්ඩුව මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් රකින්නේ නෑ



ස්වර්ණා විජේකෝන්,
සන්ධ්‍යා කරුණාරත්න

මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ කිසිවකු ආරක්ෂා කිරීමට වත්මන් ආණ්ඩුවේ කිසිවකු කටයුතු නොකරන බව වාරිමාර්ග හා ආරක්ෂක රාජ්‍ය ඇමැති චමල් රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවේ දී ඊයේ (09) පැවසීය.

පිට 06

# ශිෂ්‍යත්වය මධ්‍යස්ථාන 2936කදී හෙට

පිට 06

# කොළඹ ළමා රෝහලට ගෙනා බිලිඳියට කොවිඩ්-19

සන්ධ්‍යා කරුණාරත්න

කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලට පෙරේදා (8) ඇතුළත් කළ මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචි මාස 10 ක් වයසැති බිලිඳියට කොවිඩ් - 19 වයිරසය ආසාදිත බවට තහවුරු වී තිබේ.

පිට 06

# සෞඛ්‍ය උපදෙස් නොපිළිගත් මිනුවන්ගොඩ පොකුරේ සේවකයන්ට වැඩ වරදින ලකුණු

මහින්ද අලුත්ගෙදර

මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් කර්මාන්ත ශාලාවේ සේවය කරන මෙතෙක් සෞඛ්‍ය අංශ ලබාදුන් උපදෙස් අනුව ක්‍රියා නොකළ සේවකයන්ට එරෙහිව දැඩිව නීතිය ක්‍රියාත්මක කරන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා පවසයි.

බ්‍රැන්ඩික්ස් ආයතනය සපයා ඇති දත්තවලට අනුව සුළු පිරිසක් පමණක් මෙතෙක් සෞඛ්‍ය අංශ වෙත වාර්තා කර නොමැති බවට අනාවරණය වන බවද ඒ මහතා පෙන්වා දෙයි.

පිට 06

දර්ශගේ




★ සහරාන් ත්‍රස්තවාදියෙක් කියලා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලේ දැනගෙන ඉඳලා බං...

♦ මෛත්‍රීට කෝල් එකක් දීලා නැහැලුද ඉතිං...

# ඇඳිරි නීතියට ප්‍රවේශ පත්‍රය භාවිත කරන්න

## විභාග කොමසාරිස්

සිතාරා සේනානි

දැනට නිරෝධායන ඇඳිරිනීතිය බලපැවැත්වෙන ප්‍රදේශවල 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සහ අ.පො.ස උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන්ට විභාග ප්‍රවේශ පත්‍රය භාවිතා කර තමන්ගේ පොලිස් බල ප්‍රදේශයට අදාළ විභාග මධ්‍යස්ථානයට යාමට පහසුකම් සලසා ඇති බව විභාග කොමසාරිස් ජනරාල් බී. සනත් පූජිත මහතා පවසයි.

# 'මර්වින් ජනා'ගේ ගොලයෙක් දැලේ

මහින්ද අලුත්ගෙදර

බන්ධනාගාරගතව සිටින 'මර්වින් ජනා' නමැති මත්ද්‍රව්‍ය ජාවාරම්කරුගේ සමීපතමයකු වන නුවන් ලක්ෂිත නමැත්තා ගල්කිස්සේදී අත්අඩංගුවට ගෙන තිබේ.

පිට 06

# කිංග්ස්බරි බෝම්බකරු මුබාරක්ගේ බිරිය රිමාන්ඩ්

සුභාෂිණී සේනානායක

කොළඹ කිංග්ස්බරි හෝටලයට බෝම්බ ප්‍රහාර එල්ල කළ මොහොමඩ් මුබාරක් නමැති සැකකරුගේ බිරිය වන අයේෂා සිද්ධිකා මොහොමඩ් වසීම් යන සැකකාරිය ලබන 14 දා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස

පිට 06

# ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 71 වැනි සංවත්සරය අද

රත්නසිරි පතිරණ සහ රක්ෂණ ශ්‍රියන්ත

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 71වැනි සංවත්සරය අද (10) යෙදී ඇත. 1949 ඔක්තෝබර් 10 වැනිදා යුද්ධ හමුදාව මෙරට ස්ථාපිත කර ඇත. බ්‍රිගේඩියර් සින්ක්ලෙයාර් මහතා ප්‍රථම යුද හමුදාපතිවරයා ලෙස පත්ව ඇති අතර ඔහු 1949 ඔක්තෝබර් 10 සිට 1952 මැයි 17 දක්වා සිය ධුරයේ කටයුතු කැර ඇත.

පිට 06

# කැලණියමුල්ල හන්දියේදී තරුණයකු අමු අමුවේ මරා දමති



## ලොරි සහායකයකුටත් මන්නෙන් කොටලා

## යතුරු පැදියක් පැහැරගෙන සැකකරුවෝ පැන යති

**ගිරිඋල්ල සමූහ - ඩබ්.ඒ. සරත්**

පන්නල, කැලණියමුල්ල හන්දියේදී මන්නා පිහි අතැතිව සිටි පුද්ගලයන් දෙදෙනකු විසින් පෙරේදා (8) සවස යතුරු පැදියක ගමන් ගත් පුද්ගලයකු කොටා මරා දමා , ලොරියක ගමන් ගත් පුද්ගලයෙකුටද කොටා , යතුරු පැදියක් පැහැරගෙන පැන ගොස් ඇතැයි පන්නල පොලීසිය පවසයි.

බෙල්ලට වැදුණ පිහි පහර මත තම යතුරු පැදිය මතම මෙසේ මිය ගොස් ඇත්තේ, පන්නල පොලිස් වසමට අයත් යටත්තාවල මැදිකැලේ ප්‍රදේශයේ පදිංචිව සිටි පොල්වත්තගේ චානක ප්‍රදීප් (29) නැමති තිදරු පියෙකි.

මෙම අපරාධය සිදුකළ එක් පුද්ගලයෙකු එම ප්‍රදේශයේම අයකු බවත් අනෙක් පුද්ගලයා ඔහු සමග එම නිවසේ පදිංචිව සිටි අයෙකු බවත් පොලීසිය හඳුනා ගෙන ඇත.

මොවුන් දෙදෙනා මන්නා පිහි ඇතැතිව මිය ගිය අයට කෙටීමෙන් පසුව, මහමග පැමිණි ලොරියක් නවතා එයට නැග පලා යාමට සැරසී ඇත. ලොරි රියැදුරු එය ප්‍රතික්ෂේප කර ලොරියෙන් පැන දිව ගොස් ඇති අතර ඉන් පසුව පසුව, රිය සහායකට මන්නා පිහියකින් මොවුන් පහර දී ඇත. රිය සහායකයා කැපුම් තුවාල සහිතව කුලියාපිටිය මහ රෝහලට ඇතුළත් කර ඇත.

පසුව මන්නා පිහි ඇතැතිව, අපරාධකරුවන් එම ස්ථානයේ සිට ගිරිඋල්ල පාරේ , පා ගමනින් ගොස් හමුවූ යතුරු පැදියක් නවතා එය උදුරාගෙන පලා ගොස් ඇත.

සිද්ධිය සැලවීමත් සමග එම ස්ථානයට පැමිණි පන්නල පොලීසිය, කුලියාපිටිය කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකය සමග පරීක්ෂණ කටයුතු ආරම්භ කළහ. කුලියාපිටිය වැඩ බලන මහේස්ත්‍රාත් කැලුම් හෙට්ටිගේ මහතා පැමිණ ස්ථානීය පරීක්ෂණය සිදුකර සිරුර කුලියාපිටිය රෝහල වෙත යොමු කළේය.

මෙම අවස්ථාවට කුලියාපිටිය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි,මහින්ද දිසානායක, සහකාර පොලිස් අධිකාරි කරුණාසේන, කුලියාපිටිය කොට්ඨාශ අපරාධ විමර්ශන ඒකකයේ ස්ථානාධිපති පො.ප.රණතුංග, උ.පො.ප. ප්‍රියන්ත, පො.සැ.බණ්ඩාර , පො.සැ. ජයසිංහ පො.කො. හේරත් , පන්නල පොලිස් ස්ථානාධිපති උපුල් ආරියරත්න, උ.පො.ප.සරත් අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති සුනිල් ප්‍රේමසිරි, පො.සැ. සේනානායක ඇතුළු නිළධාරීමු එක් වූහ.

අපරාධකරුවන් අත් අඩංගුවට ගැනීම සඳහා පන්නල පොලිස් බුද්ධි අංශය ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ සිදු කරති.

## උඹ මැරියන් යැයි පෙම්වතිය කියලා:

# 17 හැවිරිදි සිසුවා දිවි නසාගෙන

**කළුතර මධ්‍යම විශේෂ**

මොරොන්තුඩුව ධම්මානන්ද මහා විදුහලේ උසස් පෙළ පන්තියක ඉගෙනුම ලැබූ සිසුවකු, පසුගියදා (08 ) ,තම නිවෙසේදී ගෙල වැල ලාගෙන මිය ගොස් තිබේ.

මෙසේ සිය දිවි නසාගෙන ඇත්තේ මොරොන්තුඩුව පතගිවත්තේ අංක 25 නිවෙසේ පදිංචිව සිටි අදීශ පැතුම් කුමාර නමැති 17 ,වියැති ,පවුලේ එකම දරුවා වූ පාසල් ශිෂ්‍යයෙකි.

අදීශ පැතුම් ශිෂ්‍යයා,මීට දින හතරකට පමණ ඉහතදී,තමා ආදරය කළ ගැහැණු ළමයා, වෙනත් පිරිමි ළමයකු සමග ආදර සම්බන්ධතාවයක් ඇතිකරගෙන ඇති බවට ලැබුනු ආරංචියකට අනුව ඔහු එම ළමයා සමග බහින් බස් වී ඇත. එහිදි මෙම ගැහැනු ළමයා මේ අවස්ථාවේ උඹ මැරියන් යනුවෙන් පැතුම්ට බැන ඇති බවත් ඉන් ඇති වූ අධික සිත් තැවුල මෙම දිවි නසා ගැනීමට හේතු වන්ට ඇති බවත් පැතුම්ගේ මව පැවැසුවාය.



මිය යාමට පෙර උඹලා දැන් සතුටෙන් ඉදපල්ලා යනුවෙන් පැතුම් මුහුණු පොතේ සටහනක් දමා තිබූ බව මොරොන්තුඩුව පොලීසිය පවසයි. පැතුම් උපන් දවසේ අම්මා ඇද සිටි චිත්තය ,ඔහුගේ මව සිහි වටනයක් වශයෙන් සුරක්ෂිතව නිවෙසේ අල්මාරියේ තබා තිබී ඇති අතර එම චිත්තය දිවි නසාගැනිමට පැතුම් යොදා ගෙන තිබූ බවද පොලිස් වාර්තාවල සඳහන්ය.

## විශේෂ කාර්ය බළකායේ පුහුණුවට යන්න සිටි තරුණයා වැමැඩිල්ල ජලාශයට බිලි

**සිගිරිය විශේෂ**

දඹුල්ල වැමැඩිල්ල ජලාශය දියනෑමට ගිය විසි තුන් හැවිරිදි තරුණයකුගේ මළසිරුරක් පැය දහ නවයකට පසුව 09 දින උදෑසන නවයට පමණ සොයාගත් බව නාඋල පොලිසිය කියයි.

මෙසේ මියගොස් ඇත්තේ ගලේවෙල මැදබැද්ද ප්‍රදේශයේ පදිංචි ඇස්වෙද ගෙදර දුමින්ද සඳරුවන් බණ්ඩාර නම් විසි තුන් හැවිරිදි තරුණයෙකි.

මෙම තරුණයා 08 දින පස්වරුවේ දියේ ගිලුණු අවස්ථාවේ ඔහුව බේරා ගැනීමට ගිය මිතුරෙකු දියේ ගිලී තවත් පිරිසක් විසින් බේරාගෙන මේ වන විට දඹුල්ල රෝහලේ ප්‍රතිකාර ලබන බව පොලීසිය කියයි.

ගලේවෙල මැදබැද්ද ප්‍රදේශයේ පදිංචි මිතුරන් පස්දෙනෙකු 08 දින පස්වරුවේ වැමැඩිල්ල ජලාශයට පැමිණ ඇත්තේ දිය නෑම සඳහා බව පොලිසිය කියයි. මෙම මියගිය තරුණයා සහ තවත් අයෙකු 9 දින උදේ පොලිස් විශේෂ කාර්ය බළකායේ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී පුහුණුව සඳහා 09 දින ගමන් කිරීමට නියමිතව තිබූ අය බව පොලිසිය කියයි.

දියේ ගිලුණු අවස්ථාවේ සිට ප්‍රදේශවාසීන් මෙම තරුණයාව සෙවීමේ කටයුතු සිදු කළ ද මළසිරුර සොයා ගැනීමට නොහැකි වූයේ අධික ගැඹුරු වළවල් ජලාශය මැද තිබීමේ හේතුවෙනි.

## ගුරුවරියක් 14 හැවිරිදි සිසුවා සමඟ පැන ගිහින්

**ටී.කේ.මහින්ද වැලිගම සමූහ**

උපකාරක ඉංග්‍රීසි පන්ති පැවැත්වූ 26 හැවිරිදි ගුරුවරියක් ලෝක ගුරු දිනය දා සිය සිසුවකු සමග වැලිගම ඌරුවිටිය ප්‍රදේශයෙන් අතුරුදහන් වීමේ පුවතක් වාර්තා වේ. මෙම පලා යෑම ප්‍රේම සබඳතාවක් මත සිදුව ඇති බවත් එම සිසුවාගේ වයස අවුරුදු 14ක් බවත් පොලීසිය පවසයි.

තම දරුවා සමඟ උපකාරක පන්ති ගුරුවරිය ප්‍රේම සම්බන්ධතාවයක් ගොඩ නගා ගෙන සිටි බවද මුවු පියන් වැලිගම පොලීසියට කරන ලද පැමිණිල්ල පරිදි පොලීසිය පරික්ෂණ ආරම්භ කර තිබේ.

ඉකුත් 5 වන දිනය සවස 2.00 ට පමණ මෙම දරුවා නිවසේ ආසන්නයේ පිහිටා ඇති මෙම ගුරුවරියගේ නිවසේ පවත්වා ගෙන යන උපකාරක පන්තියට සහභාගි වී ඇති අතර තම දරුවා නිවසට නොපැමිණිම හේතුවෙන් එම පිරිමි දරුවාගේ මව තුළ ඇති වූ සැකයක් මත එම උපකාරක පන්තියට පැමිණ ගුරුවරිය ගේ මවගෙන් විමසා ඇත. ගුරුවරියගේ මව පවසා ඇත්තේ ගුරුවරිය නිවසේ නොමැති බවයි , පසුව මෙම පිරිමි දරුවා සහ ගුරුවරියට කුමක් සිදු වූයේ දැයි සොයා ගැනීමට නොහැකිවූ මවුපියන් ප්‍රදේශවාසීන් සමග ප්‍රදේශය පුරා සෝදිසි කර තිබේ. එහෙත් කිසිදු තොරතුරක් සොයා සොයා ගැනීමට නොහැකිවූ බැවින් සිද්ධිය සම්බන්ධයෙන් පොලීසියට මවු පියන් පැමිණිලි කර ඇත. මෙම ගුරුවරියට වයස අවුරුදු දෙකක් වයැසැති කුඩා දරුවෙකු ද සිටී.

නව යොවුන් වියේ පසුවන සිසුවාගේ අතේ ඇති ජංගම දුරකතනය පිළිබඳ සොයා බැලීමේදී මතුගම ප්‍රදේශයේ දී දුරකථනය ක්‍රියාත්මක කර ඇති බවට එම දුරකථන සමාගම දැන් වූ බව එම දරුවාගේ ඥාතීහු පවසති. එහෙත් මෙම ගුරුවරියගේ පාර්ශවයෙන් ගුරුවරිය අතුරුදහන් වීම පිළිබඳ කිසිදු තැකීමක් නොමැතිව ඔවුන්ගේ දෛනික කටයුතු සිදුකර සිදු කර ගනිමින් සිටීම ගැන මෙම දරුවාගේ පාර්ශ්වය බලවත් ලෙස සැක පල කරයි. මෙම දරුවා සහ ගුරුවරිය අතර ප්‍රේම සම්බන්ධතාවයක් ඇති වී ඇති බවට සාධකයක් ලෙස ගුරුවරිය සහ මෙම දරුවා අතර ජංගම දුරකථනයෙන් හුවමාරු වූ කෙටි පණිවිඩ තුළින් හඳුනා ගැනීමය හැකි බව දරුවාගේ පියාගේ සහෝදරයා පවසයි . දරුවාගේ මව පවසන්නේ දරුවා නිවසින් උපකාරක පන්තියට යන අවස්ථාවේදී නිවසේ තිබූ දරුවාගේ රන් මාලයක් ද රැගෙන ගොස් ඇති බවයි.

## ලක්ෂ 60කට බුදු පිළිමයක් විකුණන්න හැදූ පුද්ගලයෙක් අත්අඩංගුවට

**ඇම්. පී. සරත් -පොළොන්නරුව දිස්ත්‍රික් සමූහ**

නිධානයකින් ගත් පෞරාණික බුදු පිළිමයක් යැයි කියා මැටිවලින් නිර්මාණය කළ බුදු පිළිමයක් රුපියල් ලක්ෂ 60කට විකිණීමට තැත් කළ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආරක්ෂක නිලධාරියකු මෙසේ ඔක්තෝබර් 8 රාත්‍රී බකමූණ පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන ඇත.මැ මොහු කෝට්ටපිටිය ගම්මානයේ පදිංචිකරුවකු වන අතර බකමූණ පොලිසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

## ශ්‍රීකාන්තගේ ප්‍රීදූපත



- 20ට එරෙහිව මට මාව ප්‍රචාර් වුණාට, මගේ අනෙක් අය ප්‍රචාර් නෑ කියල රිෂාඩ් බදියුදීන් කියනව බං !
- අපිටනං ප්‍රචාර් සර්, ගොනා හැරෙන්නෙ පොල් පැළේට කියල !

## ඇනැත්ත



| | |
|---|---|
| බහුතර බලය ලැබ දුන්නේ තුනෙන් | දෙක |
| රැක ගන්නටයි පොදු මිනිසුන් | අහිංසක |
| වැඩි වී යන නිසා බඩුමිල ටිකෙන් | ටික |
| සිරිකත ඉවත යයි ගෙයි හිස් වළං | ටික |
| හාල්-පිටි-සීනි-තේ කුඩු-අල- | ලූනු |
| පොල් - කහ - මිරිස් මිල වැඩි විය පෙර | නූණු |
| සැමියන්ට රවති කුස්සියෙ ඉද | ගෑනු |
| ඇතුළත නොමැත පිටතට පෙන්වන | මූණු? |

රටේමුල්ලේ මුදන්නායක

## ශ්‍රීනියාස්

| | |
|---|---|
| පන්සල් පල්ලි කෝවිල් ඈ සියලු | තැන |
| උස් මහ මැඳුරු පොඩි පැල්පත් තුළට | පැන |
| කිසිදා නොඇසු විරු පාඩම් කියා | දෙන |
| නැති හැටි කොරෝනා කිසිවකු කිරා | මැන |



ගල්මන් ගොනා

## සෙල්ල ශ්‍රී වල්ලි විහාරයේ පින් කැටය කඩලා

**කතරගම සංචාරක කේ ඩී දේවප්‍රිය**

සෙල්ල කතරගම ශ්‍රී වල්ලි විහාරස්ථානයේ පඬුරු පෙට්ටිය කඩා මුදල් සොරා ගනිති

ඓතිහාසික සෙල්ල කතරගම පුරාණ වල්ලිමාතා ගල්ලෙන් විහාරස්ථානයේ ප්‍රධාන දේවාලයේ පඬුරු පෙට්ටිය කඩා එහි තිබූ මුදල් නෝට්ටු රැසක් සොරකු විසින් මංකොල්ලා කා තිබේ.

ඉකුත් 07 වැනි දින රාත්‍රියේ වේලාව රාත්‍රි 1. 30 ට පමණ මෙම සොරා දේවාලය වෙත රහසිගතව පැමිණ මෙහි තිබූ පඬුරු පෙට්ටිය කඩා දමා මුදල් නෝට්ටු පැහැර ගෙන තිබේ.

මෙහි සවිකර තිබූ කැමරා පද්ධතියේ සොරා ඇතුළු වන අයුරු හා මුදල් බෑගයකට දමා ගන්නා අයුරු දැක්වෙන අතර මේ වැනි අයුරින් සෙල්ල කතරගම ප්‍රදේශයේ තවත් දේවාලයකද මේ අයුරින් මුදල් පෙට්ටිය කඩා මුදල් සොරා ගෙන තිබේ.

# කොරෝනා පොකුර

## හොරණ රෝහලේ 9 වාට්ටුවත් වසයි

**හල්තොට සමූහ - විනීතා මානෙල් ගමගේ**

මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවය කළ හොරණ කඳන්හේන ප්‍රදේශයේ පදිංචි කෝවිඩ් ආසාදිතයාගේ අවු 02 ක් වයසැති දරුවාට හා මවටත් ඔහුගේ බිරිය රැකියාව කළ හොරණ මූලික රෝහලේ 05 වාට්ටුවේ හෙදියකටත් කොරෝනා වයිසය ආසාදනය වී ඇති බවට 08 දා රාත්‍රියේ ලැබුණ පීසිආර් පරීක්ෂණ වාර්තා අනුව තහවුරු වී ඇතැයි කළුතර දිස්ත්‍රික් ප්‍රධාන පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක සමන් ගීගනගේ මහතා පවසයි. ඇය මදුරාවල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි බල ප්‍රදේශයේ පදිංචිකාරියක් වන අතර ඇගේ සමීපතමයන් නිරෝධානය කිරීමට කටයුතු කර තිබේ .

මේ අනුව හොරණ ප්‍රදේශයෙන් කෝවිඩ් ආසාදිතයින් සිව් දෙනෙකුත් මදුරාවලින් එක් අයෙකුත් ලෙස ආසාදිතයින් පස් දෙනෙකු හමු වී ඇතැයි ගිගනගේ මහතා තව දුරටත් පවසයි. මෙම තත්ව යටතේ හොරණ මූලික රෝහලේ 05 වාට්ටුවට රෝගින් ඇතුලත් කිරීම හෝ පිටස්තරයින් පැමිණීම නතර කර ඇති අතර එම වාට්ටුවේ විශේෂඥ වෛද්‍යවරයා 09 වාට්ටුවේද සේවය කර තිබෙන බැවින් මේ වන විට 09 වාට්ටුව ද තාවකාලිකව වසා දැමීමට පියවරගෙන තිබේ.

## හලාවත 96ක් නිරෝධායනයට

**ප්‍රසාද් පූර්ණමාල් - පුත්තලම දිසා සමූහ**

හලාවත අඹකඳවිල ප්‍රදේශයේ පුද්ගලයෙකුට කොරෝනා වැලදී ඇති බව තහවුරු වීමෙන් අනතුරුව ඔහු ඉතා ළඟින් ඇසුරු කල 96 දෙනෙකු නිරෝධායනයට ලක් කර තිබේ . ඒ හලාවත අබකඳවිල මහවැව හා බංගදෙණිය යන ප්‍රදේශ වලයි. හලාවත අඹකඳවිල පදිංචි 36 හැවිරිදි පුද්ගලයෙකුට මෙලෙස කොරෝනා වැලදී ඇති බව තහවුරු වී ඇති අතර ඔහු පෙරේදා 08 පස්වරුවේ හලාවත මහා රෝහලේ කොරෝනා ඒකකයට ඇතුලත් කිරීමට පියවර ගැණුනි. මේ පුද්ගලයා ප්‍රදේශයේ ආගමික ස්ථානයකට සම්බන්ධ වී සිටි අයෙකු වන අතර ඒ ආගමික ස්ථානයේ පසුගියදා පැවැති උත්සවයකට විශාල පිරිසක සහභාගී වී ඇත.

## ඇඟලුම් සේවිකාවක බැලීමට ගියසොරණාතොට පවුල් 15ක් නිරෝධායනයේ

**ආර්.එම්.විජේරත්න- හාලිඇල සමූහ**

කොවිඩ් 19 වෛරස ආසාදනයට ලක්වී ඇතැයි සැකපිට බදුල්ල සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මීගහවෙල වසමේ පවුල් 15 ක් සිය නිවෙස්වල ස්වයං නිරෝධායනයට යොමුකර සිටින බව සොරණාතොට ප්‍රාදේශීය සභාවේ සභාපතිනි නදීකා ප්‍රිශාන්ති දිසානායක මහත්මිය පවසයි.

බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවය කළ කොවිඩ් 19 ආසාදිතයැයි සැකකෙරෙන ඇඟළුම් සේවිකාවක බැලීමට මෙම පවුල්වල ඇතැමුන් ගොස් තිබීම හේතුවෙන් කොට්ඨාසයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඇතුළු නිළධාරීන්ගේ නිර්දේශ මත මෙම පවුල්වල සාමාජික සාමාජිකාවන් 50 දෙනෙකු එසේ ස්වයං නිරෝධායනයට යොමුකර ඇති බවත් එම පවුල්වලට අවශ්‍ය ආහාරපාන හා ජලය ඇතුළු මූලික අවශ්‍යතා සැපයීමට අදාළ අංශ එක්ව කටයුතු කරන බවත් මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ සභාපතිනිය පැවසුවාය.

## පල්ලම පවුල් 14ක් නිරෝධායනයට

**මාරවිල සමූහ සහ පුත්තලම දිසා සමූහ**

පල්ලම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ කොරෝනා ආසාදිතයෙක් හමු වීමෙන් පසු නිවාස 14 ක සාමාජිකයින් සිය නිවෙස් තුළ ස්වයං නිරෝධායනය කිරීමට කටයුතු කර ඇත.

මෙසේ ආණමඩුව ආඩිගම පුනවිටිය ඇතුළු ගම්මාන කිපයකට 7 දහවල් සිටි ජනතාව ඇතුළු විම හා පිටවිම සිමා කිරිම සිදුකළ බව පල්ලම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය පවසයි.

පොලිස් මාර්ග බාධක යොදමින් මෙසේ ඇතුල් විම හා පිටවිම සිමා කර ඇත්තේ කටුනායක ගුවන් තොටුපළේ සේවය කරනු ලබන 23 හැවිරිදි තරුණයකු කොරෝනා ආසාධිතයකු බවට තහවුරු විම හේතුවෙනි.

## මස්කෙළිය මෝකා තේ වත්තේ 17ක් නිරෝධායනයට

**මස්කෙළිය සමූහ**
**ගාමිණී බණ්ඩාර ඉලංගන්තිලක**

මස්කෙළිය පොලිස් බල ප්‍රදේශයට අයත්, මෝකා තේ වතුයායේ, "මිඩ්ලෝජියන්" කොටසේ පදිංචි පවුල් 02 ක සාමාජිකයින් 17 දෙනකු ඉකුත් (07) දා රාත්‍රී සිට ඔවුන් පදිංචි නිවාස වල ස්වයං නිරෝධායනයට ලක් කළ බව මස්කෙළිය මහජන සෞඛ්‍ය පරීක්ෂක නරේන්ද්‍ර කුමාර් මහතා පැවැසීය.

මිනුවන්ගොඩ, බ්‍රැන්ඩික්ස් ඇඟලුම් ආයතනය අසල නවාතැන් පොළක සිට පෞද්ගලික ආයතනයක සේවය කළ මෝකා තේ වතුයායේ මිඩ්ලෝජියන් කොටසේ පදිංචි තරුණියක් හා තරුණයන් දෙදෙනෙක් ඉකුත් (03) දා ඔවුන්ගේ නිවෙස් වලට පැමිණීමත් සමග එම නිවාසවල පදිංචිකරුවන් මෙසේ ස්වයං නිරෝධායනයට ලක් කිරීමට මස්කෙළිය සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය හා ආරක්ෂක අංශ මගින් මෙම පියවර ගෙන ඇත.

## මුන්නේශ්වරම බැතිමතුන්ට වැසේ

**මිහිර විජේසේකර-මාරවිල සමූහ**

මුන්නේශ්වරම දේවාලය බැතිමතුන් සඳහා විවෘත නොකිරීමට කටයුතු කර ඇති බව දේවාලයේ ප්‍රධාන පූජකවරයා සඳහන් කරයි.

මුන්නේශ්වරම දේවාලයට වැඳ පුදාගැනීමට පැමිණි මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ඇඟලුම් කම්හලේ අනියම් සේවකයකු වන මෙම ආසාදිතයා තම අවශ්‍යතාවන් ඉටු කර ගැනීමට ගිය ස්ථාන කීපයකට මුද්‍රා තැබීමට ද ඊයේ 08 පස්වරුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු පියවර ගත්හ .

## විජය රජදහනේ ගැබිනි කත ගිය සායනයේ හතරක් නිරෝධායනයට

**කොටදෙණියාව සමූහ එම්.පී. කුමාර**

කොරෝනා ආසාදිත බව අනාවරණය වූ මීරිගම විජය රජදහනේ ගැබිනි මව මාතෘ සායනයේදි පරීක්ෂා කිරීමට එක්වූ වෛද්‍යවරියක ඇතුළු සිව් දෙනෙකු නිරෝධායනයට ලක් කළ බව මීරිගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය කියයි.මෙසේ නිරෝධායනයට ලක් කර ඇත්තේ වෛද්‍යවරිය සමග හෙදි සොහොයුරියක හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් දෙදෙනෙකි.

ඔවුන් ඔවුන්ගේ නිවෙස්වලම නිරෝධායනයට ලක් කරනු ලැබ ඇති අතර ඊයේ (09 )පී.සීආර්. පරීක්ෂණයට ලක් කිරීමෙන් පසු ලැබෙන වාර්තා අනුව එම අයගේ පවුල්වල සාමාජිකයන්ද නිරෝධායනයට ලක් කිරීමට කටයුතු කෙරුණි.

## පොලීසියේ 95ක් නිරෝධායනයට

**කොටදෙණියාව සමුහ - එම් පී කුමාර**

මිනුවන්ගොඩ පොලිසියේ අනූ පස් දෙනෙකු ඊයේ 9 උදේ නිරෝධායන මධ්‍යස්ථාන තුනක් වෙත පිටත් කර යැවූ බව ගම්පහ පොලිස් අධිකාරි කාර්යාලය කියයි .මෙම පොලිස් නිලධාරීන් කාණ්ඩ තුනක් වශයෙන් හබරාදූව කළුතර හා කුණ්ඩසාලේ පිහිටි නිරෝධායන මධ්‍යස්ථාන වෙත ඊයේ 9 උදේ පිටත් කරනු ලැබීය.

## දකුණු පළාත් හිටපු සෞඛ්‍ය ඇමැති ඇතුළු 311ක් නිරෝධායනයට

**ලංකින්ද නානායක්කාර (ඉමදුව සමූහ)**

ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදුව ආසනයට අයත් අහංගම එළකැටිය ප්‍රදේශයේ පැවති දානමය පිංකමකට පැමිණි මිනුවන්ගොඩ ඇඟලුම් කම්හලේ සේවිකාවකට කොරෝනා වයිරසය ආසාදනය වි ඇති බවට තහවුරුවිමෙන් පසු එම දානමය පිංකමට සහභාගිවූ දකුණු පළාත් සභාවේ හිටපු සෞඛ්‍ය ඇමතිවරයකු වන ඒ.ජී. සී. පියසිරි මහතා ඇතුළු 311 දෙනෙකු නිවෙස්වල ස්වංය නිරෝධායනයට ලක්කොට ඇති බැව් හබරාදුව හා ඉමදුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිහු පවසති.

මේ අය අතර මෙවර අ.පො.ස උසස් පෙළ විභාගයට පෙනි සිටින දරුවන් 04 දෙනෙකු හා ශිෂ්‍යත්ව විභාගයට පෙනි සිටින එක් දරුවකුද සිටින බව ඉමදුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා සඳහන් කළේය. එම දරුවන්ගේ පි.සි.ආර්. පරික්ෂණ ඊයේ (09) සිදු කිරීමට නියමිත විය.

මේ අතර දැනට විහාරස්ථාන දෙකක නිරෝධායනය වන භික්ෂූන්වහන්සේලා 16නාගේ පි.සි.ආර්. පරික්ෂණ (08) දින සිදු කළ බවද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෛද්‍ය ප්‍රමෝද සිරිවර්ධන මහතා සදහන් කළේය

දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2020 ඔක්තෝබර් 10 සෙනසුරාදා

# තීරණාත්මක සතියක්...!

කොවිඩ් ව්‍යසනය සම්බන්ධයෙන් සලකා බලන විට ඉදිරි සතිය තීරණාත්මක යැයි සිතන්නට කරුණු තිබේ. එහි අදහස වන්නේ ඉදිරි සතියක කාලය වඩාත් පරෙස්සමෙන් කටයුතු කිරීම වැදගත් බවය. ජනාධිපතිවරයා පණිවිඩයක් නිකුත් කරමින් ප්‍රධාන සාධක තුනක් ගැන අවධාරණය කර ඇත. පළමු සාධකය වන්නේ මාර්ගෝපදේශන සෞඛ්‍ය පිළිවෙත් නිසි අයුරින් පවත්වාගත යුතු බවය. දෙවන සාධකය වන්නේ සමාජයේ සියලු දෙනා වසංගත තත්ත්වය පිළිබඳ පරීක්ෂාවකින් හා දැඩි අවධානයකින් පසුවිය යුතු බවය. තෙවන සාධකය වන්නේ අසත්‍ය ප්‍රචාරවලට මුළා නොවී පිළිගත හැකි තොරතුරු පමණක් විශ්වාස කිරීම වැදගත් බවය. මේ සාධක තුන යථානුරූපී ලෙස පවත්වාගත හැකි නම්; නව ආසාදිතයන් ඇතිවීමට හේතුවක් නැත.

වසංගත පාලනය අදාළ අංශවලට භාර දී ජනතාව සෞඛ්‍ය පිළිවෙත් රැකගෙන සිටීමත් යහපත් තත්ත්වයකි. එහෙත් සියලු පුරවැසියන් වගකීම් සහගත ලෙස හැසිරෙන බවක් පෙනෙන්නට නැත. නිරෝධායන නීති කඩකරමින් සංචාරයේ යෙදෙන අය ද, සාද පවත්වන අය ද ඉබාගාතේ ඇවිදින අය ද ඕනෑතරම් දැක ගත හැකිය. ඇඳිරි නීතිය කඩකරන අය ද ගම්පහ දිස්ත්‍රික්කයෙන් හමු වී ඇත. මෙබඳු සිදුවීම්වලින් පෙනී යන්නේ කොවිඩ් වසංගතය විහිළුවකට ගෙන ඇති පිරිසක සිටින බවය. අමෙරිකන් ජනාධිපතිවරයා කොවිඩ් - 19 ට සමච්චල් කරන අතර හිටිහැටියේ මුඛ ආවරණ ගලවා ඉවත වීසි කරයි. මෙය ලෝකය පුරා බොහෝ දෙනකුගේ දැඩි විවේචනයට ලක් විය. අමෙරිකාව යනු කොරෝනා වසංගතයෙන් බලවත්ම පීඩාවකට ලක් වූ රට ද වෙයි.

අමෙරිකාව, ඉන්දියාව,බ්‍රසීලය කොවිඩ් වසංගතයෙන් දැඩි ලෙස පීඩා විඳින රාජ්‍යයන් තුන ලෙස සැලකිය හැකිය. මේ රටවල ඇතැම් නායකයන් වසංගත තත්ත්වය නිසි ලෙස වටහා ගත්තේ නැත. ජනාධිපති ට්‍රම්ප්ට අනුව කොරෝනා යනු සාමාන්‍ය උණ රෝගයකි. එම ප්‍රකාශය ලෝක සෞඛ්‍ය සංවිධානයේ පවා දැඩි දෝෂ - දර්ශනයට ලක් විය. එම රටවල නායකයන් පමණක් නොව ජනතාව ද කොවිඩ් ගැන දක්වා ඇත්තේ අඩු සැලකිල්ලකි. එහි ප්‍රතිඵලය වන්නේ රෝගය වේගයෙන් ව්‍යාප්ත වීමය. ඉහත රටවල් තුනෙහි කොවිඩ් ව්‍යාප්තිය, මරණ සංඛ්‍යාව හා ආර්ථිකයේ පසුබෑම බරපතළ ලෙසින් සිදු වෙයි. ශ්‍රී ලංකාව ඉහත රටවල් තුන ම පාඩමකට ගත යුතු යැයි අපට හැඟේ.

කොවිඩ් සමග ජීවත් වෙමින් වසංගතය පරාජය කරමු යන්න නූතන සටන් පාඨය වී තිබේ. ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙන අන්දමට තවත් වසර දෙකක් හෝ තුනක් හෝ අපට මේ වයිරසය සමග සටන් වැදීමට සිදුවනු ඇත. එම තත්ත්වය අප ඉතා හොඳින් වටහා ගත යුතුව තිබේ. පරීක්ෂාව හා අවධානය යනුවෙන් ජනාධිපතිවරයා සඳහන් කරන්නේ එම තත්ත්වයයි. ඉදිරි දින කිහිපය තුළ දී ජාතික වශයෙන් වැදගත් විභාග දෙකක් පැවැත්වීමට නියමිතය. මේ කාලය තුළ දී තමන්ගේ දරුවන්ගේ මුළු ආරක්ෂාව මාපියන් වෙත පැවරේ. රජය අවශ්‍ය පහසුකම් සපයන අතර විභාග සඳහා දරුවන් සහභාගී කරවීමත් නැවත සුරක්ෂිත ව දරුවන් නිවෙස වෙත කැඳවාගෙන යෑමත් මාපියන් කළ යුතුය. එම වගකීම නොසලකා හැරීම වැරැද්දකි.

පවතින තත්ත්වය යටතේ වැරදි තොරතුරු ප්‍රචාරය වීම ශීඝ්‍ර වී ඇත. සමාජ මාධ්‍ය වගකීමකින් වාර්තාකරණයෙහි යෙදෙන්නේ නැත. එය සැලකිය හැක්කේ අවදිමත් සන්නිවේදනයක් හැටියටය. කැලෑ පත්තරවල සන්නිවේදනයට සමාන කාර්යයක් එයින් ඉටුවෙයි. සමාජ මාධ්‍යකරුවා තමන් හිතන දේවල් ද, මවන දේවල් ද අනෙකා වෙත සන්නිවේදනය කරයි. එය භයානක තත්ත්වයකි. විශේෂයෙන් සමාජ අර්බුදයක් හමුවේ ඉන් ඇති කළ හැකි හානිය බරපතළය. අසත්‍ය ප්‍රචාරවලට සම්බන්ධ පුද්ගලයන් කිහිප දෙනකු මේ වන විට අත්අඩංගුවට ගෙන තිබේ. මොවුන් සඳහා නීතිය හරිහැටි ක්‍රියාත්මක විය යුතුය. උපරිම දඬුවමක් ද ලබා දිය යුතුය. හැම විටම නිල ප්‍රවෘත්ති ප්‍රකාශ කෙරෙහි ජනතා අවධානය යොමු වන්නේ නම්; සිදු විය හැකි හානිය අවම කරගත හැකිය.

විපක්ෂ නායකවරයා මේ මොහොතේ ඉතා වැදගත් අදහසක් සමාජගත කර තිබේ. ඒ අනුව කොවිඩ් මර්දනය සම්බන්ධයෙන් රජයට සහයෝගය ලබාදීමට විපක්ෂය සූදානම්ය. එය ජාතික වගකීමක් බව ද විපක්ෂ නායකවරයා පෙන්වා දී ඇත. එය සාධනීය දේශපාලන තත්ත්වයක් හැටියට ගෙන විපක්ෂයට කෘතඥතාව පළ කිරීම වැදගත්ය. ඇතැම් බස් සංගම් සෞඛ්‍ය පිළිවෙත් කෙරෙහි දැඩි අවධානය යොමු කර ඇත. එම පිළිවෙත් නොසලකා හරින බස් සේවකයන් ගැන සෙවීම සඳහා මෙහෙයුමක් සිදු කරන බව ද ඔව්හු පෙන්වා දෙති. එය ද අගය කළ යුතු තීරණයකි.

ජනාධිපතිවරයා මුල සිට ම පෙන්වා දුන්නේ කොරෝනා මර්දනයේදී සාමූහිකත්වය ඉතා වැදගත් බවය. සාමූහිකත්වය තුළ අර්බුද ජය ගැනීමේ ශක්තිය පවතී. ශ්‍රී ලංකාව ඈත අතීතයේ සිට ම අර්බුදවලට මුහුණ දී ඒවා ජය ගෙන තිබේ. යුද්ධය හා ත්‍රස්තවාදය බලවත් ම අර්බුදයකි. බලවත් රටවල අදහස වූයේ යුද්ධයෙන් හා ත්‍රස්තවාදයෙන් ශ්‍රී ලංකාව විනාශයට යන බවය. එහෙත් ඒ දෙක ම පරාජය කොට ස්වාධීන රාජ්‍යයක් ලෙස නැඟී සිටින්නට අපට හැකි විය. ශ්‍රී ලංකාව හැම විටම ජයග්‍රහණ ලබාගෙන ඇත්තේ තමන්ගේම ක්‍රමවේද ඔස්සේ අභියෝගවලට මුහුණ දීමෙන්ය. කොරෝනා මර්දනය සඳහා අපේ රට ක්‍රියාත්මක වන්නේ ද අපේ ම ක්‍රමවේදයක් ඔස්සේය. එය සාර්ථක බව ලෝකය දැන් පිළිගෙන තිබේ.

අනවශ්‍ය භීතිකාවකට යට නොවී තම - තමන්ගේ යුතුකම් හා වගකීම් වටහා ගෙන ක්‍රියා කළ හොත් මිනුවන්ගොඩ කොරෝනා රැල්ල තවත් සතියක් යන්නට පෙර මුළුමනින්ම පරාජය කළ හැකිය.

### දිල්රුගෙ සීවිද

අනුකම්පා විරහිත ලෙස යට කරගෙන විස්ස
තතු හංගාගෙන තැන තැන කොවිඩ් කරයි රිස්ස
අතු අස්සෙන් බිමට බැහැපු පොල් නටවයි හොස්ස
ඔය ඔක්කොම බලා හිඳිමු බිම ඇනගෙන පස්ස



# කොවිඩ් 19 ට එරෙහි ගෝලීය සටන

විදෙස් විත්ති විග්‍රහය

කොරෝනා වසංගතය ලෝකයට තර්ජනයක් ලෙස මතුවී ගෙවී යන්නේ දස වැනි මාසයයි. මේ වනවිට ලෝක බලවතා වන අමෙරිකාවේ ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ද කොරෝනා ආසාදිතයෙකි. දෙදිනකට පෙර යළිත් වරක් අමෙරිකාවෙන් දෛනිකව වාර්තා වන කොවිඩ් රෝගීන් ගණන 44,000 ඉක්ම විය. ලොව පුරා වාර්තා වී ඇති කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව කෝටි 4කට ආසන්නය.

මරණ සංඛ්‍යාව මිලියනය ඉක්මවා තිබේ. සුවය ලැබූ පිරිස කෝටි 3කට ආසන්නය. අමෙරිකාවේ ප්‍රාන්ත අතරින් අඩකට ආසාදිතයන්ගේ වර්ධනයක් පෙන්නුම් කිරීමට පටන්ගෙන ඇත. එරටින් මිලියන 7.5 ඉක්මවා ආසාදිතයන් වාර්තා වී ඇති අතර මරණ සංඛ්‍යාව 211,000 ඉක්ම විය. ජනාධිපති ට්‍රම්ප් ක්‍රමයෙන් සුව අතට හැරෙමින් රාජකාරිවලට ද සම්බන්ධ වන බව මාධ්‍ය වාර්තාවල සඳහන් විය. එසේ සිටින අතරම, එරට ආර්ථිකය සාමාන්‍ය අතට හැරවීම සඳහා නව උත්තේජක පැකේජයක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ඩිමොක්‍රටික් පක්ෂය සමඟ සිදු කළ සාකච්ඡා අත්හිටුවීමට ජනාධිපතිවරයා උපදෙස් දුන් බවද වාර්තා වේ. මේ පිළිබඳ එකගතාවකට එළැඹීම සඳහා දෙපාර්ශ්වය මාස කිහිපයක් තිස්සේ වෑයමක යෙදී සිටියහ.

## ට්‍රම්ප්ගේ ක්‍රියා කලාපය

අමෙරිකාව, කොරෝනා වසංගතය හමුවේ ක්‍රියාත්මක වන ආකාරය හා ඊට එරෙහිව සටන් කරන ආකාරය ලෝකයේ මෙන්ම එරට තුළ ද විවේචනයට ලක් විය. විශේෂයෙන්, එහිදී, ජනාධිපති ට්‍රම්ප්ගේ ක්‍රියා කලාපය මඟින් දිස් වූයේ එය සැහැල්ලුවට ගත් හැසිරීමකි. කොවිඩ් - 19 ගෝලීය වසංගතයක් ලෙස ලෝකයට අභියෝගයක් එල්ල කරමින් ඇති පසුබිමක ලෝක බලවතා වන අමෙරිකාවේ භූමිකාව විය යුත්තේ මෙයද යන්න සංවාදයට ලක්විය. එසේ තිබියදී එරට පළවන කීර්තිමත් වෛද්‍ය සඟරාවක් වන New England Journal of Medicine නම් වාරිකය ඉකුත් බදාදා එහි සංස්කාරක මණ්ඩලයේ සියලු දෙනාගේ අස්සනින් යුතුව සංස්කාරක සටහන ප්‍රකාශයට පත් කරමින් ට්‍රම්ප් පාලනය දැඩිව දෝෂදර්ශනයට ලක් කළේය. එරට වත්මන් නායකත්වය ඉදිරි මැතිවරණයේදී බලයෙන් පහ කළ යුතු බව කියන්නට තරම් එය ඉදිරියට ගොස් තිබිණි. මෙම වාරිකය 1812 වර්ෂයේ පටන් පළ කෙරෙන අතර ගත වූ සියවසකට වැඩි ඉතිහාසයේ සමස්ත සංස්කාරක මණ්ඩලයේම අස්සන් සහිතව එහි සංස්කාරක සටහන් පළව ඇත්තේ 4 ක් පමණි. මෙම අර්බුදය මඟින් නායකත්වය පරීක්ෂාවට ලක් කෙරී ඇති බව එහි සඳහන් විය. ඇතැම් රටවල් මෙම අභියෝගයට සාර්ථකව මුහුණ දෙමින් සිටියදී, මෙම පරීක්ෂණයෙන් තම නායකයන් අසමත්ව ඇති බව පෙනෙන්නේ යැයි ද එහි දැක්විණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම අර්බුදය ඛේදවාචකයක් බවට හැරී ඇති බව ඔවුන් පෙන්වා දී තිබිණි.

යුරෝපයේ ද මේ වනවිට දෙවැනි රැල්ලක් නැගෙමින් ඇත. ජනගහනයට සාපේක්ෂව මෙතෙක් වැඩිම කොරෝනා රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වූයේ, ස්පාඤ්ඤයෙන් වුවද ගෙවී යන සතියේදී චෙක් ජනරජය එතැනට පැමිණියේය.

## ලොව වැඩිම ආසාදිතයන්

ඉකුත් බදාදා, බ්‍රසීලයෙන් නව ආසාදිතයන් 31,553ක් වාර්තා වීමත් සමඟ මෙතෙක් එරටින් වාර්තා වූ සමස්ත ආසාදිතයන් සංඛ්‍යාව 500,000 ඉක්ම විය. මරණ සංඛ්‍යාව, 148,000 ඉක්මවා තිබේ. මෙතෙක් ලොව වැඩිම කොරෝනා ආසාදිතයන් සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ අමෙරිකාවෙනි. දෙවැනි තැන සිටින්නේ ඉන්දියාවය. තුන්වැනි තැන බ්‍රසීලයයි. ජෝන්ස් හොප්කින්ස් සරසවි දත්ත දක්වන පරිදි, අමෙරිකාවට පසු වැඩිම කොවිඩ් මරණ සංඛ්‍යාව වාර්තා වන්නේ ද බ්‍රසීලයෙනි.

ගෙවී යන සතිය ආරම්භයේදී අමෙරිකාවේ කැලිෆෝනියා ප්‍රාන්ත ආණ්ඩුකාර කාර්යාලයේ කාර්ය මණ්ඩල සාමාජිකයකු ද කොවිඩ් - 19 ආසාදිතයකු ලෙස හඳුනා ගැනිණි. නෙවාඩ් ප්‍රාන්තයේ ආණ්ඩුකාරවරයාට සිදු කළ කොවිඩ් පරීක්ෂාවෙන් ඔහු ආසාදිතයකු නොවන බව තහවුරු විය. ආණ්ඩුකාරවරයා එම පරීක්ෂාවට ලක් කෙරුණේ එම කාර්ය මණ්ඩල සාමාජිකයකු ආසාදිතයකු බවට හඳුනාගැනීමෙන් පසුවයි. ජාතික පාපන්දු ලීගය (NFL) හා ක්‍රීඩක සංගමය පසුගියදා නිවේදනය කළේ ක්‍රීඩකයන් 11 දෙනකු හා කාර්ය මණ්ඩල සාමාජිකයන් 15 දෙනකු කොවිඩ් - 19 ආසාදිතයන් බවට පරීක්ෂණවලින් තහවුරු වූ බවය. අගෝස්තු 1 වැනිදා සිට මේ දක්වා කාලසීමාව තුළ පාපන්දු ක්‍රීඩකයන් 31 දෙනකු ආසාදිතයන් ලෙස හඳුනාගෙන ඇත.

## පොදු විවාදය

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 75 වෙනි සංවත්සරය සමරන විට මෙවර මහා මණ්ඩල සැසිවාරය යටතේ පැවැත්වෙන රාජ්‍ය නායකයන් සහභාගි වන පොදු විවාදය ඉතිහාසයේ ප්‍රථම වතාවට එ.ජා. මූලස්ථානයේදී පැවැත්වීමට නොහැකි විය. රාජ්‍ය නායකයන් එය ඇමතුවේ තම රටවල සිට වීඩියෝ මාධ්‍යයෙනි. මේ අතර එක්සත් ජාතීන්ගේ, සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් ෆිලිපෝ ග්‍රැන්ඩි ද කොවිඩ් - 19 ආසාදිතයකු බවට පත්ව සිටී. ඔහු විසින්ම තැබූ ට්විටර් පණිවිඩයකින් ඒ බැව් ප්‍රකාශයට පත්කර තිබූ අතර නිවෙසේ සිට ස්වයං නිරෝධායනයට ලක් වෙමින් සිටින බව සඳහන් විය.

> “විශේෂඥයන් පෙන්වා දෙන අන්දමට වසංගතයකට එරෙහිව ක්‍රියාත්මක වීමේදී ඉන්දියාවේ තත්ත්වය තවමත් බෙහෙවින් සංකීර්ණය. අධික ජන ඝනත්වය පමණක් නොව ලොව නොයෙක් ප්‍රදේශවලින් සංචාරකයන් පැමිණෙන රටක් වීම ද ඊට හේතුවක් ලෙස දැක්විය හැකිය. මෙවැනි සාධක කවර පාලනයකට වුවද අභියෝගයක් බව ඇතැම් විශ්ලේෂකයන්ගේ අදහසය.


කැනඩාවෙන් සතියකට වාර්තා වන ආසාදිතයන්ගේ සාමාන්‍ය ඉහළම අගය වාර්තා කළේ ද ගෙවී යන සතියේදීය. ඒ සමග ඉදිරි සති කිහිපය තීරණාත්මක වනු ඇති බැවින් ජනතාවට නිවෙස් තුළටම වී ගත කරන ලෙස සෞඛ්‍ය බලධාරීහු ඉල්ලා සිටිති. ගෙවී යන සතියේ එරට ආසාදිතයන් සංඛ්‍යාව 40% කින් ඉහළ ගියේය. නව ආසාදිතයන්ගෙන් 80% ක්ම ඔන්ටාරියෝ සහ ක්විබෙක් ප්‍රාන්තවලිනි. ඔවුන් අතරින් 60% ක්ම වයස අවුරුදු 40 ට අඩු අයයි. වසංගත ව්‍යාප්තියත් සමග මෙතෙක් කැනඩාවෙන් දිනක් තුළ වාර්තා වූ වැඩිම ආසාදිතයන් ගණන වාර්තා වූයේ ඉකුත් අඟහරුවාදාය. එය, 1364 කි. ක්විබෙක් සෞඛ්‍ය අමාත්‍යවරයා පවසා සිටියේ, තරුණ ප්‍රජාව සෞඛ්‍ය උපදෙස් අනුගමනය නොකිරීම මීට හේතුවී ඇති බවය. අවදානම නොගන්නා ලෙසද, සෞඛ්‍ය පද්ධතිය පරීක්ෂාවට ලක් කිරීමට නොයන ලෙසද, ඒවා විධිමත්ව ක්‍රියාත්මක වන නමුත් නිවෙසටම වී සිටින ලෙස ද ඉන් ඉල්ලා තිබිණි. අගමැති ජස්ටින් ට්‍රූඩෝ ද මුහුණ ආවරණ පලඳින ලෙස හා දුරස්ථභාවය පවත්වා ගන්නා ලෙස යළිත් සිය රටවැසියන්ගෙන් ඉල්ලා ඇත.

ඉන්දියාවෙන් වාර්තා වන ආසාදිතයන් ගණන මිලියන 7කට ආසන්නය. දෛනිකව 75,000 ක් පමණ ආසාදිතයන් වාර්තා වන තත්ත්වයක් තිබේ. මරණ සංඛ්‍යාව ලක්ෂය ඉක්මවා ඇත. රෝගයෙන් සුවය ලබා ඇති සංඛ්‍යාව 580,000 ක් පමණ වේ. දැනට පෙනී යන පරිදි සැප්තැම්බර් මාසයට වඩා ඔක්තෝබර් මාසයේ නව ආසාදිතයන් වාර්තා වීමේ අඩුවක් දක්නට ඇති බව සැලකිය හැකිය. තවදුරටත් මුහුණු ආවරණ පැලැඳීම, දෑත් සේදීම, ජනාකීර්ණ ස්ථානවලින් ඈත්ව සිටීම වැනි සෞඛ්‍ය ආරක්ෂක උපදෙස් අනුගමනය කරන ලෙසට එරට සෞඛ්‍ය අංශ ජනතාවගෙන් ඉල්ලා සිටිති. එරට තුළ ලොක්ඩවුන් රෙගුලාසි ද දැඩිව ක්‍රියාත්මක විය. සුව වෙමින් ඇති ප්‍රතිශතය 84% තරම් ඉහළ මට්ටමක තිබීම ඉන්දියාවට යම් අස්වැසිල්ලට කාරණයක් බව සැලකිය හැකිය. කෙසේ වුවද, දැඩිව ලොක්ඩවුන් රෙගුලාසි ක්‍රියාත්මක වූ පසුබිමක ළමයින් අතර මන්දපෝෂණය උග්‍ර අතට හැරීම වැනි අතුරු කාරණා ද වඩා බරපතළ වූ බව පෙනෙන්නට තිබිණි. අධ්‍යාපන කටයුතුවලට බලපෑම් ඇතිව ඇති අතර ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ඉහළ ගොස් ඇති බව ද වාර්තා විය. සාංකාව, ආතතිය වැනි මානසික ව්‍යාකූල තත්ත්වද ඉහළ ගොස් ඇත. ඉන්දියාවෙන් වාර්තා වී ඇති මරණ අතරින් 80% ක්ම වාර්තා වී ඇත්තේ ග්‍රාමීය ප්‍රදේශවලින් වීමද අවධානයට ලක් විය යුතුය. එම ප්‍රදේශවල සෞඛ්‍ය පහසුකම් ප්‍රමාණවත් ද යන ප්‍රශ්නය පැන නැඟී ඇත.

## ඉන්දියාවේ තත්ත්වය

විශේෂඥයන් පෙන්වා දෙන අන්දමට වසංගතයකට එරෙහිව ක්‍රියාත්මක වීමේදී ඉන්දියාවේ තත්ත්වය තවමත් බෙහෙවින් සංකීර්ණය. අධික ජන ඝනත්වය පමණක් නොව ලොව නොයෙක් ප්‍රදේශවලින් සංචාරකයන් පැමිණෙන රටක් වීම ද ඊට හේතුවක් ලෙස දැක්විය හැකිය. මෙවැනි සාධක කවර පාලනයකට වුවද අභියෝගයක් බව ඇතැම් විශ්ලේෂකයන්ගේ අදහසය. කොවිඩ් -19 ට එරෙහිව රුසියාව එන්නතක් හඳුන්වා දුන් අතර, අමෙරිකාව සහ තවත් රටවල් කිහිපයක් එන්නත් සඳහා පර්යේෂණාත්මක අදියරවල සිටිති. ලෝක සෞඛ්‍ය සංවිධානයද එම වෑයමේ යෙදේ. කෙසේ වුවද, මේ කිසිවක් තවමත් කඩිනමින් පුළුල්ව භාවිතයට එක්වන බවක් පෙනෙන්නට නැත. නිසි ඖෂධයක් හඳුනාගන්නා තෙක් අවදානමෙන් මිදෙන්නට ලෝකයට අසීරුය. එවැනි පසුබිමක කොවිඩ් 19 සමග ජීවත් වෙමින් වසංගතය පාලනය කිරීමට ලෝකයට සිදුවී ඇත. දැනට සිදු වෙමින් ඇත්තේ අර්බුදය කළමනාකරණය කිරීමයි. එහිදී බලවත් රටවල් පවා අසමත්ව ඇති ප්‍රමාණය ද නිදහස් සෞඛ්‍ය සේවයක් ක්‍රියාත්මක වන කුඩා රටවල් එය සතුටුදායක මට්ටමකින් පාලනය කිරීමට දරන ප්‍රයත්නය ද දැකිය හැකිය. චීන ජනාධිපති ෂී ජිංග් පිංග් පසුගියදා එක්සත් ජාතීන්ගේ 75 වෙනි සංවත්සර සැසිවාරය අමතමින්ද අවධාරණය කළ පරිදි මෙය රටවලට තනි තනිව ජය ගත හැකි අභියෝගයක් නොවේ. කොවිඩ් 19 පරාජය කළ හැකි වන්නේ සාමූහික ප්‍රයත්නයක් වශයෙනි. එය ආණ්ඩුවලට පමණක් තනිව කළ හැකි දෙයක් ද නොවේ. සෑම මනුෂ්‍යයකුටම ඇති සමාජ වගකීම ද එහිදී අවධාරණය කළ යුතුය. එය පැහැර හැරෙනතාක් දුරට කොරෝනා වසංගතය ජය ගැනීම ද දිනෙන් දින ඈතට ගමන් කරනු ඇත. මෙහිදී ලෝකය එක්ව නැඟී සිටිය යුතු වන්නේ එබැවිනි.

**ධම්මික සෙනෙවිරත්න**





# සැමට සැබෑ වන නිවාස සිහිනය

මානව ඉතිහාසයේ ජනාවාසකරණය යනු ඉතා අපූර්වතම සංසිද්ධියකි. ගල් යුගයේ සිට නූතන මිනිසා දක්වා පරිණාමීය ක්‍රමවේදය එක්තරා කතාන්තරයක අගමුල මෙන් ගැලපී ඇත. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ම මානව ජනාවාසකරණය ගංගා හා නිම්න ආශ්‍රිතව බිහිවී තිබේ. ගංගා නිම්න ආශ්‍රිතව පැවති භූගෝලීය තත්ත්වය ඒ සඳහා පාදක වන්නට ඇත.

මානව ජනාවාසකරණය නාගරීකරණය දක්වා විකාශනය වීමේදී කෘෂි ආර්ථිකය වෙනුවට වාණිජ හා සේවා ආර්ථිකයක් දක්වා මානවයා අනුගත වීමේදී ඇති වූ යම් යම් වෙනස්වීම් ඒ සඳහා බලපා ඇත. උදාහරණයක් ලෙස වාණිජ හා සේවා ආර්ථිකයේදී වෙළෙඳපොළ නිර්මාණය වීමේදී මෙම ආර්ථිකය භූගෝලීය වශයෙන් එක් ස්ථානයකට සංකේන්ද්‍රණය වීමක් දක්නට ඇත. ඉන් අනතුරුව ඊට පසුබිම නිර්මාණය වීමක් ලෙස ප්‍රවාහනය, මාර්ග, ඉදිකිරීම් ක්‍රියාවලීන් හරහා ලොව නාගරීකරණය බිහි විය.

ප්‍රාග් ඓතිහාසික යුගයේ බිහි වූ එවැනි නාගරික ජනාවාස ලෙස මොහෙන්දජාරෝ, හරප්පා වැනි ඉපැරණි නගර නිදසුන් ලෙස දැක්විය හැකිය. මානව අවශ්‍යතා පදනම් කරගනිමින් විවිධාංගීකරණය වූ ආර්ථික රටාවට ගැළපෙන අයුරින් හා ඒ හා සමගාමීව වැඩිවන ජනඝනත්වයට සරිලන අයුරින් මෙම නාගරික ජනාවාස නිර්මාණය කිරීමට ඉපැරණි මානව සමාජය සමත් විය.

ශ්‍රී ලංකාවේ ජනාවාසකරණයත් එම ජනාවාස නාගරීකරණය වීමත් ඉහත අයුරින් ම සිදු වී ඇති බව පෙනේ. එනම් ශ්‍රී ලංකාවේ ඓතිහාසික ප්‍රථම ජනාවාසය මල්වතු ඔය ආශ්‍රිතව බිහි වූ අනුරාධ ග්‍රාමය යි. අනුරාධග්‍රාමය අනුරාධපුරය බවට පත්වන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රථම ඓතිහාසික නාගරීකරණය වූ ජනාවාසය වශයෙනි. මහාතීර්ත්ථ වරායෙන් ගොඩබට විජය ඇතුළු පිරිස මල්වතු ඔය ඔස්සේ රට මැදට පැමිණ ජනාවාස ආරම්භ කිරීමත් එම ජනාවාස ක්‍රමයෙන් නාගරීකරණය වීමත් තුළ දක්නට ඇති ඉතාම සැලසුම්සහගත බව ඉතිරිව ඇති නටබුන් පවා කියාපාන්නකි.

නගර නිර්මාණයේ උපන් හපන්කම් ඇති ජාතියක් වූ සිහලුන් අනුරාධපුරය, පොලොන්නරුව ආදී නගර නිර්මාණය කර ඇති ආකාරය ලොවක් විස්මය දනවන සුලුය. සීගිරි නගර ද ඊට කදිම නිදසුනකි. රෝහල්, පාඨශාලා, ආගමික ස්ථාන, මාර්ග පද්ධතිය, කාණු පද්ධතිය, සල්පිල් වැනි නාගරික හැඩතල ඉතාම ක්‍රමානුකූලවත් නේවාසික ඉදිකිරීම් නගරයෙන් පරිබාහිරව ඉදිකිරීමත් පිළිබඳ සැලකිලිමත් වූ ශ්‍රී ලාංකේය පරපුරක් වර්තමානයේ නාගරීකරණයත් සමඟ පත්ව ඇති බිහිසුණු අභියෝගය පිළිබඳ අවධානය යොමු කළ යුතු යුගයක් උදා වී ඇත.

අතීතයේ මෙන්ම ශ්‍රී ලංකාවේ ජනාවාසකරණය හා නාගරීකරණය ගංගා හා වරාය ආශ්‍රිතව නිර්මාණය වී ඇති බව පෙනේ. කොළඹ, ගාල්ල, මාතර මෙන්ම රට වටා ඇති බොහෝමයක් නගර මෙබඳු ගංගා හා වරාය ආශ්‍රිතව බිහි වී ඇත්තේ නාගරීකරණයේ පොදු ලක්ෂණ අනුවය.

කැලණි ගං මිටියාවත හා කොළඹ වරාය ආශ්‍රිතව නාගරීකරණය වූ කොළඹ නගරය අද වන විට ඉතා අධික ජනඝනත්වයකින් හෙබි නගරයකි. වාණිජ හා සේවා ආර්ථිකයට හැඩගැසුණු රට පුරා විසිරී ඇති මිනිසුන් ගම අතහැර කොළඹට පැමිණ සිය වෙළෙඳාම් හා සේවාවන් පවත්වාගෙන ගිය අතර එම වෙළෙඳ හා සේවා සැපයීමේ පහසුව පතා ඔවුන් නගර ආසන්නයේ ම තම නේවාසික පහසුකම් ද සලසාගනු ලැබීය. ඉතා සීමිත ඉඩකඩක් තුළ දිනෙන් දින තරගකාරී වූ ආර්ථිකය කොළඹ නගරයට දායාද කළ දේ අතර පොහොසත් වෙළෙඳුන්, ප්‍රාකාරවලින් වැසුණු සුවිසල් මන්දිර මෙන්ම ඔවුන්ට සේවය සැපයූ දිළින්දන් ද ඔවුන්ගේ වාසභූමීන් ලෙස පැල්පත් හා මුඩුක්කු ද බිහි විය. එපමණක් නොව සිගන්නන්, සොරුන්, ගැටකපන්නන් මෙන්ම මත්ද්‍රව්‍ය, පාතාලය වැනි විෂමාචාර, සමාජ විරෝධී ක්‍රියාවන් ද බිහි වන්නේ මෙම තරගකාරී විවෘත ආර්ථිකයේ ප්‍රතිඵලයක් ලෙස ය.

ශ්‍රී ලංකාවේ නාගරීකරණයත් සමඟ වර්ධනය වූ නාගරික නිවාස අර්බුදය පිළිබඳ විමසා බැලීම ඉතා වැදගත් ඇරඹුමකි.

සීඝ්‍රයෙන් ජනාකීර්ණ වූ කොළඹ නගරයේ ආර්ථික යුද්ධයෙන් පරාජයට පත්වූ අඩු ආදායම් සහිත මිනිසුන් විසින් සිය නිවාස අවශ්‍යතාව අනවසර හා අවිධිමත් අයුරින් ඉදිකිරීම යන ගැටලුව මත පැල්පත්, මුඩුක්කු ජනාවාස සංස්කෘතිකය බිහි විය. ඒ හරහා ඔවුන්ගේ යහපත් සෞඛ්‍ය පවත්වාගෙන යෑම අඛණ්ඩ අධ්‍යාපනය ඇතුළත් මූලික අවශ්‍යතාවන් අමුඅමුවේ ම උල්ලංඝනය වීමක් දක්නට ලැබිණි. ඒ හරහා ඔවුන් මහා සමාජයෙන් ආන්තිකකරණයට ලක් වූ පිරිසක් ලෙස හංවඩු ගැසිණි. තමා ජීවත් වන වාසභූමියට ස්ථිර ලිපිනයක් හෝ නොමැති මෙබඳු ජනකොටසකට ඇති වී තිබෙන සමාජ සාධාරණත්වය කුමක් ද?

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

මෙම ගැටලු නිරාකරණය කිරීම පිණිස නාගරික මහල් නිවාසකරණය සඳහා ව්‍යවස්ථාපිත ආයතන කිහිපයක් පෙරමුණ ගෙන කටයුතු කරනු ලබන අතර නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය එහිදී සුවිශේෂ කාර්යභාරයක් ඉටු කරන ආයතනයකි.



> **නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ දැක්ම වන්නේ 'තිරසර නාගරික ජනාවාස තුළ සාඩම්බර ජීවිතයක් සහතික කිරීම' යි. එමෙන්ම ආයතනයේ මෙහෙවර වන්නේ 'සාකල්‍ය නාගරික සංවර්ධන සැලැස්මකට අනුගතව ඌන පහසුකම් සහිත නාගරික ජනාවාසවල සහ නාගරික කලාපවල වැසියන්ගේ නිවාස ගැටලුවට විසඳුම් ලබාදීම හා ඒ හා සමගාමීව ඔවුන් සමාජ, ආර්ථික හා සංස්කෘතික වශයෙන් සවිබලගැන්වීම' යි.**

2008 අංක 36 දරන පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපිත කරන ලද නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයකි.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණ වූයේ නාගරික සංවර්ධනයට අදාළ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, තිරසර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇතිවනු පිණිස අඩු පහසුකම් නාගරික ජනාවාසවල වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීම හා එම ජනතාවට අවම නාගරික පහසුකම් සඳහා ප්‍රවේශය සලස්වමින් දැනට පවතින නිවාස ඒකක වැඩිදියුණු කිරීම හෝ වඩාත් යහපත් නිවාස පහසුකම් ලබාදීම සඳහා වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සඳහාත් ය.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ දැක්ම වන්නේ 'තිරසර නාගරික ජනාවාස තුළ සාඩම්බර ජීවිතයක් සහතික කිරීම' යි. එමෙන්ම ආයතනයේ මෙහෙවර වන්නේ 'සාකල්‍ය නාගරික සංවර්ධන සැලැස්මකට අනුගතව ඌන පහසුකම් සහිත නාගරික ජනාවාසවල සහ නාගරික කලාපවල වැසියන්ගේ නිවාස ගැටලුවට විසඳුම් ලබාදීම හා ඒ හා සමගාමීව ඔවුන් සමාජ, ආර්ථික හා සංස්කෘතික වශයෙන් සවිබලගැන්වීම' යි.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට පැවරී ඇති ව්‍යවස්ථාපිත කාර්යභාරය අනුව අඩු පහසුකම් සහිත නාගරික ප්‍රජාවගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා අංශ දෙකක් ඔස්සේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

**භෞතික සංවර්ධන වැඩසටහන්**

භෞතික සංවර්ධන ප්‍රවේශය ඔස්සේ නාගරික අඩු පහසුකම් ජනාවාසයන්හි ජනතාව සඳහා ප්‍රතිනිවාසකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ නාගරික ප්‍රදේශවල පිහිටි තාවකාලික සහ අර්ධ ස්ථිර නිවාස ප්‍රමිතිගත නිවාස බවට පත්කිරීමේ නාගරික නිවාස වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව ක්‍රියාත්මක නිවාස ව්‍යාපෘතීන්,

***අනුරාධපුරය "තුරුඉතුරුගම" නිවාස ව්‍යාපෘතිය***

අනුරාධපුරය පූජා භූමිය හා මල්වතු ඔය ආශ්‍රිත ඌන පහසුකම් යටතේ ජීවත් වූ අඩු ආදායම්ලාභී පවුල් ඒකක 108 ක් ඉලක්ක කරගනිමින් මෙම නිවාස ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

***හලාවත "නරියගොඩැල්ල" නිවාස ව්‍යාපෘතිය***

හලාවත නගර සභාවේ සේවය කරන සනීපාරක්ෂක කම්කරු පවුල් 54 ක් මෙම නිවාස ව්‍යාපෘතියේ පදිංචි කර ඇත.

***තලවකැලේ - ලිඳුල නිවාස ව්‍යාපෘතිය***

උඩලැයිම ජනාවාසය හා පැරණි වෙළඳපොළ අසළ ඉඩමෙහි ජීවත් වන අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා තලවකැලේ ලිඳුල නගර සභා බල ප්‍රදේශයේ නිවාස ඒකක 54 කින් යුක්තව ඉදිකිරීම් මේ වන විට අවසන් කර ඇත.

***මොරටුව - අඟුලාන "සයුරුපුර" මහල් නිවාස ව්‍යාපෘතිය***

මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ අඟුලාන ග්‍රාම නිලධාරී වසමේ නිවාස ඒකක 288 ක් ඉදිකරන ලද මෙම නිවාස ව්‍යාපෘතියේ පදිංචි කරවන ලද්දේ සුනාමි සහ මුහුදු ඛාදනයෙන් පීඩා විඳින ප්‍රජාව සහ අඩු ආදායම්ලාභී ප්‍රජාවකි.

***බොරැල්ල "සිංහපුර" මහල් නිවාස ව්‍යාපෘතිය***

නිවාස ඒකක 120 කින් යුක්ත (අදියර I හා II) බොරැල්ල වනාතමුල්ල ග්‍රාම නිලධාරී වසමේ ඉදිකරන ලද මෙම නිවාස ව්‍යාපෘතියේ කොළඹ ටොරින්ටන් පිහිටි 187 ජනාවාසයේ අඩු පහසුකම් සහිතව ජීවත් වූ ප්‍රජාව පදිංචි කරවන ලදී.

තවද බොරැල්ල 'සහස්පුර' නිවාස ව්‍යාපෘතියේ නිවාස ඒකක 676 ක් ද ගාල්ල - රජ්ගම 'රළජයපුර' නිවාස ව්‍යාපෘතියේ නිවාස 149 ක් ද කොලොන්නාව 'වදුළුසෙවණ' නිවාස ව්‍යාපෘතියේ නිවාස 60 කින් ද සමන්විත වේ.

එමෙන්ම වර්තමානයේ නිවාස ඒකක 356 කින් යුක්තව මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ ලුනාව ග්‍රාම නිලධාරී වසමේ නාගරික නිවාස ව්‍යාපෘතියක් මේ වන විට ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.

**"ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන**

එමෙන්ම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක සුවිශේෂී වැඩසටහනක් ලෙස 'ස්වශක්ති' මානව සංවර්ධන වැඩසටහන පෙන්වා දිය හැකිය. 'ස්වශක්ති' මානව සංවර්ධන වැඩසටහන ඌන පහසුකම් සහිත නාගරික ජනාවාසවල ජීවත් වන ප්‍රජාවගේ මානව සංවර්ධනය සාරපූර්ණ කරනු වස් ක්‍රියාත්මක වන වැඩසටහනකි. නාගරික ජනාවාසයන්හි ජීවත් වන සියලු ප්‍රජාව සමාජීය, ආර්ථික, අධ්‍යාත්මික හා සංස්කෘතික මෙන්ම සෑම අංශයකින් ම සාධනීය තලයකට ගෙන එමින් ඔවුන් රටේ සංවර්ධන ක්‍රියාවලිය තුළ සක්‍රීය පුද්ගලයන් බවට පත්කරලීම මෙම වැඩසටහනේ අරමුණ යි.

අඩු පහසුකම් සහිත නාගරික ප්‍රජාව සුභවාදීව දකිමින් එම ජනාවාසයන්හි ජීවත් වන දූදරුවන්, යෞවන යෞවනියන්, වැඩිහිටියන්ගේ සංවර්ධනය උදෙසා සිදු කරනු ලබන වැඩසටහන් තුළින් එම ප්‍රජාවගේ පමණක් නොව සමස්ත සමාජය තුළ ම ආකල්පමය වෙනසක් ඇතිකරලීමට සමත්කම් දක්වා ඇති බව පැහැදිලිය.

මෙම ජනතාව කෙරෙහි වඩාත් සංවේදී වෙමින් ඔවුන්ගේ අවශ්‍යතා හා හැකියාවන් හඳුනාගනිමින්, හැකියාවන් තුළින් ජයගැනීමේ මාවත පැහැදිලි කරලීම තුළ නාගරික අඩු පහසුකම් ප්‍රජාව මෙන්ම ඉන් පරිබාහිරව ද පවුල් විශාල සංඛ්‍යාවක් 'ස්වශක්ති' මානව සංවර්ධන වැඩසටහනේ සක්‍රීය කොටස්කරුවන් බවට පත්ව ඇත.

ඒ නාගරික සංවර්ථන අධිකාරිය මඟින් අප ආයතනය මඟින් ඌන පහසුකම් සහිත නාගරික ප්‍රජාවගෙ දිගුකාලීන සමාජීය, සංස්කෘතික හා ආර්ථික ගැටලු සඳහා විසඳුමක් ලෙස විවිධ වූ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

**සංවර්ධන වැඩසටහන්**

කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්, ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ව්‍යවසායකයින් උදෙසා ණය වැඩසටහන්, සමාජීය හා සංස්කෘතික වැඩසටහන්, ජනාවාස කමිටු සහ කණ්ඩායම් වශයෙන් ජනතාව සංවිධානගත කිරීම, ප්‍රජා සහභාගීත්ව භෞතික හා පාරිසරික වැඩසටහන් ඒ අතර ප්‍රධාන වේ.

ඌන පහසුකම් සහිත නාගරික ජනාවාසයන්හි ජීවත් වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ඉහත සඳහන් කළ වැඩසටහන් සියල්ලම සිවුවැදෑරුම් වැඩසටහන් ඔස්සේ මේ වන විට සාර්ථකව සිදු කරමින් පවතී.

පසුගිය 2011 සිට 2019 දක්වා වූ කාලය තුළ මෙම මානව සංවර්ධන වැඩසටහන හරහා දරිද්‍රතාව තුරන් කිරීම, සමාජ ඒකාබද්ධතාව සඵල කරගැනීම වස් ප්‍රජා දායකත්වය ඉහළ නැංවීම ප්‍රවර්ධනය කිරීම තුළින් පවුල් ඒකක 60,000 කගේ පමණ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට අවශ්‍ය දායකත්වය ලබාදී තිබේ. මෙලෙස ක්‍රියාත්මක සිවුවැදෑරුම් වැඩසටහන් ලෙස,

**ප්‍රජා සවිය**
**දැන සවිය**
**නිපුණ සවිය**
**දැය සවිය**
හඳුන්වා දිය හැකිය.

මෙම වැඩසටහන් ක්‍රියාවට නැංවීමේදී ගරු නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා මැතිතුමාගේ මඟපෙන්වීමෙන් හා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සභාපති, රාජා ඒ. එදිරිසූරිය මහතාගේ හා අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාමික මේජර් ජෙනරාල් උදය නානායක්කාර මහතාගේ මූලිකත්වයෙන් සිදු කෙරිණි.

2021 වර්ෂයේ සිට නාගරික ජනාවාස සංවර්ධන අධිකරියේ මෙහෙවර දීපව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන අතර ශ්‍රී ලංකාවේ සෑම නාගරික බල ප්‍රදේශයකම ඇති නිවාස අවශ්‍යතාව හා ඒ හා සබැඳි සාමාජීය ගැටලු හඳුනාගෙන ඒ සඳහා අති ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය ප්‍රකාරව ඵලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක්, ගුණගරුක, විනයගරුක, සාධාරණ සමාජයක් හා සෞභාග්‍යමත් දේශයක් යන චතුර්විධ අරමුණු ජයගැනීම උදෙසා දස ප්‍රතිපදාවන් ඔස්සේ නාගරික ප්‍රජාවගේ ආත්මාභිමානය වර්ධනය කිරීම, ධනාත්මක ආකල්ප මඟින් ජීවිතය ජයගැනීමට අවශ්‍ය මූලික හරපද්ධතීන් සමාජගත කිරීමට අවශ්‍ය වැඩසටහන් පෙළගස්වා ඇත.

**පැතුම් සෙනෙවිරත්න, ජේ.රසුන් අනුෂ්ක, චමිලා නිරෝෂනී දිසානායක, සංගීතා සුදේශනී,**





# කොවිඩයට එරෙහි සටන පවුලින් අරඹමු

කොවිඩ් 19 හෙවත් නව කොරෝනා වයිරසය අද ලෝකයම තම අතට නතු කරවමින් තම හිතුමතේට ලොවම ක්‍රියා කරවන්නේ සිහිනෙකින්වත් නොසිතූ ආකාරයටය. ජාතියක් හෝ ආගමක් හෝ කිසිදු පැලැන්තියක් නොසලකා දුටු දුටුවන්ට පහරදෙමින් මරණයේ නාදය නාදකරවමින් ජීවිතය පිළිබඳ අනියත බියක් සෑම සිත් තුළ එක්කර ඇත.සතුන් අතර බහුලව දක්නට ඇති මෙම වයිරසය මිනිසුන් හා සතුන් අතර ඇති සම්බන්ධතාවය හේතුවෙන් වයිරසය මිනිසාට සම්ප්‍රේෂණය වීමෙන් පැතිරුණු වසංගතයක් බව ඇතමුනිගේ අදහසයි.ඇතැම්විට මූලික රෝග ලක්ෂණ මතුකරමින්ද, විටෙක නව ලක්ෂණ එක්කරමින්ද තවත් විටෙක කිසිදු ලක්ෂණයක්වත් නොපෙන්වමින්ද හරි අපූරු ආකාරයකට මිනිස් ජීවිත ගොදුර බවට පත්කොට ඇත.

චීනයේ වූහාන් නගරයෙන් ආරම්භ වූ කොරෝනා පළමු ආසාදිතයා වාර්තා වූයේ 2019 දෙසැම්බර් 8 වන දිනයේදී ය. 2020 මාර්තු මස 13 වන දින ලෝක සෞඛ්‍ය සංවිධානය එය වසංගතයක් ලෙස ප්‍රකාශයට පත්කෙරිණි. ලංකාවද අද කොවිඩයේ ගොදුර බවට පත්වී හමාරය. අප ලක්බිමේ තරමක් දුරට කොවිඩය සාර්ථකව පාලනය කර ඇතත් කොවිඩයේ සැබෑ අවදානම් ස්වරූපය තවමත් පහව ගොස් නැත.නිසි එන්නතක් හෝ නිසි ප්‍රතිකාරයක් තවමත් නොමැති කොවිඩය ලොවටම මරණීය තර්ජනයකි. එබැවින් නැවතත් කොවිඩ් රැල්ලක් ඇති නොවී වසංගතය තුරන්කිරීමට නම් පවුලක් තුළින් කොවිඩයට එරෙහිව මූලික සටන අරඹමු.

නිවෙසට වී සිටීමට අධික විවේක කාලයක් හිමි වී ඇති මෙවන් වූ මෙහොතක ඵලදායී ලෙස කොවිඩයට එරෙහිව ක්‍රියාකරවීමට වගබලා ගත යුතු ය. කොවිඩයට එරෙහිව ගෙන යන ජාතික වැඩ පිළිවෙතට මෙන්ම සෞඛ්‍ය අංශ උපදෙස්වලට අනුකූලව පවුල ප්‍රථමයෙන්ම හැඩගස්වාගත යුතුය. උදාහරණයක් වශයෙන් ගත් කල ,නිතරම සබන් යොදා දෑත් සේදීම වැනි පිරිසිදුකම රැකීමේ ක්‍රමයන් මඟින් කොරෝනා වැළදීමේ අවදානම පාලනය කළ හැකි බව සෞඛ්‍ය අංශ නිතර උපදෙස් දෙන අතර පවුල තුළින් මෙය දෛනික පුරුද්දක් බවට පත්කරගත් විට එය සැබැවින්ම සැබෑ යහපුරුද්දක් බවට පත්වනු බව නොඅනුමානය. පවුලින් අනුගත වන සෑම ක්‍රියාවක්ම පුද්ගලයාට දැඩි සේ බලපාන අතර වසංගත උවදුරෙන් වසන්තය කරා පියමන් කිරීමට මෙවන් වූ යහපුරුදු කරා පවුලින් අනුග්‍රහය සැපයිය යුතු ය. පවුලින් අරඹන මූලික පුහුණුව තුළින් මමත්, ඔබත් , පවුලත් මෙන්ම රටත් ,ලොවත් ආරක්ෂා කරගත හැකිය. "නිවෙසේ රැඳී සිටින්න - ආරක්ෂා වන්න." මෙලෙස දැඩි ලෙස පවසමින් නිවසින් බැහැරව මහජනයා අධිකව ගැවසෙන ස්ථාන කරා පිය මැනීම අනතුරුදායක බව සෞඛ්‍ය අංශ නිතර උපදෙස් ලබාදෙන අතර ඇතැමුන් එය නොසලකා හරින්නේ වීරකමක් ලෙස සලකමිනි. නමුත් එය වීරකම ප්‍රදර්ශනය කිරීමක් නොව සැබවින්ම එය මෝඩකම ප්‍රදර්ශනය කිරීමකි. රෝගයේ බරපතළ ස්වභාවය දැනගෙන කටයුතු කිරීම මනා වැදගත් වේ. දුරස්ථභාවය රැකීම,මහජනයා ඒකරාශී වීම වැලැක්වීමේ අරමුණින් මෙවන්වූ පුද්ගල යහපත තකා පැනෙව්වද එය සිතාමතා කඩකිරීම තමන්වත් , තමා තුළින් අනුන්වත් කොවිඩයේ ගොදුරක් බවට පත්කිරීම යටතේ දැඩි දඬුවම් ලැබිය හැකි වරදකි. එසේම යම් අවශතා පවතිනිනේ නම් මාර්ගත ක්‍රමයන් ඔස්සේ ඒ අවශ්‍ය මිලදී ගැනීම් සපයා ගත හැකිය. නිවසින් බැහැරව යන්නේ නම් ලබාදී ඇති ඒ සියලු උපදෙස් අනුකූලව පවත්වාගැනීමට වග බලා ගත යුතුය. පවුලක් තුළින් අරඹන කොවිඩ් සටන පවුල් රාශියක් තුළින් සමාජය කරාත් ඒ තුළින් රටත් , ලොවත් ජයගත හැකිය.

එමෙන්ම කොවිඩයේ ගොදුර බවට පහසුවෙන් පත්වන්නේ දුම්පානය කරන්නන්, මහලු අය, කුඩා දරුවන් මෙන්ම අධි රුධිර පීඩනය ,දියවැඩියාව වැනි නොයෙකුත් කාණ්ඩයේ පුද්ගලයන් ලෙස සෞඛ්‍ය අංශ අනාවරණය කර ඇත. එබැවින් ඉහළ අවදානමක් ඇති මොවුන්ව නිසි පෙලඹවීමක් යටතේ නිසි උපදෙස් අනුකූලව ක්‍රියාකරවීම පවුලක් තුළින් ඉටු විය යුතු යුතුකමකි. එමෙන්ම පවුලේ යම් සාමාජිකයකුට යම් අසාත්මික ලක්ෂණයක් මතු වූවානම් හෝ සැකයක් මතු වූවානම් නිවෙසේ හුදෙකලා වී සෞඛ්‍ය අංශ ලබා දී ඇති නිසි පිළිවෙත් , උපදෙස් අනුකූලව ක්‍රියා කළ යුතුය. මෙලෙස පවුල තුළින් කොවිඩයට එරෙහි සටන අරඹමු.

එමෙන්ම මෙතෙක් සාර්ථකව ලොවෙහි කොවිඩ් පාලනය කළ රටවල් අතරට අප මව්රට ද එක්වීම මහත් භාග්‍යකි. ඒ සඳහා දිවා රෑ නොබලා අපගේ සෞඛ්‍ය අංශ , ආරක්ෂක අංශ මෙන්ම පරිපාලන අංශයන් කළ අසීමිත කැපවීම් අප සැමට නොරහසකි. එබැවින් ඔවුන්ගේ ඒ කැපවීමේ මහන්සිය වෙනුවෙන් අපි අපේ යුතුකම ඉටුකරමු.ආත්මාර්ථකාමී නොවී පරාර්ථකාමී දෑසින් පවුලින් ලොව දකිමු. කොවිඩයට එරෙහි සටන පවුලින් අරඹමු.

**දැනුවත් වෙමු - දැනුවත් කරමු.**
**පවුලින් කොවිඩයට එරෙහි සටන අරඹමු.**
**රට රැකගනිමු - හෙට ලොව ජයගනිමු.**

**එම්. එච්. එෆ්. හංසා**
**කැලණිය විශ්වවිද්‍යාලය**

| ලොතරැයිය | දිනය | දිනුම් වාරය | අංක | අමතර |
|---|---|---|---|---|
| ගොවිසෙත | 2020 - 10 - 04 | දිනුම් වාරය - 2560 | 23 29 30 78 | අක්ෂරය M |
| සුපිරි වාසනා | 2020 - 09 - 21 | දිනුම් වාරය - 1537 | 01 33 37 57 | සුපිරි අංකය -01 |
| ලග්න වාසනාව | 2020 - 09 - 08 | දිනුම් වාරය - 2916 | 21 37 45 59 | ලග්නය-මිතුන විශේෂිත අංක රු 500 ත්‍යාග සඳහා-9609 |
| කෝටිපති කප්රුක | 2020 - 09 - 27 | දිනුම් වාරය - 630 | 11 21 45 64 | ඉංග්‍රීසි අක්ෂරය- E |
| සංවර්ධන වාසනාව | 2020 - 07 - 31 | දිනුම් වාරය - 354 | 22 23 40 | දෛව අංකය - 02 අක්ෂරය- L |
| ජයෝදා | 2020 - 09- 09 | දිනුම් වාරය - 1688 | 07 31 35 43 | අක්ෂරය-A |
| ශනිදා වාසනාව | 2020 - 09 - 09 | දිනුම් වාරය - 3366 | 31 34 60 64 | අක්ෂරය - D |
| සුපර් බෝල් | 2020 - 09- 27 | දිනුම් වාරය - 1228 | 11 27 35 42 | අක්ෂරය - Q විශේෂ අංකය -5767 |
| ජාතික සම්පත | 2020 - 09-30 | දිනුම් වාරය - 1059 | 0 0 2 7 9 6 | අක්ෂරය -H |
| අද කෝටිපති | 2020 - 09 - 09 | දිනුම් වාරය - 1036 | 07 12 39 48 | අක්ෂරය - K රු 500 ත්‍යාග සඳහා-2169 |
| වාසනා සම්පත | 2020 - 09 - 28 | දිනුම් වාරය - 1617 | 37 46 48 58 | අක්ෂරය - G |
| දරු දිරි සම්පත | 2020 - 07 - 30 | දිනුම් වාරය - 013 | 04 12 33 63 | අක්ෂරය - U |

# නොර්වුඩ් වත්තක සැඟව සිටි බ්‍රැන්ඩික්ස් සේවකයන් 2ක් දැලේ

**හැටන් මධ්‍යම විශේෂ**

ගම්පහා මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවය කර නොර්වුඩ් ඉන්ජස්ට්‍රි වතුයායට පැමිණ සැඟව සිටි දෙදෙනකු අත්අඩංගුට ගෙන නිරෝධායනය සඳහා යුඳ හමුදාවට භාර දීමට පියවර ගෙන ඇති අතර, එම දෙදෙනාට එරෙහිව නඩු පැවරීමට ද නොර්වුඩ් පොලීසිය පියවර ගෙන ඇත.

මේ පිලිබදව කරන ලද විමසීමකදී අදහස් දැක්වූ හැටන් ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරි විජිතද අල්විස් මහතා පවසන ලද්දේ කොවිඩ් 19 වසංගතය ඉස්මතුවූ මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවය කල කාන්තාවක් හා පිරිමි පුද්ගලයකු නොර්වුඩ් ඉන්ජස්ට්‍රි වතුයායට පැමින සැගව සිටියදි නොර්වුඩ් පොලිසිය මගින් අත් අඩංගුවට ගෙන ඇති බවත්ය. මෙසේ අත් අඩංගුවට ගන්නා ලද එම දෙදෙනා යුධ හමුදාවට බාර දිමෙන් පසු යුධ හමුදාව මගින් ඔවුන් රන්ටැබේ නිරෝධාන මධ්‍යස්ථානය වෙත රැගෙන යාමට කටයුතු කෙරිණි

# 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය හෙට මධ්‍යස්ථාන 2936කදී


**සිතාරා සේනානි**

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය රට පුරා විභාග මධ්‍යස්ථාන 2936 කදී හෙට (11) පැවැත්වේ.

මෙවර විභාගය සඳහා අයැදුම්කරුවෝ 331,694 දෙනෙක් පෙනී සිටිති.

මෙදින පෙරවරු 9.00 වනවිට විභාග අපේක්ෂකයන් විභාග ශාලාවල අසුන්ගැන්විය යුතු අතර, කොවිඩ් 19 වෛරසයේ ව්‍යාප්ති තත්ත්වය හේතුවෙන් විභාග මධ්‍යස්ථානවල සෞඛ්‍යා රක්ෂිත ක්‍රමවේද ක්‍රියාත්මක වන බැවින් පෙරවරු 8.45 වනවිට විභාග අපේක්ෂකයන් විභාග මධ්‍යස්ථානයට පැමිණිය යුතු බව විභාග දෙපාර් තමේන්තුව සඳහන් කරයි.

# ප්‍රසිද්ධ ව්‍යාපාරික ජී.එස්. විද්‍යාරත්නගේ අවසන් කටයුතු අද



බත්තරමුල්ල කන්දවත්ත පාරේ අංක 43 නිවසේ විසූ ප්‍රසිද්ධ ව්‍යාපාරික ජී.එස්. විද්‍යාරත්න මහතා අවුරුදු 99 ක් ආයු වළඳ අභාවප්‍රාප්ත විය.

නැසී ගිය එන්.එල්.ජී. විද්‍යාරත්න මහත්මියගේ දයාබර ස්වාමි පුරුෂයා වූ ජී.එස්. විද්‍යාරත්න මහතා සය දරු පියෙකි.

දේහය පිළිබඳ අවසන් කටයුතු අද (10) සවස 5ට බත්තරමුල්ල පොදු සුසාන භූමියේදී සිදුකෙරෙන අතර අවසාන ගෞරව දැක්වීම සඳහා දේහය බත්තරමුල්ල කන්දවත්ත පාරේ අංක 43 දරණ ඔහුගේ නිවසේ තැන්පත් කර ඇත.

## 1 පිටුවෙන් ...

### ඇඳිරි නීතිය...

මීට අමතරව ජංගම අලෙවි රථ යොදා ගනිමින් ගමින් ගමට ගොස් අවශ්‍ය එදිනෙදා පරිභෝජන භාණ්ඩ ලබා දෙන ලෙසත් නිලධාරීන්ගෙන් ඉල්ලා සිටින බන්දුල ගුණවර්ධන ඇමැතිවරයා රෝගීන්ට අවශ්‍ය ඖෂධ ලබාදීම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මගින් ලබා දෙන ඉල්ලා ඇත. තවද ධීවර සංස්ථාව, මිල්කෝ ආයතනය,පශු සම්පත් මණ්ඩලය, තැපැල් ආදී රාජ්‍ය ආයතන මහජනතාවට අවශ්‍ය භාණ්ඩ ලබා දීමට කටයුතු කරන ලෙසත් අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත.

මේ සේවා සැපයීම වෙනුවෙන් පෙරේදා (08) පැවැති සාකච්ඡාවට සමුපකාර සේවා,අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න ,ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නලීන් ප්‍රනාන්දු මහත්වරු ඇතුළු නිලධාරීහු පිරිසක් සහභාගි වූහ.

### රජයේ මුදල් ...

ලක්ෂමන් කදිරගාමර් ආයතනයේ බරපතළ මූල්‍ය අවභාවිතාවක් සිදුවන බවට විදේශ ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතාට ලැබුණු තොරතුරු අනුව ඒ පිළිබඳ පූර්ණ විගණනයක් කරන ලෙස ඇමැතිවරයා පසුගිය ජූලි 8 වැනි දා අභ්‍යන්තර විගණන ප්‍රධානියාට උපදෙස් දී තිබෙන අතර ඒ අනුව සිදු කරන ලද විගණනයට අනුව ලක්ෂමන් කදිරගාමර් ආයතනය රජයේ මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ නොසලකා රුපියල් මිලියන ගණනක රජයේ මුදල් අවභාවිතා කැර ඇති බවට කරුණු අනාවරණය කැර ගෙන ඇත.

මෙම සිද්ධීන්ට සම්බන්ධ ලක්ෂමන් කදිරගාමර් ආයතනයේ සියලුම නිලධාරින්ට එරෙහිව විනයානුකූල හා නිත්‍යානුකූල පියවර ගැනිමට ද ඇමැතිවරයා අදාළ නිලධාරින්ට උපදෙස් දී තිබේ.

## 1 පිටුවෙන් ...

### කිංග්ස්බරි බෝම්බකරුගේ ...

ගත කරන ලෙස කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඊයේ (9) නියෝග කළේය.

මාස 18 තිස්සේ රඳවා ප්‍රශ්න කළ සැකකාරියගේ රැඳවුම් කාලය අවසන් බවත් සැකකාරිය පාස්කු ප්‍රහාරයට සෘජුවම සම්බන්ධ වී ඇති බව රහස් පොලීසිය සැකකාරිය අධිකරණයට ඉදිරිපත් කරමින් කියා සිටියේය.

කිංග්ස්බරි හෝටලය ඇතුළු හෝටල් වලට සහ කතෝලික පල්ලිවලට ප්‍රහාර එල්ල කිරීම සැකකාරිය ආවේක්ෂණ සිදු කර ඇති බවත්, මාවනැල්ල බුදු පිළිම හානි කිරීමේ සිද්ධියේ සාක්ෂිකරුවකු වූ තසිලිම් යන අයට වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් පැහැදිලි දැනීමක් තිබී ඇති බවත් රහස් පොලීසිය අධිකරණයට දන්වා සිටියේය.

එමෙන්ම සැකකාරිය සතුව තිබී රුපියල් විසිහතර ලක්ෂ තිස් හත් දහසක මුදලක් පොලිස් භාරයට ගත් බවත්, එම මුදල් ෂැංග්‍රිලා හෝටලයේ දෙවන බෝම්බකරු වන ඉල්හාම් අහමඩ් සැකකාරියට ලබා දී ඇති බවත් සැකකරන බවත් පොලීසිය අධිකරණයට දැන්වීය.

එමෙන්ම සැකකාරිය සතුව තිබී ජංගම දුරකථන තුනක් අත්අඩංගුවට ගත් බව කියා සිටි රහස් පොලිසිය ඒවා රජයේ සැකකටයුතු ලේඛන පරීක්ෂා කිරීමේ ලේකම් වරයාට යොමු කළ බවත් කියා සිටියේය.

සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශන සිදු කර ලබන 14 වනදා අධිකරණයට කරුණු වාර්තා කරන ලෙස මහේස්ත්‍රාත්වරයා රහස් පොලිසියට නියෝග කළේය.

### ශ්‍රී ලංකා යුද්ධ ...

එදා මෙදා තුර යුද්ධ හමුදාපතිවරු 23 දෙනකු මෙම ධුරය හොබවා ඇති අතර 23වැනි යුදහමුදාපතිවරයා වන්නේ ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතායි. ඔහු ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානිය ලෙසද කටයුතු කැර ඇත.

ගෙවුණ වසර 71 පුරාවට මෙරට ජාතික ආරක්ෂාව වෙනුවෙන් යුද්ධ හමුදාව සුවිශේෂී කාර්යභාර්යක් ඉටුකර ඇත. විශේෂයෙන්ම තිස්වසරක් පුරා පැවැති කොටි ත්‍රස්තවාදි උවදුරින් මේ රට බේරා ගැනීමේ සටනේදි යුද හමුදාවට පැවැරි තිබුණේ අතිශය දුෂ්කර වු කාර්යභාර්යකි.

ඒ අභියෝගයට නොබියව මුහුණ දුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ජීවිත පරිත්‍යාගයෙන් මව්බිම ත්‍රස්තවාදයෙන් මුදාගත්තේ විශ්වයම විස්මයට පත් කරමිනි. එසේම ස්වභාවික විපත්වලදීද මේ රටේ ජනතාවගේ ජීවිත හා දේපොළ ආරක්ෂා කිරීමට යුද්ධ හමුදාව කරනු ලබන මෙහෙවර ද අති විශාලය.

71වැනි සංවත්සර සැමරුම වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සර්ව ආගමික වතාවත්වලට මුල් තැන දෙමින් සමස්ත යුද හමුදාවටත් ලක්වැසි සැමටත් ආශිර්වාද ප්‍රාර්ථනා කරමින් අනුරාධපුර ජයශ්‍රී මහා බෝ සමිඳුන් අබියස සහ මහනුවර ශ්‍රී දළදා සමිඳුන් අභියසද විශේෂ ආශිර්වාද පිංකම් රැසක් පසුගියදා සිදු කෙරිණි.

කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් රටත් ජනතාවත් බේරා ගැනීම සඳහා ද දිවාරාත්‍රී සෞඛ්‍ය අංශ සමඟ එක්ව යුද හමුදාව කරනු ලබන කැප කිරීම සමස්ත ජාතියේම ගෞරවාදරයට ලක්වී ඇත. මේවනවිට යුද හමුදාවට අයත් රෙජිමේන්තු ගණන විසිහතරකි. 71වැනි සංවත්සරය වෙනුවෙන් අද දින විශේෂ සැමරුම් උත්සවයක් පැවැත්වීමට කටයුතු යොදා තිබුණද රටේ පවතින කොවිඩ්- 19 වසංගත තත්ත්වය හේතුවෙන් එම සැමරුම නොපැවැත්වීමට යුද හමුදාව කටයුතු යොදා ඇත.

### කොළඹ ළමා රෝහලට ගෙනා...

කොවිඩ් - 19 ට අදාළ රෝග ලක්ෂණ හේතුවෙන් දරුවා ඇතුළත් කළ අවස්ථාවේ සිටම වෙනත් දරුවන්ගෙන් වෙන් කර ප්‍රතිකාර ලබාදීමට රෝහලේ කාර්ය මණ්ඩලය දක්ෂ වී ඇති බවත් පසුව සිදු කළ පී.සී.ආර්. පරීක්ෂණයකින් දරුවාට වෛරසය වැළඳී ඇති බවට හඳුනා ගත් බවත් රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය ජී. විජේසූරිය මහතා 'දිනමිණ'ට ඊයේ (09) පැවැසුවේය.

රෝහලෙන් ප්‍රතිකාර ලබමින් සිටින මහනුවර ලිපිනය සහිත මාස පහක් වයසැති බිළිඳියකගේ පියාට ද වෛරසය ආසාදනය වී ඇති බවත් පියාට ආසාදනය වීම නිසා දරුවාටත්, මවටත් පී.සී.ආර්. පරීක්ෂණ සිදු කළ ද ඔවුන් ආසාදිතයින් ලෙස වාර්තා නොවූ බවත් ඒ මහතා කීය.

මෙම දරුවා පසුගිය අගෝස්තු මාසයේ සිට මාස දෙකක් වැනි කාලයක් රෝහල්ගතව ප්‍රතිකාර ලබමින් සිටින නිසා දරුවාගේ මව්පියන් කොටිකාවත්ත ප්‍රදේශයේ නතර වී දරුවාගේ ප්‍රතිකාර කටයුතු සිදු කරන බවත් දරුවාගේ පියාට වෛරසය ආසාදනය වී ඇති නිසා වාට්ටුවේ කාර්ය මණ්ඩලය පී.සී.ආර්. පරීක්ෂාවට යොමු කර ඇති බවත් ඔහු ප්‍රකාශ කෙළේය.

කොළඹ ජාතික රෝහලට ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණි පුද්ගලයකුට කොවිඩ් - 19 වෛරසය වැළඳී ඇත්දැයි තහවුරු කැර ගැනීම සඳහා අදාළ පුද්ගලයා ඊයේ (09) පී.සී.ආර්. පරීක්ෂාවට ලක් කළ ද, ඔහු ආසාදිතයෙකු බවට මෙතෙක් තහවුරු නොවූ බව රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය කුමාර වික්‍රමසිංහ මහතා ඊයේ (9) ප්‍රකාශ කෙළේය.

කාසල් වීදියේ කාන්තා රෝහල, කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහල, ගම්පහ, හොරණ යනාදි රෝහල්වලින් ආසාදිතයින් හඳුනාගත් බවට මේ වන විට වාර්තා ලැබෙමින් පවතින බව සෞඛ්‍ය අංශ සඳහන් කරයි.

### හිටපු ඇමැති රාජිත ...

ඇමැතිවරයාගේ බිරිය වූ සුජාතා සේනාරත්න මහත්මියට සම්බන්ධීකරණ නිලධාරි තනතුරක්, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීනි හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මියට නීති සහකාර තනතුරක්, කළුතර නගර සභා හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට රුපියල් පහළොස්දහසක මාසික වැටුපක් හා කළුතර ප්‍රදේශයේ පුද්ගලයින් රැසකට සම්බන්ධීකරණ හා උපදේශක තනතුරු දෙමින් මෙම මුදල් වැය කිරීම් කළ බව හෙතෙම හෙළි කළේය.

ධීවර වරාය නීතිගත සංස්ථාවේ රැකියා අත්තනෝමතිකව හා හිතුමනාපයේ දීම හේතුවෙන් එම පිරිසට වැටුප් හා වේතන ගෙවීමට මාසිකව රුපියල් මිලියන 40 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ගත් බව ද පැවසීය.

හිටපු ඇමැතිවරයාගේ හිතවතෙකු ධීවර වරාය සංස්ථාවේ කළමනාකරණ අධ්‍යක්ෂ තනතුරකට පත් කරමින් ඔහුට වැටුපට අමතරව රුපියල් තිස්දහසක මුදල් ගෙවීමට නියෝග කළ බව ද පැවසීය.

පසුගිය මැතිවරණයට තරග කළ ඡන්ද අපේක්ෂකයකු මෙම පත්වීම්ලාභීන් අතර සිටි බව පැවසීය.

හිටපු ඇමැතිවරයා දේශපාලන බලපුළුවන්කාරකම් පෙන්වමින් සිය හිතවත් සමාගම්වලට සංස්ථා දේපොළ දීමට දන්වා සිටි බව ද, ඒ අනුව රජරට ට්‍රේඩින් නමැති සමාගමට පානදුර ධීවර වරායෙන් වැලි කියුබ් දසදහසක් දීමට නියෝග කළ බව ද කීවේය.

මාධ්‍ය හිමිකරු කොම්පැණියකට ත්‍රිකුණාමල ධීවර වරාය අංගණය බදු දෙන්න ක්‍රියා කළ හිටපු ඇමැතිවරයා ඔහුගේ වචනයට අවනත නොවන පුද්ගලයින් සේවයෙන් දොට්ට දැමීමට ක්‍රියා කළ බව ද පැවසීය.

නීතිඥ තුසිත මහතා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දුන් උපාලි ලියනගේ මහතා මෙසේ ද පැවසීය.

හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මියට ධීවර වරාය නීතිගත සංස්ථාවේ නීති සහකාර තනතුරක් දෙන්න කියලා ඇමැතිවරයා සඳහන් කැර තිබුණා. එවැනි තනතුරක් දෙන්න හිරුණිකා මහත්මියට සුදුසුකම් නොතිබූ නිසා රුපියල් 20,000 ක රැකියාවක් දෙන්න පුළුවන් කියලා කිව්වා. ඉතිරි රුපියල් 25,000 රාජිත ඇමැතිතුමාගෙන් ගන්නම් කියලා හිරුණිකා කිව්වා.

මේ වන විට සුජාතා සේනාරත්න මහත්මිය විශ්‍රාමිකව සිටියා. එතුමියට රුපියල් හැටපන්දහසක වැටුපක් සහිතව සම්බන්ධීකරණ තනතුරක් දුන්නා.

ප්‍රාදේශීය සභා හා නගර සභා මන්ත්‍රීවරුන්ට රුපියල් 15,000 ක් ගෙවන්න කිව්වා.

මේ මුදල් ගෙවන්න සංස්ථාවට ආදායම් තිබුණේ නැහැ. ඒ අනුව රුපියල් මිලියන 40 ක් පී. බී. ජයසුන්දර මහතාගෙන් ගන්න සිදු වුණා.

මේ අත්තනෝමතික ක්‍රියා ගැන මම මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට කිව්වා. රාජිත ඇමැතිතුමාගේ ක්‍රියාවලට මම එරෙහි වූ නිසා ඔහු දේශපාලනික වශයෙන් මගෙන් පළි ගන්න කටයුතු කළා. මීගමුව වෙරළ සංරක්ෂණ ක්‍රියාවලිය එතුමාගේ සංකල්පයක් අනුව ක්‍රියාත්මක වුණා. එහෙත් මට විරුද්ධව නඩු පැවරුවා.

වැඩිදුර සාක්ෂි විභාගය ලබන 17 වැනි දිනට නියම කෙරිණි.

### මිනුවන්ගොඩ පොකුරේ...

මෙම පොකුරට අදාළව රට පුරා පුද්ගලයින් 8000 ක් පමණ ස්වයං නිරෝධායනයට ලක් කැර ඇති බවත් ඉන් 6000 ක පිරිස ගම්පහ ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අතර එම 6000 ක පිරිසගෙන් 1300 ක් පමණ දිවුලපිටිය ඥාණවිමල විද්‍යාලයේ කොවිඩ් ආසාදිත දරුවාගේ ආශ්‍රිතයින් බවත් ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ ලේකම් එම්. බාලසූරිය මහතා 'දිනමිණ'ට ඊයේ (09) පැවැසුවේය.

ස්වයං නිරෝධායනයට ලක් කEර ඇති ඉතිරි 2000 ක පමණ පිරිස කොළඹ, කළුතර, ගාල්ල, මාතර, මාතලේ, අනුරාධපුරය, යාපනය, කුරුණෑගල, පුත්තලම, බදුල්ල දිස්ත්‍රික්වල පදිංචි පුද්ගලයින් බව ද ඔහු කීය.

මිනුවන්ගොඩ කොවිඩ් පොකුරට අදාළව මේ වන විට පී.සී.ආර්. පරීක්ෂණ 6000 ක් පමණ සිදු කර ඇති බවත් මෙම පරීක්ෂණ කිරීමේදී මේ වන විට රසායනාගාරවල කිසියම් තදබදයක් පවතින බවට වාර්තා වන බවත් ඒ මහතා පැවැසුවේය.

කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පසුගියදා පැවැති පොත් ප්‍රදර්ශනයට පැමිණි පුද්ගලයකුට ද මෙම වෛරසය ආසාදනය වී ඇති බවට වාර්තා වීමත් සමඟ ඔහුගේ ආශ්‍රිතයින් සොයා විමර්ශන සිදු කරමින් පවතින බව සෞඛ්‍ය අංශ සඳහන් කරයි. පසුගිය මාර්තු මාසයේ සිට මේ දක්වා මෙරටින් වාර්තා වන සමස්ත ආසාදිතයින්ගේ සංඛ්‍යාව 4488 ක් බවත් 1179 ක් ඊයේ (09) වන විට රෝහල්ගතව සිටි බවත් වසංගත රෝග විද්‍යා අංශය සඳහන් කරයි.

ආසාදිතයින් 3296 ක් පූර්ණ සුවය ලබා රෝහල්වලින් පිටව ගොස් ඇති බවට ද වාර්තා වේ.

### නිරෝධායන ඇඳිරි නීතිය ...

පෙරේදා (8) දිනයේ පමණක් ඇඳිරිනීතිය කඩකළ පුද්ගලයින් 11 දෙනෙකු අත්අඩංගුවට ගත් බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා සඳහන් කරයි.

නියෝජ්‍ය පොලිස්පතිවරයා පෙන්වා දෙන්නේ මේ පිරිස අත්අඩංගුවට ගැනීමට අමතරව යතුරුපැදි 19ක්, ත්‍රීරෝද රථයක් 3ක් සහ ලොරි රථයක් ලෙස රථවාහන 23ක් පොලිස් භාරයට ගෙන ඇති බවයි.

ගම්පහ දිස්ත්‍රික්කයේ පොලිස් බල ප්‍රදේශ 18කට සහ දිවුලපිටිය, ජාඇල, කඳාන, සීදුව යන පොලිස් බල ප්‍රදේශවලට මේ වනවිට නිරෝධායන ඇඳිරිනීතිය පනවා ඇති අතර එය යළි දැනුම්දෙන තුරු ක්‍රියාත්මක කෙරේ.

ඇඳිරිනීතිය බලපැවැත්වෙන ප්‍රදේශවල අත්‍යවශ්‍ය සේවා සැපයෙන ඇතැම් ආයතන විවෘත කඅර තැබීමට පියවර ගන්නා බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශවරයා පවසයි.

### 'මර්වින් ජනා'ගේ...

මත්ද්‍රව්‍ය ජාවාරමින් උපයාගත් රුපියල් ලක්ෂ 436ක් නුවන් ලක්ෂිත නැමැති 37 හැවිරිදි මේ සැකකරුගේ බැංකු ගිණුමේ සංසරණය වී ඇති බවට මේ වනවිට අනාවරණය කරගෙන තිබෙන බව පොලිස් මාධ්‍ය කොට්ඨාශය පවසයි.

ගල්කිස්ස ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරී රෝහාන් ප්‍රේමරත්න මහතාගේ මෙහෙයවීම මත මේ වැටලීම සිදුකර තිබෙන අතර මේ සැකකරුගේ බැංකු ගිණුමට මුදල් ලැබී ඇත්තේ කාගෙන් ද යන්න පිළිබඳව විමර්ශන ආරම්භ කර තිබේ.

මේ සැකකරු ඊයේ (09) ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

### මෛත්‍රී-ගෝඨාභය...

කියා සිටියේය.

සුවිශේෂී වරප්‍රසාද සහිතව රටේ අර්බුද නිර්මාණය කළ නාමල් කුමාර වැනි අයවලුන් සේම වරප්‍රසාද සහිතව ආණ්ඩුකාරකම් කරමින් ජනාධිපති උපදේශකයන් ලෙස කටයුතු කළ අය සම්බන්ධයෙන් ද තමන් කොමිසම හමුවේ අනාවරණය කිරීමට සූදානම් බවද ඒ මහතා කියා සිටියේය.

නාමල් කුමාර මහනුවර සිද්ධියේ දී තොරතුරු කරුවෙක් ලෙස සම්බන්ධ වු බවත් ඔහුට රුපියල් ලක්ෂ පහක පොලිස් අරමුදලෙන් ත්‍යාග මුදලක් ලබා දුන් බවත් කියා සිටි පූජිත ජයසුන්දර මහතා නාමල් කුමාර ගේ සම්බන්ධය පිටුපස සිටින අය ගැන මෙන්ම දෙහිවල ට්‍රොපිකල් ඉන් හෝටලයේ බෝම්බය පුපුරවා ගත් ජමීල් පුපුරවා ගැනීමට පෙර හමු වූ බුද්ධි නිලධාරියා ගැන ද සොයා බලන මෙන්ද ඒ මහතා කොමිසමෙන් ඉල්ලා සිටියේය.

තමා අප්‍රේල් 14 අලුත් අවුරුදු දා හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ නිවෙසින් වතුර වීදුරුවක්වත් නොබිව් බවත් ඒ මහතාගේ ආරක්ෂාව සම්බන්ධව සිටි අධ්‍යක්ෂ රොහාන් සිල්වා මහතා සමග ගොස් බුලත් දී මිනිත්තු 10න් පමණ පිට වූ බවත් කියා සිටි හිටපු පොලිස්පති වරයා තමාගේ බිරිය බුලත් දීමට යෑම ප්‍රතික්ෂේප කළ නිසා ඇය එහි නොගිය බවත් කියා සිටියේය.

හිටපු ජනාධිපතිවරයා බොරු කියනවා කියල ද ඔබ කියන්නේ යැයි කොමිසම සිදු කළ විමසීමට පිළිතුරු දෙමින් හිටපු පොලිස්පති වරයා කියා සිටියේ

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පුරුද්දක් හැටියට බොරු කියන බවය. හිටපු ජනාධිපතිවරයා මටම බොරු කියලා තිබෙනවා. හිටපු පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා මහතා මාරු කරන්න කියලා මටම කියලා විදේශ ගත වී පැමිණෙන අවස්ථාවේදී කවුද මාරු කරන්න කිව්වේ කියලා ඇහුවම.

ආරක්ෂක මණ්ඩලයේ කිව්වේ හිටපු ජනාධිපති ලේකම් උදය ආර්. සෙනෙවිරත්න මහතාත් මට කිව්වා. එහෙම කියලා මගෙන් අහනවා සජිත් ප්‍රේමදාස මහින්ද අමරවීර මට කතා කරනවා. මොන කෙහෙල්මලක්ද කියලා. මම ලේකම්ට කතා කරලා බල ගන්නම්කො කියලා කිව්වා. පොලිස් අවුරුදු උත්සවය දවසේත් එවැනිම සිද්ධියක් සිදු වුණා. මම විදේශ ගත වන විට ගුවන්යානයට නැග්ගා කියලා සාක්ෂි දෙමින් කොමිසම හමුවේ කිව්වා. ජනාධිපතිතුමා රට යනවිට මම රාජකාරි මට්ටමෙන් සහභාගී වුණා. මම රටේ පොලිස්පති. එතුමා රටේ පළමු පුරවැසියා. යටත් නිලධාරියෙක් විදියට ඒ ගමන ගියා. ගුවන් යානය තුළට ගියේ නෑ ආචාර කපා. මා කෙරෙහි එතුමන්ගේ තිබූ ප්‍රතිචාරය සහ මා දෙස බලන විදිහ මම දන්නවා. තරහකාරයෙක් දෙස බලන විදිහට අප්පිරියාවෙන් මා දෙස හැම අවස්ථාවකදීම බැලුවේ. ඇයි මොකද එහෙමයි ඇහුවේ. ප්‍රහාරය ගැන තොරතුරු කියනවා තියා රාජකාරි වැඩවලදීත් හරිම අඩුවෙන් ආරක්ෂක ලේකම් ජනාධිපති ලේකම් හරහා තමයි හමු වුණේ යැයිද ඒ මහතා කියා සිටියේය.

### වත්මන් ආණ්ඩුව මත්ද්‍රව්‍ය ...

නිලධාරීන් පවා අත්අඩංගුවට ගැනීමට වත්මන් ආණ්ඩුව කටයුතු කර ඇති බවත් ඇමැතිවරයා පැවසීය.

ඇමැති චමල් රාජපක්ෂ මහතා මේ බව සඳහන් කෙළේ පාර්ලිමේන්තු මන්ත්‍රී චමින්ද විජේසිරි මහතා මතුකරන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.

පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාශ පිහිටුවා තමන්ට අභිමත පුද්ගලයින් දඩුවම් කිරීමට පසුගිය ආණ්ඩුව කටයුතු කළත් මෙවැනි ජාවාරම් වලට සම්බන්ධ වූ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ උදවිය හෝ පසුගිය ආණ්ඩුව අත්අඩංගුවට නොගත් බවද ඇමැතිවරයා පැවසීය.

එහිදි වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැති චමල් රාජපක්ෂ මහතා සඳහන් කෙළේ අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරින්ගෙන් 13 දෙනකු රක්ෂිත බන්ධනාගාර කර ඇති අතර හය දෙනකු රැඳවුම් නියෝග යටතේ රඳවා තබා ප්‍රශ්න කිරීම් සිදුකරන බවයි. එමෙන්ම මෙලෙස අත්අඩංගුවට ගත් උදවිය සතුව තිබූ මිලියන දහනවයකට අධික වත්කම් සම්බන්ධයෙන් මුදල් විශුද්ධිකරණය පනත යටතේ කටයුතු කර ඇති බවයි.

මුහුදෙන් මත්කුඩු ප්‍රවාහනය කරන ස්ථාන හඳුනාගෙන ත්‍රිවිධ හමුදාවේ සහාය ඇතිව මහා පරිමාණයෙන් සිදු කරගෙන යන ජාවාරම් නැවැත්වීමට ආණ්ඩුව පියවර ගෙන ඇති බවත්

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා මත් ද්‍රව්‍ය සමාජයට පේන විදියට විනාශ කිරීමේ වැඩපිළිවෙළක් සකස් කරමින් පවතින බවත් නීතිවිරෝධී මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කරන පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සඳහා ජනතාවගේ සහාය ද අවශ්‍ය වන බවත් ඇමැතිවරයා පැවැසුවේය.

මෙතෙක් කාලයක් නීතිවිරෝධී මත්ද්‍රව්‍ය වැටලීම් සිදු කෙළේ නාකොටික් නිලධාරීන් පමණක් වන අතර වැටලීම් සම්බන්ධයෙන් එහිදී ඇතැම් අඩුපාඩු සිදු වූ බවත් ත්‍රිවිධ හමුදාව, සී.අයි.ඩී.ය ද මේ වන විට මේ සම්බන්ධයෙන් කටයුතු කරන නිසා වැටලීම් සම්බන්ධයෙන් පසුගිය කාලයේ සිදු වූ අඩුපාඩු මඟ හරවා ගත හැකි බවත් ඇමැතිවරයා කීය.

රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හේෂා විතානගේ මහතා වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කෙළේ ගංජා අපනයනය සඳහා කිසිවිටෙකත් ඉඩ නොදෙන බවයි.

ශ්‍රී ලංකා පොලීසිය, රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව, බන්ධනාගාරය යනාදී ආයතන එක්ව නීති විරෝධී මත්ද්‍රව්‍ය මර්දනයට කටයුතු කරන බවත් 2015 වසරේ සිට පසුගිය සැප්තැම්බර් 18 වැනිදා දක්වා නීතිවිරෝධී මත්ද්‍රව්‍ය අලෙවිය හා භාවිතය සම්බන්ධයෙන් පුද්ගලයින් 470,206 ක් අත්අඩංගුවට ගත් බවත් ඇමැතිවරයා පැවැසුවේය.

මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වැටලීම් සිදු කරන ආයතන එක්ව 2015 පෙබරවාරි 01 වැනිදා සිට 2020 සැප්තැම්බර් 18 වැනිදා දක්වා කාලය තුළ මත්ද්‍රව්‍ය කිලෝග්රෑම් 46,370 කට අධික ප්‍රමාණයක් සහ මත් පෙති එක්කෝටි පනස් හතර ලක්ෂයකට අධික ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන ඇති බවත් ඇමැතිවරයා පැවැසුවේය.

### සෞඛ්‍ය උපදෙස් ...

එම ලේඛන සසඳා බලනවිට දැනට අඩුවක් නැති නමුත් තවත් කිහිප දෙනෙක් පමණ පැමිණිය යුතුව තිබෙන අතර ඇතැම්විට කොළඹින් පිට සිටින ප්‍රදේශවල පමණක් පොලිස් ස්ථාන වෙත වාර්තා කර තිබෙන බවද දැනට සියලු දෙනාම පැමිණ ඇතැයි ද හෙතෙම විශ්වාසය පළකරයි.

කෙසේ නමුත් කවුරුන් හෝ කෙනෙක් පැමිණ නොමැතිනම් එලෙස නිරෝධායන නියෝගයට අකීකරු වී කටයුතු කරන පුද්ගලයන්ට සහ ඒ අය රඳවා තබාගත් අයට විරුද්ධව නිරෝධායන රීතීන් යටතේ කටයුතු කරන බවද අජිත් රෝහණ මහතා පවසයි.

ඊට අමතරව ඔවුන් සිටි නිශ්චල හෝ චංචල දේපළ නිරෝධායන රීතීන් යටතේ තහනමට ලක්කරන බවද නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා වැඩිදුරටත් කියාසිටී.

### මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු ...

සෙල්වරාජා සහදේවන් නමැති මෙම විත්තිකරු නියමිත නඩු දිනයේදී අධිකරණයට ඉදිරිපත් නොකර එසේ ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් අධිකරණයට කිසිදු කරුණු පැහැදිළි කිරීමක් ද නොකිරීම සම්බන්ධයෙන් අධිකරණය හමුවේ පෞද්ගලිකව පෙනී සිට කරුණු දක්වන ලෙසට කොළඹ මහාධිකරණ විනිසුරු දමිත් තොටවත්ත මහතා බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාට පසුගිය දිනක නොතීසි නිකුත් කැර තිබුණි.

කොවිඩ් වසන්ගත තත්ත්වය සම්බන්ධයෙන් ඊයේ (09) දින පැවැත්වෙන විශේෂ රැස්වීමකට සහභාගිවීමට සිදුවීම හේතුවෙන් එම නොතීසිය සම්බන්ධව තමාට පෞද්ගලිකව අධිකරණය හමුවේ පෙනී සිටීමට නොහැකි වන බවද අධිකරණය වෙත ඉදිරිපක් කළ එම ලිපිය මගින් කොමසාරිස් ජනරාල්වරයා දන්වා සිටියේය.

බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල්වරයා වෙනුවෙන් අධිකරණය හමුවේ පෙනී සිටි නව මැගසින් බන්ධනාගාරයේ අධිකාරිවරයා කොමසාරිස් ජනරාල්වරයාගේ එකී ලිඛිත පොරොන්දුව හා සමාව ඉල්ලන ලද ලිපිය අධිකරණය යෙත භාරදී තිබුණි.

විත්තිකරු අධිකරණය වෙත ඊයේ(9) දින ඉදිරිපත් කිරීමටද බන්ධනාගාර අධිකාරිවරයා පියවර ගෙන තිබුණි.

### අත්‍යවශ්‍ය සේවාවලට...

ඒ අනුව සියලුම ඖෂධහල්, සතොස වෙළෙඳ සල් ඇතුළු සියලුම සුපිරි වෙළෙඳ සල්, සමූපකාර වෙළෙඳ සල්, සියලුම සත්ත්ව නිෂ්පාදන හා බෙදාහැරීම්, සත්ත්ව ආහාර නිෂ්පාදන හා බෙදාහැරීම්, ධීවර සංස්ථාවට අයත් වෙළෙඳ සල් සහ ආහාර පාන නිෂ්පාදනය කරන රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන පවත්වාගෙන යාමට අවසර ලබාදී තිබෙන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය පවසයි.

නිරෝධායන ඇඳිරිනීති කාලය තුළ විවෘතව තැබෙන සතොස ඇතුළු සුපිරි වෙළඳසල් හා සමුපකාර වෙළෙඳසල් වෙත පැමිණෙන සෑම අයෙක්ම මුව ආවරණ පැළඳිය යුතුවන අතර ඊට අමතරව සමාජ දුරස්ථභාවය පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය බවද පොලීසිය සඳහන් කරයි.

ඊට අමතරව ඒ ඒ ආයතනය වෙත පැමිණෙන සෑම අයෙකුගේම ශරීර උෂ්ණත්වය පරීක්ෂා කිරීම, කොරෝනා රෝග ලක්ෂණ පෙන්නුම් කරන අයෙක් පැමිණෙන්නේ නම් ආයතනයට ඇතුළත් නොකර අදාළ බලධාරීන් දැනුවත් කිරීම මෙන්ම දෑත් විෂබීජහරණය කිරීම හා අනෙකුත් සෞඛ්‍ය ආරක්ෂක ක්‍රම අනුගමනය කිරීම ඒ ඒ ආයතනය විසින් කළයුතු බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය කියයි.

කොවිඩ් 19 හෙවත් නව කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය හේතුවෙන් මේ වනවිට ගම්පහ දිස්ත්‍රික්කයට අයත් ගම්පහ, ගනේමුල්ල, කිරිඳිවැල, දොම්පේ, මල්වතුහිරිපිටිය, මීරිගම, නිට්ටඹුව, පූගොඩ, වේයන්ගොඩ, මිනුවන්ගොඩ, වීරගුල, වැලිවේරිය, පල්ලෙවෙල, යක්කල, ජා ඇල, කඳාන, දිවුලපිටිය සහ සීදූව පොලිස් බල ප්‍රදේශ සඳහා නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක වේ.

### ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ...

ජීවන මට්ටම වර්ධනය කිරීමට ඉවහල් වන බවත්, සනාථ කරන්න මට අවශ්‍යයි. ඒ සඳහා අපට උදව් කරන්න, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා චීන දූත පිරිසට මෙහිදී පැවැසීය.

# චීනයට සමාන සංවර්ධනයක් මව්බිමට උදා කිරීම ඉලක්කයයි

## ජනපති



### වෙළෙඳ හිඟය පියව ගන්න සහාය වන්න ජනපති චීන රජයෙන් ඉල්ලයි

### ශ්‍රී ලංකාවේ සංවර්ධනයට දිගටම සහය දෙනවා චීනය ජනපතිට සහතික වෙයි

කොවිඩ් වසංගතයේ ව්‍යාප්තිය හේතුවෙන් රටේ ආර්ථිකය යම්කිසි පසුබෑමකට ලක්ව තිබුණ ද චීනයට සමාන සංවර්ධනයක් මව්බිමට උදා කිරීම තම ඉලක්කය බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අවධාරණය කළේය.

ග්‍රාමීය ජනතාවගේ ජීවන මට්ටම දියුණු කිරීමට පියවර ගන්නා බව කී ඒ මහතා ඉදිරි සිව්වසර ඇතුළත වරාය නගර ව්‍යාපෘතියේ දෘශ්‍යමාන ප්‍රගතියක් දැකීම තම අපේක්ෂා බවද මෙරටට පැමිණ සිටින චීන දූත පිරිස හමුවේ ප්‍රකාශ කළේය.

සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ දේශපාලන මණ්ඩල සාමාජික සහ චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ විදේශ කටයුතු කොමිසමේ කාර්යාල අධ්‍යක්ෂ යැං ජියෙචි මහතා (Yang Jiechi) ප්‍රමුඛ සත් පුද්ගල දූත පිරිස ඊයේ (9) පෙරවරුවේ ජනාධිපති කාර්යාලයේ දී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා හමු වූ අවස්ථාවේදී ජනාධිපතිවරයා මේ බව සඳහන් කළේය.

දිගු කලක සිට චීන විදේශ අමාත්‍යාංශයේ විවිධ තනතුරුවල සේවය කළ යැං ජියෙචි මහතා 2001-2005 කාලයේ අමෙරිකා එක්සත් ජනපදයේ චීන තානාපති ධුරයත්, 2007- 2013 කාලයේ විදේශ අමාත්‍ය ධුරයත් හෙබවීය.

චීන පාලන තන්ත්‍රය තුළ ඒ මහතා උප අගමැතිවරයකු (Vice Premier) හා සමානය. ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රයත්නය සාර්ථක කරගැනීමට අඛණ්ඩව උදව් කරන බවට ශ්‍රී ලංකාවට පැමිණ සිටින චීන මහජන සමූහාණ්ඩුවේ ඉහළ පෙළේ දූත පිරිසේ ප්‍රධානියා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට සහතික විය.

චීන ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික සබඳතා දැනටමත් බෙහෙවින් සතුටුදායක මට්ටමක පවතී. මේ මිත්‍රත්වය පවත්වාගැනීමත්, වර්ධනය කර ගැනීමත් චීන ජනාධිපති ෂී ජිං පින් මහතාගේ ප්‍රමුඛතාවකි.

චීනය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය ඇතුළු අන්තර්ජාතික වේදිකාවල දී ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය, ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාව වෙනුවෙන් නොසැලී පෙනී සිටින බව ද චීන දූත පිරිසේ ප්‍රධානියා පැවසීය.

පසුගිය මහා මැතිවරණයේ දී අත්කරගත් විශිෂ්ට ජයග්‍රහණය පිළිබඳ ෂී ජින් පිං මහතාගේ සුබ පැතුම් ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත පුද කළ යැං මහතා තමා වසර 35කට පෙර භාෂා පරිවර්තකයකු ලෙස චීන දූත පිරිසක් සමඟ ශ්‍රී ලංකාවට පැමිණි බව සිහිපත් කළේය. රටවල් 4ක් ඇතුළත් සිය ආසියානු චාරිකාවේ ප්‍රථම රට ශ්‍රී ලංකාව බව සඳහන් කළ ඒ මහතා චීන ජනාධිපතිවරයා ශ්‍රී ලංකාව සමඟ ද්විපාර්ශ්වික සබඳතා වර්ධනයට ඉහළ ප්‍රමුඛත්වයක් දී ඇතැයි පැවසීය.



### දෙරට අතර සබඳතාවලට ජනපතිවරු දෙපළගේම ප්‍රමුඛතාව

### ශ්‍රී ලංකාව වෙනුවෙන් ජගත් වේදිකාවේ පෙනී සිටිනවා

### වරාය නගර ව්‍යාපෘතිය නිම කිරීම කඩිනමින්

චීන - ශ්‍රී ලංකා සබඳතාවල වත්මන් අවධිය ගැන සතුට පළ කරමින් සංවාදය ආරම්භ කළ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා චීනය බලයේ සිටින ආණ්ඩු ගැන වෙනසක් නැතිව ශ්‍රී ලංකාවට උපකාර කළ දිගුකාලීන මිතුරෙකු යැයි හැඳින්වීය. ත්‍රස්තවාදය පරාජය කිරීමට චීනයෙන් ඉමහත් සහයෝගයක් ලැබුණු බවද සිහිපත් කළේය. යුද්ධය අවසන් වීමෙන් පසු ද්විපාර්ශ්වික සබඳතා තවත් ඉහළ මට්ටමකට ළඟා වූබව කීවේය. රටේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා චීනයෙන් ලැබුණු දායකත්වය ඒ මහතා විශේෂයෙන් සිහිපත් කළේය.

"මහ පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ගණනාවකට චීනය දායක වුණා. හම්බන්තොට වරාය, වරාය නගර ව්‍යාපෘතිය, දක්ෂිණ අධිවේගී මාර්ගය ඉන් කිහිපයක්. හම්බන්තොට වරාය ඉදිකිරීම චීනයේ නොව ශ්‍රී ලංකාවේ අදහසක්. එය ඉහළ ආදායම් සහ රැකියා උත්පාදන විභවතාවක් සහිත ව්‍යාපෘතියක් බව අප තේරුම් ගත්තා. ඊට අරමුදල් සම්පාදනය කිරීමට චීනය ඉදිරිපත් වුණා. බොහෝ භූ දේශපාලන විශ්ලේෂණවල මේ ව්‍යාපෘති අර්ථ කතනය කරන්නේ ශ්‍රී ලංකාව, චීනය ඇටවූ 'ණය උගුලක' සිරවීමක් ලෙසයි. එය එසේ නොවන බවත්, මේ මහා පරිමාණ ව්‍යාපෘති ජනතාවගේ ජීවන මට්ටම වර්ධනය කිරීමට ඉවහල් වන බවත්, සනාථ කරන්න මට අවශ්‍යයයි. ඒ සඳහා අපට උදව් කරන්න යැයි ජනාධිපතිවරයා චීන දූත පිරිසට පැවසීය.

ජනාධිපති ධුරයට පැමිණීමට පෙර 13 වරක් චීනයේ චාරිකා කළ තමාට චීනය අත්කරගෙන ඇති සංවර්ධනය ප්‍රගතිය සියැසින් දැකගැනීමට හැකි විණැයි ජනාධිපතිවරයා කීවේය. විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල විශාල සංවර්ධනයක් මා දුටුවා. මගේ ඉලක්කය ඊට සමාන සංවර්ධනයක් අපේ රටේ ග්‍රාමීය ප්‍රදේශවල ඇති කරන්නයි. එමගින් ග්‍රාමීය ජනතාවගේ ජීවන මට්ටම දියුණු කරනවා .

ඉදිරි සිව්වසර ඇතුළත වරාය නගර ව්‍යාපෘතියේ දෘශ්‍යමාන ප්‍රගතියක් දකින්න මා අපේක්ෂා කරනවා

චීනය සමඟ වෙළෙඳාමේ දී ශ්‍රී ලංකාවේ වෙළෙඳ හිඟය විශාල අගයක් ගන්නා බව පෙන්වා දුන් ජනාධිපතිවරයා එය අඩුකරනු පිණිස ශ්‍රී ලංකාවෙන් මිලදී ගන්නා භාණ්ඩ ප්‍රමාණය වැඩි කරන්නැයි දූත පිරිසේ නායකයාගෙන් ඉල්ලීමක් කළේය. ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය ශක්තිමත්. ඔවුන් විවිධ භාණ්ඩ නිෂ්පාදනය කරනවා. ඒ සඳහා චීන වෙළෙඳපොළ විවෘත කරන්න. ශ්‍රී ලංකාවේ ආයෝජනය කරන මෙන් චීන ව්‍යාපාරිකයන් දිරිමත් කරන්න. ශ්‍රී ලංකාවේ සංචාරය සඳහා චීන වැසියන් උනන්දු කරවන්න. ශ්‍රී ලංකාවේ තේ වෙන්දේසියට සහභාගිවීමට චීනයට හැකිනම් එය ආර්ථික ස්ථාවරත්වයට විශාල ශක්තියක් බවද හෙතෙම පැවසීය.

උසස් පෙළ සමත් වන ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට විවෘතව ඇති උසස් අධ්‍යාපන ඉඩ ප්‍රස්ථා සීමාසහිත බව පැහැදිළි කළ ජනාධිපතිවරයා ඔවුන් උදෙසා තාක්ෂණ විශ්වවිද්‍යාලයක් ආරම්භ කිරීම චීනයට ශ්‍රී ලංකාවේ ආයෝජනය කළ හැකි ක්ෂේත්‍රයක් ලෙස හඳුන්වා දුන්නේය. ජනාධිපතිවරයාගේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශයේ අන්තර්ගත සංවර්ධන අරමුණු සපුරා ගැනීමට වචනයෙන් නොව ක්‍රියාවෙන්ම උදව් කිරීමට චීනය සූදානම් යැයි යං ජියෙෂි මහතා පැවසීය.

ශ්‍රී ලංකාව සමඟ බහුපාර්ශ්වික සහයෝගිතා වර්ධනයට සුදුසු ක්ෂේත්‍ර ගණනාවක් චීනය හඳුනාගෙන ඇත. දැනටමත් ආරම්භ කර ඇති මහා පරිමාණ ව්‍යාපෘති නිම කිරීමට අමරතව කෘෂිකර්මය, අධ්‍යාපනය, සංචාරක ව්‍යාපාරය, ජල සම්පාදනය, සෞඛ්‍ය, වෛද්‍ය සැපයුම්, නූතන තාක්ෂණය, ඩිජිටල් ආර්ථිකය, නිල් ආර්ථිකය (Blue Economy) සහ ශ්‍රමික පුහුණුව ඉන් කිහිපයකි. චීන ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා යළි පටන් ගැනීමටත්, හම්බන්තොට කර්මාන්තපුර යෝජනා ක්‍රමය ඉක්මණින් නිම කිරීමටත් සැලසුම් කර ඇතැයි ද චීන දූත පිරිසේ ප්‍රධානියා පැවසීය.

කොවිඩ් 19 උවදුර සාර්ථක ලෙස පාලනය කළ පසු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නිල චාරිකාවක් සඳහා චීනයට එනු ඇතැයි ඉමහත් බලාපොරොත්තුවෙන් සිටින බවද යැං ජියේචි මහතා සඳහන් කළේය.

චීන අන්තර්ජාතික සහයෝගීතා සංවර්ධන අධ්‍යක්ෂ වැං ෂියාඕ තාවෝ, චීන විදේශ අමාත්‍යාංශයේ සහාය ඇමැති ඩොං ලි, කොළඹ චීන තානාපති කාර්යාලයේ ප්‍රධානී හූ වෙයි, චීන විදේශ අමාත්‍යාංශයේ ආසියානු කටයුතු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් චෙං සොං, විදේශ ඇමැති දිනේෂ් ගුණවර්ධන, ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර, ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග, විදේශ ලේකම් අද්මිරාල් ජයනාත් කොළඹගේ, චීනයේ ශ්‍රී ලංකා තානාපති ලෙස පත් කර සිටින ආචාර්ය පාලිත කොහොන මහත්වරු ද මේ සාකච්ඡාවට එක්ව සිටියහ.

# පොදු අභියෝගවලට විසඳුම් සෙවීමට චීනය සමඟ සමීපව කටයුතු කරනවා

## අගමැති මහින්ද රාජපක්ෂ



### ආරක්ෂිත සංචාරක ගමනාන්තයක් සැපයීමට ශ්‍රී ලංකාව කැප වනවා





ගෝලීය වසංගතය අවසන් කිරීමේ සටන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සබඳතා වර්ධනය කිරීම ඇතුළු පොදු අභියෝගයන්ට සාමූහික විසඳුම් සෙවීම සඳහා චීන රජය සමඟ සමීපව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා අවධාරණය කළේය.

වත්මන් තත්ත්වය හමුවේ, සංචාරක ක්ෂේත්‍රයට ගෝලීය වශයෙන් දැඩි ලෙස බලපෑම් ඇති වී ඇති බව පෙන්වා දුන් අගමැතිවරයා, සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් අනුව කටයුතු කරමින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය නැවත ගොඩනැඟීමට සහ ලොව පුරා සංචාරකයන් සඳහා ආරක්ෂිත සංචාරක ගමනාන්තයක් සැපයීමට ශ්‍රී ලංකාව උනන්දු වන බවද පැවසීය.

හිටපු චීන විදේශ අමාත්‍ය සහ වත්මන් කොමියුනිස්ට් පක්ෂ දේශපාලන කාර්යාංශයේ සාමාජික යැං ජියෙචි (Yang Jiechi) මහතාගේ නායකත්වයෙන් යුත් ඉහළ පෙළේ චීනදූත පිරිස ඊයේ (9) අරලියගහ මන්දිරයේ දී අගමැති මහින්ද රාජපක්ෂ මහතා හමු වූ අවස්ථාවේ අගමැතිවරයා මේ බව සඳහන් කළේය.

ගෝලීය කොරෝනා වසංගතයෙන් අනතුරුව චීන රාජ්‍ය තාන්ත්‍රික දූත පිරිසක් දකුණු ආසියානු කලාපයේ සංචාරයේ නිරත වන ප්‍රථම අවස්ථාව මෙය වන අතර, කොවිඩ්-19 ගෝලීය වසංගතයට එරෙහිව සටන් කිරීම සහ ආර්ථික සබඳතා පුනර්ජීවනය කිරීම යන ක්ෂේත්‍රයන්හි ශ්‍රී ලංකා - චීන සහයෝගිතාව තවත් ශක්තිමත් කිරීම උදෙසා මෙම හමුව පැවැත්විණි.

හිටපු චීන විදේශ අමාත්‍ය සහ වත්මන් කොමියුනිස්ට් පක්ෂ දේශපාලන කාර්යාංශයේ සාමාජික යැං ජියෙචි (Yang Jiechi) මහතා ඇතුළු දූත පිරිස, පිළි ගනිමින් අගමැති මහින්ද රාජපක්ෂ මහතා වැඩි දුරටත් මෙසේ ද පැවසීය.

යැං ජියෙචි (Yang Jiechi) මහතා නැවත වතාවක් ශ්‍රී ලංකාවට පිළි ගැනීමට ලැබීම ගැන ඉතා සතුටුයි. මම හිතනවා ඔබ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සමඟ ඉතා හොඳ සාකච්ඡාවකට එක්වන්න ඇතියි කියා. අප සෑම විටම දෙරට අතර සමීප සහයෝගීතාව ඉදිරියට පවත්වාගෙන යෑමට බලාපොරොත්තු වනවා. ගෝලීය කොරෝනා වසංගතයෙන් අනතුරුව චීන රාජ්‍ය තාන්ත්‍රික දූත පිරිසක් දකුණු ආසියානු කලාපයේ සංචාරයේ නිරත වන ප්‍රථම අවස්ථාව මෙයයි. මෙම සංචාරයෙන් පවත්නා ශක්තිමත් ද්විපාර්ශ්වික සබඳතා යළි තහවුරු කිරීමට ශ්‍රී ලංකාවට හා චීනයට හැකිවීම ගැන මම සතුටු වෙනවා. කොවිඩ්-19 වසංගතයට එරෙහිව සටන් කිරීම සඳහා ශ්‍රී ලංකාවට නොමසුරුව සහයෝගය දැක්වීම පිළිබඳ චීන රජයට මා කෘතඥතාව පළ කරනවා. කොවිඩ්-19 වසංගතය හමුවේ ශ්‍රී ලාංකික පුරවැසියන් ආරක්ෂා කිරීම සඳහා පරිත්‍යාග කළ ආරක්ෂක උපකරණ සහ වෛද්‍ය සැපයුම්වලට චීන රජයට ස්තූතිවන්ත විය යුතුයි.

කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් පසුව රටේ ඇති වූ ආර්ථික බලපෑමෙන් ගොඩ ඒමට බොහෝ දේ කළ යුතුයි. අපේ රටේ ආර්ථිකය ගොඩනැඟීම සඳහා කටයුතු කිරීමේ දී ආයෝජකයන් අතර විශ්වාසය නැවත ගොඩනගා ගැනීමට චීන රජය අතර පවත්නා අපගේ දිගුකාලීන මිත්‍රත්වය භාවිතා කිරීමට හැකිවනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් පසුව, රජය ලොව පුරා ආයෝජන පිළි ගැනීමට උනන්දුවක් දක්වන බවත් එහිදී ප්‍රමුඛතාව වන්නේ කොළඹ වරාය නගරයයි.

ශ්‍රී ලංකාවට පැමිණ ආයෝජන කිරීමට චීන සමාගම් දිරිමත් කිරීමට චීන රජයට හැකි වනු ඇතැයි බලාපොරොත්තු වනවා. එය අපනයන ආදායමක් ඇති කිරීමට මෙන්ම ශ්‍රී ලාංකිකයන්ට, විශේෂයෙන් තරුණ තරුණියන්ට රැකියා අවස්ථා නිර්මාණය කිරීමට උපකාරී වනවා.

මේ තත්ත්වය හමුවේ, සංචාරක ක්ෂේත්‍රයට ගෝලීය වශයෙන් දැඩි ලෙස බලපෑම් ඇති වී ඇති බව පෙන්වා දුන් අගමැතිවරයා, සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් අනුව කටයුතු කරමින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය නැවත ගොඩනැඟීමට සහ ලොව පුරා සංචාරකයන් සඳහා ආරක්ෂිත සංචාරක ගමනාන්තයක් සැපයීමට ශ්‍රී ලංකාව උනන්දු වන බවද පැවසීය. මෙම ගෝලීය වසංගතය අවසන් කිරීමේ සටන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සබඳතා වර්ධනය කිරීම ඇතුළු වසංගතයෙන් මතුවන පොදු අභියෝගයන්ට විසඳුම් සෙවීම සඳහා සාමූහික විසඳුම් සෙවීමට චීන රජය සමඟ සමීපව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බවද අගමැතිවරයා ප්‍රකාශ කළේය.

මෙහිදී හිටපු චීන විදේශ අමාත්‍ය සහ වත්මන් කොමියුනිස්ට් පක්ෂ දේශපාලන කාර්යාංශයේ සාමාජික යැං ජියෙචි (Yang Jiechi) මහතා ද අදහස් පළ කළ අතර, අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණ ජයග්‍රහණයට සුබ පැතුම් එක්කරන බව පැවසීය. මහජන චීන සමූහාණ්ඩුව සහ ශ්‍රී ලංකාව අතර පවතිනුයේ ඓතිහාසික දැඩි මිත්‍රත්වයක් බවද හෙතෙම පෙන්වා දුන්නේය. දෙරට අතර එම මිත්‍රත්වයේ බැඳීම මේ දක්වා යාවත්කාලීන වෙමින් පවතින බව සඳහන් කළ යැං ජියෙචි (Yang Jiechi) මහතා කොවිඩ් -19 වසංගත තත්ත්වය පරාජය කිරීම වෙනුවෙන් රටවල් දෙකම එකට අත්වැල් බැඳ කටයුතු කරමින් සිටින බව සිහිපත් කළේය.

චීනය කොවිඩ්-19 පරාජය කිරීම වෙනුවෙන් අවශ්‍ය සහය ලෝක සෞඛ්‍ය සංවිධානයට නොමදව ලබාදෙන බවත්, ශ්‍රී ලංකාව කොවිඩ්-19 තත්ත්වය ඉතා විශිෂ්ට අයුරින් පාලනය කර ඇති බවත් යැංග් ජියෙචි මහතා පැවසීය. දෙරට අතර ආර්ථික සහයෝගීතාවයේ දී ලැබූ ජයග්‍රහණ චීනයට මෙන්ම ශ්‍රී ලංකාවට ද ඇති බව පෙන්වා දුන් යැං ජියෙචි මහතා සෑමවිටම ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට චීන සමාගම්වලට අවශ්‍ය දිරිමත් කිරීම චීන රජය විසින් ඇති කර තිබෙන බව කීය.

යැං ජියෙචි මැතිතුමා මෙසේ ද පැවසීය.

කොළඹ වරාය නගරය ඇතුළු අනෙකුත් ව්‍යාපෘතිවලට අදාළව සංවර්ධන ක්‍රියාදාමයට අපගේ දායකත්වය ශ්‍රී ලංකාවට දැනටමත් හිමිව තිබෙනවා. සංචාරක ක්ෂේත්‍රය දෙරට අතර සබඳතාවට ඉතා වැදගත්. කොවිඩ්-19 තත්ත්වය පාලනය වූ වහාම එම සබඳතා නැවත අඛණ්ඩව පවතිනු ඇතැයි අප විශ්වාස කරනවා. චීනය ශ්‍රී ලංකාවේ දේශීය නිෂ්පාදන ආනයනය කිරීම ඉහළ දමා තිබෙනවා. අපගේ මෙම සංචාරය ඔස්සේ දෙරට අතර සබඳතාව තවත් පුළුල් වනු ඇතැයි විශ්වාස කරනවා. ශ්‍රී ලංකාවේ ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමා හා චීන ජනාධිපති ෂී ජිං පිං මැතිතුමා එක්ව ද්විපාර්ශ්වීය සබඳතා තවත් වර්ධනය කිරීම ඔස්සේ ආර්ථික සහයෝගීතාව මත දෙරටේම සංවර්ධන කටයුතු තවත් පුළුල් වනු ඇතැයි මා විශ්වාස කරනවා. යැයි යැංග් ජියේචි මහතා පැවසීය.

මෙම අවස්ථාවට ඇමැතිවරුන් වන දිනේෂ් ගුණවර්ධන, නාමල් රාජපක්ෂ, විමල් වීරවංශ, ආචාර්ය බන්දුල ගුණවර්ධන, ජොන්ස්ටන් ප්‍රනාන්දු, මහාචාර්ය ජී.එල්. පීරිස්, පවිත්‍රා වන්නිආරච්චි, රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල්, අග්‍රාමාත්‍ය ලේකම් ගාමිණී සෙනරත්, විදේශ අමාත්‍යාංශයේ ලේකම් අද්මිරාල් ජයනාත් කොළඹගේ, මුදල් අමාත්‍යාංශ ලේකම් එස්.ආර්.ආටිගල, චීනයේ ශ්‍රී ලංකා තානාපති ආචාර්ය පාලිත කොහොන යන මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

# පළාත් සභා ගැන විධිමත් අධ්‍යයනයක් සිදු කරනවා

## ● රාජ්‍ය ඇමැති සරත් වීරසේකර

**අමෝදා ජයමහ**

පළාත් සභා ඇමැතිවරයා ලෙස පළාත් සභා ක්‍රමවේදයෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳ සාධාරණ අධ්‍යනයක් සිදු කර එම සමීක්ෂණය හරහා ලැබෙන තොරතුරු මත පදනම්ව පළාත් සභා අහෝසි කළ යුතු ද? නැද් ද? යන්න සාධාරණීය තීරණයකට එළැඹෙන බව පළාත් සභා පළාත් පාලන රාජ්‍ය අමාත්‍ය විශ්‍රාමික රියර් අද්මිරාල් සරත් වීරසේකර මහතා පැවසීය.

දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරගෙන එන විසිවන සංශෝධනයෙහි දහනව වැනි සංශෝධනයට පෙර තිබූ ව්‍යවස්ථා සංශෝධනයේ කරුණු පමණක් ඇතුළත් විය යුතු බවද අමාත්‍යවරයා අවධාරණය කළේය.

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනහි නිලධාරීන් සමඟ ඊයේ (9) නිරීක්ෂණ චාරිකාවකට එක් වෙමින් අමාත්‍යවරයා මේ බව පැවසුවේය.

එහි දී වැඩිදුර අදහස් දැක් වූ අමාත්‍යවරයා මෙසේ ද කීය.

දහනව වැනි සංශෝධනය විරුද්ධ වූ එකම පුද්ගලයා මායි. විසිවන වන සංශෝධනය හරහා සිදු කරනුයේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීම පමණි. දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කර ගෙන එන විසිවන සංශෝධනයෙන් දහනව වැනි සංශෝධනයට පෙර තිබූ ව්‍යවස්ථා සංශෝධනයේ කරුණු පමණක් ඇතුළත් විය යුතුයි. නමුත් එහි අන්තර්ගත නො වන කරුණු මේ නව ව්‍යවස්ථා සංශෝධනයෙහි ඇතුළත්ව තිබෙනවා. 'ජනාධිපතිවරයකුට දෙවරකට වඩා තරග කළ නො හැකි' යන කරුණ දහනව වැනි පනත හරහා ගෙන ආ කරුණක්. නමුත් විසි වැනි සංශෝධනයෙහි ද මෙම පනත ඇතුළත්ව තිබෙනවා. එය වෙනස් විය යුතුයි කියා මා විශ්වාස කරනවා. ද්විත්ව පුරවැසිභාවය ඕනෑම තනතුරක් ලබා ගැනීමට, රටක ජනාධිපතිවරයකු වීමට නුසුදුසු කරුණක් නොවන බව දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනයට පෙර සඳහන්ව තිබුණා. විසි වැනි සංශෝධනය හරහා සිදු කරනුයේ එය නැති කිරීම පමණයි.

එමෙන්ම පළාත් සභා අහෝසි කිරීමට මා හට හැකියාවක් නෑ. එය පාර්ලිමේන්තුව තුළ තුනෙන් දෙදක ඡන්දයකින් සම්මත කරගත යුතුයි. පළාත් සභාවලින් නීති සෑදීමට හැකියාව ඇති විෂයන් තිස් හයක් පමණ තිබෙනවා. ඒ හරහා බලය බෙදා හැර තිබෙනවා. නමුත් අපට ආණ්ඩුකාරවරයා හරහා ජනාධිපතිවරයාට හිමි බලය තබා ගැනීමේ හැකියාව තිබෙනවා. පළාත් පාලන ආයතන පනත තුළ බලය බෙදා හැරිය යුතු යැයි සඳහන්ව යම් වගන්තියක් තිබේ නම්, එය නිවැරදි කර බලය විමධ්‍යගත කළ යුතුය යන වගන්තිය යෙදිය යුතුයි. බලය බෙදා හැරීම සිදු කරන්න බෑ. සෑම විටම බලය මධ්‍යම රජය සතුව තිබිය යුතුයි.

අපේ රට ඒකීය රටක්. ප්‍රමාණයෙන් විශාල රටවල් බලය බෙදා හරින්නේ ඒ රටවල එක් ස්ථානයක සිට පාලනය කිරීමට අපහසු නිසයි. ඉන්දියාව ෆෙඩරල් රටක්. රට ෆෙඩරල්කරණය කිරීමට හෝ බලය බෙදා හැරීමෙන් ප්‍රශ්න රැසක් සිදුවිය හැකියි. විශේෂයෙන් ජනවාර්ගයන් අනුව උතුරු, නැගෙනහිර ප්‍රදේශවල 99% පමණ දෙමළ ජනතාව සිටිනවා. මෙවැනි ප්‍රදේශ තුළ මේ ආකාරයට බලය බෙදී යාමෙන් විශාල ප්‍රශ්න ඇති විය හැකියි. මේ පිළිබඳ මා පාර්ලිමේන්තුවේ ද කිව්වා. අප බලය බෙදීම ගැන කිසිවිටක විශ්වාස කරන්නේ නෑ.



**ඡායාරූපය - රංජිත් අසංක**

# නිලන්තට ලැබුණු තොරතුරු මට දැනුම් දුන්නා නම් ප්‍රහාරය වැළැක්වීමට පියවර ගන්න තිබුණා

● විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති **එම්.ආර්.ලතීෆ්**

**සුභාෂිණී සේනානායක**

පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරය එල්ල වන අවස්ථාවේ පොලිස් විශේෂ කාර්ය බළකායේ අණ දෙන නිලධාරීවරයාව සිටි විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එම්. ආර්. ලතීෆ් මහතාට කොමිසන් සභා පනතේ 16 වන වගන්තිය අනුව නොතීසි නිකුත් කිරීමට ජනාධිපති කොමිසම පසුගියදා (07) තීරණය කළේය.

විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා මීට පෙර කොමිසම් සභාව ඉදිරියේ ලබා දුන් සාක්ෂි සහ පසුගිය 07 වැනිදා ලබා දුන් සාක්ෂි අතර පරස්පරතා කොමිසමේදී නිරීක්ෂණයවීම හේතුවෙන් නීතිඥ සහායක් සහිතව හෙට (10) කොමිසම හමුවේ පෙනී සිටින ලෙස ලතීෆ් මහතාට නොතීසි නිකුත් කළේය.

පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරය එල්ල වන අවස්ථාවේ පොලිස් විශේෂ කාර්ය බළකායේ අණ දෙන නිලධාරරීවරයාව සිටි විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එම්. ආර්. ලතීෆ් මහතා සාක්ෂි ලබාදීමට පසුගිය 07 වැනිදා ජනාධිපති කොමිසම වෙත පැමිණියේ දෙවැනි දිනටය.

ඉකුත් වසරේ පාස්කු ප්‍රහාරයට පෙර දින එවකට පොලිස් විශේෂ කාර්ය බළකායේ අණ දෙන නිලධාරියා වූ සාක්ෂිකරු සහ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා අතර ඇතිව තිබූ මිනිත්තු 15ක් පමණ වූ දුරකතන සංවාදය ගැන එහිදී රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කර සිටියේය.

එහිදී සාක්ෂිකරු මෙසේ කීය.

පානමුණේ යතුරු පැදි පිපිරීම සම්බන්ධයෙන් නිලන්ත ජයවර්ධන මහතා මගෙන් කරුණු විමසීමක් කර තිබුණා. මා 20 වැනිදා සවස කතා කර නිලන්තට කිව්වා මේක ප්‍රභූ කණ්ඩායමක් හෝ මහජනයා විශාල වශයෙන් ගැවසෙන ස්ථානයක් ඉලක්ක කර ප්‍රහාරයක් එල්ල කිරීමට කරන ලද පෙර පුහුණුවක් කියලා.

**රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරයා:**

අදාළ දුරකතන සංවාදයේදී එම අවස්ථාව වන විටත් නිලන්ත ජයවර්ධන මහතාට ලැබී තිබූ හෙට හෝ ඊට පෙර ප්‍රහාරයක් එල්ල වෙනවා යැයි වූ තොරතුර පිළිබඳ ඔබව දැනුම්වත් කර තිබුණේ ද?

**සාක්ෂිකරු:**

නෑ, ස්වාමීනි. දැනුම්වත් කළේ නෑ. මට මේක දැනුම් දුන්නා නම් ප්‍රහාරය වැළැක්වීමට පියවර ගන්න තිබුණා. මේක නිශ්චිත තොරතුරක්. ත්‍රස්තවාදය මර්දනය පිළිබඳ එස්. ටී. එෆ්. දන්න උපක්‍රම ක්‍රියාමාර්ග ගන්න තිබ්බා. නමුත් අප්‍රේල් මස 09 වැනිදා පළමු විදෙස් බුද්ධි තොරතුර ලැබුණාට පසු අප්‍රේල් මස 21 වැනිදා ප්‍රහාර වනතුරුම මට කිසිම තොරතුරුක් ලැබී තිබුණේ නෑ.

**කොමිසම:**

21න් පසුවත් නිලන්ත ජයවර්ධන මහතාගෙන් ඇහුවේ නැද්ද ඇයි මේ තොරතුර ඔබට ලබා නොදුන්නේ කියලා?

**සාක්ෂිකරු:**

නෑ. මා නිලන්තගෙන් ඇහුවේ නෑ. ඒත් 21 සවස ඉන්දියානු තානාපති කාර්යාලයේ පොලිස් නිලධාරියෙක් ප්‍රහාරයට පෙර දිනයේ ලබාදී තිබූ නිශ්චිත බුද්ධි තොරතුර මට පෙන්නුවා. මම ඒ වෙලාවේ මට ඒ තොරතුර නොලැබීම ගැන කනගාටු වුණා. පසුව 22 උදේ ජාතික ආරක්ෂක කවුන්සලයේ රැස්වීමට මා ගියා. එතැනදී ප්‍රහාරය සම්බන්ධයෙන් සැක පළ කරන අන්තවාදීන් 98 දෙනෙක්ගේ නාම ලේඛනයක් ඉදිරිපත් වුණා.

රැස්වීමෙන් පසු මා නිලන්තගෙන් ඇහුවා, ඇයි මේ තොරතුරු ගැන STF එක දැනුවත් නොකළේ කියලා. නිලන්ත මට කිව්වා සාක්ෂි තිබුණේ නෑ, එකයි මම දැනුවත් නොකළේ කියලා. මා අනිත් පැත්තට කිව්වා සාක්ෂි නොතිබුණාට තිබූ දත්තවලින් මේ සිද්ධිය වළක්වාගන්න සෑහෙන දෙයක් අපට කරන්න තිබ්බා කියලා. මා මේවා කියද්දී නිලන්ත කිසිවක් නොකියා නිහඬව සිටියා. මට ඒ නිහඬතාවයෙන් හැඟුණා නිලන්තගේ අතින් ප්‍රබල අතපසුවීමක් වෙලා තිබෙනවා කියලා.

**කොමිසම:**

පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාර මාලාව එල්ල වන අවස්ථාව වන විට පොලිස් විශේෂ කාර්ය බළකායට අයත් කඳවුරු කොපමණ ප්‍රමාණයක් නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක වුණා ද?

**සාක්ෂිකරු:**

වව්නතිව්, කලවන්චිකුඩි, මල්වත්ත, මහඔය, ලාහුගල, අම්පාර සහ ආරුගම්බේ ප්‍රදේශවල කඳවුරු 07ක් තිබුණා.

**කොමිසම:**

අප්‍රේල් මස 09 වැනිදා විදෙස් බුද්ධි තොරතුර ඔබ අතට ලැබීමෙන් පසු ඒ පිළිබඳ සොයා බලන ලෙස නැගෙනහිර පළාතේ පොලිස් විශේෂ කාර්ය බළකා කඳවුරු දැනුම්වත් කළා ද?

**සාක්ෂිකරු:**

ඔව්, මා දැනුම්වත් කළා. විමර්ශනයක් කර වාර්තා කරන්න කියලා දැනුම් දුන්නා. සාමාන්‍යයෙන් අප විමර්ශනයක් කර වාර්තාවක් කරන්න දින 10කට වඩා කල් දෙනවා. ඒ නිසා වාර්තාව එවන්න කියලා මා දින දුන්නේ අප්‍රේල් 23 වැනිදාට. අවාසනාවකට ඒ වෙද්දී ප්‍රහාරය සිදු වෙලා ඉවරයි.

**කොමිසම:**

2017 වර්ෂයේ අල්ලියාර් මංසන්දියේ ගැටුමෙන් පසු නැගෙනහිර පළාතේ සිටි පොලිස් විශේෂ කාර්ය බළකා බුද්ධි අංශ විසින් සහරාන් ඇතුළු අන්තවාදීන් කණ්ඩායම පිළිබඳ විමර්ශන සිදු කළේ නැද්ද?

**සාක්ෂිකරු:**

පොලිස් විශේෂ කාර්ය බළකා බුද්ධි අංශ තිබෙන්නේ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු සොයන්න නොවේ. ඒකට රටේ බුද්ධි තොරතුරු රැස් කිරීමේ ප්‍රධාන ආයතනය වන රාජ්‍ය බුද්ධි සේවය ඉන්නවා. එයාලා බුද්ධි තොරතුරු එවූ විට ඒ සම්බන්ධයෙන් මෙහෙයුම් ක්‍රියාත්මක කරන්න සහ ඒ මෙහෙයුම් සැලසුම් කරන්න තමයි පොලිස් විශේෂ කාර්ය බළකා බුද්ධි අංශ ඉන්නේ.

**කොමිසම:**

ඔබ ඔය කියන්නේ STF බුද්ධි අංශ ඉස්ලාම් අන්තවාදය පිළිබඳ විමර්ශන කළේ නෑ කියන එක ද?

**සාක්ෂිකරු:**

ඔව්.

එම පිළිතුරත් සමඟ ජනාධිපති කොමිසමේ සභාපති විනිසුරුවරයා මේ වන විටත් කොමිසම් සභාව හමුවේ සාක්ෂි ලෙස ඉදිරිපත් වී ඇති නැගෙනහිර පළාතේ පොලිස් විශේෂ කාර්ය බළකා බුද්ධි අංශ විසින් සහරාන් සම්බන්ධයෙන් කළ විමර්ශන වාර්තා තුනක් සාක්ෂිකරුගේ අවධානයට යොමු කළේය.

**කොමිසමේ සභාපති විනිසුරුවරයා:**

මේ වාර්තාවල පොලිස් විශේෂ කාර්ය බළකා බුද්ධි නිලධාරීන් සහරාන් සම්බන්ධයෙන් කළ විමර්ශන ගැන සඳහන්ව ඇත්නම්, STF හිටපු අණ දෙන නිලධාරියා වන ඔබ සහරාන් සම්බන්ධයෙන් STF බුද්ධි අංශ විමර්ශන සිදු නොකළ බව පැවැසීමෙන් කියා පාන්නේ STF බුද්ධි නිලධාරීන් තමන්ට අයිති නැති වැඩක් කළා කියන එක ද?

**සාක්ෂිකරු:**

නෑ, ස්වාමීනි.

**කොමිසමේ සභාපති විනිසුරුවරයා:**

පොලිස් විශේෂ කාර්ය බළකා බුද්ධි අංශ සහරාන් සම්බන්ධයෙන් සිදු කළ සියලු විමර්ශනවලට අදාළ වාර්තා ජනාධිපති කොමිසමට ලබා දෙන ලෙස නියෝග කර තිබියදීත් STF හිටපු අණ දෙන නිලධාරියා වන ඔබ විසින් කොමිසම අද දින පෙන්වන ලද වාර්තා තුන කොමිසමට ඉදිරිපත් නොකළේ ඇයි?

**සාක්ෂිකරු:**

ස්වාමීනි, මේ කිසිවක් STF අණ දෙන නිලධාරියා වන මගේ නමට එවූ ඒවා නොවේ. මේවා ප්‍රාදේශීය නිලධාරීන් අතර හුවමාරු වූ ඒවා. මේවා පොලිස් විශේෂ කාර්ය බළකා අණ දෙන නිලධාරියාගේ කාර්යාලයට යොමු වෙලා නෑ. මා දැකලත් නෑ. කොමිසමට මා කියන්නේ මේ වාර්තා පොලිස් විශේෂ කාර්ය බළකා මූලස්ථානයට ආව ද නැත්තම් කලාප නිලධාරීන් ළඟ තිබ්බා ද කියලා.

**කොමිසමේ සභාපති විනිසුරුවරයා:**

අප්‍රේල් මස 09 වැනිදා විදෙස් බුද්ධි තොරතුර ඔබගේ අතට ලැබෙන තෙක් ඔබ සහරාන් කියන පුද්ගලයකු ගැන නොදැන සිටි බව මීට පෙර දිනයේ ජනාධිපති කොමිසම ඉදිරියේ සාක්ෂි දුන්නා නේද?

**සාක්ෂිකරු:**

ඔව්, ස්වාමීනි. සහරාන්ගේ නම මාධ්‍ය ඔස්සේ කිහිප වරක් අසා තිබුණා වගේ මතකයි. නමුත් පොලිස් විශේෂ කාර්ය බළකා බුද්ධි අංශ විසින් මට සහරාන් කියන නමක් ගැන තොරතුරු වාර්තා කර තිබුණේ නෑ. ජාතික තවුහිද් ජමාත් සංවිධානය කියන නම ඇහිලා තිබුණා. නමුත් අප්‍රේල් මස 09 වැනිදා වනතුරු සහරාන් කියන නම අහලා තිබුණේ නෑ.

**කොමිසමේ සභාපති විනිසුරුවරයා:**

ජාතික තවුහිද් ජමාත් කියන නම අසා තිබූ ඔබ සහරාන් යන නම අසා නොතිබූ බවට විශ්වාස ද?

**සාක්ෂිකරු:**

2018 තෙල්දෙණිය සිදුවීමෙන් පසු සහරාන් යන පුද්ගලයකු පිළිබඳ දැනුම්වත්ව සිටියා.

**කොමිසමේ සභාපති විනිසුරුවරයා:**

එසේ නම් පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරයට පෙර ඔබ රාජකාරී මට්ටමින් සහරාන් ගැන නොදැන සිටියා යැයි මීට පෙර කොමිසම හමුවේ ලබා දුන් සාක්ෂිය වැරැදියි නේද?

**සාක්ෂිකරු:**

(එම ප්‍රශ්නය හමුවේ සුළු මොහොතක් නිහඬ වූ සාක්ෂිකරු)

මා සහරාන් ගැන දැන සිටියා. ඔහු ත්‍රස්තවාදියෙක් යැයි සිතුවේ නෑ.

**කොමිසමේ සභාපති විනිසුරුවරයා:**

(ලතීෆ් මහතා පොලිස් විශේෂ කාර්ය බළකායේ අණ දෙන නිලධාරියාව සිටියදී නැගෙනහිර පළාතේ පොලිස් විශේෂ කාර්ය බළකා කඳවුරුවල සිදුව තිබූ ගැටලුසහගත බුද්ධි නිලධාරීන් මාරු කිරීම් කිහිපයක් ගැන ප්‍රශ්න කළා.)

ඒ අනුව ආරුගම්බේ STF කඳවුරේ සේවය කළ STF බුද්ධි නිලධාරීන් 5 දෙනකු වසර එක හමාරක් වැනි කෙටි කාලයකදී ස්ථාන මාරු කිරීමට ද, කලවන්චිකුඩි STF කඳවුරේ බුද්ධි නිලධාරීන් 4 දෙනකු වසර එක හමාරක් වැනි කෙටි කාල සීමාවකදී ස්ථාන මාරු කිරීමට ද මුල්වූ කරුණු මොනවා ද?

**සාක්ෂිකරු:**

අදාළ ලේඛන පරීක්ෂා කිරීමෙන් තොරව මට පිළිතුරු දෙන්න බෑ.

**යතුරුපැදි පෙර පුහුණුවක් විය හැකි බව මා නිලන්තට පැවැසුවා**

**අප්‍රේල් 6 දින වන තුරු මා සහරාන් කියා නමක් අසා තිබුණේ නෑ**

**සහරාන් ගැන දැන සිටියා; එහෙත් ඔහු ත්‍රස්තවාදියකු යැයි මා සිතුවේ නෑ**

**පාස්කු ඉරු දින ප්‍රහාරය විමර්ශනය කරන ජනපති කොමිසම**

## යහපාලන ආණ්ඩුවේ දූෂණ විරෝධී කමිටු ක්‍රියාකාරිත්වයෙන්

# නීතිය හා අධිකරණය කෙරෙහි ජනතා විශ්වාසය කඩා වැටිලා

● හිටපු අධිකරණ ඇමැති **විජයදාස රාජපක්ෂ**

**රෝෂන් තුෂාර**

යහපාලන ආණ්ඩුවේ දූෂණ විරෝධී කමිටු ක්‍රියාකාරිත්වයෙන් නීතිය හා අධිකරණය කෙරෙහි ජනතා විශ්වාසය කඩා වැටීමට ලක් වූ බව හිටපු අධිකරණ ඇමැති විජයදාස රාජපක්ෂ මහතා දේශපාලන පළිගැනීම් විමර්ශන ජනපති කොමිසම හමුවේ සාක්ෂි දෙමින් පෙරේදා (08) පැවැසීය.

නීතිඥ දක්ෂිත දේවපුර මහතා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දුන් හිටපු අධිකරණ බන්ධනාගාර හා කම්කරු ඇමැති, පාර්ලිමේන්තු මන්ත්‍රී විජයදාස රාජපක්ෂ මහතා සාක්ෂි දෙමින් මෙසේ ද පැවැසීය.

'2015 ජනවාරි මස 21 වැනි දින හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා විසින් කැබිනට් සංදේශයක් ඇමැති මණ්ඩලයට ඉදිරිපත් කළා. දූෂණ විරෝධී කමිටුව පිහිටුවීමට එම පත්‍රිකාව ඉදිරිපත් කළා. මේ කැබිනට් පත්‍රිකාව පිළිබඳව සියලු විස්තර 2020 ජූලි මස 29 වැනි දින මේ කොමිසමේ සාක්ෂි ලබාදීමේදී මා ප්‍රකාශ කළා. දූෂණ විරෝධී කමිටුවේ මගේ නම තිබුණාට මා කිසි දිනෙක එම කමිටුවට සහභාගී වී නැති බව මා සාක්ෂියේදී ප්‍රකාශ කළා. ඊට අදාළ වූ හේතු ද මා විස්තර කළා.'

**කොමිසම:**

ඔබට මේ කමිටුව ගැන දැනීමක් නැද්ද?

**සාක්ෂිකරු:**

ආරාධනාවක් තිබුණෙත් නෑ. දැනීමක් තිබුණෙත් නෑ. සහභාගී වීත් නෑ.

**කොමිසම :**

මේ කමිටුව ගැන සාක්ෂි දෙන්න පැමිණි සෑම කෙනෙක්ම කමිටුවේ නම තිබෙනවා කියලා විතරයි කිව්වේ.

**සාක්ෂිකරු:**

වෙන්න පුළුවන් කොමසාරිස්තුමනි. විශේෂයෙන් මා එදා සාක්ෂි දුන් ආකාරයට ආණ්ඩුව පිහිටුවා තුන් වැනි සතියේදී ආණ්ඩුවයි මායි අතර ලොකු ගැටීමක් ඇති වුණා. බෙදීමක් ඇති වුණා. ඒ නිසා මාව කිසි දේකට සහභාගී නොකර ඒ අය කටයුතු කළා. විශේෂයෙන් දූෂණ විරෝධී කමිටුව පිළිබඳ මගේ මතය වුණේ දූෂණ විරෝධී කමිටුව ලෙස නම් කළ දේශපාලන කමිටුවක සාමාජිකයකු ලෙස අධිකරණ ඇමැතිවරයා ලෙස මා කටයුතු කිරීම යුක්තිසහගත නෑ කියලා මා කිව්වා. මට ආරාධනා කළත් නොයන ස්ථාවරයේ මා සිටියා.

**කොමිසම:**

දූෂණ විරෝධී කමිටුවේ නම ඇතුළත් සියලු දෙනා මෙතැන සාක්ෂිදීමේදී කමිටුවෙන් දුරස්ථව ඉන්නවා කියලා පෙන්වීමට උත්සාහ කළා.

**සාක්ෂිකරු:**

ඒ ගැන මට අදහසක් නෑ.

**කොමිසම:**

දූෂණ විරෝධී කමිටුවක් තිබුණා කියා පිළිගත්තේ හිටපු අගමැතිවරයා පමණයි.

**සාක්ෂිකරු:**

එතුමා කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කර තිබූ නිසා ප්‍රතික්ෂේප කරන්න බෑ. මා කැබිනට් එකේ සිටියා. ඒ නිසා මෙලෙස කැබිනට් පත්‍රිකාවක් තිබෙනවා එය සම්මත වුණා කියලා දන්නවා.

**කොමිසම:**

මේ කැබිනට් පත්‍රිකාවේ අනුකමිටුවෙන් ඊට ඉදිරිපත් වන පැමිණිලි මූල්‍ය අපරාධ කොට්ඨාසයට යොමු කරනවා. එම එෆ්. සී. අයි. ඩී. එකත් පිහිටුවන්නේ 2015 නව රජය නේද?

**සාක්ෂිකරු:**

නව රජය බලයට පත්වීමෙන් පසුවයි.

එෆ්. සී. අයි. ඩී. ගැන මා කියන්න ඕනැ ස්වාමීනි. මා එහිදී යෝජනා කළා මේකේ දේශපාලන මුහුණුවරක් ගන්න බව පෙනෙන නිසා, මේ රටේ නීතිය අධිකරණය ගැන ජනතා විශ්වාසය බිඳ වැටෙන නිසා, මේ වගේ දූෂණ හොයන්න සී. අයි. ඩී. එක ඇතුළේ, රහස් පොලීසියේ වෙනම ඒකකයක් පිහිටුවා දූෂණ පිළිබඳ පැමිණිලි සෘජු ලෙස එම ඒකකයට යොමු කරන්න කියලා. නමුත් මගේ යෝජනාව පිළිගත්තේ නෑ.

**කොමිසම:**

එෆ්. සී. අයි. ඩී. එකේ නීත්‍යනුකූලභාවය පිළිබඳ ඔබේ අදහස මොකක් ද?

**සාක්ෂිකරු:**

පොලිස් ආඥා පනත අනුව එෆ්. සී. අයි. ඩී. එකේ නීත්‍යනුකූලතාවක් නෑ. නමුත් මගේ යෝජනාව අනුව සී. අයි. ඩී. එකට හෝ සී. අයි. ඩී. එකේ වෙනම ඒකකයක් ඇති කරලා කළා නම් නීත්‍යනුකූලයි.

**කොමිසම:**

එවැනි ආකාරයේ ඔබේ යෝජනා ඉටු නොකර මෙවැනි විශේෂ ඒකකයක් නීතියට එකඟ නොවී පිහිටුවීමෙන් බලාපොරොත්තු වුණේ දූෂණ විරෝධී කමිටුවේ පැමිණිලි දේශපාලනික වශයෙන් විභාග කිරීම ද?

**සාක්ෂිකරු:**

මේ කමිටුවල සිටියේ දේශපාලනඥයෝ සහ දේශපාලනඥයන්ගේ ආධාරකරුවෝ.

එහිදී එතැන ස්වාධීනතාවක් කිසිසේත් සිටින්න බෑ. නමුත් මගේ උපදෙස් පිළිපදින්න ඒ අය කටයුතු කළේ නෑ. හේතුව පොලිසිය භාරව සිටියේ මා නොවෙයි. වෙනත් ඇමැතිවරයෙක්. අගමැතිවරයාත්, පොලීසිය භාර ඇමැති සාගල රත්නායක මහතාත් තමයි තීන්දු තීරණ ගත්තේ.

දූෂණ විරෝධීව ක්‍රියා කිරීම අත්‍යවශ්‍යයි. ඒක හොඳ දෙයක් කියලා මා පිළිගන්නවා. ප්‍රශ්නය වුණේ මේවා පිහිටුවූ ආකාරය හා කමිටු සංයුතියයි. අනුගමනය කළ ක්‍රමවේදය දුර්වලයි. ඒ වගේම කමිටු සංයුතියේ අපක්ෂපාතීත්වය ගැන ප්‍රශ්න තිබුණා.

**කොමිසම:**

එදා පොලීසිය ක්‍රියාත්මක වුණේ කොහොම ද?

**සාක්ෂිකරු:**

පොලීසිය අද වගේමයි. එදත් බලවතුන්ගේ කාරණාවලදී සියල්ල පොලීසිය තීරණ ගත්තේ අදෘශ්‍යමාන හස්තවලින්. නීතිපති අධිකරණය අවශ්‍ය වුණේ නෑ. දුර්වලයන්ට විතරක් පොලීසිය තදින් නීතිය ක්‍රියාත්මක කළා.

ඒ බව ඊයේ පෙරේදා සිද්ධියකින් පැහැදිලිව පෙනුණා. ලංකාවේ විශාල අපරාධය තුන්සියයක් මරාදාපු මිනී මැරුමේ ප්‍රබල සාක්ෂි තිබෙනවා කියලා පොලීසියේ උසස් නිලධාරීන් ජනතාවට කියලා. ඊට මාස කිහිපයකට පෙර කියලා නීතිපතිත් නැතුව අධිකරණයක් නැතුව ප්‍රබලයන් මුදා හරිනවා. ඒ නිසා මේ රටේ නීතිය ක්‍රියාත්මක වන්නේ දුබලයන්ට බව පේනවා. ප්‍රබලයන්ට ක්‍රියාත්මක වෙන්නේ නෑ.

එවකටත් එහෙමයි. ගරු ගෝඨාභය රාජපක්ෂ මහතා අත්අඩංගුවට ගන්න දැරූ උත්සාහයත්, යෝෂිත රාජපක්ෂ මහතා අත්අඩංගුවට ගැනීමත් මේ ආකාරයෙන් තමයි වුණේ.

මේ පැමිණිල්ල ඉදිරිපත් කළ පියදාස කුඩාබාලගේ මහතා මා හොඳින් දන්නවා. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රජයට අත්පත් කර දුන්නේ මා. කෝප් වාර්තාවෙන් මා පෙන්නුවා බිලියන 125ක වටිනාකමක් තිබෙන රක්ෂණ සමාගම ඇපලෝ සමාගමත් එක්ක බිලියන 06කට අරක්කු සමාගමකට විකුණුවා. එවකට ආණ්ඩුවට මා කෝප් වාර්තාවෙන් නිර්දේශයක් දුන්නා. ඒක පවරගන්න කිව්වා. වාසුදේව නානායක්කාර මහතා නඩු දැම්මා. එවකට නීතිපතිතුමා මේක රජයට ඕනැ නෑ කියලා අවුරුදු එක හමාරක් ප්‍රමාද කළා.

2015 දූෂණ විරෝධී කමිටුවට දූෂණ විරෝධී කියලා නම දැම්මට 'දූෂණ' වළක්වන එකම අණ පනතක් මේ කමිටුවෙන් හැදුවේ නෑ. පාර්ලිමේන්තු ස්ථාවර තේරීම් කාරක සභාව සභාපතිවරයා ලෙස මා එම අණ පනත් සම්මත කළා. මේ කමිටුවට මා කවදාකවත් ගිහිල්ලා නෑ. සහභාගි වෙලා නෑ.

**කොමිෂම:**

දූෂණ විරෝධී කමිටුවට එරෙහිව මේ කොමිසමට ඉදිරිපත්ව ඇති පැමිණිලි අනුව රහස් පොලීසිය යම් යම් පුද්ගලයන්ගෙන් පළි ගැනීම් කිරීමට 127 යටතේ බලහත්කාරයෙන් ප්‍රකාශ අරගෙන තිබෙනවා. එහෙම කළේ මේ කැබිනට් පත්‍රිකාව අනුව යමින්ද?

**සාක්ෂිකරු:**

යම් පිරිසක් ඉලක්ක කරගෙන පොලීසිය කටයුතු කළා කියලා පේනවා.

**ආණ්ඩුව හදා තුන්වන සතියේදී මාත් ආණ්ඩුවත් අතර බෙදීමක් ඇති වුණා**

**කමිටුවේ නම හොඳ වුවත් පිහිටවූ ආකාරය හා සංයුතිය ප්‍රශ්නකාරියි**

**දේශපාලන පළි ගැනීම් විමර්ශන ජනපති කොමිසම**

# ආණ්ඩුවට පීලි පනින්න ඉඩ දෙන්න බෑ

## 'පැවිදි හඬ' සභාපති මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි

**අනුර ප්‍රේමලාල්**

එදා වත්මන් ආණ්ඩුවේ නායකයන් විපක්ෂයේ සිටින විට පළාතකවත් නොසිටි අය දැන් ආණ්ඩුවට ඇවිත් පෙරමුණ අරගෙන වැඩකරන හැටි දැක්කාම පුදුම හිතෙනවා! ඒ අයගේ කේලාම්වලට අසුවෙලා ආණ්ඩුවට පීලිපනින්න දෙන්න නොහැකි බව පැවිදි හඬ සංවිධානයේ සභාපති නාරaහේන්පිට අභයාරාමයේ විහාරාධිපති මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමියෝ ප්‍රකාශ කළහ.

උන්වහන්සේ මේ බව සඳහන් කළේ ඉකුත් (8) නාරහේන්පිට අභයාරාමයේදී පැවැති පැවැදි හඬ සංවිධානයේ මාධ්‍ය හමුවට එක්වෙමින්ය. එහිදි වැඩිදුරටත් කතා කළ මුරුත්තෙට්ටුවේ අනාන්ද හිමියෝ මෙසේද කීහ.

පැවිදි හඬ සංවිධානය ඉකුත් මැතිවරණවලට පෙර සිටිම අතිසම්භාවනීය මහා සංඝරත්නයෙන් සමන්විත සංවිධානයක්. මෙම සංවිධානයට කිසිම දේශපාලනඥයකුගෙන් හා ඔවුන්ගේ අනුගාමිකයන්ගෙන් කිසිදු වරප්‍රසාදයක් ලබාගෙනත් නැහැ. ලබා ගන්න බලාපොරොත්තුවකුත් නැහැ. රටට ජාතියට කරදරයක් සිදුවන සෑම අවස්ථාවකම ඉදිරියට පැමිණ කටයුතු කළේ රටේ සංඝයා වහන්සේලායි. ඒ නිසා ජාතියේ මුරදේවතාවුන් ලෙස කව්රුත් හඳුන්වනවා. මෙම සංවිධානයේ එකම ප්‍රාර්ථනාව රටේත්, ජනතාවගේ සුබසිද්ධියයි.

ඉකුත් සමයේ අප ගත කළේ සෑම අංශයකම පිරිහිලායි. එම පිරිහුණු යුගය අවසන් කර මේ රටට ඔබින නායකයෙක් පත් කරගෙන ඒ නායකයාට මේ රට භාරදී රට ඉදිරියට ගමන් කරවීම තමයි ඉන් බලාපොරොත්තු වුණේ. ඒ සඳහා කටයුතු කළේ අපේ පැවිදි හඬ කිව්වොත් එහි අතිශයෝක්තියකුත් නැහැ ඊට අභියෝග කරන්න කිසිවකුටත් බැහැ. අප හදපු ආණ්ඩුව අපම රැක ගත යුතුයි.

ආණ්ඩුවේ අඩුපාඩු පෙන්වමින් ඉදිරියට යමු. ඊට ඇහුම්කන් දෙන්නේ නැත්නම් ආණ්ඩුව පලවා හරිමු කියන තැන අප ඉන්නවා. මේ රටේ කහ සිවුරේ බලය තවම අඩුවෙලා නැහැ. එවැනි බලයක් තියෙනවා කියා එකිනෙකාට ගැතිකම් කරමින් එකිනෙකාට වන්දිබට්ටකම් කරගෙන, ප්‍රශස්ති ගායනා කරමින් ඉන්න අප කැමැතිත් නැහැ. කාගේ වුවත් වැරැද්ද දුටු තැන කතා කරනවා. එය නිවැරදි කරන්න ක්‍රියා කරනවා. මේ ආණ්ඩුව ගැන කතා කරද්දී ඊට අපට අයිතියක් තියෙනවා. කල දුටු කළ වළ ඉහ ගැනීමේ පරමාර්ථයෙන් සිටින අයත් සිටිනවා අපි එහෙම නැහැ. මේ ආණ්ඩුව හදන්න පුරෝගාමී වූ පැවැදි හඬ ආණ්ඩුව නිවැරදි කරන්න නිරන්තරයෙන් ක්‍රියාකරනවා

කොළඹ ආනන්ද විද්‍යාලයේ හිටපු ආචාර්ය ශාස්ත්‍රපති වේපතඉර හේමාලෝක නාහිමි- මේ රජය වැරැදි ගමන් මඟක යනවා නම් එය නිවැරදි කිරීමේ අයිතිය තිබෙන්නේ භික්ෂූන් වහන්සේලාටයි. ඉකුත් ආණ්ඩුවෙන් රටට සිදුවන විනාශය දැක තමයි, මේ රටේ භක්ෂූන්ගෙන් 98%ක් එකතුවෙලා ඒ ආණ්ඩුව පරාජය කිරීමට කටයුතු කළේ. අප කිසි දෙයක් මේ ආණ්ඩුවලින් බලාපොරොත්තු වන්නේ නැහැ. අපට ලාභ ප්‍රයෝජන අවශ්‍ය නැහැ. රට අගතියට යෑම වළක්වා ගන්නයි අපට අවශ්‍ය වන්නේ. දැන් කොමිෂන්වල සිදුවන සාක්කිදීම් වලින් පැවැති යහපාලන ආණ්ඩුවෙන් සිදු වූ දේවල් ගැන කියැවෙනවා. එදා ඒවා දැකපු නිසයි අප පන්සලක් පන්සලක් ගානේ, ගමක් ගමක් ගානේ ගොස් කටයුතු කළේ. ඒ මහන්සියට පසෙකට දාලා තුට්ටුවකටවත් ගණන් ගන්නේ නැතිව මේ පාලකයෝ ක්‍රියා කරනවා නම් ඒවාට විරුද්ධ වෙන්න අපට හැකියාව තිබෙනවා.

බෙල්ලවිල රජමහා විහාරාධිපති ආචාර්ය ධම්මරතන නාහිමි- මහා සංඝරත්නය එකමුතු වුණාම ලොකු බලයක් තියෙනවා. ඉකුත් ආණ්ඩුව ඒ බලය අමතක කළා. මමත් අතුළු මේ සියලු දෙනා පක්ෂ දේශපාලනයක් කරන්න කැමැති නැහැ. 19 වැනි සංශෝධනය නිසා මේ රට අගතියට ගිය හැටි දැකපු ජනතාව තමයි වත්මන් ආණ්ඩුවට බලය දුන්නේ. ජනාධිපති හා අගමැති රටට යමක් කළ අයයි. ඒ නිසයි භික්ෂූන් වහන්සේලා මේ තරම් ආණ්ඩුවට සහයෝගය දුන්නේ. අපේ රට නිලධාරිවාදයට යටත් වූ රටක්. යටත් විජිත සමයේ දිසාපති දිසාපති හමුදුරුවෝ කියන තත්ත්තවයට ගියා. ඒ නිසා මේ රටේ නිලධාරිවාදය තිබෙනවා. ඒ සිවිල් පාලනයේ පොඩි, පොඩි වෙනස් කම් ඇතිව ඒ ක්‍රමයම තමයි දැනුත් තියෙන්නේත්. ඒ නිසා පාර්ලිමේන්තුවට පත්වෙන නායකයන්ට මේ නිලධාරීන් පසෙකලා වැඩ කරන්න බැහැ.

ගතානුගතික නිලධාරීන් ඉවත් කර හොඳ නිලධාරීන් පත් කරගෙන රට ඉදිරියට ගෙන යායුතුයි. ඒ කලින් තිබුණු පරගැති පාලනය යළි ඇති නොකළ යුතුයි.

දොස්තර ජයරුවන් බණ්ඩාර මහතා ඉවත් කිරීම ගැන කතා කරනවිට සිය සේවය ඉතා හොඳින් ඉටු කළා. කොවිඩ් 19 කොරෝනා වසංගතය වෙනුවන් හොඳ සේවයක් කළා. එවැනි අයෙක්ව මේ ආකාරයට ඉවත් කළාම ඒ මනුස්සයාගේ මානසික තත්ත්වය කුමක්ද?. පාස්කු සිද්ධිය ගැන පොලිස් මාධ්‍ය ප්‍රකාශක කියන දේ ගැන පමණක් කල්පනා කරන්න බැහැ. එහි පිටුපස සිටින්නේ කවුද කියා සොයා බැලිය යුතුයි.




# හොරණට කඩිනමින් නළ ජලය

කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ආසනයට කඩිනමින් ජල සැපයුම ලබාදීමට මේවන විට සැලසුම් සකස් කරමින් පවතියි.

කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ආසනයේ පානීය ජල සැපයුම් සැලැස්ම පිළිබඳ සාකච්ඡාවක්, ජල සම්පාදනඅමාත්‍ය වාසුදේව නානායක්කාර මහතාගේ ප්‍රධානත්වයෙන් ජාතික උරුමය පිළිබද රාජ්‍යඅමාත්‍ය විදුර වික්‍රමනායක මහතාගේ සහභාගීත්වයෙන්

නව රජයේ සෞභාග්‍යය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ක්‍රියාත්මක කරන රටටම පානීය ජලය ලබාදීමේ ජාතික සැලැස්ම අනුව (2021 - 2025) කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ආසනයේ පානීය ජල සැපයුම් සැලැස්ම පිළිබඳ සාකච්ඡාව ඉකුත්දා (8) ජල සම්පාදන අමාත්‍ය වාසුදේව නානායක්කාර මහතාගේ ප්‍රධානත්වයෙන් ජාතික උරුමය පිළිබද රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක මහතාගේ සහභාගීත්වයෙන් ජල සම්පාදන අමාත්‍යාංශයේ දී පැවැත් විණි.

නැගෙනහිර කොළඹ ජල සම්පාදන ව්‍යාපෘතියෙන් ජලය ලබාගෙන 2021 දී මොරගහහේනට පානීය ජලය ලබාදීම සහ මධ්‍ය පරිමාණයේ ජල සම්පාදන ව්‍යාපෘති තුළින් සල්මල් උයන, හදපාන්ගොඩ, වව්ලුගල යන ප්‍රදේශයන්ට පානීය ජලය ලබා දීමට සැලසුම් සැකසීම, ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත කදන ජල සම්පාදන ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ 2025 වන විට හොරණ ආසනය ආවරණය වන පරිදි ජල සම්පාදන ලබාදීම පිළිබඳ වැඩිදුරටත් මෙහිදී සාකච්ඡා කෙරිණි.

හොරණ ප්‍රදේශීය සභාවේ සභාපති අශෝක රණතුංග, උප සභාපති දිලීප් විරක්කොඩි, බුලත්සිංහල හිටපු සභාපති තුසිත කුලරත්න, ජල සම්පාදන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක ජනරාල් සැලසුම් එම්.එස්. බණ්ඩාර, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී සී.සී.එච්.එස්. ප්‍රනාන්දු, අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් සරත් රණසිංහ, මාධ්‍ය ලේකම් කේ.එච්. සංජීව ධම්මික යන මහත්වරු ඇතුළු ජල සම්පාදන අමාත්‍යාංශයේ හා ජාතික ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරීන් මෙම අවස්ථාවට එක් වූහ.

# යටියන්තොට සාන්ත මරියා දේවස්ථානයේ 125 වැනි ජුබිලිය හෙට

වසර 125ක් පැරැණි යටියන්තොට සාන්ත මරියා දේවස්ථානයේ 125 වැනි ජුබිලිය හෙට (11) පැවැත්වීමට කටයුතු සංවිධාන කර තිබේ.

අගරදගුරු මැල්කම් රංජිත් හිමිපානන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන මෙම ජුබිලි මංගල්‍යයේදී නවීකරණය කළ දේවස්ථාන ගොඩනැගිල්ල ආශිර්වාද කිරීමද මෙදින සිදු කිරීමට කටයුතු යොදා ඇත.

යටියන්තොට සාන්ත මරියා දේවස්ථානයේ මීසම් පාලක ඩේමියන් ප්‍රනාන්දු හිමිපානන්ගේ මග පෙන්වීම හා මූලිකත්වයෙන් සිදු කරන මෙම කටයුත්ත සඳහා විශාල පිරිසකගේ දායකත්වය හිමි වී තිබේ. දැනට රටේ පවතින තත්ත්වය අනුව මෙම ජුබිලි මංගල්‍යය ඉතාමත් චාම් අන්දමින් මීසමේ ජනතාව පමණක් සහභාගී කරගනිමින් සෞඛ්‍යාරක්ෂිත නීතිවලට අනුව පවත්වන බව මීසම් පාලක හිමියෝ සඳහන් කළහ. එදින උදෑසන 8ට පමණ දිව්‍ය පූජාව පවත්වා දේවස්ථානය ආශිර්වාද ගැන්වීම සිදු කරන අතර, ප්‍රදේශයේ සියලු ආගමික නායකයන්ගේ සහභාගීත්වයෙන් විශේෂ සර්ව ආගමික

වැඩසටනක් ද පැවැත්වීමට කටයුතු යොදා ඇති බව උන්වහන්සේ සඳහන් කළේය. එසේම මෙම දේවස්ථාන ගොඩනැගීමට මූලිකත්වය ගත් සියලු දෙනාටම ආශිර්වාද කිරීමට හා උපහාර පුද කිරරීම ද මෙදිනම සිදු කිරීමට මීසම් පාලක කමිටුව කටයුතු යොදා තිබේ.

# සෞඛ්‍ය ක්‍රමවේදවලට අනුව කිරි නිෂ්පාදන වෙළෙඳපොළට දෙන්න

## රාජ්‍ය ඇමැති ඩී.බී. හේරත්

පවතින සෞඛ්‍ය ක්‍රමවේද අනුගමනය කරමින් ආරක්ෂක අංශවලට, සෞඛ්‍ය අංශවලට හා රජයට සහාය දෙමින් තම නිෂ්පාදන වෙළඳපොළට යොමු කිරීමට පියවර ගන්නා ලෙස කිරි නිෂ්පාදනයේ හා සත්ත්ව පාලනයේ යෙදෙන ගොවීන්ගෙන්, රාජ්‍ය අමාත්‍ය ඩී.බී. හේරත් මහතා ඊයේ (9) නිවේදනයක් නිකුත් කරමින් දන්වා සිටියේය.

පවතින නිරෝධායන ඇඳිරිනිතී තත්ත්වය නිසා සත්ත්ව පාලනයෙහි නිරත ගොවිජනතාව සහ ව්‍යවසායකයන් හට එක්දින කුකුළු පැටවුන්, කිරි, බිත්තර, සත්ත්ව ආහාර, සත්ත්ව ආහාර අමුද්‍රව්‍ය, සත්ත්ව ඖෂධ, පශු වෛද්‍ය සේවා සැපයීම, ගොවිපොළ සේවක ප්‍රවාහනයේදී සිදුවන ප්‍රවාහන අපහසුතාවන් සම්බන්ධව ගැටලුකාරී තත්ත්වයන් පැන නැගුණු අතර නිසි ක්‍රමවේදයක් යටතේ ඇඳිරිනිතී බලපත්‍ර නිකුත් කිරීමෙන් පවතින ගැටලුකාරී තත්ත්වයන් අවම කරගැනීමට හැකිවනු ඇතැයි ඩී.බී. හේරත් මහතා විශ්වාස කරයි.

අනන්‍යතාව තහවුරු කරන ගොවීන්ට, ව්‍යවසායකයන්ට අදාළ ක්ෂේත්‍රයේ පශු වෛද්‍යවරුන්ගේ නිර්දේශ සහිතව සත්ත්ව ආහාර, සත්ත්ව නිෂ්පාදන ප්‍රවාහනය සඳහා ඇඳිරිනිතී බලපත්‍ර නිකුත් කිරීමට පියවර ගන්නා ලෙස අමාත්‍යාංශ ලේකම්වරයා මඟින් වැඩබලන පොලිස්පතිවරයාට දන්වා තිබේ.

දැනට පවතින කොවිඩ් 19 වසංගතය හේතුවෙන් නිරෝධායන ඇඳිරි නීතිය පවතින ප්‍රදේශවල සත්ව ගොවිපොළ 400ක් පමණ පවතින අතර, බ්‍රොයිලර් සතුන් ලක්ෂ 30ක් පමණ ද, ලේයර් සතුන් ලක්ෂ 35ක් පමණ ද සිටී. එමෙන්ම කුකුල් පැටව් අභිජනන මධ්‍යස්ථාන මෙන්ම සත්ත්ව ආහාර නිෂ්පාදන ආයතන කිහිපයක් ද එම ප්‍රදේශවල පිහිටා තිබේ.

# ලෝකයටම බැටරි හදන්න තරම් මිනිරන් ලංකාවේ තියෙනවා

## ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන් සෙනෙවීර

**ඉන්ද්‍රානි තෝරදෙනිය**

ලෝකයටම බැටරි නිපදවීමට අවශ්‍ය මිනිරන් ලංකාව සතුව පවතින බවත් එම විශේෂිත මිනිරන් වර්ගය ඇත්තේ ලංකාවට පමණක් බවත් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන් සෙනෙවීර මහතා පැවසීය.

මූලික අධ්‍යයන ආයතනය මඟින් වසර පහළොවක පමණ කාලයක් මේ පිළිබඳ පර්යේෂණ සිදු කර බැටරියක් ද නිෂ්පාදනය කර අවසන් බවද ඒ මහතා වැඩි දුරටත් කීවේය.

නිෂ්පාදිත බැටරිය වෙළෙඳ පොළේ පවතින බැටරියට වඩා දිගු කාලයක් පවතින බවත්, කාර්යක්ෂමතාව අතින් 30%කින් වැඩි බවත් අඩු මිලකට නිෂ්පාදනය කරගත හැකි බවත් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයා පැවසීය.

ලෝකයටම අවශ්‍ය බැටරි වර්ග නිෂ්පාදනය කිරීමට වසර දෙසියකට අවශ්‍ය තරම් මේ විශේෂ මිනිරන් සම්පත අප රටේ සතුව පවතින බවද ඒ මහතා කියා සිටියේය.

ඒ පිළිබඳ වැඩි දුරටත් අදහස් දැක්වූ මහාචාර්යවරයා- මූලික විද්‍යාව නැතුව ලෝකයේ කිසිම රටක් දියුණු වී නෑ. ලෝකයේ බොහෝ රටවල් ශ්‍රමය සහ ධනය වැඩි වශයෙන් විද්‍යා පර්යේෂණ සඳහා යොදවන්නේ දියුණුවේ මාවත එය බව දන්නා නිසයි. ජපානය , අමෙරිකාව, ඔස්ට්‍රේලියාව, ජර්මනිය සහ ස්වීඩනය වැනි රටවල් විද්‍යාව මූලික පර්යේෂණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම නිසා ශීඝ්‍රයෙන් දියුණුව කරා පියනඟා තිබෙනවා. විද්‍යාවේ අභිවෘද්ධිය උදෙසා මූලික විද්‍යා පර්යේෂණ සිදු කරන ලංකාවේ තිබෙන එකම ආයතනය මහනුවර පිහිටි ජාතික මූලික අධ්‍යයන අයාතනයයි. මෙය පාර්ලිමේන්තු පනතකින් අනුමත කර 1981 වසරේ පිහිට වූ ආයතනයක්. මෙහි මහාචාර්ය වරුන් විසිහත් දෙනකු, ආචාර්යවරුන් ඇතුළු දෙසීයක පමණ කාර්ය මණ්ඩලයකින් සමන්විතයි.

සෑම ක්ෂේත්‍රයකම මූලික විද්‍යා පර්යේෂණ රටකට ඉතා වැදගත්. ලෝකයේ අන් රටවල් ගත් කළ මූලික විද්‍යා පර්යේෂණ සිදු කිරීම සඳහා ජර්මනියේ මැක්ස් ප්ලාන්ක් ආයතනය, අමෙරිකාවේ හාරවර්ඩ් සහ මක්ස් වර්ඩ් විශ්වවිද්‍යාල, ජපානයේ ටෝකියෝ විශ්වවිද්‍යාලය, ඔස්ට්‍රේලියාවේ CSIRO ඉන්දියාමේ ටාටා ඉන්ස්ටිටියුට් යන ආයතන තිබෙනවා. අපේ රටටත් මෙවැනි ආයතනයක් තිබීම වැදගත්.

රටක දියුණුව ගැන කතා කිරීමේදී රටක දළ ජාතික ආදායම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතු වෙනවා. දළ ජාතික ආදායම වැඩිවන නිෂ්පාදන කෙරෙහි මූලික අවධානය යොමු කළ යුතුයි. රටේ පවතින සම්පත් පිළිබඳ අවධානය යොමු කළ යුතුයි. අපේ රටේ ඉතා වටිනා සම්පත් විශාල ප්‍රමාණයක් තිබෙනවා. අප එම සම්පත් පිළිබඳ මූලික පර්යේෂණ සිදු කරනවා. මිනිරන් එහිදී අප හඳුනා ගත් විශේෂිත සම්පතක්. බැටරි නිෂ්පාදනයට මිනිරන් උපයෝගි කරගන්නා ආකාරය පිළිබඳ මූලික අධ්‍යයන ආයතනය වසර පහළොවක් පමණ පර්යේෂණ සිදු කළා. ලෝකයේ කිසිම රටක නැති ඉතා වටිනා කමින් යුත් මිනිරන් විශේෂයක් අපේ රට සතුව පවතිනවා. මේ මඟින් අප බැටරියක් නිෂ්පාදනය කළා. ඒ ඔස්සේ මොබයිල් පෝන් සඳහා බැටරි, කාර් බැටරි, විදුලි බලය නොමැතිව නිවෙස්වල සියලුම උපකරණ සඳහා පාවිච්චිකළ හැකි බැටරි ඇතුළු ඕනෑම බැටරි වර්ගයක් නිෂ්පාදනය කළ හැකි බවට පර්යේෂණවලින් තහවුරු කරගත හැකි වුණා. අවශ්‍ය තරම් මිනිරන් අපේ රට සතුව පවතිනවා. තව වසර දෙසීයක් ඉදිරියට වුණත් ප්‍ර යෝජනයට ගත හැකි මිනිරන් ප්‍රමාණයක් අප රට සතුයි.

# 'වීඕසී' ගිනි අවි 2ක් සමඟ කොටු වූ සැකකරු රිමාන්ඩ්

**පී. මද්දුමගේ මාවරල සමූහ**

වසර 300කට වඩා පැරණි බව හඳුනාගත් 'වීඕසී' අකුරු සහිත ගිනි අවි දෙකක් සමඟ අත්අඩංගුවට ගත් සැකකරුවකු මාතර ප්‍රධාන මහේස්ත්‍රාත්, අතිරේක දිසාවිනිසුරු ඉසුරු නෙත්තිකුමාර මහතා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව ලබන 19 දා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට නියම කළේය. මෙසේ රක්ෂිත බන්ධනාගාර ගත වූයේ පාලටුව, උනැල්ල පදිංචි, කීරගලගේ දොන් කෝසල දේවේන්ද්‍ර නමැත්තෙකි.

සැකකරු අධිකරණයට ඉදිරිපත් කළ අක්මීමන පොලිස් විශේෂ කාර්ය බළකා ඒකකයේ පොලිස් පරීක්ෂක හේවා පතිරණ මහතා කරුණු දක්වමින් කියා සිටියේ, බුද්ධි අංශ නිලධාරීන්ට ලැබුණ තොරතුරකට අනුව පුරාවිද්‍යාත්මක ගිනි අවි දෙකක් රුපියල් කෝටි දෙකකට විකිණීමට ඇති බවත්, එය උනැල්ල ප්‍රදේශයේ පුද්ගලයකු සතුව ඇති බවත් දැනගන්නට ලැබුණු බවයි. ඒ අනුව පරීක්ෂණ පවත්වන විට මෙම සැකකරු හැඳිනගත් බවත්, ගිනි අවිදෙක මුදලට ඉල්ලා සිටි විට මුදල් පෙන්නන්න කී බවත්, මුදල් ටිකක් පෙන්නූ විට මුළු මුදලම ඕනෑ යැයි කී බවත් හෙතෙම කීවේය.

# විද්‍යුත් අපද්‍රව්‍ය තැපැල් කාර්යාලවලින් එක්රැස් කිරීමේ අවසන් දිනය අද

**බුද්ධිකා ඉඹුලාන**



විද්‍යුත් අපද්‍රව්‍ය තැපැල් කාර්යාල මඟින් එක්රැස් කිරීමේ අවසන් දිනය අද (10) බැවින් නිවාසවල ඇති විද්‍යුත් අපද්‍රව්‍ය ළඟම තැපැල් කාර්යාලයට බාර දෙන ලෙස පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා ඉල්ලීමක් කරයි.

පරිසර දූෂණයට ඉවහල් වන නිවෙස්වල ගොඩ ගසා ගෙන සිටින භාවිතයෙන් ඉවත් කර ඇති විද්‍යුත් අපද්‍රව්‍ය E-WASTE බැහැර කිරීමට විදිමත් වැඩපිළිවෙළක් නොතිබීම නිසා මහජනතාව ඉතාමත් පීඩාවට පත්ව සිටින බව පරිසර අමාත්‍යාංශය වෙත පැමිණිලි ඉදිරිපත් වූ අතර එම නිසා තැපැල් දෙපාර්තමේන්තුව සමඟ එක්ව 650ක් පමණ වන සියලුම තැපැල් කාර්යාලවලින්, විද්‍යුත් අපද්‍රව්‍ය එක්රැස්කිරීමේ සතියක් පසුගිය 2 දා සිට ආරම්භ කෙරිණි.

එහි අවසන් දිනය අදට (10) යෙදී තිබෙන බවත් එම නිසා නිවෙස්වල ගොඩ ගසාගෙන සිටින ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය සියල්ලම ළඟම තැපැල් කාර්යාලය වෙත භාරදෙන්නැයි පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා මහජනතාවගෙන් ඉල්ලීමක් කරයි.

ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍යවල අඩංගු වන ඊයම්, කැඩ්මියම්, ආසනික් වැනි බැරලෝහ වර්ග නිසා මේ වන විට දැවැන්ත පරිසර හානියක් සිදු වේ. ජංගම දුරකතනයකින් ඉවත් කරන බැටරියක් ජල මූලාශ්‍රයකට එක් වුවහොත් ජල ලීටර් 30,000ක් දූෂණය වන බව පර්යේෂණ මඟින් තහවුරු වී තිබේ. එමෙන්ම මෙම ජලය පරිහරණය නිසා වකුගඩු දුර්වලවීම වැනි රෝග රැසක් වැළැදීමට ඉඩ ඇති අතර, විශේෂයෙන් විකිරණ ද්‍රව්‍ය මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍යවල අන්තර්ගත වන බැවින් පිළිකා, ස්නායු ආබාධ සහ වෙනත් මිනිස් සිරුරේ ඉන්ද්‍රිය රෝගවලට ගොදුරුවීමේ හැකියාව මේ වන විටත් ඉහළ ගොස් තිබේ. එම නිසා තැපැල් කාර්යාල ආශ්‍රිතව මෙම වැඩපිළිවෙළ ආරම්භ කළේ හැම කෙනෙකුටම පහසුවෙන් තම නිවසේ ඇති විද්‍යුත්අපද්‍රව්‍ය භාරදීමට ඇති හැකියාව නිසාය.

# ඇඟලුම් කර්මාන්තය කොරෝනාවේ ගොදුරක් වීමට ඉඩ නොදිය යුතුයි

## හිටපු ආණ්ඩුකාර රජිත් කීර්ති තෙන්නකෝන්

**අනුර ප්‍රේමලාල්**

ලංකාවේ ජාතික ආදායමෙන් 44%ක් උපයා දෙන ඇඟලුම් කර්මාන්තය කොරෝනා උවදුරේ ගොදුරක් නොවී රැක ගත යුතුව ඇතැයි හිටපු ආණ්ඩුකාර රජිත් කීර්ති තෙන්නකෝන් මහතා පවසයි.

ඒ මහතා මේ බව පැවසුවේ ඉකුක් දා (8) නාරාහේන්පිට පැවති පුවත් පත් සාකච්ඡාවකට සහභාගී වෙමිනි. එහිදි වැඩිදුරටත් කතා කළ තෙන්නකෝන් මහතා මෙසේද කීය.

ඇඟලුම් කර්මාන්තයේ නිරත සේවක සංඛ්‍යාව 990,000ක් පමණ ඉන්නවා. වාර්ෂිකව ඩොලර් බිලියන 5.3ක ආදායමක් එමඟින් ජාතික ආර්ථිකයට එක් කරනවා.

අද වන විට ඩොලර් බිලයන 5.5ක් දක්වා රටේ ඩොලර් සංචිතය පහත වැටී තිබෙනවා. සෑම මසකම ඩොලර් මිලියන 500කට වැඩි වෙළෙඳ ශේෂයක් අප රටේ පවතිනවා. මේ වසරේ ජූලි දක්වා ඩොලර් මිලියන 3,470 ක වෙළෙඳ හිඟයක් රටේ ආර්ථිකයට බලපා තිබෙනවා.

2019 දී සංචාරක කර්මාන්තයෙන් ඩොලර් බිලියන 3.6ක ආදායමක් රටට ලැබුණු බව මහ බැංකු වාර්තා දක්වනවා. අද සංචාරක කර්මාන්තය බිඳවැටිලා. කොළඹ, ප්‍රධාන නගරවල විදේශ රැකියා කාර්යාල සියල්ලම වැසී ගිහින්. අපේ විශාලතම ආදායම් මාර්ගය වූ විදේශ ශ්‍රමිකයන්ගෙන් ලැබෙන ආදායම නැති වී ගිහින්. මැණික් හා පාෂාණවලින් ලැබෙන ආදායම විදේශ වෙළෙඳම නැවතීම නිසා සම්පූර්ණයෙන්ම නැතිවී ගිහින්. අපේ රටට විදේශ විනිමය ලැබෙන ප්‍රධානතම මාර්ගය ලෙස ඇඟලුම් කර්මාන්තය කෝවිඩ් තත්වය තුළ වුණත් පවත්වාගෙන යෑමට හැකියාව ලැබුණා.

මිනුවන්ගොඩ කර්මාන්ත ශාලාවේ ප්‍රශ්නය නිසා දැන් ඇඟලුම් කර්මාන්තයේ දැවැන්ත කඩාවැටීමක් සිදුවන්න පුළුවන්. එය වළක්වා ගැනීමට රජය වගකීමෙන් පියවර ගත යුතුයි.

නිරෝධායන නොවූ ඉන්දීය ජාතිකයන්ගෙන් කොරෝනා පැමිණි බවට සැකයක් තිබෙනවා.


අපේ ඇඟලුම් ආදායමෙන් 74%ක් අමෙරිකාව, යුරෝපා සංගමය හා එංගලන්තයෙන් ලැබෙනවා. දැනටමත් මේ රටවල්වලින් ආනයන සීමා කිරීම නිසා ලංකාවත් සමග තිබෙන වෙළෙඳ සබඳතා යම් ප්‍රමාණයකට බලපෑමට ලක් වී තිබෙනවා.

# නව කතා-කෙටි කතා-කාව්‍යවලට යෞවන සම්මාන

2020 යෞවන සම්මාන උලෙළේදී සිංහල දෙමළ ඉංග්‍රිසි මාධ්‍යයන්ගෙන් ප්‍රකාශිත නවකතා, කෙටි කතා සහ කාව්‍ය සංග්‍රහ අතරින් විශිෂ්ටතම කෘතියට සම්මාන පිරිනැමීමට ජාතික තරුණ සේවා සභාව කටයුතු සංවිධානය කර ඇත.

වයස අවුරුදු 15ත් 29ත් අතර ලේඛක ලේඛිකාවන්ට 2019 වසරේ ජනවාරි 1 හා 2019 වසරේ දෙසැම්බර් 31 දක්වා ප්‍රකාශිත කෘතිවල පිටපත් 3ක් තම ඉල්ලුම්පත සමඟ යොමු කිරීමෙන් මෙයට සහභාගි විය හැකි. තරගය පිළිබඳ වැඩි විස්තර www.nysc.lk වෙබ් අඩවියෙන් හෝ 0112-746601 සංස්කෘතික අංශය ඇමතීමෙන් ලබා ගත හැකිය.

# කිරිවෙහෙර රාජමහා විහාරයට එන බැතිමතුන්ට සෞඛ්‍ය ආරක්ෂක ක්‍රමවේද



**රත්නසිරි පතිරණ**

ඓතිහාසික රුහුණු කතරගම මහා දේවාලය කිරිවෙහෙර රාජමහා විහාරය වැඳපුදා ගැනීමට එන බැතිමතුන් සඳහා සෞඛ්‍ය අංශ ලබාදී ඇති උපදෙස් අනුව සෞඛ්‍ය ආරක්ෂක ක්‍රම සියල්ල හොඳින් ක්‍රියාත්මක කරන බව කතරගම ශ්‍රී අභිනවාරාමාධිපති රුහුණු මාගම් පත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝනායක කපුගම සරණතිස්ස හිමියෝ පැවසූහ.

පුදබිමට පැමිණෙන බැතිමතුන් සියලුදෙනා මුඛ ආවරණ පැළඳීම, දෑත් සේදීම, එකිනෙකා අතර දුරස්ථභාවය තබාගැනීම ආදී සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම අකුරටම ක්‍රියාත්මක කිරීමට සෑම කෙනෙකුගේම වගකීම සහ යුතුකම බව සඳහන් කළ සරණතිස්ස හිමියෝ රුහුණු කතරගම මහා දේවාලයේ පුදපූජා කටයුතු නියමිත පරිදි සිදු කරන බවද සඳහන් කළහ.

කතරගම පුදබිම කොවිඩ් - 19 වසංගත රෝගය නොමැති සුරක්ෂිත පුදබිමක් ලෙස පවත්වාගෙන යෑමට බැතිමතුන්ගේ සහාය ලබාදීම මේ මොහොතේ අත්‍යවශ්‍ය කරුණක් බවද උන්වහන්සේ වැඩිදුරටත් සඳහන් කළහ.

ඡායාරූපය - උපාලි ජයරත්න



ජාත්‍යන්තර තැපැල් දින සැමරුම ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජගත් පී. විජේවීර මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ තැපැල් දෙපාර්තමේන්තුවේදී පැවැත්විණි. එහිදී නව තැපැල් ලාංඡනය සහිත වැන් රථ නිල වශයෙන් ධාවනයට එක්කිරීමත්, නව මුද්දර 4ක් සහිත මුල් දින කවරයක් නිකුත් කිරීම ද සිදු විණි.

තැපැල්පති රංජිත් ආරියරත්න මහතා අමාත්‍යාංශ ලේකම් ජගත් පී. විජේවීර මහතා වෙත එම මුල් දින කවරය පිරිනැමූ අයුරු. මේ සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජෙනරාල් නාලක කලුවැව මහතා ද සහභාගී විය.

ඡායාරූපය - රොෂාන් පිටිපන

# ශ්‍රී ලාංකික පසුබිමක් ඇති චූලාන් ජයසිංහ හියුම් කවුන්සල් ඡන්දයට



**අනුර ප්‍රේමලාල්**

ශ්‍රී ලාංකික අභිමානය ජාත්‍යන්තරයට ගෙන යමින් චූලාන් ජයසිංහ මෙවර හියුම් කවුන්සල් මැතිවරණයට ඉදිරිපත්ව සිටියි.

මොහු ඕස්ට්‍රේලියාවේ උපන් ශ්‍රී ලාංකික පසුබිමක් සහිත 18 හැවිරිදි විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකි. එළඹෙන හියුම් කවුන්සිල් මැතිවරණය සඳහා ඉදිරිපත් වීමට චූලාන් අදහස් කර ඇත්තේ කවුන්සලයේ සාමාජිකයකු සතුවිය යුතු ගුණාංග නායකත්වය සහ සංවිධානාත්මක හැකියාවන් තමා සතුව ඇති බව තහවුරු කරමින්ය. එසේම තවදුරටත් නව අත්දැකීම් තුළින් එකී හැකියාවන් වර්ධනය කර ගැනීමට හෙතෙම උත්සහ කරන බව කියයි.

මානසික සෞඛ්‍ය වර්ධනයත්, පාරිසරික සුරක්ෂිතතාවයත්, සුරක්ෂිත පුරවරයක් සහ තරුණ සංවර්ධනය යනාදිය මූලික ප්‍රතිපත්ති ගැන සිය මැතිවරණයේදී ඔහු අවධානයට ලක් කරයි.

# සිංහල කවි සම්මේලනයේ නිලවරණය කල් යයි

මේ මස 18 වැනි දින මාලබේ පිට්ටුගල ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේදි පවත්වන්නට තිබූ සමස්ත ලංකා සිංහල කවි සම්මේලනයේ නිලවරණය සහ වාර්ෂික මහා සභා රැස්වීම රටේ පවතින කොරෝනා වයිරස් තත්ත්වය හේතුවෙන් දින නියමයක් නැතිව කල් ගිය බව එම සංගමයේ ලේකම් දමුණුපොළ සුමනසිරි හිමියෝ දන්වා සිටී.

# කුණු එවූවාට එංගලන්තයෙන් කෝටි 1,69ක වන්දියක් ඉල්ලයි

**අමෝදා ජයහම**

බාසල් සම්මුතිය කඩ කරමින් 2017-2018 වර්ෂවලදී එංගලන්තයෙන් කසළ බහාලුම් ආනයනය කිරීම නිසා සිදු හානියට රුපියල් 1,694,274,751 ක වන්දි මුදලක් ලබා දෙන ලෙස ශ්‍රී ලංකාව බාසල් සම්මුති කාර්යාලයෙන් ඉල්ලීමක් කර ඇත.

කොළඹ වරායේ අංගනයක රඳවාගෙන තිබූ කසළ බහාලුම් 133න් 21ක් මේ වන විට පරීක්ෂණ කටයුතු අවසන් වී ඇති බැවින් එම බහාලුම් 21 පසුගිය සැප්තැම්බර් මස 27 වැනි දා එක්සත් රාජධානිය වෙත ආපසු යැවීමට කටයුතු කෙරිණි.

එමෙන්ම ඉන් ඉතිරි කසළ බහාලුම් 112හි පරීක්ෂණ කටයුතු අවසන් වූ වහාම එක්සත් රාජධානිය වෙත නැවත යැවීමට ශ්‍රී ලංකා රේගු දෙපාර්තුමේන්තුව සමඟ පරිසර අමාත්‍යාංශය මේ වන විට කටයුතු කරමින් සිටී.

බාසල් සම්මුතිය කඩකරමින් 2017-218 වර්ෂවල දී මෙරටට ගෙන්වා ඇති කසළ බහාලුම් 263ක් බහාලුම් 130ක් පෞද්ගලික සමාගමක් කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ අංගනය රඳවාගෙන ඇති අතර, ඉතිරි බහාලුම් 133 කොළඹ වරායේ අංගනයක රඳවාගෙන තිබිණි.

බාසල් සම්මුතියට අනුව, වෙනත් රටකින් තවත් රටකට කසළ ගෙන්විය හැක්කේ රටවල් දෙකෙහිම කැමැත්ත මත පමණි.

නමුත් එක්සත් රාජධානියේ වෙසෙන ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පුද්ගලයකු ශ්‍රී ලංකාවෙහි වෙසෙන තම සහෝදරයකුගේ සහය ඇතිව මේ ආකාරයෙන් කසළ බහාලුම් මෙරටට ගෙන්වා ඇත.

බාසල් සම්මුතිය කඩකරමින් මෙරටට ගෙන්වා ඇති කසළ බහාලුම් ප්‍රතිඅපනයනය කිරීම සම්බන්ධයෙන් බාසල් සම්මුතියහි විෂය ප්‍රකාරව හා නියමිත ක්‍රමවේදයට යටත්ව බාසල් සම්මුතියේ ලේකම් කාර්යාලයට පැමිණිල්ලක් කළ බව පරිසර අමාත්‍යාංශය නිවේදනයක් නිකුත් කරමින් පවසයි.


**නිල ප්‍රතිඵල**

NLB



දිරූ දිරි සම්පත

தரு திரி சம்பத DARU DIRI SAMPATHA

| | |
|---|---|
| දිනය | 2020/10/08 |
| දිනුම් වාරය | 022 |

ඉංග්‍රීසි අකුර: P

ජයග්‍රාහී අංක: 07 19 26 32

| | සංයෝග | තෑගි | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 04 ගැලපේ නම් | රු. 1,000,000/- බැගින් | - |
| 2 ත්‍යාගය | අංක 3 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 50,000/- බැගින් | 02 |
| 3 ත්‍යාගය | අංක 3 ක් ගැලපේ නම් | රු. 1,000/- බැගින් | 86 |
| 4 ත්‍යාගය | අංක 2 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 500/- බැගින් | 156 |
| 5 ත්‍යාගය | අංක 2 ක් ගැලපේ නම් | රු. 100/- බැගින් | 3,960 |
| 6 ත්‍යාගය | අංක 1 ක් සමග ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 40/- බැගින් | 2,139 |
| 7 ත්‍යාගය | අංක 1 ක් ගැලපේ නම් | රු. 20/- බැගින් | 53,276 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම් | රු. 20/- බැගින් | 7,918 |

මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල
රු. 1,969,440/-

මීළඟ සුපිරි ත්‍යාගය
රු. 6,885,143.60

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන: 011 4607000, 011 2324324 ෆැක්ස්:011 4669416
වෙබ්:www.nlb.lk


## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## සංචාරක අමාත්‍යාංශය

## ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

# ලංසු කැඳවීම

## ඉදිකිරීම්, අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදුකිරීම - 2020

01. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් පහත ඉදිකිරීම්, අලුත්වැඩියා හා නඩත්තු සඳහා එම කොන්ත්‍රාත් සඳහා ව්‍යාපාර ලෙස ලියාපදිංචි වී ඇති ආයතන වලින් මුද්‍රා තබන ලද ලංසුපත් භාරගනු ලැබේ.

| අනු අංකය | ඉදිකිරීම් කාර්යයේ නම | කොන්ත්‍රාත් අංකය | අවම ICTAD ලියාපදිංචිය | ලංසු ආරක්ෂණ වටිනාකම රු. | ආපසු නොගෙවන ලංසු අයදුම්පත්‍ර ගාස්තුව (රු.) |
|---|---|---|---|---|---|
| 01 | රාජකීය උද්භිද උද්‍යානයේ ගේබියන් බැමි හා කානු පද්ධතියක් ඉදිකිරීම | DN/BG/F6/Pro/RBG/Gabion wall/2020-37 | C7, වාරිමාර්ග හා ඉඩම් සංවර්ධනය, වැලිකඩන හා ගල්වැටි සංවර්ධන | 80,000.00 | 3,000.00 |

(ලංසු කැඳවීම දීප ව්‍යාප්ත ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටියට අනුව සිදු කරනු ලැබේ. ලංසු ආරක්ෂණ වටිනාකම ලංසුව විවෘත කරන දින සිට දින 90 ට ලබාගත යුතුය)

03. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2020.10.12 දින සිට 2020.11.02 දින දක්වා කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ඒ ඒ කාර්යයට අදාළ ආපසු නොගෙවන ලංසු අයදුම්පත් ගාස්තුවක් ගෙවා (එක් කට්ටලයක් සඳහා) ලංසු ආකෘති පත්‍ර පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශයෙන් ලබාගත හැකිය. ලංසු ආකෘති ලබා ගැනීම සඳහා ICTAD / CIDA ලියාපදිංචි පොත (මුල් පිටපත) හා ආයතනයේ ලිපි ශීර්ෂයෙන් ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

04. ඉහත සඳහන් ලංසු ආරක්ෂණය රජයේ පිළිගත් වාණිජ බැංකුවකින් ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොමැති නම් එම ලංසු ආරක්ෂණය මුදලින් පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ තැන්පත් කළ හැකිය. ලංසු ලියවිලි සමග ලංසු ආරක්ෂණය ඉදිරිපත් කර නොමැති ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. සම්පූර්ණ කරන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව විධිමත් පරිදි මුද්‍රා තබා (මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර) 2020.11.03 දින පෙ.ව. 10.30 ට පෙර **සභාපති, දෙපාර්තමේන්තු මහ පරිමාණ ප්‍රසම්පාදන කමිටුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, තැ.පෙ. 14, පේරාදෙණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම කාර්ය සඳහා මුදල් අංශයේ තබා ඇති මහ පරිමාණ ප්‍රසම්පාදන බහාලුම් පෙට්ටියට දැමිය යුතු වන අතර, ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසුපත් භාරගැනීම අවසන් වූ වහාම ලංසුපත් විවෘත කරන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක. ලංසුපත් බහා එවන ලියුම් කවරවල වම්පස ඉහළ කෙළවරේ අදාළ කොන්ත්‍රාත්තුවේ නම සඳහන් කළ යුතු අතර, ඒ ඒ ලිපි කවර වල අදාළ කොන්ත්‍රාත් ආයතනයේ ද නම සඳහන් කළ යුතුය.

06. ලංසුපත් පිළිබඳ තීරණ ගැනීමේ සම්පූර්ණ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය සතුවන අතර, මෙම නිවේදනයේ හෝ ලංසු ආකෘතීන්හි සඳහන් හෝ සඳහන් නොවන මෙම ප්‍රසම්පාදන කාර්යයට අදාළ කිසියම් කාරණයක් පිළිබඳ තීරණයක් ලබා දීමේ බලය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වේ. (මේ පිළිබඳ වැඩිමනත් විස්තර 081-2388293 දුරකථනය මගින් මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී ඇමතීමෙන් ලබාගත හැක.)

**සභාපති,**
**දෙපාර්තමේන්තු මහ පරිමාණ ප්‍රසම්පාදන කමිටුව,**
**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.**
**2020.10.07**


**2020-10-08 - ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකල මුළු ත්‍යාග ලාභීන් සංඛ්‍යාව 638,262**

**ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල 27,456,370.00**

**රු. 2,000,000.00 ත්‍යාග 02 රු. 1,000,000.00 ත්‍යාග 01 රු. 100,000.00 ත්‍යාග 25**

NLB NATIONAL LOTTERIES

www.nlb.lk

දිනුම් වාරය - 4269 නිල ප්‍රතිඵල

NLB

**මහජන සම්පත**

දිනය: 2020-10-08

ජයග්‍රාහී අක්ෂරය: G ජයග්‍රාහී අංක: 2 0 5 6 1 0

ත්‍යාග රටාව - අග සිට මුලට

| | | | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 වැනි ත්‍යාගය | 2 0 5 6 1 0 | රු. 2,000,000/- | 02 |
| 2 වැනි ත්‍යාගය | 0 5 6 1 0 | රු. 100,000/- | 11 |
| 3 වැනි ත්‍යාගය | 5 6 1 0 | රු. 10,000/- | 108 |
| 4 වැනි ත්‍යාගය | 6 1 0 | රු. 1,000/- | 1,073 |
| 5 වැනි ත්‍යාගය | 1 0 | රු. 100/- | 10,658 |
| 6 වැනි ත්‍යාගය | 0 | රු. 20/- | 105,482 |

ත්‍යාග රටාව - මුල සිට අගට

| | | | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 7 වැනි ත්‍යාගය | 2 0 5 6 1 | රු. 10,000/- | 09 |
| 8 වැනි ත්‍යාගය | 2 0 5 6 | රු. 1,000/- | 107 |
| 9 වැනි ත්‍යාගය | 2 0 5 | රු. 100/- | 1,086 |
| 10 වැනි ත්‍යාගය | 2 0 | රු. 50/- | 10,601 |
| 11 වැනි ත්‍යාගය | G | රු. 20/- | 42,341 |

දිනා ඇති මුළු ත්‍යාග මුදල - රු. 12,110,910.00

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 23,491,900.00

NLB ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01
දුරකථන: 011-4607000, 011-2324324. Fax: 011-4669416.
www.nlb.lk

ට්‍රිපල් ජැක්පොට් Mega POWER මෙගා පවර් மெகா பவர்

දිනුම් වාරය 636

NLB NATIONAL LOTTERIES

නිල ප්‍රතිඵල

දිනය: 2020.10.08

ඔබ දිනවන ඔබේ විශ්වාසය

ඉංග්‍රීසි අකුර: P සුපිරි අංකය / ජයග්‍රාහී අංක: 01 27 39 44 77

| | ත්‍යාග රටාව | ත්‍යාග මුදල රු. | ජයග්‍රාහකයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 වන ත්‍යාගය | අංක 4 ක් පමණක් ගැළපේ නම් | 1,000,000.00 | - |
| 2 වන ත්‍යාගය | අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 100,000.00 | 05 |
| 3 වන ත්‍යාගය | අංක 3 ක් පමණක් ගැළපේ නම් | 1,000.00 | 100 |
| 4 වන ත්‍යාගය | අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 500.00 | 246 |
| 5 වන ත්‍යාගය | අංක 2 ක් පමණක් ගැළපේ නම් | 100.00 | 6,287 |
| 6 වන ත්‍යාගය | අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 40.00 | 4,021 |
| 7 වන ත්‍යාගය | අංක 1 ක් පමණක් ගැළපේ නම් | 20.00 | 101,198 |
| 8 වන ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම් | 20.00 | 18,586 |

මීළඟ මෙගා සුපිරි ත්‍යාගය රු. 52,597,256.00

මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 11,867,695.60

මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය රු. 19,328,817.20

දිනා ඇති මුළු මුදල රු. 3,908,220.00

- රු. ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
නො. 32,එන්.ඩබ්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01
දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585
ෆැක්ස්: 0112 433 631,
වෙබ් අඩවිය: www.nlb.lk

**වාසනා සම්පත**

வாசனா சம்பத Vasana Sampatha

NLB ජාතික ලොතරැයිය

එදත් අදත් සුරයා

| නිල ප්‍රතිඵල | |
|---|---|
| දිනුම් වාරය | 1620 |
| දිනය | 2020.10.08 |

U 33 54 67 69

| ත්‍යාගය | ත්‍යාග රටාව | ත්‍යාග මුදල | ජයග්‍රාහකයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 ත්‍යාගය | අංක 4 පමණක් ගැළපේ නම් | 1,000,000/- | 01 |
| 02 ත්‍යාගය | අංක 3ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 100,000/- | 01 |
| 03 ත්‍යාගය | අංක 3ක් පමණක් ගැළපේ නම් | 2,000/- | 77 |
| 04 ත්‍යාගය | අංක 2ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 500/- | 140 |
| 05 ත්‍යාගය | අංක 2ක් පමණක් ගැළපේ නම් | 100/- | 3,708 |
| 06 ත්‍යාගය | අංක 1ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 60/- | 2,245 |
| 07 ත්‍යාගය | අංක 1ක් පමණක් ගැළපේ නම් | 20/- | 53,997 |
| 08 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම් | 20/- | 8,889 |

මෙවර දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 3,087,220.00

මීළඟ වාරයේ සුපිරි ත්‍යාගය රු. 24,216,550.40

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
32, දේශමාන්‍ය N.W.J. මුදලිගේ මාවත, කොළඹ 01.

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි.

**ගොවි සෙත**

නිල ප්‍රතිඵල

NLB NATIONAL LOTTERIES

දිනුම් වාරය 2564 දිනුම් අදින ලද දිනය 2020.10.08

ඉංග්‍රීසි අක්ෂරය: K ජයග්‍රාහී අංක: 07 22 23 70

| | සංයෝගය | තෑගි මුදල | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 4 ම නිවැරදි | රු. 1,000,000.00 | - |
| 2 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 3 ක් නිවැරදි | රු. 100,000.00 | 08 |
| 3 ත්‍යාගය | අංක 3 ක් පමණක් නිවැරදි | රු. 2,000.00 | 168 |
| 4 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 2 ක් නිවැරදි | රු. 1,000.00 | 378 |
| 5 ත්‍යාගය | අංක 2 ක් පමණක් නිවැරදි | රු. 100.00 | 9466 |
| 6 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමග අංක 1 ක් නිවැරදි | රු. 40.00 | 6273 |
| 7 ත්‍යාගය | අංක 1 ක් පමණක් නිවැරදි | රු. 20.00 | 155286 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් නිවැරදි | රු. 20.00 | 28167 |

මෙම දිනුම් වාරයේ බිහි වූ ජයග්‍රාහකයන් ගණන 199,746

මෙවර දිනා ඇති මුළු තෑගි මුදල රු. 6,380,580.00

ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 62,787,465.20

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 සහ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති වලට යටත්වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යවේ.



ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD

නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන : 0114 607 000, 0112 324 324
ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk

# ලුහුඬු දැන්වීම්

## වෙළෙඳ

## නිවාස හා ඉඩම්

233

**යන්ත්‍රෝපකරණ හා මෙවලම්**

විකිණීම

විකිණීමට - ආනයනය කළ කම්බි දිග හැරීමේ සහ කැපීමේ යන්ත්‍රයක් වහාම විකිණීමට. පාවිච්චිය මාස 03 ක් පමණයි. හොඳ තත්වය ධාරිතාවය මිමී 6 සිට මිමී 16 දක්වා. 0773930800 / 0775789109

*061641*

618

**ගේ දෙර ඉඩකඩම්**

**කළුතර**
දිස්ත්‍රික්කය

විකිණීමට

පානදුර, ගොරකපොළ, (පැරණි කොළඹ පානදුර මාර්ගය) පර්චස් 20.95 ක නේවාසික හා වාණිජ තෙමහල් ගොඩනැගිල්ල, මාර්ගය ඉදිරිපස වහාම විකිණීමට. බිම් මහල සාප්පු ඒකක තුනක් සමග නිදන කාමර පහක්, නාන කාමර තුනක්, ලොබිය, බැල්කනිය හා පැන්ට්‍රිය සහිතය. ව. අඩි 3350, හොඳ නේවාසික ප්‍රදේශයක පිහිටීම. දුරකථනය 0773930800 / 0777634791

*061314*

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.**

**බෙස්ට් ලෑන්ඩ්ස් පුද්ගලික සමාගම**

සමාගම් අංකය : PV 124377

ලියාපදිංචි කාර්යාලය :

නො. 305/B, වැබොඩ,
නැගෙනහිර, වැබොඩ.

සංස්ථාගත කළ දිනය :
2017 අගෝස්තු 01

**නම වෙනස් කිරීමයි**

කොළඹ දිස්ත්‍රික්කයේ කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 163/18/19 ඥණානන්ද හිමි මාවත මෙගොඩ කොළොන්නාව, වැල්ලම්පිටිය, ලිපිනයේ පදිංචි **මාහිංගොඩ ගෙදර සුසුන් මදුසංක රත්නායක** වන මා මෙතැන් පටන් **මොහොමඩ් නව්ෂඩ් මොහොමඩ් ෆසාල්** යනුවෙන් භාවිත කරන බව ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මෙයට, මොහොමඩ් නව්ෂඩ්
මොහොමඩ් ෆසාල්

## වාර්ෂික මහා සභාව

වාර්ෂික මහා සභාව 2020 ඔක්තෝබර් 11 වැනි දින උදේ 10.30 දෙදියවල පන්සලේදී පැවැත්වේ. ලියාපදිංචි සාමාජික මහතුන් කැඳවීමේ ලිපිය සමගින් කොරෝනා නීතිරීතිවලට අවනතව පැමිණිය යුතුය. මෙදින ආරාධිත අප සමිතියේ අනුශාසක මහා නාහිමි සහ සමස්ත බොදු සංගමයේ ලේකම් ඒකනායක මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුවෙන බව කරුණාවෙන් මතක් කරමි.

**ලේකම් අයි. සිරිවර්ධන,**
**කළුතර බෝධි ආරක්ෂක සමිතිය**

## - නිවැරදි කිරීමකි -

### ලංසු සඳහා ආරාධනයයි

**පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

**පළාත් පාලන සංවර්ධන සහාය ව්‍යාපෘතිය**

**ව්‍යාපෘති හඳුනා ගැනීමේ අංකය - P163305**

**නැගෙනහිර පළාත - ත්‍රිකුණාමලය**

2020 ඔක්තෝම්බර් මස 03 දින දිනමිණ පුවත්පතේ 19 පිටුවේ පළ වූ දැන්වීමේ "අනු අංක 07 යටතේ මොරවැව ප්‍රාදේශීය සභාවේ අවශ්‍ය ශ්‍රේණිය හා විශේෂඥතාවය C 7 හා C 8 මාර්ග ඉදිකිරීම" යනුවෙන් නිවැරදි විය යුතු බව කරුණාවෙන් සලකන්න. පෙර පලකරන ලද දැන්වීමේ සඳහන් අනෙකුත් සියලු විස්තර නොවෙනස්ව පවතී.

**සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**පළාත් පාලන සංවර්ධන සහාය ව්‍යාපෘතිය (LDSP),**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය.**

## නිව් ඩී.පී.ෆැෂන් ගාමන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්

**සමාගමේ ලියාපදිංචි අංකය PV 3841**

**2007 අංක 07 දරන සමාගම් පනතේ පරිවෘත කිරීමේ නියෝගය සහ සංඩිය ඈවරකරුවන්ගේ පත්වීමේ දැන්වීම**

| | |
|---|---|
| සමාගමේ නම | නිව් ඩී.පී.ෆැෂන් ගාමන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : අසෝකාරාම පාර, කුන්දෙනිය, දික්වැල්ල |
| උසාවිය | : බස්නාහිර පලාතේ වාණිජ මහාධිකරණය |
| නඩු අංකය | : HC(CIVIL) 76/2019/CO |
| නියෝගය දුන් දිනය | : 2020 ජනවාරි 29 |
| පෙත්සම ඉදිරිපත් කල දිනය | : 2019 සැප්තැම්බර් 25 |
| සංඩිය ඈවරකරුවන්ගේ නම් | : පිංචබඩුගේ එක්සිරි අරුණ ජයවික්‍රම සහ පෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් |
| ලිපිනය | : සංඩිය ඈවරකරුවෝ 3 වන මහල, නො.11, කාසල් පටුමග, කොළඹ 04 |
| පත්වීමේ දිනය | : 2020 ජනවාරි 29 |

## උකස් රන් භාණ්ඩ වෙන්දේසිය

මහජන බැංකුවේ රන් භාණ්ඩ උකස් ගැනීමේ නියෝජිත වන සී/ස බදුල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ

**බදුල්ල, කහටරුප්ප, කැන්දගොල්ල බටහිර, රඹුක්පොත, දෙබැද්ද, මයිලගස්තැන්න, කැන්දගොල්ල නැගෙනහිර, තල්දෙන, හිඟුරුගමුව වෙලේකඩේ සහ පුවක්ගොඩමුල්ල**

යන ග්‍රාමීය බැංකු ශාඛාවල 2018-01-01 දින සිට 2019-07-31 දින ද ඇතුළත්ව එම දිනය දක්වා උකස් කරන ලද එහෙත් මෙතෙක් බේරා නොගත් රන් භාණ්ඩ **2020-10-25 යන දින පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා සී/ස බදුල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ රැස්වීම් ශාලාවේදී** ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**සාමාන්‍යාධිකාරී,**
**සී/ස බදුල්ල විවිධ සේවා සමුපකාර සමිතිය,**
**මයිලගස්තැන්න, බදුල්ල.**
**055-4936091/095.**

# ප්‍රසම්පාදන දැන්වීම

## 2021 වර්ෂය සඳහා ලුණුගල ප්‍රාදේශීය සභාවට අයත් දේපළ බදු දීම.

ලුණුගල ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් දේපළයන් හි ව්‍යාපාර පවත්වාගෙන යාමේ අයිතිය 2021-01-01 දින සිට 2021-12-31 දක්වා අවුරුද්දක කාලයකට බදු දීම පිණිස ප්‍රසම්පාදන ඉල්ලුම්පත් භාරගනු ලැබේ.

- **ප්‍රසම්පාදන ඉල්ලුම්පත් නිකුත් කිරීම -** 2020-10-12 සිට 2020-10-26 දින පෙ.ව. 10.00 දක්වා
- **ප්‍රසම්පාදන ඉල්ලුම්පත් භාර ගැනීම -** 2020-10-26 දින දවල් 12.00 දක්වා
- **ප්‍රසම්පාදන ඉල්ලුම්පත් විවෘත කිරීම -** 2020-10-26 වන දින ප.ව. 1.00 ට

| අනු අංකය | දේපළ විස්තරය |
|---|---|
| 01. | ලුණුගල කරදිය මාළු වෙළෙඳසැල අංක 01 |
| 02. | ලුණුගල කරදිය මාළු වෙළෙඳසැල අංක 02 |
| 03. | ලුණුගල මිරිදිය මාළු වෙළෙඳසැල |
| 04. | මඩොල්සිම කරදිය හා මිරිදිය මාළු වෙළෙඳසැල |
| 05. | ලුණුගල ඉරිදා සතිපොළ |

වැඩි විස්තර 055-2263978 විමසීමෙන් හෝ www.lunugala.ps.gov.lk වෙබ් ලිපිනයෙන් හෝ කාර්යාලයට පැමිණ ලබා ගත හැකිය.

**සභාපති, ලුණුගල ප්‍රාදේශීය සභාව,**

**2020-10-08 වන දින ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදීය**

# ප්‍රසම්පාදන දැන්වීමයි

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC)

**සපුගස්කන්ද නයිලෝන් හය පරිශ්‍රයේ ඇති නිශ්චල අයිතම, පාවිච්කළ ටයර් සහ ඩිජිටල් වායු මීටර් සහ කොළොන්නාව කෘෂි රසායනික යන්ත්‍රාගාරයේ ඇති අපවිත්‍ර නොවූ කෘෂිරසායනික අපවිත්‍ර ද්‍රව්‍ය බැහැර කිරීම**

**B/45/2020**

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් සපුගස්කන්ද EX Nylon 06 පරිශ්‍රයේ සහ කොළොන්නාව කෘෂිරසායනික යන්ත්‍රාගාරයේ ඇති පහත සඳහන් අයිතම බැහැර කිරීම සඳහා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

ලොට් A : පිරවුම්හල්වල මෙහෙයුම් කටයුතුවලින් ලැබුණු ඩිජිටල් වායුමීටර් ඇතුළුව නිශ්චල අමතර කොටස්

ලොට් B : පාවිච්චි කළ ටයර්

ලොට් C : කොළොන්නාව කෘෂිරසායනික යන්ත්‍රාගාරයෙන් ඉවත් කරන පොලිතින් කාඩ්බෝඩ් ඇසුරුම් ද්‍රව්‍ය සහ ලී පුවරු (Wooden Pallets) (අපවිත්‍ර නොවූ)

2020-10-29 වන දින දක්වා 900 පැයත් 1500 පැයත් අතර, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත රු. 500/- (එනම් 469.96 + 8%VAT) ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව කොළඹ 09, වෛද්‍ය ඩැනිස්ටර් ද සිල්වා මාවතේ නො.609, 1 වන මහලේ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා) කාර්යාලය වෙතින් ලංසු ලිපිලේඛන ලබාගත හැකිය.

2020-11-02 වන දි 1400 පැයට ලංසු භාරගැනීම අවසාන කරනු ලබන අතර, අනතුරුව වහාම කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා) කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ.

බැහැර කිරීමට නියමිත අයිතම සපුගස්කන්ද Ex Nylon 06 පරිශ්‍රයේ සහ කොළොන්නාව කෘෂිරසායනික යන්ත්‍රාගාරයේ තබා ඇති අතර, කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා) සමග කලින් වේලාවක් වෙන්කර ගැනීමෙන් 2020-10-29 වන දින දක්වා අයිතම පරීක්ෂා කළ හැකිය.

මේ පිළිබඳ පැහැදිලි කරගැනීම් වෙතොත් දුරකථන අංක. 5455330, 5666225 හෝ ෆැක්ස් අංක 5455424 ඔස්සේ කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා) වෙතින් සිදුකළ හැකිය.

**සභාපති,**
**ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව,**
**1 වන මහල, නො.609, වෛද්‍ය ඩැනිස්ටර්ද සිල්වා මාවත,**
**කොළඹ 09.**

# කොළඹ මහා නගර සභාව

## නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව

## 2021 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

2021 වර්ෂය සඳහා කොළඹ මහා නගර සභාව සමග ලියාපදිංචි වීම සඳහා කොන්ත්‍රාත්කරුවන් වෙතින් අයදුම්පත් මා විසින් කැඳවනු ලැබේ. කොළඹ මහා නගර සභාව සමග ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන පහත සඳහන් වර්ගීකරණවල කොන්ත්‍රාත්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබති.

01. CIDA C ශ්‍රේණියේ ගොඩනැගිලි ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්
02. CIDA C ශ්‍රේණියේ ජල සම්පාදන හා ජලාපවහන කොන්ත්‍රාත්කරුවන්
03. CIDA C ශ්‍රේණියේ කුණාටු ජලාපවහන කොන්ත්‍රාත්කරුවන්
04. CIDA SP/F ශ්‍රේණියේ ඇලුමිනියම් සහ නිමාකිරීමේ කොන්ත්‍රාත්කරුවන්
05. CIDA SP/F ශ්‍රේණියේ භූමි (මාර්ග) නිමා කිරීමේ කොන්ත්‍රාත්කරුවන්
06. CIDA SP/F ශ්‍රේණියේ සැමිදර්ශන සකස් කිරීමේ කොන්ත්‍රාත්කරුවන්
07. CIDA EM ශ්‍රේණියේ විදුලි සවිකිරීම් (අඩු වෝල්ටීයතා / මධ්‍යම වෝල්ටීයතා) කොන්ත්‍රාත්කරුවන්
08. CIDA SP ශ්‍රේණියේ ජලරෝධක කොන්ත්‍රාත්කරුවන්
09. ස්මාරක මූර්ති සැපයීමේ සහ සවිකිරීමේ කොන්ත්‍රාත්කරුවන් (මාබල්, ග්‍රැනයිට්, ටෙරාසෝ, කොන්ක්‍රීට් ආදිය) CIDA ශ්‍රේණිය අවශ්‍ය නොවේ.

අයදුම්පත් ඉදිරිපත් කරන්නන් සතුව කොළඹ 07 විජේරාම මාවතේ අංක 123 දරන ස්ථානයේ පිහිටි ඉදිකිරීම් කර්මාන්ත අධිකාරියේ (CIDA) වලංගු ලියාපදිංචිය සහ (ඉහත අංක 1 සිට 8 දක්වා) වලංගු ව්‍යාපාර ලියාපදිංචි සහතිකය තිබිය යුතුය. රජයේ ටෙන්ඩර් පටිපාටියහී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.4 ට අනුකූලව මිල සැඳහුම් ප්‍රසම්පාදන වර්ගීකරණය යටතේ රු. මිලියන 5 ක් දක්වා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවීමට කොළඹ මහා නගර සභාවට අයිතිය ඇත. එසේ වුවද තරගකාරිත්වය වැඩි කිරීමට අවශ්‍ය වූ විටක ඕනෑම වටිනාකමක ව්‍යාප්තියක් සඳහා පුවත්පත්වල විවෘත ටෙන්ඩර් කැඳවීමට කොළඹ මහා නගර සභාවට අයිතිය ඇත.

රු. 1080.00 ක (වැට් ඇතුළුව) ආපසු නොගෙවන ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව කොළඹ 07, නගර ශාලාවේ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ව්‍යාපාර ලිපි ශීර්ෂයක් මත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් අදාළ අයදුම්පත් මිලදීගත හැකිය. එක් එක් වර්ගීකරණය සඳහා රු. 2000.00 ක ලියාපදිංචි වීමේ ගාස්තුවක් කලින් අයකරගනු ලැබේ. ගෙවීමේ ලදුපත අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

ලියාපදිංචිය සඳහා සුසුදුකම් නොලබන අයදුම්කරුවන්ගේ ලියාපදිංචි ගාස්තුව ආපසු ගෙවනු ලැබේ. කොළඹ මහා නගර සභාව විසින් පැහැරහරින්නන් ලෙස ප්‍රකාශ කර ඇති කොන්ත්‍රාත්කරුවන්හට අයැදුම්පත් නිකුත් කරනු නොලැබේ.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ආධාරක ලේඛන සමග 2020 ඔක්තෝබර් 31 වන දින හෝ ඉන්පෙර කාර්යාලය වෙත ලැබෙන පරිදි කොළඹ 07, නගරශාලාවේ, කොළඹ මහා නගර සභාවේ අධ්‍යක්ෂ ඉංජිනේරු (ව්‍යාපෘති) වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මුද්‍රා තබන ලද ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ "**කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2021**" යනුවෙන් සඳහන් කළ යුතුය.

අයදුම්පත් සඳහන් තොරතුරුවල සත්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා අයදුම්කරුවන්ව සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. සියලු සහතික / ලේඛනවල මුල් පිටපත් සහ සත්‍ය පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. වැඩිදුර විස්තර කොළඹ මහා නගර සභාවේ ව්‍යාපෘති කළමනාකරණ කොට්ඨාසයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඉංජිනේරු (කොන්ත්‍රාත්) වෙතින් වැඩිදුර විස්තර ලබාගත හැකිය. 011-2675591.

**රොෂාණි දිසානායක - නීතිඥ**
**නාගරික කොමසාරිස්,**
**කොළඹ මහා නගර සභාව,**
**නගර ශාලාව, කොළඹ 07.**

# ලුණුගල ප්‍රාදේශීය සභාව

## 2021 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2021 වර්ෂය වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා මෙම සභාවේ ලියාපදිංචි වීමට කැමති පිළිගත් සැපයුම්කරුවන්ගෙන්, කොන්ත්‍රාත්කරුවන්ගෙන්, නිෂ්පාදකයින්ගෙන් 2020-12-31 දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ. තම ආයතනයේ සියලු විස්තර ඇතුළත් අයදුම්පතක් සකස් කර, නියමිත අයිතමය සඳහන් කර ලියාපදිංචි ගාස්තු වශයෙන් "**සභාපති, ප්‍රාදේශීය සභාව, ලුණුගල**" නමට ලියන ලද රු. 500.00 ක් වටිනා චෙක්පතකින් හෝ මුදලින් ඉදිරිපත් කළ යුතුය.

**කොන්දේසි :**

1. සාමාන්‍යයෙන් ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයෙන් භාණ්ඩ මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ඇත. එහෙත් ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් ප්‍රමාණවත් මිල ගණන් නොලැබුණු අවස්ථාවක හා මිල ගණන් ඉදිරිපත් නොකරන අවස්ථාවන්හි දී මිල ගණන් කැඳවීම හා භාණ්ඩ මිලදී ගැනීම ලුණුගල ප්‍රාදේශීය සභාව සතු ය.
2. එක් අයිතමයකට වඩා වැඩියෙන් ලියාපදිංචි වීමට අදහස් කරන්නේ නම් එක් එක් අයිතමය සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

**සැපයුම් භාණ්ඩ හා උපකරණ**

1. ලිපිද්‍රව්‍ය, මුද්‍රිත පෝර්ම, කාර්යාල උපකරණ
2. ලී බඩු හා වානේ භාණ්ඩ
3. විදුලි භාණ්ඩ හා උපකරණ
4. වීථි ලාම්පු ආලෝකකරණ උපකරණ
5. සෞඛ්‍ය හා සනීපාරක්ෂක උපකරණ
6. විෂබීජ නාශක හා පවිත්‍රතා ද්‍රව්‍ය
7. නිල ඇඳුම් රෙදි, සපත්තු, රේන්කෝට්
8. ඉදිකිරීම් ද්‍රව්‍ය (ගල්, වැලි, ගඩොල්, මැටල්, සිමෙන්ති)
9. පරිගණක, ඡායාපිටපත්, ෆැක්ස්, මුද්‍රණ යන්ත්‍ර යනාදී අමතර උපාංග
10. ජල නළ උපාංග (PVC හා GI අමතර කොටස්)
11. ආවුද හා මෙවලම් (උදළු, විසිකැති, පිහි, සවල්)
12. පුස්තකාල පොත් සඟරා මිලදී ගැනීම
13. වාහන අමතර කොටස් සැපයීම
14. ටයර්, ටියුබ්, බැටරි සැපයීම
15. දැන්වීම් පුවරු, බැනර් සකස් කිරීම
16. මුද්‍රණ කටයුතු
17. මහන මැෂින්
18. මුලුතැන්ගෙයි උපකරණ

**සේවාවන්**

1. වාහන අලුත්වැඩියා කිරීම / වාහන සේවා කිරීම
2. ට්‍රැක්ටර් ට්‍රේලර් අලුත්වැඩියා කිරීම
3. පරිගණක, ඡායා පිටපත්, ෆැක්ස්, මුද්‍රණ යන්ත්‍ර යනාදී අලුත්වැඩියාව
4. මිනින්දෝරු සේවා
5. මාර්ග තලන යන්ත්‍ර, කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර (දිනකට පැය 08 ක සේවා කාලය)

වැඩි විස්තර කාර්යාලීය වේලාවන් තුළදී 055 - 2263975 දුරකථන අංකය අමතා ලබාගත හැකිය.

**2020-10-08 දින,**
**ලුණුගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.**

**සභාපති,**
**ලුණුගල ප්‍රාදේශීය සභාව.**

# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව

## වෛද්‍ය උපකරණ සහ රසායනාගාර ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩරය

01. නුගේගොඩ, තලපත්පිටිය ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් වෛද්‍ය හා රසායනාගාර උපකරණ සැපයීම සඳහා 2020-10-29 වන දින පෙ.ව. 2.00 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | අයිතමය | ප්‍රමාණය | ආපසු ගෙවනු නොලබන තැන්පතුව (රුපියල්) |
|---|---|---|---|
| Q687/20 | Microtome Machine | 01 | 3000.00 |
| Q688/20 | Tympanometer | 01 | 3000.00 |
| Q689/20 | Ambulatory B.P. Monitoring System wiht 3 Recorder for Holter Monitor Unit | 01 | 3000.00 |
| Q690/20 | Rigid Cystoscopy with Telescope | 01 | 3000.00 |

ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.
ලංසුකරුවන් සමාන උපකරණ සැපයීමේ පෙර පළපුරුද්ද සහිත නිෂ්පාදකයින්/ ඒජන්තවරුන්/ සමාගම් විය යුතුය.
අනු පිටපතකින් යුත් සම්පූර්ණ ලංසුකරණ ලිපිලේඛන කට්ටලයක් පහත සඳහන් ද ඉදිරිපත් කිරීමෙන් ලබාගත හැකිය.

(i) **ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ අධ්‍යක්ෂක වෙත ලිඛිත අයදුම්පතක්**
(ii) **ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ ගණකාධිකාරී වෙත ඉහත වගුවේ සඳහන් අදාළ ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන්**
(iii) **ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඡායාස්ථ පිටපතක්**

02. ලංසු, රෝහල විසින් සපයනු ලබන ආකෘති පත්‍ර මත පමණක් ඉදිරිපත් කළ යුතුය. රෝහල විසින් සපයනු ලබන ආකෘති පත්‍ර හැර වෙනත් ආකෘති පත්‍ර මත ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.
03. ටෙන්ඩර් ලිපි ලේඛන, රෝහලේ සැපයුම් කාර්යාලයේදී ගාස්තු ගෙවීමෙන් තොරව, පරීක්ෂා කරනු ලැබිය හැකිය.
04. ටෙන්ඩර් ලිපිලේඛන, රාජකාරී දිනවල, පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අතරතුර 2020-03-11 වන දින තෙක් සැපයුම් කාර්යාලයෙන් ලබාගත හැකිය.
05. ටෙන්ඩර් භාරගැනීම 2020-10-29 වන දින පෙ.ව. 10.00 ට අවසන් වන අතර, එකී වේලාව ඉක්මවූ වහාම, ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ, දේශන ශාලාවේදී එම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන් හෝ බලයලත් නියෝජිතයෙකු හට එම ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටීමට අවසර ඇත.
06. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති සතුව ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් භාරගැනීම ප්‍රතික්ෂේප කිරීමේ සහ ටෙන්ඩරයකින් ඕනෑම කොටසක් පමණක් භාර ගැනීමේ අයිතිය ඇත්තේය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව,**
**තලපත්පිටිය, නුගේගොඩ.**



**ලේක්හවුස් ඡායාරූප ශිල්පීන් විසින් ඡායාරූප ගත කරන ලද කළු සුදු හා වර්ණ සේයා පත් කර්තෘ මණ්ඩල පුස්තකාලයෙන් මිලදී ලබාගැනීමට පහසුකම් සලසා ඇත.**

**දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට 1950 සිට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.**

**පුස්තකාලයාධිපති**

**දුරකථන අංක 2429491**

තමරසිරි විජේසේකර - දෙයියන්දර සමූහ

# ඇමැති කාංචන දෙවිනුවරට යයි...





දෙවිනුවර නගරය සංවර්ධනය කිරීම සඳහා වූ නව නගර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය ඇමැති කාංචන විජේසේකර මහතා පසුගියදා සහභාගි විය. දෙවිනුවර - සුදුගල ප්‍රදේශයේ පරිපාලන කේන්ද්‍රස්ථානයක් ඉදි කිරීමටත්,පවතින වෙළෙඳ පොළ දෙක කඩා ඉවත් කර එක වෙළෙඳ මධ්‍යස්ථානයක් සහ ක්‍රීඩා පිටිය අවට ප්‍රාදේශීය සභාව ඇතුළු ගොඩනැගිලි ඉවත් කර ක්‍රීඩාංගණය පුළුල් කර නගරයේ ත්‍රිරෝද රථ සහ අනෙකුත් රථ වාහන වෙනුවෙන් වෙනම ස්ථානයක් ඇති කිරීමටත් නියමිතය. මීට අදාළ වැඩකටයුතු නොවැම්බර් මාසයේ ආරම්භ කරන බව මෙහි දී අවධාරණය කෙරිණි. මේ අවස්ථාවට නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු නිලධාරීන්,දෙවිනුවර ප්‍රාදේශීය සභාව,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගන්දර පොලීසිය ඇතුළු රජයේ ආයතනවල නිලධාරීහු ඇතුළු පිරිසක් සහභාගි වී සිටියහ.

පියසේන වතුදුර - දිගාමඩුල්ල සංචාරක

## අම්පාරේ මහකන්නයේ වී වැපිරීම් ලබන මාසයේදී අවසන්

2020/2021 මහ කන්නයේ අම්පාර දිස්ත්‍රික්කය තුළ අක්කර 215,000ක වී ගොවිතැන් කිරීමට සූදානම් කිරීමට ද නොවැම්බර් 12වැනිදා වන විට වී වපුරා අවසන් කිරීමට ද තීරණය කර ඇත. අම්පාර මහ දිසාපති ඩී. එම්. එල්. බණ්ඩාරණායක මහතාගේ ප්‍රධානත්වයෙන් කන්න රැස්වීම පවත්වා මේ තීරණය ගනු ලැබීය.

ගල්ඔය වම් ඉවුර සහ දමන ව්‍යාපාරයේ කන්න රැස්වීම පසුගියදා අම්පාර දිසාපති කාර්යාලයේ ඒ.අයි. වික්‍රම ශාලාවේදී පැවැත්වුණ අතර එදින සවස අක්කරපත්තු ජාතික පාසලේදී වෙරළබඩ කොට්ඨාසයේ කන්න රැස්වීම පැවැත්වීය. මහා වාරිමාර්ග, සුළු වාරිමාර්ග, මහවැලි සී කලාපය ඉඩම් අක්කර 215,000ක මේ අනුව වී වගා කිරීමට කටයුතු යොදා ඇත.

ගල්ඔය දකුණු ඉවුර දමන කලාපය නොවැම්බර් 01 වැනි දා, ගල්ඔය වම් ඉවුර නොවැම්බර් 10 වැනිදා සහ වෙරළබඩ කලාපය නොවැම්බර් 12 වැනිදා වන විට මාස 03-3 ½ ඇතුළත වී වපුරා අවසන් කිරීමට ද මේ කන්න රැස්වීම්වලදි තීරණය කරනු ලැබීය.

ප්‍රියන්ත සුමනසේන - උකුවෙල සංචාරක

## මාතලේ සහ අවට හෙරොයින් වික්ක සැකකරුවෙක් දැලේ

මාතලේ නගරයේ සහ ඒ අවට ප්‍රදේශවල හෙරොයින් බෙදා හැරි පුද්ගලයකු මාතලේ ඔය පහළ දි සැකපිට අත්අඩංගුවට ගත් බව මාතලේ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය සඳහන් කරයි.

සැකකරු මත් කුඩු ජාවාරමේ නිරත වන අයෙක් බවත් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ සැකකරු සන්තකයේ හෙරොයින් මිලිගෑම් 1733ක් තිබී සොයා ගත් බවත් පොලීසිය කියයි. සැකකරු මාතලේ මහේස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට නියමත බවද පොලීසිය කියයි.

මාතලේ කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අනුරුද්ධ බණ්ඩාරනායක මහතාගේ මෙහෙයවීම මත මාතලේ කොට්ඨාසය භාර 01 ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අජිත් වංශනාථ මහතාගේ උපදෙස් පරිදි මාතලේ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප සුගත් බණ්ඩාර ,උ.පො. ප. දේශප්‍රිය නවරත්න,පො.සැ 57200 හේරත්,57218 බණ්ඩාර,පො.කො 69389 ජයවිර,87884 මල්දෙණිය,81560 බුද්ධික,කා.පො .සැ. 1209 වත්සලා යන නිලධාරිහු මේ වැටලීම සිදු කළහ.

ටී.කේ.මහින්ද - වැලිගම සමූහ

## මාතර යෞවන ක්‍රීඩා උළෙලේ සමස්ත ශූරතාව කොකාවෙල සිංහ යෞවන සමාජයට

ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය,ජාතික තරුණ සේවා සභාව ,ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය එක්ව සංවිධාන කෙරෙන 32 වැනි ජාතික යෞවන ක්‍රීඩා උළෙලට සමගාමීව පැවැත්වෙන මාතර ප්‍රාදේශීය යෞවන ක්‍රීඩා උළෙල පසුගියදා මාතර උයන්වත්ත ක්‍රීඩාංගණයේ දී පැවැති අතර එහිදී සමස්ත ශූරතාව දිනා ගැනීමට කොකාවෙල සිංහ යෞවන සමාජය සමත් විය.

අනු ශූරතාව දිනා ගත්තේ වැවහමන්දුව ප්‍රින්ස්ටාර් යෞවන සමාජයයි. ජය සංකේත ප්‍රදානය මාතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති නිපුණ රණවක මහතාගේ පෞද්ගලික ලේකම් රමේෂ් නිලන්ත,ජාතික තරුණ සේවා සභාවේ සභා අධ්‍යක්ෂ දුෂාන් හෙට්ටිආරච්චි,මාතර සහකාර අධ්‍යක්ෂ චන්ද්‍රසිරි වනිගසිංහ යන මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් සිදු කෙරිණි.

රාහුල් සමන්ත හෙට්ටිආරච්චි - අම්බලන්තොට සමූහ

## බටඅත නිවෙසකින් කංසා ගසක්



හුංගම පොලිස් වසමේ බටඅත ප්‍රදේශයේ නිවෙසක රහසිගතව වගාකර තිබූ අඩි හතහමාරක් දිගකින් යුත් කංසා පැළයක් සමඟ වයස අවුරුදු 36ක පමණ පුද්ගලයකු පසුගියදා හුංගම පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

සැකකරු රජයේ ගොවිපොළක සේවකයෙකි. සැකකරු අගුණුකොළපැලැස්ස අධිකරණයට ඉදිරිපත් කර තිබේ.මේ වැටලීම හුංගම පොලීසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ක්‍රිෂාන්ත ජයසිංහ මහතාගේ උපදෙස් පරිදි , උ .පො .ප කේ .පි ජී .ජී .සමීර මහතාගේ ප්‍රධානත්වයෙන් පො ,සැ .17465 රසික ,27847 රන්ජිත් ,පො .කො 72896 සුජිත් ,සි ආ ,බා 14489 මල්ලිකාආරච්චි යන නිලධාරීන් විසින් සිදුකර තිබේ.

ඒ.පි.දයාචන්ද්‍ර - ඌරුබොක්ක විශේෂ

# පළාත් කොමසාරිස් පස්ගොඩ ආයුර්වේදයට තවමත් දොස්තර කෙනෙක් දීලා නෑ

## සංයෝජකවරිය වැඩ නැතිව පඩිත් අරන්

පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා ආයුර්වේද වෛද්‍යවරයකු නොමැති වීම හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව දැඩි අසීරුතාවකට පත්ව සිටිති.

පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ හිටපු ආයුර්වේද වෛද්‍ය වසන්තලාල් වීරමන් මහතා පසුගියදා විශ්‍රාම යෑමත් සමඟ මේ තත්ත්වය උදාවී ඇති අතර දැනට මසකට ආසන්න කාලයක් ගතව ඇතැත් මෙතෙක් නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට ආයුර්වේද වෛද්‍යවරයෙක් අනුයුක්ත කිරීමට දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද කොමසාරිස්වරයා මෙතෙක් කටයුතු කර නොමැත.

හිටපු ආයුර්වේද වෛද්‍යවරයා විශ්‍රාම යෑම වෙනුවෙන් පැවැති උපහාර උත්සවය සදහා දකුණු පළාත් පාලන කොමසාරිස් සේනක පල්ලිය ගුරුගේ මහතා ද සහභාගි වූ අතර එහෙත් අද වන තෙක් ආයුර්වේද වෛද්‍යවරයකු අනුයුක්ත කිරීමට පළාත් පාලන කොමසාරිස්වරයා හෝ කටයුතු කර නොමැති බවට ප්‍රදේශයේ ජනතාව චෝදනා කරති.

පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව පසුගිය 12වැනි දින සිට වසා තැබුවත් එහි ඖෂධ සංයෝජකවරිය සේවයට වාර්තා කරන අතරම එම නිලධාරිනිය කිසිම සේවාවක් සිදු නොකර වැටුප් ලබා ගෙන ඇත.

ඌරුබොක්ක සහ බෙංගමුව ආයුර්වේද බෙහෙත් ශාලා දෙකම මේ වනවිට වසා දමා ඇත.

ඌරුබොක්ක ආයුර්වේද බෙහෙත් ශාලාවෙන් සහ බෙංගමුව ආයුර්වේද බෙහෙත් ශාලාවෙන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා විශාල රෝගීන් පිරිසක් දෛනිකව පැමිණෙන අතර පසුගිය සැප්තැම්බර් 12 දින සිට වසා තැබීම හේතුවෙන් ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන රෝගීන් දැඩි අපහසුතාවට පත්ව සිටිති.

මේ නිසා හැකි ඉක්මනින් පස්ගොඩ ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා ආයුර්වේද වෛද්‍යවරයෙක් අනුයුක්ත කරන ලෙසට දකුණු පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් සහ දකුණු පළාත් ආයුර්වේද කොමසාරිස්වරයාගෙන් ප්‍රදේශයේ ජනතාව ඉල්ලා සිටිති.

සිරි අබයසිරි - මාතලේ මධ්‍යම සමූහ

# කැටයමින් සරිකර ගත් ජීවිත ලස්සනට ගෙවා ගන්න ඉඩ දෙන්න





උකුවෙල ගිරන්දාපිටිය ගමේ පාරම්පරික ශිල්පීන් දුක කියති

පාරම්පරික කැටයම් කර්මාන්තය තම ජීවිකාව කර ගනිමින් ජීවත් වන කැටයම් ශිල්පීන්ගේ නිර්මාණ අලෙවිකර ගැනීමට නොහැකි විමෙන් ඔවුහු ගැටලු රැසකට මුහුණ දී ඇතැයි ඔවුහු පවසති. මාතලේ, උකුවෙල, රත්වත්ත, ගිරන්දාපිටිය ප්‍රදේශයේ පදිංචි එකම පවුලේ පියා සහ දරුවන් 05 දෙනාම කැටයම් කර්මාන්තය තම ජීවිකාව කර ගනිමින් ජීවත් වුවත් අද ඔවුන්ගේ නිර්මාණ අලෙවිකර ගැනීමට නොහැකි වීමෙන් අසරණ තත්ත්වයට පත්ව සිටිති. තම කර්මාන්තයේ වර්තමාන තත්ත්වය පිළිබඳ කැටයම් ශිල්පි ආර්. ජී. ගාමිණි පතිරත්න මහතා මෙසේ පැවැසීය - අපි පරම්පරික කැටයම් ශිල්පියෝ. මගේ තාත්ත, සීයත්, කැටයම් ශිල්පීන්. මගේ දරුවන් 05දෙනාත් මාත් සමඟ කැටයම් කර්මාන්තයේ

යෙදිලා ඉන්නවා. කොරෝනා වසංගතය එන්න ඉස්සල්ලා හොඳ වෙළෙඳාමක් තිබුණා.දැන් අපිට හරි හැටි ආදායමක් නෑ .ජීවත් වෙන්නත් අමාරුයි. එත් මමයි, මගේ දරුවනුයි මේ කර්මාන්තයේ අතහරින්නේ නෑ.අපි ඉල්ලන්නේ අපිට වෙළෙඳ පොළක් හොයලා දෙන්න කියලා විතරයි.

**ගිහාන් ප්‍රභාත් පතිරන මහතා** -මේ කර්මාන්තය හොඳ කර්මාන්තයක්.අපි නව නිර්මාණ රැසක් කරලා තියනවා. ජනතාව ගොඩක් අපේ කැටයම් නිර්මාණවලට ආසයි.කොරෝනා එන්න පෙර අපි විදේශිකයන්ටත් අපේ නිර්මාණ අලෙවි කළා .දැන් දේශීය නිර්මාණ කර්මාන්තයට මුල්තැනදී කටයුතු

කරනවා. ඒක ගොඩක් හොඳයි. අපිට අපේ රටේ අයට හොඳ නිර්මාණ අඩු මිලට දෙන්න පුළුවන්.අපිට රජයෙන් වෙන මොනවත් ඕනේ නෑ. අපිට අපේ නිර්මාණ ප්‍රදර්ශනය කරන්න හා අලෙවි කරගන්න ක්‍රමවේදයක් හදලා දෙන්න කියලා තමයි අපි බලධාරීන්ගෙන් ඉල්ලා සිටින්නේ.

මාතලේ දිස්ත්‍රික් සමූහ

## ගලේවෙල රජයේ පශු වෛද්‍ය කාර්යාලයට චෝදනා රැසක්

මාතලේ දිස්ත්‍රික්කයේ සත්ව පාලනයේ යෙදෙන වැඩිම පිරිසක් ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිටින නමුත් සිය සත්ව පාලන අවශ්‍යතා සඳහා සතුන්ට ප්‍රතිකාර ලබා ගැනීමට යෑමේ දී මහත් අපහසුතාවට මුහුණ පෑමට සිදුවී ඇතැයි සත්ව ගොවිපොළ හිමිකරුවෝ පවසති.

මොවුන් සඳහන් කරන්නේ ගලේවෙල නගරයේ පවත්වාගන යන මේ රජයේ පශු වෛද්‍ය කාර්යාලයෙන් සතුන්ට අවශ්‍ය කුමන අන්දමේ ප්‍රතිකාරයක් ලබාගැනීමට ගියත් එහි නිලධාරින්ට මුදල් ගෙවීමට සිදුවන බවය.

මහජන මුදලින් නඩත්තු වන රජයේ කාර්යාලයක් වන මේ පශු වෛද්‍ය කාර්යාලීය නිලධාරින් මෙසේ සෑම කාර්යයක් සඳහාම සත්ව ගොවිපළ හිමියන්ගෙන් මෙන්ම ගෘහස්ත සතුන් ඇතිකරන්නන්ගෙන්ද මෙසේ මුදල් අය කිරීම මහත් පීඩාවක් බවද මොවුහු වැඩි දුරටත් කියා සිටිති. එපමණක් නොව යම්කිසිවෙක් ප්‍රතිකාර සඳහා සතෙක් මේ ස්ථානය වෙත රැගෙන ගියහොත් මිල අධික ඇතැම් ඖෂධ පෞද්ගලික ඔසුහල්වලින් ගෙන ඒමට සිදුවීමෙන් තමන් දැඩි අපහසුතාවට පත්වන බවද ඔවුහු පෙන්නා දෙති.එමෙන්ම මේ නිලධාරින් ලබාදෙන උපදේශන සේවාවන්ටද මුදල් අය කරන බවද මේ ගොවිපළ හිමියෝ පවසති. මේ පශු වෛද්‍ය කාර්යාලය සඳහා රියැදුරෙක් සමඟ නිල වාහනයක් ලබාදී ඇතත් රියැදුරු සේවයේ නොමැති අවස්ථාවන්හි දී සතුන්ට ප්‍රතිකාර ලබා දීම සඳහා වෛද්‍යවරයා කැඳවාගෙන යාමට ගමන් පහසුව ලබා දීමටද ගොවිපළ හිමියන්ට සිදුවේ.

එස්. ලොකුකරවිට - කරාපිටිය සමූහ

## ගාල්ලේ හඳුනාගත් වසම්වලට කිකිළි පැටවු 10 බැගින්

ග්‍රාමීය ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමේ සහ දරිද්‍රතාව තුරන් කිරීමේ අරමුණින් ග්‍රාම නිලධාරි වසම්වල හඳුනාගත් පවුල් සඳහා මසක් වයසැති කිකිළි පැටවුන් 10 බැගින් ලබාදීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරිමට රජය සැලසුම් කර ඇතැයි මෙවර පැවති ගාල්ල දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීමේදි ගාල්ල දිස්ත්‍රික් ලේකම් සෝමරත්න විදානපතිරණ මහතා පැවැසීය. බිත්තර අතිරික්තය යාබද ගෙවල්වලටද හුවමාරු කර ගැනීමට හැකිවන ආකාරයට අවම වශයෙන් ගෙවල් පහකට එක් කුකුළු පාලන ගෘහයක් බැගින් ආරම්භ කිරීමට රජය බලාපොරොත්තු වන බවද දිස්ත්‍රික් ලේකම්වරයා පැවැසිය.

ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බළකායේ මෙහෙයවීම මත දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සෘජු අධීක්ෂණය යටතේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් මේ වැඩ සටහන ක්‍රියාත්මක කෙරෙනු ඇත.

ප්‍රියන්ත සුමනසේන - උකුවෙල සංචාරක

# කලල්පිටිය වෙල් යායේ අලුත් සහල් මංගල්‍ය ...



කලල්පිටිය කෙත් යායේ අලුත් සහල් මංගල්‍ය පැරැණි චාරිත්‍ර ක්‍රම අනුසාරයෙන් හා රාජ්‍ය නිලධාරින්ගේද සහාය ඇතිව පැවත්වීමට කලල්පිටිය ගොවි සංවිධානය කටයුතු යොදා තිබිණි. පැරැණි චාරිත්‍රවලට මුල් තැන දෙමින් කැත්ත, උදැල්ල, නඟුල, විය ගහ , දැකැත්ත, පෝරුලෑල්ල , අත්පෝරුව,බෝලත්ත,කෙවිට,සහ ගවයෙක්,වී, සහල්ද,සම්බන්ධ කරගෙන කිරි ඉතිරීම් කටයුතු ආරම්භ කිරීම කුඹියන්ගොඩ පත්තිනි දේවාලයේ අබේකෝන් කපු මහතා විසින් සිදු කරන ලදි.

මූලික වැඩ ආරම්භ කිරීමට පෙර මහ සංඝරත්නයේ ආශිර්වාදය සහිතව කිරි ඉතිරීම් මංගල්‍ය ආරම්භ වූ අතර එහිදි පිරිස පංචශිලයෙහි පිහිටුවා ආශිර්වාද කිරිමද සිදු විය.උකුවෙල ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රි කලල්පිටිය වසම භාර ගාමිණි කුලතුංග මහතා සදහන් කළේ මෙවන් උතුම් කටයුතු ගමෙන් ගිලිහී යන මොහොතක වත්පිළිවෙත් අනුව පුරාණ කාලයේ සිට පැවතෙන සාරධර්ම සියල්ල අභාවයට යන කාලයක අලුත් තරුණ පරපුරට ආදර්ශයක් වගේම ඒවා දැන හැඳින ගැනීමේ අවස්ථාව උදාකර දීම පිළිබඳ ගොවි සංවිධානයට ස්තුතිය පළ කරන බවය. කලල්පිටිය ගොවි සංවිධානයේ සභාපති පි. ජී. ධර්මපාල මහතා සඳහන් කළේ මේ කෙත් යාය අක්කර 65ක් සහිත යල මහ දෙකන්නය මාරුවෙන් මාරුවට එළවළු සහ වී වගාව ඉතාම සාර්ථකව කෙරෙන සරුසාර කෙත් යායක් බවයි. මේ අවස්ථාව සඳහා මහජන සෞඛ්‍ය පරික්ෂක ආර්.ජී.සි.බි. කරුණාරත්න මහතා විසින් ගොවියා ආරක්ෂා කිරීම සඳහා ගොවියන්ට වැලඳෙන මී උණ රෝගයෙන් ආරක්ෂා වීම සඳහා බෙහෙත් මාත්‍රාවක්ද ලබාදීමට කටයුතු කළ අතර කෘෂි පර්යේෂණ නිලධාරිනි විසාකා කපිලරත්න මහත්මිය කෘෂි පර්යේෂණ නිලධාරිනි සේනානි ද සිල්වා මහත්මිය, සිවිල් ආක්ෂක කමිටුව නියෝජනය කරමින් සැරයන් 62300 ජී .ජී. එම්. එස් . චන්ද්‍රසේන මහතාද ඇතුළු විශාල පිරිසක් ද සහභාගි වූහ.

රාහුල් සමන්ත හෙට්ටිආරච්චි - අම්බලන්තොට සමූහ

## බෝර 12 ගිනි අවියක් සමඟ පුද්ගලයෙක් අත්අඩංගුවේ

හුංගම පොලීසියට ලැබුණු තොරතුරකට අනුව රන්න නිදහස්ගම කහඳමෝදර ප්‍රදේශයේ හෝටලයක් පවත්වාගෙන ගිය සැකකරුවකු සතුව තිබී බෝර 12 පතොරම් දැමිය හැකි ගිනි අවියක් හා බෝර 12 ජීව පතොරම් 02ක් සමඟ අදාළ සැකකරු අත්අඩංගුවට ගැනීමට හුංගම පොලීසියේ අපරාධ අංශයේ නිලධාරීන් සමත් වී තිබේ.අදාළ සැකකරු වයස අවුරුදු 41ක් පමණ වන අයකු වන අතර ඔහුගෙන් කළ ප්‍රශ්න කිරීමේදී ප්‍රකාශ කර ඇත්තේ පාතාල සාමජිකයකුගෙන් තමාට ඇති තර්ජන නිසා මේ ගිනි අවිය ළඟ තබාගත් බවයි.

කැබිතිගොල්ලෑව සමූහ

# උතුරු මැද ප්‍රා. සභා - නගර සභා දින 180 අනියම් සේවකයන් ස්ථිර කරන්න

## උතුරු මැද අනියම් සේවකයෝ ජනපතිගෙන් ඉල්ලති

උතුරු මැද පළාතේ ප්‍රාදේශීය සභා සහ නගර සභාවල PL වැටුප් කාණ්ඩය යටතේ අනියම් තනතුරේ දින 180 සම්පූර්ණ කරමින් නොකඩවා මේ වනතුරු සේවයේ යෙදී සිටි සේවකයන්ගේ පත්වීම් ස්ථිර කරන්නැයි උතුරුමැද පළාතේ ප්‍රාදේශීය සභා සහ නගර සභා අනියම් සේවකයෝ ජනාධිපතිතුමන්ගෙන් ඉල්ලීමක් කරති.

මේ වන විට ඌන අධ්‍යාපන මට්ටමේ ඇති තරුණ තරුණියන් සඳහා ජනාධිපතිතුමන්ගේ සංකල්පයක් මත ලබා දෙන රැකියා ලක්ෂයේ වැඩසටහන මගින් උතුරු මැද පළාතේ පළාත් පාලන ආයතනයට අනුයුක්තව ප්‍රාදේශීය සභා සහ නගර සභාවල PL වැටුප් කාණ්ඩය යටතේ නව රැකියා ලබා දීමේ සැලැසුමක් ඇත. එම සැලැසුම අනුව මීට පෙර PL වැටුප් කාණ්ඩය යටතේ අනියම් සේවකයන් ලෙස දින 180 සම්පූර්ණ කරමින් නොකඩවා මේ වන තුරු වසර ගණනාවක් සේවයේ යෙදී සිටි සේවකයන්ට සිදුවන්නේ කුමක්දැයි අනියම් සේවකයෝ බලධාරින්ගෙන් විමසති. උතුරු මැද පළාතේ අනියම් සේවකයන් 500කට ආසන්න පිරිසක් සිටින අතර ඔවුන් පවසන්නේ තමන් සේවයෙන් ඉවත් කර නව පත්වීම්ලාභීන්ට එම තනතුරු ලබාදීමේ ක්‍රමවේදයක් මේ වන විට ක්‍රියාත්මක වන බවට තොරතුරු ලැබී ඇති බවයි.

මේ පිළිබඳ අදහස් දැක්වූ මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ PL වැටුප් කාණ්ඩයේ සේවක **ඩී.වී. පී.එන්.සී කරුණාරත්න මහතා -**

අපි මේ වෙලාවේ හරිම අසරණයි. මම අනියම් පත්වීම ගත්තේ 2014 වර්ෂයේ. මේ වෙනකම් කවුරුත් අපිව ස්ථිර කළේ නෑ. අපිට ස්ථිර පත්වීම් දෙයි කියලා ලොකු විශ්වාසයක් තිබුණා. ඒත් මේ වනතෙක් අපට ඒ පිළිබඳ නිසි තොරතුරක් නෑ. විවිධ කථා කරළියට එනවා. අපිව ඉවත් කරලා අලුත් අය දානවා කියලා. එහෙම අසාධාරණයක් කරන්න එපා කියලා අපි ජනාධිපතිතුමන්ගෙන් ඉල්ලා සිටිනවා.

අපි පසුගියදා ජනාධිපති ලේකම් කාර්යාලයටත් ගියා. මේ පිළිබඳ දැනුම්වත් කරන්න. එහිදී සතියක් ඇතුළත විසඳුමක් දෙනවා කිවුවලු. එහෙත් තාම ලිඛිතව විසඳුමක් ලැබුණේ නෑ. 6 වැනිදා වන විට ලිපියක් එවලා තිබුණා. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් PS/GPA/8/ Letters අංක දරණ ලිපිය මගින් මේ ආයතනවල පුරප්පාඩු ඉල්ලලා. රැකියා ලක්ෂයේ අය බඳවා ගන්න. අපව පාරට ඇද දමන්න එපා. අපවත් ස්ථිර කර දෙන්න කියලයි මා ජනාධිපතිතුමන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටින්නේ.

**කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ PL වැටුප් කාණ්ඩයේ සේවක ජේ.එස්. කේ ජයසිංහ මහතා -**

අපි මේ වෙලාවේ කුමක් කරන්නද කියලා දන්නේ නෑ. අපි මේ වැටුප ගන්නේ සියලුම රාජකාරි කටයුතු බැහැයි නොකියා කරලා. අපිව එක පාරටම එළියට දානවා කියන කතාව යද්දි අපි අන්ත අසරණ වෙනවා. අපව දින 180 යටතේ ස්ථිර කරන්න සියල්ල කරලා තියෙද්දි මේ ස්ථිර කිරීම් නතර වුණේ. අපි එදා බඳවා ගත්ත තනතුරු අද නෑ. විවිධ චක්‍රලේඛණ නිසා. අප සිටිද්දි වෙන අය ස්ථිර කරලා දාන එක අපට කරන ලොකු අසාධාරණයක්. ජනාධිපතිතුමන් සහ පළාත් කොමසාරිස්තුමා අපට විශ්වාසයි. අපව ආරක්ෂා කරලා අපේ පත්වීම් ස්ථිර කරලා දෙන්න කියලයි එතුමන්ලාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

සීගිරිය විශේෂ



## ලොකු ලූනු ගොවීන්ට හොඳ කලක්

දේශීය ලොකු ලූනු කිලෝවක් සඳහා රුපියල් 240ක ඉහළ තොග මිල දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ දී ගොවීන්ට ලැබෙන බව දේශීය ලොකු ලූනු ගොවියෝ පවසති.

පසුගිය දින කිහිපයේ දේශීය ලොකු ලූනු කිලෝවක ගැනුම් මිල රුපියල් 85 සිට රුපියල් 130 දක්වා පැවති බවත් කොරෝනා තත්ත්වයත් සමඟ දේශීය ලොකුලූනු සඳහා ඉහළ ඉල්ලුමක් පැවතීම හේතුවෙන් පසුගිය 7 වැනිදා පෙරවරුවේ සිට දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ දේශීය ලොකු ලූනු කිලෝවක ගැනුම් මිල රුපියල් 200 සිට රුපියල් 240 දක්වා වූ ඉහළ මිලකට අලෙවි වන බවත් ගොවීහු කියති.

මෙවර දේශීය ලොකු ලූනු වගාවට හඳුනා නොගත් රෝගයක් බෝවීම නිසා සාර්ථක අස්වැන්නක් නොලැබ් ගොවීන් අසීරුතාවට පත්ව සිටින අවධියක කිලෝවකට රුපියල් 240ක් වැනි ඉහළ මිලක් ලැබීම නිසා යම් මට්ටමකින් තමන්ට ණය ගෙවාගෙන සතුටෙන් ජීවත් වීමට හැකි බව දේශීය ලොකුලූනු ගොවීහු පැවසූහ.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට ගොවීන් විශාල වශයෙන් තම අස්වනු අලෙවි කිරීම සඳහා රැගෙන එන ආකාරය දැක ගැනීමට හැකිවිය .

දිනමිණ දුසත දස අත ම එක තැන

ඩබ්ලිව්.පී. ධර්මසේන මාතර සමූහ

# ‘උඹ දඟලනවා වැඩියි’ කියා ලංගම කොන්දොස්තරට ගහලා

සාක්කුවේ තිබුණු දහදාහත් අරන්

පෞද්ගලික බස්රථ වර්ජනයක් තිබියදී බස්රථය ධාවනය කිරීම නිසා ලංගම බස්රථයකට ගොඩවී කොන්දොස්තරට පහරදී රුපියල් 10,600ක මුදලක් කොල්ලකෑමේ සිද්ධියක් දෙනියාය ප්‍රදේශයෙන් වාර්තා වේ.

පසුගිය 6 වැනි දින සවස 6.10 ට දෙනියාය නගරයේ 51 කනුව අසලදි බස් රථය නතරකර ඇති සැකකරු එම බස්රථයට ගොඩවී කොන්දොස්තරට පහරදී මේ මුදල් කොල්ලකා පලාගොස් ඇත. සැකකරු දෙනියාය ප්‍රදේශයේ පෞද්ගලික බස්රථයක රියැදුරකු බවට හඳුනාගෙන තිබේ. දෙනියාය අකුරැස්ස මාර්ගයේ පෞද්ගලික බස්රථ වර්ජනයක් තිබියදී එය නොතකා දෙනියාය ඉහළගම පදිංචි පැමිණිලිකරු දෙනියාය ඩිපෝවට අයත් ලංගම බස්රථයේ කොන්දෙස්තරවරයා වශයෙන් කටයුතු කර තිබේ. සැකකරු කොන්දෙස්තරට කිහිපවරක් දුරකථනයෙන් තර්ජනය කර ඇති අතර කෙටි පණිවිඩයක් එවමින් “උඹ දඟලනවා වැඩියි. දැඟලිල්ල නවත්වනවා” යැයි කියා තර්ජනාත්මක පණිවිඩයක් එවා ඇත. සැකකරු අත්අඩංගුවට ගැනීමට දෙනියාය පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

පී.පී.ජී. සුගතදාස - තිහගොඩ සමූහ

## මාතර බිම්මල් වගා ව්‍යාපෘති සාර්ථකයි

මාතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක බිම්මල් වගා ව්‍යාපෘති සාර්ථක ප්‍රගතියක් පෙන්වයි.

යෝජිත වගා ව්‍යාපෘති දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ආරම්භ කිරීමට අපේක්ෂිත අතර එහි පළමු අදියර කඹුරුපිටිය ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ දැනටමත් සාර්ථකව ක්‍රියාත්මක බව කඹුරුපිටිය එකමුතු බිම්මල් නිෂ්පාදකයන්ගේ සංගමය පවසයි.

එම සංගමය සඳහන් කරන පරිදි දැනටමත් කඹුරුපිටිය ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 39ක් පුරා මේ වගා වැඩසටහන ව්‍යාප්ත කර ඇති අතර එම වගා වැඩසටහන්වල යෙදී සිටින පවුල් සංඛ්‍යාව 1000කට අධිකය. මාතර දිස්ත්‍රික්කය පුරා විසිරී සිටින බිම්මල් නිෂ්පාදකයන් ඒකරාශි කරමින් වගා කටයුතු සඳහා අවශ්‍ය නවීන තාක්ෂණික දැනුම හා උපදෙස් ලබාදීම, මූල්‍යාධාර සැපයීම, ගුණාත්මක වර්ගයේ බීජ සැපයීම, නිෂ්පාදන ගැටලු නිරාකරණය කිරීම හා වගාකරුවන්ගේ සුබසාධනය සැපයීම කඹුරුපිටිය එකමුතු බිම්මල් නිෂ්පාදකයන් සංගමය හරහා දැනටමත් සිදුකෙරේ.

බී.එම්.විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

## පුතාට දෙන්න කුඩු ගෙනා මවකට ඇප

හෙරොයින් සම්බන්ධ චෝදනාවකට අනුරාධපුර මූලස්ථාන පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණයට රැගෙන ආ පුත්‍රයාට ලබාදීමට හෙරොයින් මිලිග්‍රෑම් 350ක ප්‍රමාණයක් ගෙනා වයෝවෘද්ධ මවක අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව සියලුම චෝදනාවලට නිවැරැදිකරු බව විවෘත අධිකරණය හමුවේ පැවසීම නිසා රුපියල් ලක්ෂය බැගින්වූ ශරීර ඇප දෙකක් මත මුදාහරින ලෙස අනුරාධපුර ප්‍රධාන මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු ජනක ප්‍රසන්න සමරසිංහ මහතා නියෝග කළේය.

අධිකරණයට හෙරොයින් රැගෙන නොපැමිණි බවට ප්‍රකාශ කළ පසේ ඇළ ශ්‍රාවස්තිපුර අනුරාධපුර ලිපිනයේ පදිංචි 59 හැවිරිදි මවක මෙසේ ඇපමත මුදාහැරියේය.

සැකකාරිය අධිකරණයට ඉදිරිපත් කළ අනුරාධපුර මූලස්ථාන පොලීසියේ දූෂණ මර්දන නඩු මෙහෙයුම් ඒකකය කියා සිටියේ සැකකාරිය අනුරාධපුර අධිකරණ සංකීර්ණයේ ප්‍රධාන පිවිසුමෙන් අධිකරණ භූමියට ඇතුළුවීමට පෙර පොලිස් නිලධාරින් ඇයගේ අත්බෑගය පරීක්ෂාවට ලක්කරද්දී ලේන්සුවක එතූ යමක් තිබී පොලිස් බාරයට ගෙන පරීක්ෂාකර ඇති බවයි.

ටී. එල්. ජව්ෆර් කාන් - මඩකළපුව සමූහ

## හෙරොයින් සහ ගංජා සමඟ 3ක් කොටු වෙති

හෙරොයින් සහ ගංජා සමඟ තිදෙනකු කාත්තාන්කුඩි පොලිස් වසමේදී අත්අඩංගුවට ගත් බව කාත්තාන්කුඩි පොලිස් ස්ථානාධිපති දුමින්ද නයනසිරි මහතා පවසයි.

මඩකළපුව දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නුවන් මැන්ඩිස් මහතාගේ නියෝග මත සහකාර පොලිස් අධිකාරි ඒ. එම්. ෆාරුක් මහතාගේ මඟ පෙන්වීමෙන් පොලිස් ස්ථානාධිපති දුමින්ද නයනසිරි මහතා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් සැකකරුවන් විසින් අත්අඩංගුවට ගන්නා ලදි.

සැකකරුවන් මඩකළපුව මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිත බව පොලීසිය පැවැසීය.

ඩබ්ලිව්.ඒ. පියතිලක - මැදිරිගිරිය සමූහ

## ලංකාපුර තඹාල ගමට අලි කරදර නිමක් නෑ



අලිවැටක් නිසි පරිදි නොමැතිකම නිසා ලංකාපුර තඹාල නගරයට අද (7) අලුයම වන අලියකු පැමිණ පුද්ගලයකුට පහර දී නිවාස, වගා සහ දේපළවලට හානි රැසක් සිදු කළ බව තඹාල නගරයේ වැසියෝ කියති.

මෙසේ වනඅලියා පහරදීම හෙතුවෙන් බරපතළ තුවාල ලබා ඇත්තේ තඹාල නගරයේ පදිංචි අබ්දුල් හමීඩ් නැමැති (60) හැවිරිදි අයෙකි. නිවාස හිමියන් පවසා සිටින්නේ අලුයම 3ට පමණ නිවෙස ඉදිරිපිට ඇති මක්ක්‍ෂොක්කා ගස ගලවා කන ශබ්දය ඇසී දොර අරගෙන එළියට එනවාත් සමග වන අලියා පහර දුන් බවයි. අසල්වාසි සියලු දෙනා කෑ ගැසීම නිසා වන අලියා පහරදීම නවතා ඉදිරිපස තිබූ තාප්පයත් කඩාගෙන ගොස් ඇති අතර පසුව ගම්වාසීන් එක්ව තුවාලකරු පොළොන්නරුව මහ රෝහලට රැගෙන ගොස් තිබේ.

සෝමාවතිය ජාතික උද්‍යානයේ සිට වනඅලින්ට ගම්මානයට පැමිණීමට නොහැකිවන පරිදි ඉදිකර ඇති අලිවැටේ විදුලිය නොමැතිකමත් නිසි පරිදි අලිවැට ඉදි නොකිරීමත් නිසා මෙසේ වනඅලි ගම්වැදීම සිදුවන බව ගම්වැසියෝ කියති.

වනඅලි ගම්මානයට පැමිණ නිවාස කිපයක් බිඳ දමා එහි තිබූ වී කා දමා ඇති අතර බවබෝග ද විනාශ කර තිබේ.

වන අලි ගම්වැදිම මේ පිළිබඳ අදහස් දැක් වූ **වයි.එල්. නජ්මුදින් මහතා** - අපිට මේ ඉඩම් ලැබුණේ අපේ අත්තාලා මුත්තලාගෙන්. ඒ කාලේ අලිවැටවල් තියා මොකුත් තිබිලාත් නෑ. ගමට අලින්ගෙන් කරදරයක් තිබිලත් නෑ. දැන් අලි වැටත් තිබිලාත් හැමදාම ගෙවල් කනවා, වගාවට හානි කරනවා, ඒ වාගේම මිනිස්සු මරනවා. වනජීවී එකට අලි ගමට ආවා කියලා හරි වගාව හානි කරනවා හරි එහෙම නැත්තම් අලි ගහලා මිනිහෙක් මැරිලා කියලා කෝල් කළාට ගමට එන්නේ නෑ.

මේ අවට ගම්මානවල අයට අලි ගහලා ගොඩක් අය මැරුණා. මේ ගිය සතියෙත් එක්කෙක් මැරුණා. ඒ මොකවත් නිසා නෙවේයි අලිවැට හරියට නැති නිසා. ඊයේ වුණත් තව පොඩ්ඩෙන් අලියා ගහලා තවත් කිප දෙනෙක් ම මැරෙනවා. පොඩ්ඩෙන් බේරුණා. ගෙවල් දෙකක් කඩලා වී කාලා ගියා. ඒත් අද අපි අසරණයි. අපි කියන්නේ අපි ගැන තෙරුම් අරන් ඉන්න පිරිසක් මේ රටේ ඉන්නවා නම් අඩුම ගානේ අපේ දරු පවුල් ටික ආරක්ෂා කර දෙන්න අලි වැටක් ගහලා දෙන්න.

**ඒ. එම්. රස්මි මහතා** - අලි අල්ලන් ඇවිත් මේ කැලෑවලට තමයි ගෙනත් දාන්නේ. ඒ අලි හොයාගෙන කන්න දන්නේ නෑ. උන් දන්නේ ගෙවල් කඩලා එවාගේ තියෙන දෙවල් කන්න. ඒ අලි දරුණු අලි. උන් රෑට ගම්වදිනවා. මේ අලි කරදරෙන් අපිට නිදහසේ ජීවත් වෙන්න පුළුවන් මොකක් හරි වැඩ පිළිවෙළක් සකසා දෙන ලෙසඉල්ලා සිටිනවා.

ධර්මදාස සිරිවර්ධන - ගාල්ල දිස්ත්‍රික් සංචාරක

## කරාපිටිය රෝහලේ බාහිර රෝගී අංශයේ දැඩි තදබදයක්



සෞඛ්‍යාරක්ෂිත පිළිවෙත් කිසිවක් නෑ

කරාපිටිය රෝහලේ මේ වන විට බාහිර රෝගී අංශය පිරී ඉතිරී ගොස් ඇති අතර දුර සීමාවන්, අත්සේදීම, උණ බැලීම, ආදී සනීපාරක්ෂ ක්‍රමවේද කිසිවක් සම්බන්ධයෙන් තුට්ටුවකටවත් මායිම් නොකරන බවට රෝගීහු මෙන්ම රෝහල් කාර්ය මණ්ඩලය ද චෝදනා කරති.

මී මැස්සන් රංචු මෙන් පොදි ගැසී සායන හා කවුන්ටර් අසල රෝගීන් පොදි කන අතර කිසිදු පරිපාලන ක්‍රමවේදයක් අනුගමනය කරන බවක් නොපෙනෙන බවත් ආරක්ෂිත පියවරයන් අනුගමනය නොකරන බවත් ඔවුහු පවසති.

මේ තත්ත්වය ඉදිරියටත් පැවතුනණහොත් ඉදිරියේ දී දකුණු පළාත දැඩි අවදානම් තත්ත්වයකට පත් විය හැකි බවත් මේ තත්ත්වයට කඩිනමින් නිසි පිළියම් යෙදිය යුතු බවත් රෝගීහු සඳහන් කරති. කෙසේ වුව ද රෝහලේ සේවකයකු කීවේ අපට කරන්න කිසිම දෙයක් නෑ. ප්‍රකාශයක් දෙන්න අපිට කොහොමවත් බෑ. යනුවෙනි. අත සෝදන බේසම් පවා මේ වන විට කැඩී ගොස් ඇති බව පවසන ඔවුහු ඒ පිළිබඳව රෝහල් බලධාරීන්ගේ දැඩි අවධානය යොමු කළ යුතුව ඇති බව වැඩිදුරටත් පෙන්වා දෙති.

ගම්පහ දිස්ත්‍රික් විශේෂ -සිසිල ගුණතිලක

## 2020 ගෝතමී ගායනා අභිෂේක තරඟයේ සුපිරි තරුව සනුර සුපිරි තාරකාව යසංගා



ලෝක ළමා දිනයට සමගාමීව ගම්පහ ගෝතමී විද්‍යාලයේ විදුහල්පති උපාලි විජේවර්ධන මහතාගේ මඟ පෙන්වීම යටතේ විද්‍යාලයීය සෞන්දර්ය ඒකකය මඟින් සංවිධාන කළ 2020 ගෝතමී ගායනා අභිෂේක තරඟය ගම්පහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ එස්.කේ. මල්ලවආරච්චි සහ කලාපයේ සංගීත අධ්‍යක්ෂිකා චමල්කා අතපත්තු මහත්ම මහත්මීන්ගේ ප්‍රධානත්වයෙන් විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්විණි.

එහිදී ප්‍රාථමික අංශයේ සුපිරි තරුව ලෙස සනුර ආදිත්‍ය සිසුවා ද , ද්විතීක අංශයේ සුපිරි තාරකාව ලෙස යසංගා දේසදී හලංගොඩ සිසුවිය ද අභිෂේක ලැබූහ.

අනුරාධ ප්‍රියදර්ශන - කරන්දෙණිය සමූහ

## භූමිතෙල් යොදා ධාවනය කරන බස් සොයා මෙහෙයුම්



ඩීසල් යොදා ධාවනය කළ යුතු මඟී ප්‍රවාහන බස් රථ අධික ලාභයක් ලබා ගැනීමේ අරමුණින් භූමිතෙල් යොදා ධාවනය කරනු ලබන්නේ දැයි පරීක්ෂා කිරීමේ මෙහෙයුමක් පෙරේදා (7) බෙන්තොටදී ක්‍රියාත්මක කෙරිණි.

ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ විමර්ශන අංශය හා බෙන්තොට පොලීසිය ඒකාබද්ධව මේ මෙහෙයුම සිදු කෙරිණි. එහිදී බෙන්තොට නගරය හරහා ධාවනය කරනු ලැබූ මඟී ප්‍රවාහන බස් රථයක් ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ විමර්ශන අංශයේ නිලධාරීන් හා බෙන්තොට පොලීසියේ නිලධාරීන් එක්ව පරීක්ෂා කළ අයුරුයි මේ.

මහානාම විතානගේ - මල්වාන සමූහ

## බියගම නිදහස් වෙළෙඳ කලාපයේ ගංජා ජාවාරම් කළැයි සේවකයෙක් දැලේ

බියගම නිදහස් වෙළෙඳ කලාපයේ සේවකයන්ට කේරල ගංජා ජාවාරම් කළ එහි සේවකයකු බියගම පොලීසිය මඟින් පසුගියදා (6) පෙරවරුවේ එම වෙළෙඳ කලාපයේ ප්‍රධාන දොරටුව අසල දී අත්අඩංගුවට ගෙන ඇත.

ඒ සමගම මේ සේවකයා ළඟ තිබී කේරල ගංජා ග්‍රෑම්ස් 3යි මිලිග්‍රෑම්ස් 260ක් ද පොලිස් භාරයට ගැනිණි.

එහි දූෂණ මර්දන විමර්ශන අංශයේ උප පොලිස් පරීක්ෂක ජී. ඩබ්ලිව්. ඒ. කෞශල්‍ය මහතාට ලද තොරතුරක් මත වෙළෙඳ කලාපයේ සේවා වැඩ මුරය නිමවී පිටතට එන සේවකයන්ට කේරල ගංජා ජාවාරම් කිරීම සඳහා පැමිණ සිටි අවස්ථාවක මොහු මෙසේ අත්අඩංගුවට ගැනීමට හැකිවිය. මේ සේවකයා අම්පාර ප්‍රදේශයේ පදිංචි තිස් හැවිරිදි පුද්ගලයකු වන අතර ඔහු මහර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිත ය.

බියගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඊ.ඒ.සී. එල්. අමරසේකර මහතාගේ උපදෙස් අනුව දූෂණ මර්දන විමර්ශන අංශයේ උප පොලිස් පරෞක්ෂක ජී.ඩබ්ලිව්.ඒ. කෞශල්‍ය , සැරයන් උඩුනුවර සහ පො. කො. අසංක නිලධාරීහු මේ වැටලීම සිදු කළහ.

ඩබ්ලිව්.පී. ධර්මසේන - මාතර සමූහ

## හොරෙන් කොස් කඳන් ඇද්ද ලොරියක් අකුරැස්සේදී අල්ලයි

මාතර අකුරැස්ස නිල්වලා අධිවේගී පිවිසුම අසලදී කොස් කඳන් 11ක් ලොරි රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් තිදෙනකු මාතර කොට්ඨාස දූෂන මර්දන අංශය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරුවන් වල්ගම, කනත්තගොඩ, සුල්තානාගොඩ පදිංචි 36 , 38, 40 වයස්වල පසුවන්නෝ වෙති.

මාතර කොට්ඨාස දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක අජිත් මෙන්ඩිස්, උප පොලිස් පරීක්ෂක අශෝක ප්‍රියංකර යන මහත්වරුන් ඇතුළු නිලධාරීන් පසුගිය 5 වැනි දින උදෑසන මේ ලොරි රථය නතර කර පරීක්ෂා කිරීමේදී බලපත්‍ර නොමැති කොස් කඳන් එකොළහක් තිබී ඇති අතර දැවවල වටිනාකම පිළිබඳ දැව සංස්ථාවේ නිලධාරීන් විසින් වාර්තාවක් දීමට නියමිතව ඇත. සැකකරුවන් මාතර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිත ය.

කපිල සෝමරත්න - පාණදුර සමූහ

## නීතීඥයකුට අයත් ජංගම දුරකථන දෙකක් ඉස්සූ කතකට වැඩ වරදී

පාණදුර මහෙස්ත්‍රාත් අධිකරණයේ නීතීඥයකුට අයත් ජංගම දුරකථන දෙකක් පාණදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී සොරකම් කරන ලද කාන්තාවක් විශේෂ පොලිස් කාණ්ඩායමක් විසින් මිල්ලනියේදී අත්අඩංගුවට ගෙන ඇත. මෙහිදී සොරකම් කළ ජංගම දුරකථන දෙක ද සොයා ගැනිණි.

මේ සැකකාරිය සම්බන්ධයෙන් නීතීඥවරයා විසින් පාණදුර දකුණ පොලීසියට පැමිණිල්ලක් කිරීමෙන් පසු පරීක්ෂණ කටයුතු ආරම්භ විය. පාණදුර මහෙස්ත්‍රාත් අධිකරණයේ නීතීඥයකු ලෙස සේවය කරන අරුණ දීපාල යන අය පසුගිය 6වැනිදා පාණදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට ගොස් තම ජංගම දුරකථන දෙක එම කාර්යාලයේ මේසයක් මත තබා රාජකාරි කටයුත්තකට සහභාගි වෙමින් සිටියදී රුපියල් ලක්ෂයක් පමණ වටිනා මේ ජංගම දුරකථන දෙක සැකකාරිය සොරකම් කර ඇතිබව පොලිස් පරීක්ෂණයේදී අනාවරණය විය. සැකකාරිය පාණදුර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

# විස්සෙන් විගණකාධිපතිගේ ස්වාධීනත්වයට හානියක් නෑ

## ආචාර්ය උදය ශ්‍රී කාරියවසම්

**චන්දිමා කරුණාරත්න**

20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය නොවෙනස්ව ක්‍රියාත්මක වන බව වරලත් ගණකාධිකාරී ආචාර්ය උදය ශ්‍රී කාරියවසම් මහතා පැවැසීය.

එදා සිටම අද දක්වාම විගණකාධිපතිවරයා ස්වාධීන පාර්ශ්වයක් ලෙස පැවැති බවත් 19ට පෙරත් ස්වාධීනව පැවැති බවත් ප්‍රකාශ කළ ඒ මහතා එය ඉදිරියටත් නොවෙනස්ව පවතින බවත් පෙන්වා දුන්නේය.

විගණකාධිපතිවරයාට බලපෑම් කරන කිසිදු නෛතික ප්‍රතිපාදනයක් 20 වැනි සංශෝධනයෙන් නොලැබෙන බවත්, විගණකාධිපතිවරයා හිතූ හිතූ ආකාරයට පත් කළ නොහැකි බවත් උදය ශ්‍රී කාරියවසම් මහතා ප්‍රකාශ කළේය.

ඒ මහතා මේ බව පැවැසුවේ වියත්මග කාර්යාලයේදී පෙරේදා (8) පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවට සහභාගී වෙමිනි.

එහිදී ඒ මහතා වැඩි දුරටත් මෙසේද ප්‍රකාශ කළේය.

මේ වන විට සමාජයේ මාධ්‍යවේදීන්, දේශපාලනඥයන් හා විද්වතුන් තුළත් මේ ගැන විවිධ මත ඇති වී තිබෙනවා. මෙහිදී සමාජයට ඇවිත් තිබෙන සමහර කාරණා නිවැරැදි කරුණු නොවෙයි. මගේ තිබෙන අත්දැකීම් සමඟ රාජ්‍ය ආයතන කිහිපයක සේවය කළ පුද්ගලයෙක් විදිහටත් මට වගකීමක් තිබෙනවා. මොකද විගණකාධිපතිවරයා වන්නේ වරලත් ගණකාධිකාරිවරයෙක්.

ශ්‍රීලංකාවේ විගණකාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කර තිබූ සහ අදටත් එසේම තිබෙන තනතුරක්. රාජ්‍ය මූල්‍ය සම්බන්ධව පාර්ලිමේන්තුවට තිබෙන බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඒ රාජ්‍ය ආයතනයේ ගිණුම් ගැන පාර්ලිමේන්තුවට වාර්තා කිරීමේ වගකීමක් තිබෙනවා.

එසේ කිරීමේ දී ස්වාධීන පාර්ශ්වයක් විදිහට විගණකාධිපතිවරයෙක් ඉන්නවා. එම තනතුර එදා සිටම ස්වාධීන පැවැතියා. 19ට පෙරත් ස්වාධීනව පැවැතියා. එය ඉදිරියටත් නොවෙනස්ව පවතින බව 20න් පෙනෙනවා. විගණකාධිපතිවරයාගේ බලය ලැබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්. එය ඉදිරියේදීත් නොවෙනස්ව පවතිනවා.

19 වැනි සංශෝධනයට පෙර විගණකාධිපතිවරයා පත් කළේ ජනාධිපතිවරයායි. 19 දී එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට යටත්ව සිදු කළා. නැවත 20 දී ජනාධිපතිවරයා පත් කරනවා. නමුත් 19ට පසු හා 20 සම්මත වූ පසුවත් විගණකාධිපතිවරයා ඉවත් කිරීමට ජනාධිපතිවරයාට හැකියාවක් නැහැ. විගණකාධිපතිවරයාගේ විගණනයට යටත්වන ආයතන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154/1 වගන්තිය යටතේ සඳහන් වෙනවා. 20 වැනි සංශෝධනය යටතේ 154/1 වගන්තිය සංශෝධනය වෙනවා.

විගණකාධිපතිවරයා යම් අමාත්‍යාංශයටක් යටතට පත් කර තිබුණේ නැහැ. 20 වැනි සංශෝධනයෙන්ද එය වෙනස් කර නැහැ. ස්වාධීනත්වය නොවෙන්සව පවතිනවා. 20 හරහාද 154/3 වගන්තියට වෙනසක් වෙන්නේ නැහැ.

විගණන ප්‍රමිතීන් තිබෙනවා. විගණන ක්‍රමවේදය හදන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයයි. විගණකාධිපතිවරයාගේ කාර්යභාර්ය ගැන විගණන කොමිෂන් සභාවට කිසිදු බලයක් තිබුණේ නැහැ. එයට පැවැරී තිබුණේ පරිපාලන කටයුතු පමණයි.

අග්‍රාමාත්‍ය කාර්යාලය හා ජනාධිපති කාර්යයාලය විගණකාධිපතිවරයාගෙන් ඉවත් වී තිබෙනවා කියා සමහරු ප්‍රකාශ කරනවා.

ඒවාගේම විගණන කොමිෂන් සභාව පැවැතිය ද එයට අවශ්‍ය කාර්ය මණ්ඩලය පසුගිය කාලයේදී ලබා දී නැහැ. විගණකාධිපතිවරයා සිදුකරන්නේ ඒ වගවීම අදාළ රාජ්‍ය ආයතන සිදු කර තිබේද යන්න පාර්ලිමේන්තුවට වාර්තා කිරීමයි. විගණන කොමිෂන් සභාව අහෝසි වීමෙන් විගණකාධිපතිවරයාගේ තාක්ෂණික දැනුම, තාක්ෂණික ශිල්ප ක්‍රම, ස්වාධීනත්වය, විෂය පථය වෙනස් වෙන්නේ නැහැ.

වියත් මග විධායක කමිටු සාමාජික නීතිඥ යජිත් තෙන්නකෝන් මහතා ද මේ අවස්ථාවට සහභාගී විය.

# පන්තියකට 45 දානවාට ගුරු සංගම් එරෙහි වෙයි

**සිතාරා සේනානි,**

එක් පන්තියක සිටිය යුතු ළමයින් සංඛ්‍යාව 45 දක්වා වැඩි කිරීමේ ඇමැති මණ්ඩල තීරණයට එරෙහිව ගුරු සංගම් විරෝධය පළ කරයි.

ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝසප් ස්ටාලින් මහතා පවසන්නේ මෙම ඇමැති මණ්ඩල තීරණය කි්‍රයාත්මක කළහොත් තම සංගමය එයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු වාර්තා කරන බවයි.

එක් පන්තියක සිටිය යුතු සිසුන් සංඛ්‍යාව 35කට සීමා කළ යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය 2016 වසරේ තීන්දුවක් ලබා දී තිබූ බවද එම සංගමය පවසයි. එහෙයින් එම තීන්දුවට පටහැනිව සිසුන් සංඛ්‍යාව 45 දක්වා ඉහළ දැමීමට 2020-10- 04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කිරීම ශ්‍රේෂ්ඨාධිකරණයට අපහාස කිරීමක් බව ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝසප් ස්ටාලින් මහතා සඳහන් කරයි.

අධ්‍යාපන අමාත්‍යාංශය ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයට අනුව කටයුතු කරන බව ප්‍රකාශ කරමින් 2016 වසරේ ළමයින් 40 කින් ආරම්භ කර, වසරකට එක් සිසුවා බැගින් අඩු කොට 2021 වසරේ සිට ළමයින් 35 තීරණය කි්‍රයාවට නැඟීමට අවශ්‍ය චක්‍රලේඛය නිකුත් කළ බවද, එසේ තිබියදී එම තීරණය උල්ලංඝනය කරමින් අමාත්‍ය මණ්ඩලය මෙම 35 සීමාව 45 දක්වා වැඩි කිරීමට ගත් තීරණයට ලංකා ගුරු සංගමය දැඩි විරෝධය පළ කරන බවද ඒ මහතා පවසයි.

අත්‍යාවශ්‍ය වෘත්තික කණ්ඩායම් සහ විවිධ පදනම් මත පාසලට ඇතුළත් කිරීමේ දී ළමයින් 35 උපරිම සීමාව සමාජ ගැටලුවක් බවට පත් වී ඇති බවට පසුගියදා කැබිනට් මණ්ඩලයේදී තීරණය කර තිබීමෙන් පැහැදිලි වන්නේ තෝරා ගත් පිරිසකට වරප්‍රසාදයක් ලබාදීමේ අරමුණින් මෙම තීරණය ගෙන ඇති බව යැයි ද කියයි.

ශ්‍රී ලංකාවේ පාසල් 10,174 න් ජාතික පාසල් 378 ක් පැවතිය ද බරපතළ තරගකාරීත්වයක් ඇත්තේ පාසල් 36 ක පමණක් බවත්, මෙම ජනපි්‍රය සහ අධි ඉල්ලුමක් සහිත පාසල්වලට සමානව සිසුන් ඇතුළත් කිරීම වෙනුවට තෝරා ගත් පන්තියකට ඉඩ ලබාදීම වෙනුවෙන් මෙවැනි තීරණ ගැනීම සමාන සැලකීමේ මූලධර්මය උල්ලංඝනය කිරීමක් බවත් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝසප් ස්ටාලින් මහතා පෙන්වා දෙයි.

ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ මහතා මෙම තීරණයට විරෝධය පළ කරමින්, එය වහා හකුළා ගන්නා ලෙස අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා වෙත ලිපියක් යවමින් සඳහන් කර ඇත.

පන්ති කාමරයක ප්‍රශස්ත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් පවත්වා ගෙන යාමට නම් එහි ශිෂ්‍ය සංඛ්‍යාව උපරිම 35ක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් විය යුතු බව අධ්‍යාපන විශේෂඥයන්ගේ ස්ථාවරය බවත්, ගුරුවරයකුට තම සිසුන් පිළිබඳ ඉහළ අවධානයක් යොමු කිරීමට හැකි වන්නේ පන්ති කාමරයක අවම සිසුන් සංඛ්‍යාවක් සිටින විට බව අමුතුවෙන් කිව යුතු කරුණක් නොවන බවත් ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම්වරයා සඳහන් කරයි.

පටු දේශපාලන වුවමනාවන් වෙනුවෙන් පවත්වා ගෙන යන ජනප්‍රිය පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමට අවස්ථාවක් සලසා ගැනීමේ අරමුණ මිස මෙම තීරණයේ අන් යමක් නොවන බවද ඒ මහතා අධ්‍යාපන ඇමැතිවරයා වෙත යවා ඇති ලිපියේ සඳහන් කර තිබේ.

### ඇමුණුම් කටු භාවිතයෙන් තොරව
# ටී බෑග් නිෂ්පාදනයට අලුත් යන්ත්‍රයක්



ඇමුණුම් කටු භාවිතයෙන් තොරව ටී බෑග් නිෂ්පාදනය කළ හැකි නව යන්ත්‍රය ශ්‍රී ලංකික තේ නාමය ප්‍රවර්ධනය සඳහා සුවිශේෂී කාර්යක් ඉටු කරනු ඇති බව වැවිලි රාජ්‍ය අමාත්‍ය කනක හේරත් මහතා පැවසීය.

අමාත්‍යවරයා මේ බව ප්‍රකාශ කළේ ඇමුණුම් කටු භාවිතයෙන් තොරව තේ තේ බෑග් නිෂ්පාදනය කළ හැකි යන්ත්‍රයක් අමාත්‍යවරයාගේ අධීක්ෂණයට යොමු කළ අවස්ථාවේදීය. තේ කර්මාන්තයේ නියුතු ශ්‍රී ලංකික නිපැයුම්කරුවන් පිරිසක් මෙම යන්ත්‍රය දේශීයව නිෂ්පාදනය කර ඇත. මෙතෙක් කලක් තේ බෑග් නිෂ්පාදනයේදී ඇමුණුම් කටු (staples) භාවිත වූ අතර නව යන්ත්‍රයෙන් ඇමුණුම් කටු භාවිතයෙන් තොරව තේ මලු නිෂ්පාදනය කළ හැක.

මෙම තේ මලු නිෂ්පාදන යන්ත්‍රයේ නිපැයුම්කරුවන් පැවසුයේ මෙම යන්ත්‍රය ලොව ඇති එකම ඇමුණුම් කටු භාවිතයෙන් තොර යන්ත්‍රය බවයි. මෙම නව නිපැයුම සම්බන්ධයෙන් පේටන්ට් බලපත්‍රය ලබා ගැනීමට අපේක්ෂා කරන බවද ඔවුහු පැවසූහ.

මේ වනවිට යන්ත්‍ර 40ක් පමණ නිෂ්පාදනය කර ඇති බවත්, සියල්ල රට පුරා විවිධ කර්මාන්තවල තේ මලු නිෂ්පාදන කාර්යට යොදාගත හැකි බවත් යන්ත්‍රය නිෂ්පාදනය කළ ඇබකස් තේ (පුද්) ආයතනයේ ඉෂාන් ද ලැනරෝල් පැවසීය. යන්ත්‍රය පරිහරණයට සුවිශේෂී පුහුණුවක් අවශ්‍ය නොවන බවත් ඔවුහු පැවසූහ.

ඇමුණුම්කටු භාවිත නොවන බැවින් ඒවා මල බැඳීම් ලෝහ කොටස් තේ සමඟ මිශ්‍ර නොවීම වැනි ගැටලු යන්ත්‍රයෙන් මඟ හැරේ.

යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය නිරීක්ෂණයෙන් පසුව ඒ පිළිබඳ අදහස් දැක්වූ අමාත්‍යවරයා ප්‍රකාශ කළේ මෙම නිර්මාණය තේ කර්මාන්තයේ උන්නතිය වෙනුවෙන් යොදා ගැනීමට ඇති හැකියාව සොයා බලන බවයි. ඒ අනුව මෙම නිර්මාණය තේ පර්යේෂණ ආයතනයේ නිරීක්ෂණයට ඉදිරිපත් කිරීමටත්, ශ්‍රී ලාංකික තේ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමටත් යොදා ගන්නා බවත් පැවසීය.

# කරු ගැන නොකියූ කතාව



හිටපු කථානායක දේශබන්දු කරු ජයසූරිය මහතා පදනම් කරගත් විශේෂ ලිපියක් පසුගිය සැප්තැම්බර් 24 දින දිනමිණ පුවත්පතෙහි පළ වී තිබුණි. එහි සිරස්තලය වූයේ "කථානායක සමයේ ධුරය අවභාවිතා කර යකා නැටුවේ කරු" යනුවෙනි.

උපනන්ද නන්දිමිත්‍ර යන පුද්ගල නාමයකින් සම්පාදනය කර තිබූ එම ලිපිය මඟින් උත්සාහ කර තිබුණේ කරු ජයසූරිය මහතාගේ දේශපාලන භූමිකාව පිළිබඳ යම් විවරණයක් කිරීම විය හැකිය.

අදාළ ලිපියෙන් උපනන්ද නන්දිමිත්‍ර මූලික කරුණු තුනක් පිළිබඳ සිය අදහස් පළ කර තිබිණි. එහිදී ඔහුගේ ප්‍රමුඛ අවධාරණය වී තිබුණේ යෝජිත 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරයේ සභාපතිවරයා ලෙස දේශබන්ධු කරු ජයසූරිය මහතා පළ කර ඇතැයි කියන අදහසක් පදනම් කරගෙනය. එහිදී උපනන්ද නන්දිමිත්‍ර කියන්නේ 20 වැනි සංශෝධනය ගෙන එමින් ගෝඨාභය රාජපක්ෂ මහතා ඒකාධිපතියකු ලෙස කටයුතු කරන්න උත්සාහ කරන බව කරු ජයසූරිය මහතා ප්‍රකාශ කර ඇති බවය. කරුණු වශයෙන් සැලකීමේදී එය සම්පූර්ණයෙන්ම අසත්‍ය ප්‍රකාශයකි.

සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය නියෝජනය කරමින් එහි සභාපතිවරයා ලෙස කරු ජයසූරිය මහතා කිසිදු අවස්ථාවක දී ගෝඨාභය රාජපක්ෂ මහතා ඒකාධිපතියකු ලෙස හඳුන්වා දී නැත. එහෙත් 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් රජය විසින් ගනු ලබන උත්සාහය සාර්ථක වුවහොත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයට ඇතිවිය හැකි ඛේදනීය ඉරණම හා ඒ තුළ රටේ ජනතාව අත්විඳිමින් සිටින නිදහස හා අයිතිවාසිකම්වලට ඇතිවිය හැකි බරපතළ හානි පිළිබඳ කරු ජයසූරිය මහතා මෙන්ම සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය ද ඕනෑ තරම් කරුණු දක්වා තිබේ.

එහෙත් කිසිදු විටක පුද්ගලයකු ලෙස මෙන්ම රටේ ජනාධිපතිවරයා ලෙස ද ගෝඨාභය රාජපක්ෂ මහතා ඉලක්ක කරගනිමින් පටු හා ද්වේෂ සහගත විවේචන එල්ල කිරීමට ඔවුන් කිසිවිටෙක කටයුතු කර නැත.

20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ. සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය රට හමුවේ කරුණු දැක්වූ පළමුවන ප්‍රවෘත්ති සාකච්ඡාවේදීත් ඉන් අනතුරුව සිදු කළ සියලු අදහස් දැක්වීම්වලදීත් කරු ජයසූරිය මහතා අවධාරණය කළ ප්‍රමුඛතම කරුණ වූයේ රටක ව්‍යවස්ථාවක් නිර්මාණය කරගැනීමේදී මෙන්ම ව්‍යවස්ථා සංශෝධනයක් සිදුකිරීමේදී එක් පුද්ගලයකුගේ අරමුණක් පෙරදැරිව හෝ පුද්ගල කේන්ද්‍රීයව එකී කටයුතු සිදු නොවිය යුතුව ඇතැයි යන්නය.

එවන් අවස්ථාවලදී ජයසූරිය මහතා ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නම සඳහන් කර ඇත්නම් එය සිදුකර ඇත්තේ එක් කරුණක් පැහැදිලි කරලීමටය. එනම් 20 වැනි සංශෝධනය මඟින් ගෝඨාභය රාජපක්ෂ මහතාට ඒකාධිපතියකු වීමේ අරමුණක් ඇතැම් විට නොතිබිය හැකි වූවත් එකී සංශෝධනය මඟින් ජනාධිපතිවරයාට ලබාදෙන අසීමිත බලය තුළ අනාගතයේ යම් දිනක මේ රටේ ඒකාධිපති පාලකයකු නිර්මාණයවීමේ අනතුරක් එමඟින් ඇතිවන බවය. එය බැහැර කරන කිසියම් විද්වතකු ඇත්නම් එම විද්වතා කවුරුන්ද යන්න සඳහන් කිරීම ද ලේඛකයාගේ වගකීමක් වී තිබුණි. එහෙත් අදාළ ලිපියේ කිසිදු තැනක එම විද්වතා කවුරුන් ද යන්න සඳහන් වී නොතිබිණි.

උපනන්ද නන්දිමිත්‍ර මහතාගේ දෙවැනි අවධාරණය වී තිබුණේ කරු ජයසූරිය මහතා පාර්ලිමේන්තුවේ කථානායකවරයා ලෙස කටයුතු කරමින් සිටියදී සිය ධුරයේ බලය අවභාවිතා කළ බවය. එමෙන්ම පාර්ලිමේන්තුවේදී යකා නැටූ අයකු වන බවය. ඔහු එම අවධාරණය කිරීමේදී නම් උපුටා දැක්වීම් දෙකක් සිදු කර තිබුණි. ඒ නීතිඥ ක්‍රිෂ්මාල් වර්ණකුලසූරිය මහතා සහ පූජ්‍ය බෙංගමුවේ නාලක හිමියන් ප්‍රකාශ කර ඇතැයි කියන අදහස් කිහිපයක් මතු කර දක්වමිනි.

නීතිඥ ක්‍රිෂ්මාල් වර්ණකුලසූරිය මහතා මෙන්ම බෙංගමුවේ නාලක හිමියන් ද එම අදහස් පළ කර ඇති බව පෙනෙන්නේ 2018 වසරේදී මේ රටේ සිදු වූ දේශපාලන සිද්ධියක් පදනම් කරගෙනය. එනම් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා අග්‍රාමාත්‍යවරයා ලෙස මහින්ද රාජපක්ෂ මහතා පත් කරමින් නව කැබිනට් මණ්ඩලයක් පත් කළ අවස්ථාවේදී රට තුළ මතු වූ දේශපාලන අර්බුදය පදනම් කරගෙනය.

එහෙත් එම අවස්ථාවේදී එම දෙපළ පළ කර ඇති අදහස් දැක්වීම් තුළ ගම්‍ය වන මූලික තර්ක පිළිබඳ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරු ප්‍රමුඛ විනිසුරුවන් මඬුල්ලක් ලබා දී ඇති තීන්දුව පිළිබඳ ලේඛකයා කිසිදු අවධානයක් යොමු කර නොතිබීම නම් බරපතළ වැරැද්දකි. විශාල අඩුපාඩුවකි, අදාළ දේශපාලන අර්බුදය දිගහැරුණු මොහොතේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක ධුරය හොබවන ලද්දේ කරු ජයසූරිය මහතාය. එහිදී ඔහු යම් ස්ථාවරයක පිහිටා කටයුතු කළේ නම් එම ස්ථාවරය ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් දී ඇති තීන්දුව මඟින් ද තහවුරු වී ඇති බව ඉතා පැහැදිලිය.

අදාළ ලේඛකයාට මෙන්ම සමස්ත පාඨක ජනතාවගේ අවධානය යොමු කළ යුතු වැදගත්ම කරුණ වන්නේ කරු ජයසූරිය මහතා කොළඹ නගරාධිපති ලෙස කටයුතු කළේ මාස 16ක් තරම් ඉතාමත් කෙටි කාලසීමාවක් වන බවය. එහෙත් එම කෙටි කාලසීමාව තුළ කොළඹ නගර සභාව දක්වා ඇති වේගවත් ප්‍රගතිය හා ඒ තුළ ජාතික හා අන්තර්ජාතික වශයෙන් දිනා ඇති කීර්තිය අන් කිසිදු නගරාධිපතිවරයකුගේ යුගයක ලබාගත නොහැකි වූ තරම සුවිශේෂී වන බවය.

දකුණු ආසියාවේ පවිත්‍රම නගරය ලෙස කොළඹ නගරය සම්මානයට පත්වන්නේ එම කාලයේදීය.

එමෙන්ම කොළඹ නගර සභාව ආසියානු කලාපයේම ප්‍රථම ස්ථානයට පත්කරමින් තවත් අන්තර්ජාතික සම්මාන දෙකක්ම දිනා ගත්තේ එම යුගයේදීය. ඒ ආසියානු කලාපයේ හොඳම නගර සභාව හා ආසියානු කලාපයේ නව්‍යකරණයට ලක්වන හොඳම නගර සභාව වශයෙනි. උපනන්ද නන්දිමිත්‍ර ලේඛකයා එය දකිනු ඇත්තේ අඳුරු යුගයක් ලෙස නම් ඒ මඟින් අප තේරුම්ගත යුත්තේ කුමක්දැයි තීරණය කිරීම පාඨකයාට භාර කළ යුතුය.

අදාළ ලිපියේ සමස්තාර්ථය ගෙන සලකා බැලූව ද දැකිය හැකි වන්නේ එවැනි තත්වයකි. දේශපාලන ළැදියාවන් තුළ වේවා තම ස්වාමීත්වය මත පිහිටා හෝ වේවා කරුණු විග්‍රහ කිරීමට ඕනෑම අයකුට අයිතියක් තිබේ. ඒ අයිතියට අප නිතැතින්ම ගරු කළ යුතුය. එහෙත් එවැනි ඕනෑම අයෙක් එසේ කිරීමේ දී ඒ සඳහා පදනම් කරගත යුත්තේ නිශ්චිත කරුණු හා සාධකයන්මය.

**සුනිල් ජයසේකර**
**මාධ්‍ය ලේකම්, සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරය**



# පැපිලියාන සුනේත්‍රා මහා දේවි පිරිවෙනෙහි ප්‍රභාලෝකය

ශ්‍රී ලාංකේය බෞද්ධ භික්ෂුවකගේ නූතන භූමිකාව කුමක් විය යුතු ද යන්න වරින් වර සමාජ කතිකාවට ගෝචර වන සංවාදශීලී තේමාවකි. එකී තේමාවේ ඉදිරියෙන්ම සිටින තරුණ යතිවරයන් වහන්සේ නමක් වශයෙන් මහාචාර්ය මැදගොඩ අභයතිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේ අවිවාදයෙන් ම හැඳින්විය හැකිය. තිස්වසරක් පුරා නිකැළැල් පැවිදි ජීවිතයක් ගත කරමින් සිටින උන්වහන්සේගේ පන්සාළිස් ජන්ම දින සැමරුම වෙනුවෙන් මෙම සටහන තැබීමට හැකිවීම අපට මහත් වූ ආනන්දයකි.

### ළමා විය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල, ඉහළ මැදගොඩ, විද්‍යාසූරී දේශීය වෛද්‍යාචාර්ය පොඩිබණ්ඩාර වීරසූරිය මැතිතුමා හා විමලධර්මසූරිය සෙනරත් අභයකෝන් වාසල රාලහාමිලාගේ චන්ද්‍රාවතී මැණිකේ මැතිනියගේ තුන්වැනි පිරිමි දරුවා ලෙස 1976 වප් මස දසවන දින උපත ලද මේ කතා කරුවා සිය මෑණියන්ගේ ජන්ම දිනය යෙදී තිබූ 1988 සැප්තැම්බර් 13 වැනි දින, එවකට පැපිලියාන ඓතිහාසික සුනේත්‍රා මහාදේවී පිරිවෙන් රජමහා විහාරාධිපති ආචාර්ය මැදගොඩ සුමනතිස්ස මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ඉල්ලීම මත ප්‍රාව්‍රජාභිලාශයෙන් තත් විහාරස්ථානයට පැමිණියේ යාන්තමට 12 වැනි විය පිරෙද්දීය.

### පැවිදිවීම

පැපිලියාන සුනේත්‍රා මහාදේවී කනිටු විදුහලෙන් තවදුරටත් අධ්‍යාපනය හදාළ ඔහු සිය දිවි ගමනේ හැරවුම් ලක්ෂ්‍යය සටහන් කරගනිමින් ආචාර්ය මැදගොඩ සුමනතිස්ස මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආචාර්යත්වයෙන් 1990 මැයි මස 7 වැනි දින උතුම් ප්‍රව්‍රජ්ජා සම්පත්තිය ලැබීය. මැදගොඩ අභයතිස්ස නම් වූ කුඩා සාමණේරයන් වහන්සේගේ ස්මෘතිය පිළිබඳ වූ සහජ දක්ෂතාව කල් තියාම හඳුනාගත් මැදගොඩ සුමනතිස්ස මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ සිය ශිෂ්‍ය පුත්‍ර තෙම පිරිවෙන් අධ්‍යාපනයට යොමු කරවීමට පෙර මූලික බණදහම් වනපොත් කරමින් නිසි ගුරු ඇසුරක ගොඩනගනු පිණිස එවකට කිඳෙල්පිටිය ශ්‍රී මහා චෛතියාරාම විහාරාධිපති හඟුරන්කෙත විමල අනුනාහිමියන්ට භාරකරවීය. එය මැදගොඩ අභයතිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ පැවිදි දිවිය සර්ව සම්පූර්ණ වීමට මහත් පිටිවහලක් විය.

කාලයක් ඇවෑමෙන් සිය ශිෂ්‍ය පුත්‍රයාණන් විෂයයෙහි අපේක්ෂා කළ අභිප්‍රාය එකී ස්ථානයෙන් සඵල වූ බව වටහාගත් සුමනතිස්ස ගුරු හාමුදුරුවෝ දෙවනුව සිය සමකාලීන යතිවරයන් වහන්සේ නමක් වූ එවකට විද්‍යෝදය මහ පිරිවෙන්පති රාජකීය පණ්ඩිත අකුරටියේ අමරවංශ නාහිමිපාණන් වහන්සේට සිය ශිෂ්‍ය පුත්‍රයාණන් භාර කළහ. ඒ අනුව 1992-1998 කාලය තුළ විද්‍යෝදය පිරිවෙණෙන් මූලික හා ද්විතීයික අධ්‍යාපනය ලද උන්වහන්සේ 1997 වසරේ රාජකීය පණ්ඩිත උපාධිය සාර්ථක ලෙස පිමා කරමින් සියලු විෂයන් සඳහා වැඩිම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයන්ට පිරිනමනු ලබන සියලුම ත්‍යාග දිනා ගැනීමට සමත් වූහ.

### උසස් අධ්‍යාපනය

වසරේ විශිෂ්ටතම ශිෂ්‍යයාට පිරිනමන සුවිශේෂතම සම්මානය වන 'ශ්‍යාමරාජ' ත්‍යාගය හිමි කර ගැනීම ඒ අතුරින් වඩාත් විශේෂ වෙයි. මැදගොඩ අභයතිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අධ්‍යාපන ගමන් මගෙහි ඊළඟ නවාතැන වූයේ කැලණිය විශ්වවිද්‍යාලයයි. එහි දී පාලි විෂයය පිළිබඳ පළමු වන පන්තියේ සාමර්ථ්‍යයක් සහිත ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය ද, ශාස්ත්‍රපති උපාධිය සහ දර්ශනපති උපාධිය ද වශයෙන් වසර හතක් වැනි කෙටි කාලයක් තුළ උපාධි ත්‍රිත්වයක් ලබා ගැනීමට උන්වහන්සේ සමත් වූහ. සිය අධ්‍යාපන ගමන් මග නිමා නොකළ උන්වහන්සේ අනතුරුව ඉන්දියාවේ දිල්ලි විශ්වවිද්‍යාලයට ඇතුළත් ව මහාචාර්ය අයි. පී. සිං නම් වූ කීර්තිමත් ඉන්දීය මහැදුරු තුමන්ගේ උපදේශකත්වයෙන් ආචාර්ය උපාධිය ලබා ගත්හ.

මෙලෙස සිය අධ්‍යාපන ගමන් මගෙහි හිණිපෙත්තට නැඟි උන්වහන්සේගේ සේවාව අනාගත ශ්‍රී ලාංකේය ශාස්ත්‍රාභිලාශීන් වෙත ප්‍රදානය කිරීමේ අවස්ථාව උදා වූයේ 2003 වසරේ දී කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ සහාය කථිකාචාර්ය ධූරයකට බඳවා ගැනීමෙනි. අනතුරුව 2005 වසරේ දී ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය ධූරය ලබාගත් උන්වහන්සේ එහිම ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධුරයට ද පත් වූහ. අනතුරුව 2010 වසරේ දී උන්වහන්සේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි භාෂාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු වශයෙන් පත්වීම් ලැබ පැමිණීම මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයටත් සමස්ත විශ්වවිද්‍යාලයටත් මහත් ආලෝකයක් විය. මෙය එක්තරා අයුරකින් පරවේණියානුබද්ධ ඓතිහාසික ආගමනයකි. මෙකී පත්වීමත් සමග සිය ගුරුදේවෝත්තමයන් වූ ආචාර්ය මැදගොඩ සුමනතිස්ස මහා ස්වාමීන්ද්‍රයන් කුලපති ධුරය හොබවන ලද්දා වූ ද, උන්වහන්සේගේ සග පරපුරට අයත් සාංඝික භූමියක ස්ථාපිත වූ ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ඔසවා තැබීමේ ඓතිහාසික වගකීමක් මැදගොඩ අභයතිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේට පැවරිණි. එය තවදුරටත් තහවුරු කරමින් 2016 වසරේ දී උන්වහන්සේ පාලි භාෂාව පිළිබඳ මහාචාර්ය තනතුරට ද පත් වූහ.

මේ දක්වා සංක්ෂිප්ත කළ උන්වහන්සේගේ චරිත කතාවෙහි නොපළ වූ බොහෝ දේ තිබේ. එදා මෙදා තුර ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික හා දේශපාලන පෙරළියෙහි පුරෝගාමී මෙහෙවරක් උන්වහන්සේ සිදු කර තිබේ. "දොරමඬලාවේ හාමුදුරුවෝ" නමින් ප්‍රකටව උන්වහන්සේගේ චතුර දේශනා විලාසයත් ත්‍රිපිටකය විෂයයෙහි ප්‍රාමාණික දැනුමත් පුළුල් සමාජ දේශපාලනික දැනුමත් සමාජ ගතවිය. "මැදගොඩ හාමුදුරුවෝ" හෙවත් "පැපිලියානේ හාමුදුරුවෝ" නමින් ජාතිමාමකත්වය හරහා ජන හදවත් තුළ ලැගුම්ගෙන ඇති උන්වහන්සේ වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම ජාතියේ මුරදේවතාවකු ලෙස කටයුතු කරති.


### සමාජ මෙහෙවර

රටෙන් යමක් ලබා ගන්නවාට වඩා උන්වහන්සේ රටට දී ඇති දෑ බොහෝය. අද පැපිලියාන සුනේත්‍රා මහා දේවි විද්‍යාස්ථානය කීර්තිමත් අධ්‍යාපනික ආයතනයකි. ආදර්ශවත් බෞද්ධ සිද්ධස්ථානයකි. මනා දැනුමින් පිරිපුන් සහජ කුසලතාව මත පදනම්ව රට පුරාත් ලෝකයේ විවිධ රටවලත් ධර්ම දූත සේවාවේ යෙදෙන්නට උන්වහන්සේට හැකියාව ලැබී ඇත්තේ සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි මෙන්ම හින්දි බසද හැසිරවීමේ ප්‍රවීණතාව නිසාය.

ශ්‍රී ලාංකේය අනාගත ශාසනික අභිවෘද්ධිය උදෙසා භික්ෂුවකගේ භූමිකාව ප්‍රතිනිර්මාණය කිරීමේ දී මහාචාර්ය මැදගොඩ අභයතිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ බොහෝය. එක රැයින් ධර්ම දේශකයන් හා ධර්ම දූතයන් වහන්සේලා බිහිවීමේ ක්‍රමය වෙනුවට ප්‍රථමයෙන්ම නිසි මඟ පෙන්වීමක් යටතේ මූලික බණ දහම් සහ ශාසනික පිළිවෙත් ප්‍රගුණ කරවීමට සාමණේරයන් වහන්සේලා යොමු කළ යුතුය යන ආදර්ශය ඉන් එකකි. ත්‍රිපිටක ධර්මය, පාලි, සංස්කෘත හා සිංහල විෂය දැනුම කේන්ද්‍ර කරගත් මූලික පිරිවෙන් අධ්‍යාපනයටත් තෙවනුව උසස් අධ්‍යාපනයටත් යොමු කරවිය හැකි ක්‍රමවේදයක් අවැසි බවත් ප්‍රකට වෙයි. දැනුමින් පිරිපුන් සේම ජාති හිතෛෂී බවත් ශාසනස්ප්‍රීතිකාමී උද්‍යෝගයත්, අනුන්ගේ දුකෙහි දී පිහිටවීමේ පරමාභිලාශයත් සහිත ආකල්පමය වෙනසකට යොමු කිරීමේ වැදගත්කම ද මෙයින් අවධාරණය වෙයි. අභයතිස්ස ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ චරිතය විෂයෙහි ප්‍රභාමත් බවට හේතු වී ඇත්තේ උන්වහන්සේ කුඩා කළ පටන් ලද එබඳු භාවිතාවයි. බෞද්ධ භික්ෂුවක සතු විය යුතු පරාර්ථකාමී ගුණය ජාති, ආගම්, කුල ගොත්, නිකාය භේදයකින් තොර විය යුතු බවට කදිම ආදර්ශයක් අභයතිස්ස හාමුදුරුවන්ගෙන් ලැබෙයි. උන්වහන්සේ කිසි විටෙකත් ස්ව නිකාය පමණක් මුල් තැන තබා කටයුතු නොකරති. මෙරට පිටරට වැසි සියලු ස්වාමීන්ද්‍රයන් වහන්සේලා උන්වහන්සේගේ වන්දනාවට හා සම්මානනාවට පාත්‍ර වෙති. රටේ සියලු සිද්ධස්ථාන විෂයයෙහි උන්වහන්සේ දක්වන්නේ මෙකී සමානාත්මතා ප්‍රතිපදාවයි. සිය ගුරු දේවෝත්තමයන් වහන්සේගේ වාර්ෂික ගුණ සමරුව නිමිත්තෙන් එලදායී යමක් ඉටු කිරීම අභයතිස්ස හිමියන් දිගටම අනුගමනය කළ පිළිවෙතයි. ඒ අනුව ඈත පිටිසරබද ගම්මානයන්හි අඩු පහසුකම් සහිත විහාරස්ථානවලට පහසුකම් සැපයීම, නිවාස අහිමි දිළිඳු පවුල් උදෙසා නිවාස තනා දීම, වගා ලිං, ජල ටැංකි, කෘෂි මෙවලම් සැපයීම ආදී සුවිශාල සමාජ සුබසාධන කාර්යයක් උන්වහන්සේ වාර්ෂිකව සිදු කරති.

මෙකී අනේකවිධ ගතිගුණයෙන් සෝභමාන මහාචාර්ය මැදගොඩ අභයතිස්ස යතිවරයාණන් වහන්සේට චිරාත් කාලයක් ශාසනික හා ජාතික සේවාවෙහි නියුත්තව වැඩ වඩන්නට දිරිය හා බලය වැඩේවායි ප්‍රාර්ථනා කරමු.

**ආචාර්ය පින්නවල සංඝසුමන හිමි**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**



පුහුණුකරුවන් - නිලධාරීන් - කථිකාචාර්යවරුන් ඇතුළු 91ක් සිටි

## ආධුනික මල්ලවපොර වැඩමුළුවට පැමිණි

# මාරපොළ පුහුණුකරුගේ පීසීආර් වාර්තාව අද

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනය සංවිධාන කළ මල්ලවපොර පුහුණුකරුවන්ගේ වැඩමුළුවකට සහභාගී වූ මාරපොළ ප්‍රදේශයේ පුහුණුකරුවකුගේ මව බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවිකාවක බැවින් චීන වරාය නිරෝධායන කඳවුරේ සිටින එම පුහුණුකරු ඊයේ පීසීආර් පරීක්ෂණයකට ලක් කොට ඇත. නිරෝධායන මධ්‍යස්ථානයේ සිටින මල්ලවපොර පුහුණුකරුගේ පීසීආර් පරීක්ෂණ වාර්තාව අද ලැබෙනු ඇතැයි පැවැසේ. එම බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවිකාව සෞඛ්‍ය අංශවල අධීක්ෂණය යටතේ වෙනම රඳවා සිටී.

මේ නවක ආධුනික මල්ලවපොර පුහුණුකරුවන්ගේ වැඩමුළුව පසුගිය 2 හා 3 දෙදින කොළඹ ටොරින්ටන් ක්‍රීඩා අමාත්‍යාංශ ක්‍රීඩාංගණයේ පැවැති අතර, වැඩමුළුවට මල්ලවපොර පුහුණකරුවන් 79ක්, මල්ලවපොර සම්මේලනයේ නිලධාරීන් 6ක්, පුහුණු කථිකාචාර්යවරුන් 6ක් එක්ව සිටියහ. සහභාගී වූ පුහුණුකරුවන් බහුතරය පාසල් ක්‍රීඩා හා ශාරීරික අභ්‍යාසක ගුරුවරුන් ලෙස අලුතින් පත්වීම් ලද අය බව ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනයේ සභාපති ප්‍රදීප් ප්‍රියන්ත පෙරේරා මහතා 'දිනමිණ'ට පැවැසීය.

වැඩමුළුව අවසානයේ සියලු පිරිස් නිවෙස් වෙත ගිය පසු මාරපොළ ප්‍රදේශයේ පුහුණුකරුවකුගේ මව බ්‍රැන්ඩික්ස් ආයතනයේ සේවය කළ අයකු බැවින් එම කාන්තාවගේ නිවෙසේ සියලු දෙනා නිරෝධායනයට ලක් කිරීමට සෞඛ්‍ය අංශ පියවර ගෙන ඇත. මේ හේතුවෙන් ආධුනික මල්ලවපොර පුහුණුකරුවන්ගේ වැඩමුළුවට පැමිණි මාරපොළ පුහුණුකරු ද නිරෝධායන මධ්‍යස්ථානයට රැගෙන යනු ලැබිණි.

කෙසේ වුවද එම මාරපොළ මල්ලවපොර පුහුණුකරු දැනට කිසිදු කොවිඩ් රෝග ලක්ෂණයක් පෙන්නුම් නොකරන බවත් ඔහු ඉතා හොඳ තත්ත්වයේ සිටින බවත් කරුණු තහවුරු කර ගත් බව ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනයේ සභාපතිවරයා සඳහන් කළේය. එබැවින් නවක ආධුනික මල්ලවපොර පුහුණුකරුවන්ගේ වැඩමුළුවට සහභාගී වූ කිසිදු පුහුණකරුවකු, නිලධාරියකු හෝ පුහුණු කථිකාචාර්යවරයකු අනිසි බියක් ඇති කරගත යුතු නැතැයි ඒ මහතා පැවැසීය.

කෙසේ වුවද නවක ආධුනික මල්ලවපොර පුහුණුකරුවන්ගේ වැඩමුළුවට සහභාගී වූ සියලු දෙනාට මේ තත්ත්වය දුරකතන මගින් දැනුම්දීමට ක්‍රීඩා අමාත්‍යාංශයේ මල්ලවපොර ක්‍රීඩාව භාර ව්‍යාපෘති නිලධාරී සිසිර වැල්ලේගෙදර මහතා පියවර ගෙන තිබිණි. එම දැනුම්දීමෙන් ආධුනික මල්ලවපොර පුහුණුකරුවන්ගේ වැඩමුළුවට සහභාගී වූ අයට මෙන්ම ඔවුන් සමඟ ජීවත් වන සියලු දෙනාට ආරක්ෂිතව සිටීමේ ඉඩ ප්‍රස්තා විවර කිරීම අරමුණ විය.

මේ වැඩමුළුව සෑම වසරකම සංවිධාන කරන බවත් කොරෝනා තර්ජන පැවැතීම හේතුවෙන් මෙවර පැවැත්වීමේදී ක්‍රීඩා වෛද්‍ය ඒකකයේ උපදෙස් හා විශේෂ අවසරය ලිඛිතව ලබා ගැනීමට පියවර ගත් බවත් ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනයේ සභාපති ප්‍රදීප් ප්‍රියන්ත පෙරේරා මහතා පැවැසීය.

ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනයේ නිල කාලය අවසන් වීමට ඔන්න මෙන්න තිබෙන හෙයින් වත්මන් පාලනය අවසන් වැඩමුළුව ලෙස මෙය සංවිධාන කළේය. වරින් වර අර්බුද රැසකට මුහුණ දුන් ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනයේ නව නිලධාරීන් තෝරා ගැනීමේ නිලවරණය ලබන මස 30 වැනිදා පැවැත්වීමට නියමිතව ඇත. එම නිලවරණයට වත්මන් සභාපති ඇතුළු මේ වැඩමුළුව සංවිධාන කළ ප්‍රධාන නිලධාරීන් කිහිපදෙනකු ඉදිරිපත් නොවීමට තීරණය කොට ඇත.

## මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය දිස්ත්‍රික් ක්‍රීඩා ශූරතාව දිනයි



සඳුන් සහ විහංගා



සමස්ත ක්‍රීඩා ශූරතාව මාතලේ ප්‍රා.ලේ කොට්ඨාසයට ප්‍රදානය කළ අයුරු. මාතලේ ක්‍රීඩා නිලධාරි පී.කේ අලුවිහාරේ සහ මාතලේ දිසා මලල ක්‍රීඩා පුහුණුකාරිනි විශාඛා මල්ලව යන මහත්ම මහත්මීහු ද මෙහි වෙති.

*ඡායාරූප - මාතලේ දිසා විශේෂ*

**මාතලේ දිසා විශේෂ**
**අසෝක හිඳගොඩ**

හතළිස් හය වැනි ජාතික මහා ක්‍රීඩා උලෙළට සමගාමීව දෙවැනි අදියර යටතේ පැවැති 2020 මාතලේ දිස්ත්‍රික් ක්‍රීඩා තරගාවලියේ සමස්ත ශූරතාව දිනා ගැනිමට මාතලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය සමත් විය.

මාතලේ එඩ්වඩ් ද සිල්වා ක්‍රීඩාංගණයේ පැවැති මේ තරගාවලියේ අනු ශූරතාව නාඋල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට හිමි විය.

මෙහිදි වසරේ මලල ක්‍රීඩා ශූරතාව ලකුණු 25ක් ගත් මාතලේ ප්‍රා.ලේ කොට්ඨාසය විසින් ද අනුශූරතාව ලකුණු 20ක් රැස් කළ උකුවෙල ප්‍රා.ලේ කොට්ඨාසය විසින් ද හිමි කර ගත්තේය.

මෙවර තරගාවලියේ දක්ෂතම මලල ක්‍රීඩකයා ලෙස උකුවෙල කොට්ඨාසයේ සඳුන් තුෂාර සෙනෙවිරත්න (තුම්පිම්ම මීටර් 14.20) සහ දක්ෂතම මලල ක්‍රීඩිකාව ලෙස ශාලුකී විහංගා (මීටර් 100 තත්.13.5) සම්මාන ලැබූහ.

මාතලේ දිසා ක්‍රීඩා නිලධාරි ලක්ෂ්මන් විජේසේකර මහතාගේ අධීක්ෂණය යටතේ මාතලේ දිසා ක්‍රීඩා නිලධාරි කාර්යාලය මගින් ක්‍රීඩා උලෙළ සංවිධානය කර තිබිණි.

තරගාවලියේ ජය සංකේත ප්‍රදානය මාතලේ දිසා ක්‍රීඩා නිලධාරි ලක්ෂ්මන් විජේසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු විය. මේ අවස්ථාවට මාතලේ තරුණ සේවා සහකාර අධක්ෂ තිලක් ධර්මකීර්ති සහ මධ්‍යම පළාත් හිටපු ක්‍රීඩා අධක්ෂ කේ.පී.බී නිශ්ශංක යන මහත්වරු ද එක් වූහ.

## සෞඛ්‍ය නීති පිළිපදින්න

### ක්‍රීඩා අමාත්‍යාංශය කියයි

කොවිඩ් වයිරස් තත්ත්වය හේතුවන් පසුගිය 4 වැනිදා සිට ලබන 31 වැනිදා දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති නියෝග අනුව මහජනතාව රැස් වන සියලු ක්‍රියාකාරකම් සංවිධාන කිරීම හා පැවැත්වීම තහනම් කොට හෝ සීමා කර ඇත. ශාරීරික යෝග්‍යතා මධ්‍යස්ථාන සහ ක්‍රීඩාගාරවල සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් ක්‍රීඩා කළ හැකි පුද්ගලයන් සංඛ්‍යාව 50% දක්වා සීමා කර ඇත. රජය මගින් නිකුත් කර ඇති මේ නියෝග ක්‍රීඩා අංශයට ද අදාළ වන බව ක්‍රීඩා අමාත්‍යාංශය පවසයි.

එම නිසා මේ නියෝග ක්‍රීඩා සංගම් හා ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිළිපැදිය යුතු අතර, ක්‍රීඩා කටයුතුවලදී ප්‍රාදේශීය වශයෙන් ඇති වන ගැටලු සෞඛ්‍ය බලධාරීන් සමඟ සාකච්ඡා කොට තීරණය කළ යුතු බවත්, ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණුවීම් කටයුතු සෞඛ්‍යාරක්ෂිතව සිදු කිරීමේදී ක්‍රීඩා අමාත්‍යාංශය මගින් කොවිඩ් 19 රෝග තත්ත්වය යටතේ නැවැත ක්‍රීඩාව පවත්වා ගැනීමට නිකුත් කර ඇති 'ක්‍රීඩාව නැවත ආරම්භ කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ' පියවර 1 සිට 3 දක්වා ඇති ආකාරයට පුහුණුවීම් කටයුතු සිදු කළ යුත බවත් ක්‍රීඩා අමාත්‍යාංශය කියයි. මේ සම්බන්ධ සියලු තොරතුරු මැයි 11දා ක්‍රීඩා වෛද්‍ය ආයතනය මගින් සම්පාදනය කළ 'කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය හමුවේ ක්‍රීඩා පුහුණුවීම් නැවත ආරම්භ කිරීම සඳහා වූ ජාතික මාර්ගෝපදේශ සංග්‍රහය' මගින් ලබා ගත හැකිය.



## මැග් ලැනින් පෙරමුණට



**ඔස්ට්‍රේලියානු ක්‍රිකට් නායිකා මැග් ලැනින් අයිසීසීය නිකුත් කළ නවතම කාන්තා එක්දින ක්‍රිකට් ශ්‍රේණිගත කිරීම්වල පිතිකරණ අංශයෙන් පෙරමුණ ගැනීමට සමත් වූවාය.**

**නවසීලන්ත කාන්තා පිල සමඟ ඔස්ට්‍රේලියාවේ සත්කාරකත්වයෙන් පැවැති තරග 3කින් සමන්විත එක්දින තරගාවලියේදී තරග 2කට එක් වූ ලැනින් ලකුණු 163ක් රැස් කිරීමට සමත් වූයේ ශතකයක් සහ අර්ධ ශතකයක් සමඟිනි. මේ දස්කම් හේතුවෙන් ශ්‍රේණිගත කිරීම්වල 5 වැනි ස්ථානයේ සිට පළමු ස්ථානය දක්වා ඉහළට ඒමට 28 හැවිරිදි ලැනින් සමත් වූවාය. ඇය මෙලෙස ශ්‍රේණිගත කිරීම්වල පළමු ස්ථානය හිමි කර ගත් 5 වැනි අවස්ථාව මෙයයි. 2014 වසරේ පළමු වරට ලෝක පිතිකාරිනියන් ශ්‍රේණිගත කිරීම්වල පළමු ස්ථානයට පිවිසි ලැනින් අවසන් වරට 2018 වසරේ ඔක්තෝබර් මාසයේදී ශ්‍රේණිගත කිරීම්වල පෙරමුණට පිවිස තිබිණි. මේ සමඟින් බටහිර ඉන්දීය කොදෙව් ක්‍රීඩිකා ස්ටෙෆානි ටේලර් දෙවැනි ස්ථානය දක්වා පහතට වැටිණි.**

## තුන්වැනි ජයෙන් සන්රයිසස් තෙවැනි තැනට



ජොනි බෙයාර්ස්ටෝව්

දහතුන් වැනි අයිපීඑල් ක්‍රිකට් තරගාවලියේ සිය තෙවැනි ජයග්‍රහණය වාර්තා කළ ඩේවිඩ් වෝනර්ගේ නායකත්වයෙන් යුත් සන්රයිසස් හයිද්‍රාබාද් පිල ප්‍රසාද ලකුණු සටහනේ තෙවැනි ස්ථානය දක්වා ඉහළට ඒමට ද සමත් විය. ඩුබායිහිදී පැවැති තරගාවලියේ 22 වැනි තරගය ආරම්භ වන විට 6 වැනි ස්ථානයේ පසු වූ හයිද්‍රාබාද් පිල හමුවේ කිංග්ස් ලෙවන් පන්ජාබ් කණ්ඩායම ලකුණු 69කින් පරාජයට පත් විය. තරගයේ පළමුව පන්දුවට පහර දෙමින් සන්රයිසස් පිල ලබා දුන් ලකුණු 202ක ඉලක්කය හමුවේ පන්ජාබ් පිතිකරුවන් සියලු දෙනාට ඕවර 16.5කදී රැස් කළ හැකි වූයේ ලකුණු 132ක් පමණි. මෙවර තරගාවලියේ වේගවත්ම අර්ධ ශතකය වාර්තා කළ නිකලස් පූරන් පන්දු 37කින් ලකුණු 77ක් රැස් කළ ද අවසන් කඩුලු 5 ලකුණු 6ක් තුළ බිඳ වැටීමෙන් පන්ජාබ් කණ්ඩායමට ජයග්‍රාහී ඉලක්කය පසු කිරීමට නොහැකි විය. පන්දු 17කින් අර්ධ ශතකය රැස් කළ පූරන් හතරේ පහර 5ක් සහ හයේ පහර 7කින් ඉනිම වර්ණවත් කර ගත්තේය. සන්රයිසස් පන්දු යවන්නන් හමුවේ සෙසු පිතිකරුවන්ට ලකුණු 11 සීමාව ඉක්මවීමට නොහැකි විණි. පන්දු යැවීමේදී රෂීඩ් ඛාන් කඩුලු 3ක් දවාගත් අතර, කලීල් අහමඩ් සහ ටී. නටරාජන් කඩුලු 2ක බැගින් බිඳ දැමූහ.

පළමුව පන්දුවට පහර දුන් සන්රයිසස් ඉනිමට සාර්ථක ආරම්භයක් දුන් නායක ඩේවිඩ් වෝනර් සහ ජොනී බෙයාර්ස්ටෝව් පළමු කඩුල්ලට ලකුණු 160ක සබඳතාවක් ගොඩනැගුවේ පන්දු 91කිනි. අයිපීඑල් පිටියේ පළමු කඩුල්ලට ගොඩනැගූ 7 වැනි හොඳම සබඳතාව මෙය වන අතර, පළමු කඩුල්ල සඳහා හොඳම සබඳතාවට හිමිකම් කීමට මේ පිතිකරුවන් දෙදෙනා පසුගිය වසරේ සමත් වූයේ රෝයල් චැලෙන්ජර්ස් බැංගලෝර් පිලට එරෙහිව ලකුණු 185ක් රැස් කරමිනි. හතරේ පහර 5ක් සහ හයේ පහරක් සමඟින් පන්දු 40කින් ලකුණු 52ක් රැස් කළ වෝනර් දැවී යෑමෙන් මේ සබඳතාව බිඳ දැමූ රවී බිෂ්නෝයි එම ඕවරයේදී බෙයාර්ස්ටෝව්ගේ ඉනිම නිමා කළේය. බෙයාර්ස්ටෝව් අවාසනාවන්ත ලෙස දැවී යන විට ශතකයට ලකුණු 3ක් පසුපසින් සිටියේය. හතරේ පහර 7ක් සහ හයේ පහර 6කින් ඉනිම අලංකාර කර ගත් ඔහු ඒ සඳහා වැය කළේ පන්දු 55ක් පමණි.

පන්දු යැවීමේදී බිෂ්නෝයි කඩුලු 3ක් දවාගත් අතර, අර්ෂ්දීප් සිං කඩුලු 2ක් බිඳ දැම්මේය. තරගයේ වීරයා ලෙස බෙයාර්ස්ටෝව් සම්මාන දිනා ගත්තේය.

## 19 හැවිරිදි ඉගා පළමු වරට ග්‍රෑන්ඩ් ස්ලෑම් අවසන් සටනක



සොෆියා කෙනින්

ප්‍රංශ විවෘත ටෙනිස් තරගාවලියේ කාන්තා කේවල ඉසව්වේ අවසන් තරගයට සුදුසුකම් ලබා ගැනීමට පෝලන්තයේ 19 හැවිරිදි යොවුන් ක්‍රීඩිකා ඉගා ස්වියාටෙක් සමත් වූවාය.

ලෝක ශ්‍රේණිගත කිරීම්වල 54 වැනි තැන පසුවන ඉගා ග්‍රෑන්ඩ් ස්ලෑම් ශූරතාවලියක අවසන් තරගයට පිවිසි පළමු අවස්ථාව මෙයයි.

ඒ අනුව ඉගා අද (10) අවසන් තරගයේදී 21 හැවිරිදි සොෆියා කෙනින් සමඟින් තරග වැදීමට නියමිතය. සොෆියා ලෝක ශ්‍රේණිගත කිරීම්වල සිව්වැනි ස්ථානයේ පසුවන ක්‍රීඩිකාවයි.

මේ සමග ලෝක ශ්‍රේණිගත කිරීම්වල 24 වැනි තැන දක්වා ඉදිරියට ඒමට ඉගාට අවස්ථාව හිමි වන අතර, තරගාවලියේ ශූරතාව දිනාගත හොත් 17 වැනි ස්ථානය හිමි වනු ඇත.

මෙලෙස පෝලන්ත ක්‍රීඩිකාවක් ග්‍රෑන්ඩ් ස්ලෑම් අවසන් තරගයකට පිවිසියේ වසර 8කට පසුව මෙන්ම ප්‍රංශ තරගාවලියක පෝලන්ත ක්‍රීඩිකාවක් අවසන් තරගයට එක් වන්නේ වසර 1939න් පසුව වීම විශේෂත්වයකි. 2012 වසරේ ඇග්නිස්කා රඩ්වන්ස්කා විම්බල්ඩන් අවසන් තරගයට එක්වූ අතර, එහිදී ඇය ශූරතාව දිනා ගැනීමට සමත් වූවාය.

ග්‍රෑන්ඩ් ස්ලෑම් තරගාවලි අතරට ප්‍රංශ ශූරතාවලිය සමඟින් ඔස්ට්‍රේලියා, අමෙරිකා විවෘත ශූරතාවලි සහ විම්බල්ඩන් තරගාවලිය ඇතුළත් වෙයි. මේ වසරේ පැවැති ඔස්ට්‍රේලියා තරගාවලියේදී සිව්වැනි වටය තෙක් පැමිණි ඉගාට අමෙරිකානු තරගාවලියේදී තෙවැනි වටයෙන් ඉවත්වීමට සිදු වූවාය.

මේ තරගාවලියේ සිව්වැනි වටයේදී ඊගා හමුවේ ලෝක ශ්‍රේණිගත කිරීම්වල පළමු ස්ථානයේ පසුවන සිමෝනා හෙල්ප් පරාජය වීම කැපී පෙණෙන සිදු වීමක් විය.

ඉගා සමඟ අවසන් තරගයට එක්වන සොෆියා ද ප්‍රංශ තරගාවලියක අවසන් තරගයට පිවිසි පළමු අවස්ථාව මෙයයි. කෙසේ වෙතත් ඇය මේ වසරේ පැවැති ඔස්ට්‍රේලියානු විවෘත තරගාවලියේ ශූරතාව දිනා ගත් අතර, අමෙරිකානු තරගාවලියේදී සිව්වැනි වටයෙන් ඉවතට විසි වූවාය.

මේ පිළිබඳ ඉගා කියා සිටියේ සිහිනයක් සැබෑ වූ බවයි. "එය මට පුදුම සහගතයි. එය සිහිනයක් සැබෑ වීමක්. මම මුලදී හිතුවේ නැහැ මෙච්චර හොඳට ක්‍රීඩා කරයි කියලා. ඒත් මම නිතරම දැනගෙන හිටියා මම ග්‍රෑන්ඩ් ස්ලෑම් තරගාවලියක අවසන් තරගයකට යන්නේ නම් ඒ ප්‍රංශ විවෘත තරගාවලියේදී කියලා." ඉගා පවසන්නීය.

2020 ඔක්තෝබර් 10 සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිනමිණ The Dinamina
ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

# "සෞභාග්‍ය දැක්ම" මාර්ග කි.මී. 100,000 ක් වැඩසටහන

## ලංසු සඳහා ආරාධනයයි (IFB)

## පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (බස්නාහිර පළාත)

## පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශය (බස්නාහිර පළාත)

1. බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත වගුවේ සඳහන් මහා මාර්ග ඉදිකිරීම් සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.
2. ජාතික තරඟකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහයවනු ලබන නමුත් රු. මිලියන 50 ට අඩු හෝ සමාන වන ව්‍යාපෘති බස්නාහිර පළාත් පරිපාලන සීමාව තුළ ලියාපදිංචි ලංසුකරුවන් සඳහා සීමා කර ඇත.
3. එක් එක් ලංසු සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන ඡේදය යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය ලංසුකරු විසින් ඉදිරිපත් කළ යුතුය.
4. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු කොළඹ 12, ශාන්ත සෙබස්තියන් කන්ද, අංක 59, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ (බ.ප.) ප්‍රසම්පාදන නිලධාරී වෙතින් ලබාගත හැකි අතර, ඉහත සඳහන් ලිපිනයේදී 2020 ඔක්තෝබර් 12 වෙනි දින සිට රාජකාරී දිනයන්හි කාර්යාල වේලාව තුළදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැක. දුරකථන අංක. 011-5107010
5. ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් 2020 ඔක්තෝබර් 12 වෙනි දින සිට 2020 නොවැම්බර් 02 වෙනි දින දක්වා රාජකාරී දිනයන්හි 9.00 පැය සහ 14.45 පැය අතර මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් කොළඹ 12, ශාන්ත සෙබස්තියන් කන්ද, අංක 59, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන නිලධාරී කාර්යාලය වෙතින් ඉංග්‍රීසි බසින් සකස්කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම් මුදලින් සිදු කළ යුතුය.
6. වෙන් වෙන් වශයෙන් මුල් පිටපත සහ අනු පිටපත ලෙස සඳහන් කළ කවරවල බහාලන ලද මුද්‍රා තබනලද ලංසු කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"ව්‍යාපෘති නම"** සඳහන් කර **2020 නොවැම්බර් 03 වෙනි දින 10.30 පැයට (පෙ.ව. 10.30) හෝ ඊට පෙර** ලැබෙන පරිදි **"සභාපති, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය,(බ.ප.), අංක 59, ශාන්ත සෙබස්තියන් කන්ද, කොළඹ 12"** යන ලිපිනය සඳහන් කර කොළඹ 12, ශාන්ත සෙබස්තියන් කන්ද, අංක 59, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන නිලධාරී වෙත ගෙනැවිත් භාර දිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන ලංසු සහ විද්‍යුත් මාර්ගයෙන් එවනු ලබන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
7. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පුද්ගලිකව පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් සහ/හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
8. සියලුම ලංසු සමග, පහත වගුවේ සඳහන් පරිදි, ලංසු ලිපිලේඛනය සමග ලබා දී ඇති සම්මත ආකෘතිය භාවිතා කරමින් බැංකු ඇපකරයක/රක්ෂණ බැඳුම්කරයක ආකාරයේ ලංසු ඇපකරයක් අමුණා එවීමට හෝ මුදලින් ගෙවීමට හැකි අතර, **ලංසු ඇපකරය 2021 මාර්තු 01** වෙනි දින දක්වා වලංගු විය යුතුය.
9. ලංසු පිළියෙල කිරීමේදී සහ ගෙනැවිත් භාරදීමේදී ලංසුකරුවන්ට දරන්නට සිදුවන යම් පිරිවැයක් හෝ වියදමක් සම්බන්ධයෙන් පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය වග කියනු නොලැබේ.
10. ලැබුණු ඕනෑම ලංසුවක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ හා කිසිදු හේතුවක් නොදක්වා ඕනෑම අවස්ථාවක ලංසු ක්‍රියාවලිය අවලංගු කිරීමේ සහ සුදුසු යැයි හැඟෙන ප්‍රමාණයකට කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුව පාලනය කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුයි.

**සභාපති**
**ප්‍රසම්පාදන කමිටුව**
**පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (බ.ප.)**
**අංක 59, ශාන්ත සෙබස්තියන් කන්ද,**
**කොළඹ 12**

## ලංසු උපලේඛනය - 2020

| අනු අංකය | විධායක ඉංජිනේරු කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පාරේ නම | ව්‍යාපෘති විස්තරය | ටෙන්ඩර් අංකය | වැට් බදු රහිතව ටෙන්ඩර් කළ හැකි වටිනාකම (රු. මිලියන) | ව්‍යාපෘති කාල සීමාව (සති) | CIDA/ICTAD ශ්‍රේණිය (මහා මාර්ග) | ටෙන්ඩර් ගාස්තුව (ආපසු ගෙවනු නොලබන) VAT සහිතව 8% (රු.) | ලංසු බැඳුම්කරයේ වටිනාකම | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | බැංකු ඇපකරය හෝ රක්ෂණ බැඳුම්කරය | මුදලින් |
| 1 | උඩුගම්පොල | ගම්පහ | බණ්ඩාරවත්ත මිරිස්වත්ත පාර | ABC සැපයීම, ඇතිරීම, සනවත් කිරීම, ගැටිති ඉදිකිරීම සහ ව්‍යුහයන් | PE/2020/SPD/22 | 11.72 | 08 | C-05 and C-06 | 3,780.00 | 117,200.00 | - |
| 2 | උඩුගම්පොල | ගම්පහ | බණ්ඩාරවත්ත ඉහළගම පාර | ABC සැපයීම, ඇතිරීම, සනවත් කිරීම, ගැටිති ඉදිකිරීම සහ ව්‍යුහයන් | PE/2020/SPD/23 | 11.54 | 08 | C-05 and C-06 | 3,780.00 | 115,400.00 | - |
| 3 | උඩුගම්පොල | මිණුවන්ගොඩ | කොරස වඩුමුල්ල පාර | ABC සැපයීම, ඇතිරීම, සනවත් කිරීම, ගැටිති ඉදිකිරීම සහ ව්‍යුහයන් | PE/2020/SPD/24 | 14.76 | 08 | C-05 and C-06 | 3,780.00 | 147,600.00 | - |
| 4 | උඩුගම්පොල | මිණුවන්ගොඩ | පෙඩිපොල වතුමුල්ලපාර<br>උග්ගල්බොඩ පාතන්දුවන පාර<br>උඩුගම්පොල දේවාලපොළ පාර | ABC සැපයීම, ඇතිරීම, සනවත් කිරීම, ඇස්ෆල්ට් කොන්ක්‍රීට් කර්මාන්ත, ගැටිති කර්මාන්ත සහ ව්‍යුහයන් | PE/2020/SPD/25 | 64.16 | 08 | C-04 or Above | 15,120.00 | 641,600.00 | - |
| 5 | මීගමුව | වත්තල<br>ජා ඇල<br>මීගමුව | නුගපේ බෝපිටිය පාර, මාබෝල<br>වැලිකඩමුල්ල පාර, වල්පොල<br>රාගම පාර, දූව පල්ලිය පාර | ABC සැපයීම, ඇතිරීම, සනවත් කිරීම, ඇස්ෆල්ට් කොන්ක්‍රීට් කර්මාන්ත, ගැටිති කර්මාන්ත සහ ව්‍යුහයන් | PE/2020/SPD/26 | 94.82 | 08 | C-04 or Above | 20,520.00 | 948,200.00 | - |
| 6 | තිට්ටඹුව<br>කිරිඳිවෙල | මීරිගම<br>අත්තනගල්ල<br>කැලණිය | කොට්ටල ඉලුක්හේන බාදුරාගොඩ පාර<br>තිහාරිය වේයන්ගොඩ පාර<br>තල්වත්ත සපුගස්කන්ද පාර | ABC සැපයීම, ඇතිරීම, සනවත් කිරීම, ඇස්ෆල්ට් කොන්ක්‍රීට් කර්මාන්ත, ගැටිති කර්මාන්ත හා ව්‍යුහයන් | PE/2020/SPD/27 | 97.09 | 08 | C-04 or Above | 21,600.00 | 970,900.00 | - |
| 7 | තිට්ටඹුව | මීරිගම | ගස්පේ හිරිවෙල පාර | ABC සැපයීම, ඇතිරීම, සනවත් කිරීම, ඇස්ෆල්ට් කොන්ක්‍රීට් කර්මාන්ත, ගැටිති ඉදිකිරීම සහ ව්‍යුහයන් | PE/2020/SPD/28 | 65.13 | 06 | C-04 or Above | 15,660.00 | 651,300.00 | - |
| 8 | කිරිඳිවෙල | මහර<br>බියගම | හේනේගම රතුපස්වල පාර<br>බියගම මල්වාන පාර | ABC සැපයීම, ඇතිරීම, සනවත් කිරීම, ඇස්ෆල්ට් කොන්ක්‍රීට් කර්මාන්ත හා ගැටිති ඉදිකිරීම | PE/2020/SPD/29 | 70.10 | 08 | C-04 or Above | 16,200.00 | 701,000.00 | - |
| 9 | අවිස්සාවේල්ල | හංවැල්ල | කනම්පැල්ල ඇස්වත්ත පාර | ABC සැපයීම, ඇතිරීම, සනවත් කිරීම, ඇස්ෆල්ට් කොන්ක්‍රීට් කර්මාන්ත හා ගැටිති ඉදිකිරීම | PE/2020/SPD/30 | 31.10 | 06 | C-04 and C-05 | 9,720.00 | 311,000.00 | - |
| 10 | අවිස්සාවේල්ල | හෝමාගම | මීගොඩ දම්පේ බෙරුකැටිය පාර | ABC සැපයීම, ඇතිරීම, සනවත් කිරීම, ඇස්ෆල්ට් කොන්ක්‍රීට් කර්මාන්ත හා ගැටිති ඉදිකිරීම | PE/2020/SPD/31 | 77.85 | 06 | C-04 or Above | 17,280.00 | 778,500.00 | - |
| 11 | අවිස්සාවේල්ල | හෝමාගම | හිරිපිටිය සියඹලාගොඩ පාර | ABC සැපයීම, ඇතිරීම, සනවත් කිරීම, ඇස්ෆල්ට් කොන්ක්‍රීට් කර්මාන්ත හා ව්‍යුහයන් | PE/2020/SPD/32 | 30.10 | 06 | C-04 and C-05 | 9,720.00 | 301,000.00 | - |
| 12 | කොළඹ | කෝට්ටේ<br>කොළොන්නාව | ගංගොඩවිල උඩහමුල්ල පාර<br>වැල්ලම්පිටිය කොටුවිල පාර | ABC සැපයීම, ඇතිරීම, සනවත් කිරීම, ඇස්ෆල්ට් කොන්ක්‍රීට් කර්මාන්ත හා ව්‍යුහයන් | PE/2020/SPD/33 | 35.20 | 06 | C-04 and C-05 | 10,800.00 | 352,000.00 | - |
| 13 | හොරණ | හොරණ | කලුපාන ඔලබඳුව පාර | ABC සැපයීම, ඇතිරීම හා සනවත් කිරීම, මූලික ආලේපනය හා ව්‍යුහයන් | PE/2020/SPD/34 | 13.41 | 04 | C-05 and C-06 | 3,780.00 | 134,100.00 | - |
| 14 | හොරණ | හොරණ | පාලංඔරුව කිඳෙල්පිටිය පාර | ABC සැපයීම, ඇතිරීම හා සනවත් කිරීම, මූලික ආලේපනය | PE/2020/SPD/35 | 13.40 | 04 | C-05 and C-06 | 3,780.00 | 134,000.00 | - |
| 15 | හොරණ | ඉංගිරිය | හඳපාන්ගොඩ මෙනේරිගම පාර | ABC සැපයීම, ඇතිරීම හා සනවත් කිරීම, මූලික ආලේපනය | PE/2020/SPD/36 | 13.52 | 04 | C-05 and C-06 | 3,780.00 | 135,200.00 | - |
| 16 | හොරණ | මදුරාවල | රයිගම අගුරුවාතොට පාර | ABC සැපයීම, ඇතිරීම හා සනවත් කිරීම, මූලික ආලේපනය | PE/2020/SPD/37 | 13.20 | 04 | C-05 and C-06 | 3,780.00 | 132,000.00 | - |
| 17 | හොරණ | ඉංගිරිය<br>හොරණ | හඳපාන්ගොඩ මෙනේරිගම පාර<br>පාලංඔරුව කිඳෙල්පිටිය පාර | ඇස්ෆල්ට් කොන්ක්‍රීට් සැපයීම, ඇතිරීම හා සනවත් කිරීම | PE/2020/SPD/38 | 43.72 | 10 | C-04 and C-05 | 11,880.00 | 437,200.00 | - |
| 18 | හොරණ | හොරණ<br>මදුරාවල<br>මදුරාවල | කළුපාන ඔලබඳුව පාර<br>රයිගම අගුරුවාතොට පාර<br>වරකාගොඩ ප්‍රෝසෙස්ටර් | ඇස්ෆල්ට් කොන්ක්‍රීට් සැපයීම, ඇතිරීම, සනවත් කිරීම | PE/2020/SPD/39 | 70.10 | 10 | C-04 or Above | 16,200.00 | 701,000.00 | - |
| 19 | අගලවත්ත | දොඩංගොඩ | පළාතොට කෙත්හේන පාර<br>පාලයංගොඩ නාගහදූව පාර<br>නැබොඩ වෙල්ලත තුඩුගල පාර | ABC සැපයීම, ඇතිරීම හා සනවත් කිරීම, ඇස්ෆල්ට් කොන්ක්‍රීට් කර්මාන්ත හා ගැටිති ඉදිකිරීම | PE/2020/SPD/40 | 53.40 | 08 | C-04 or Above | 14,040.00 | 534,000.00 | - |
| 20 | අගලවත්ත | මතුගම | ගල්මත්ත පල්ලේගොඩ රිටිකෙටිය පාර | ABC සැපයීම, ඇතිරීම හා සනවත් කිරීම, ඇස්ෆල්ට් කොන්ක්‍රීට් කර්මාන්ත හා ගැටිති ඉදිකිරීම | PE/2020/SPD/41 | 44.80 | 08 | C-04 and C-05 | 11,880.00 | 448,000.00 | - |
| 21 | අගලවත්ත | පාලින්දනුවර | බෙල්ලන යකුපිටිය පාර | ABC සැපයීම, ඇතිරීම හා සනවත් කිරීම සහ මූලික ආලේපනය | PE/2020/SPD/42 | 24.40 | 06 | C-05 and C-06 | 6,480.00 | 244,000.00 | - |
| 22 | කළුතර | කළුතර | හීනටියංගල ඇටවිල පාර | ABC සැපයීම, ඇතිරීම හා සනවත් කිරීම සහ මූලික ආලේපනය | PE/2020/SPD/43 | 10.25 | 04 | C-05 and C-06 | 3,780.00 | 102,500.00 | - |
| 23 | කළුතර | කළුතර | මෙස්ටියා පාර | ABC සැපයීම, ඇතිරීම හා සනවත් කිරීම සහ මූලික ආලේපනය | PE/2020/SPD/44 | 9.46 | 04 | C-06 and C-07 | 3,240.00 | 94,600.00 | 47,300.00 |
| 24 | කළුතර | බේරුවල | පිංහේන පාදගොඩ පාර | ABC සැපයීම, ඇතිරීම හා සනවත් කිරීම සහ මූලික ආලේපනය | PE/2020/SPD/45 | 17.15 | 04 | C-05 and C-06 | 4,860.00 | 171,500.00 | - |
| 25 | කළුතර | බේරුවල | කංකානම්ගොඩ කීරන්තිඩිය පාර | ABC සැපයීම, ඇතිරීම හා සනවත් කිරීම සහ මූලික ආලේපනය | PE/2020/SPD/46 | 12.51 | 04 | C-05 and C-06 | 3,780.00 | 125,100.00 | - |
| 26 | කළුතර | බේරුවල | පයාගල දෙඩංගොඩ පාර | ABC සැපයීම, ඇතිරීම හා සනවත් කිරීම සහ මූලික ආලේපනය | PE/2020/SPD/47 | 5.62 | 04 | C-06 and C-07 | 3,240.00 | 56,200.00 | 28,100.00 |
| 27 | කළුතර | බේරුවල | බේරුවල අළුත්ගම් විදිය පාර | ABC සැපයීම, ඇතිරීම හා සනවත් කිරීම සහ මූලික ආලේපනය | PE/2020/SPD/48 | 18.12 | 04 | C-05 and C-06 | 4,860.00 | 181,200.00 | - |
| 28 | කළුතර | බේරුවල | මග්ගොන මුංහේන හල්කඳවිල පාර | ABC සැපයීම, ඇතිරීම හා සනවත් කිරීම සහ මූලික ආලේපනය | PE/2020/SPD/49 | 11.29 | 04 | C-05 and C-06 | 3 ,780.00 | 112,900.00 | - |

BE BETTER INFORMED!
News you can trust now free on your mobile phone.
Dinamina
Daily News
Thinakaran
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
AVAILABLE AT
LAKE HOUSE

THE WORLD BANK
IBRD • IDA | WORLD BANK GROUP

# කෘෂිකර්ම අමාත්‍යාංශය

# දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP)

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින්, ශ්‍රී ලංකාවේ තෝරාගත් අධික්‍රියාකාරීත්වයෙන් යුත් ස්ථානයන් හි කුඩා කෘෂිකර්ම ඉඩම්වල ඵලදායිතාව හා දේශගුණික ප්‍රගතිය වැඩිදියුණු කිරීම සඳහා, ලෝක බැංකුව විසින් ඇමරිකන් ඩොලර් මිලියන 110 ක් වූ මූල්‍ය සහාය ලබාදෙනු ලබන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලය අවුරුදු 6 ක් (2019 – 2024) වන අතර, එහි ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 125 ක් වේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දිස්ත්‍රික්ක, පොළොන්නරුව, අනුරාධපුර, හම්බන්තොට, කිළිනොච්චිය, කුරුණෑගල, මොණරාගල, මුලතිව්, පුත්තලම, ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර යනුවෙන් වේ. අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය (PMU) රාජගිරියේ පිහිටුවා ඇත.
වැඩිදුර විස්තර සඳහා, කරුණාකර, http://www.csiap.lk/ වෙත පිවිසෙන්න.
පහත සඳහන් තනතුරු පූර්ණකාලීන පදනමින් පිරවීම සඳහා එහි සඳහන් සුදුසුකම් හා පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. කෘෂිකර්ම විශේෂඥ (PS3) – තනතුරු 01 (උතුරු පළාත, කිළිනොච්චිය)

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, අදාළ ක්ෂේත්‍රයේ, උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්, **හෝ**

අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්, **සමග**

කෘෂිකර්ම ව්‍යාප්ති කටයුතු සමග කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 12 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම, **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්, **හෝ**

අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්, **සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ වෘත්තීය සුදුසුකම්, **සමග**

කෘෂිකර්ම ව්‍යාප්ති කටයුතු සමග කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 9 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

3) රජයේ දීපව්‍යාප්ත සේවයේ 1 පංතිය නිලධාරියකු හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක්.

**සමග**

1. පංතිය තනතුරක අවම වශයෙන් වසර 04 ක පළපුරුද්ද.

## 02. ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු (ජල කළමනාකරණ) PMU, රාජගිරිය (PS03) තනතුර 01

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම. **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්, **හෝ**

අදාළ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම්, **සමග**

ඉංජිනේරුවරයෙකු ලෙස, කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 12 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම, **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්, **හෝ**

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්, **සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික/ වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්, **සමග**

ඉංජිනේරුවරයකු ලෙස කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 9 ක පශ්චාත් උපාධි සුදුසුකම්,

3) රජයේ දීපව්‍යාප්ත සේවයේ 1 පංතිය නිලධාරියකු වීම හෝ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ සමාන තනතුරක්, **සමග**

ඉංජිනේරුවරයෙකු ලෙස 1 පංතිය තනතුරක අවම වශයෙන් වසර 04 ක පළපුරුද්ද.

## 03. ජල විද්‍යාඥ DPD වාරිමාර්ග අංශය (PMU, රාජගිරිය) (PS03) තනතුරු 01

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් (ජල විද්‍යා හෝ ජල සම්පත් ඉංජිනේරු හෝ ජල සම්පත් කළමනාකරණ හෝ සමාන ක්ෂේත්‍රයක) ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කොට තිබීම, **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, ජල විද්‍යා හෝ ජලසම්පත් ඉංජිනේරු හෝ ජල සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්, **හෝ**

ජල විද්‍යා හෝ ජලසම්පත් ඉංජිනේරු හෝ ජල සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම්, **සමග**

ඉංජිනේරුවරයකු ලෙස කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 12 ක පශ්චාත් උපාධි පළපුරුද්ද,

2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජල විද්‍යා හෝ ජලසම්පත් ඉංජිනේරු හෝ ජල සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කොට තිබීම, **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජල විද්‍යා හෝ ජලසම්පත් ඉංජිනේරු හෝ ජල සම්පත් කළමනකරණ ක්ෂේත්‍රයේ උපාධියට සමාන වෙනත් සුදුසුකම්, **හෝ**

ජල විද්‍යා හෝ ජලසම්පත් ඉංජිනේරු හෝ ජලසම්පත් කළමනාකරණ ක්ෂේත්‍රය පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම්, **සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ ජල විද්‍යා හෝ ජලසම්පත් ඉංජිනේරු හෝ ජල සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්, **සමග**

ඉංජිනේරුවරයකු ලෙස කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 9 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද,

3) රජයේ දීපව්‍යාප්ත සේවයේ 1 පංතිය නිලධාරියකු වීම හෝ ජල විද්‍යා හෝ ජල සම්පත් ඉංජිනේරු හෝ ජල සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ සමාන තනතුරක්, **සමග**

ඉංජිනේරුවරයකු ලෙස 1 පංතියේ තනතුරක අවම වශයෙන් වසර 04 ක පළපුරුද්ද.

## 04. සමාජ සංවර්ධන නිලධාරී (PS6A) – තනතුරු 01 (PMU රාජගිරිය)

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජීය විද්‍යාව (සමාජ විද්‍යාව, සමාජ වැඩ) ප්‍රථම උපාධියක්, **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, උපාධියට සමාන බව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම්, **හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම්, **හෝ**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තනතුරට අදාළ තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 7 තලයට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම. **සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද,

2) තෘතියීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, **සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද,

3) තෘත්තීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතියක් ලබා තිබීම. **සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද, **සහ**

වාර්තා ලිවීමේ කුසලතා හා ඉංග්‍රීසි භාෂා භාවිතයේ හැකියාව ඇති අයට ප්‍රමුඛතාව.

## 05. ස්ත්‍රී පුරුෂ සමාජභාවය සංවර්ධන නිලධාරී (PS6A)

**උතුරු පළාත, කිළිනොච්චිය – (තනතුරු 01)**
**දකුණු පළාත, හම්බන්තොට (තනතුරු 01)**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජීය විද්‍යාව (සමාජ විද්‍යා කාර්ය හා ස්ත්‍රී පුරුෂ සමාජභාව අධ්‍යයන) ප්‍රථම උපාධියක්, **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්, **හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ, ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම්, **හෝ**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තනතුරට අදාළ තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 7 තලය නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. **සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද,

2) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තනතුරට අදාළ තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, **සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද,

3) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. **සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද, **සහ**

වාර්තා ලිවීමේ කුසලතා හා ඉංග්‍රීසි භාෂා නිපුණතාවය සතු අයට ප්‍රමුඛතාව.

## 06. පරිසර ආරක්ෂණ නිලධාරී (PS6A) තනතුරු 01 (වයඹ පළාත) කුරුණෑගල

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යා (පාරිසරික, ස්වභාව විද්‍යා හා භූගෝලය) ප්‍රථම උපාධියක්, **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්, **හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ, ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම්, **හෝ**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 7 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම. **සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද,

2) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, **සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද,

3) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. **සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ පුනරුත්ථාපනය පිළිබඳ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද, **සහ**

වාර්තා ලිවීමේ කුසලතා හා ඉංග්‍රීසි භාෂා නිපුණතාවය සතු අය හට ප්‍රමුඛතාව.

## 07. "A" වර්ගීකරණයේ ප්‍රසම්පාදන නිලධාරී (PS6A) තනතුරු 01, PMU රාජගිරිය

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යා (පාරිසරික, ස්වභාවික භූගෝල විද්‍යාව ) ප්‍රථම උපාධියක්, **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්, **හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ, ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම්, **හෝ**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් 7 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. **සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද,

2) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, **සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 8 ක පළපුරුද්ද,

3) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම. **සහ**

අදාළ විශේෂඥතා ක්ෂේත්‍රයේ පුනරුත්ථාපනය පිළිබඳ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද, **සහ**

වාර්තා ලිවීමේ කුසලතා හා ඉංග්‍රීසි භාෂා නිපුණත්වය සතු අයහට ප්‍රමුඛතාව හිමි වේ.

## 08. සංවර්ධන නිලධාරී (මූල්‍ය) (PS6A) තනතුරු 01 PMU, රාජගිරිය

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය කළමනාකරණ ප්‍රථම උපාධියක්, **හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්, **හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ, ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම්, (AAT ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම ද වෘත්තීය සුදුසුකමක් ලෙස සැලේක්.) **හෝ**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තනතුරට අදාළව තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 7 තලය නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම. **සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද,

2) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ තනතුරට අදාළව තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම, **සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද,

3) තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ /වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කළ තනතුරට අදාළ තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම. **සහ**

අදාළ විශේෂඥතා ක්ෂේත්‍රයේ පුනරුත්ථාපනය පිළිබඳ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද. **සහ**

වාර්තා ලිවීමේ කුසලතා හා ඉංග්‍රීසි භාෂා, නිපුණතාවය සතු අයහට ප්‍රමුඛතාව හිමි වේ.

## 09. කළමනාකරණ සහකාර

**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU), රාජගිරිය (තනතුරු 03)**
**දකුණු පළාත, හම්බන්තොට (තනතුරු 02)**
**උතුරු මැද පළාත, අනුරාධපුර (තනතුරු 01)**
**නැගෙනහිර පළාත, ත්‍රිකුණාමලය (තනතුරු 01)**
**ඌව පළාත, මොණරාගල (තනතුරු 01)**

1) අ.පො.ස. (උ/ පෙළ) විභාගය, එක් වරකදී (පොදු ප්‍රශ්න පත්‍රය හැර) සියලුම විෂයයන්ගෙන් සමත්ව සිටිය යුතුය. **සහ**
අ.පො.ස (සා/ පෙළ) විභාගය, එක් වරකදී, සිංහල/ දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළත්ව සම්මාන සාමාර්ථ හතරක් (4) සහිතව විෂයයන් හයකින් (06) සමත්ව සිටීම. **සමග**
ඉංග්‍රීසි කථනය හා බහු සංස්කෘතික කාර්ය පරිසරයක කටයුතු කිරීම, පරිගණක සාක්ෂරතාවය (MS පැකේජ, වර්ඩ් එක්සෙල්, පවර් පොයින්ට්) අන්තර්ජාල කටයුතු, ඊමේල් සන්නිවේදන, ආදියෙහි අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද තිබිය යුතුය. පරිගණක සාක්ෂරතාවය හා ඉංග්‍රීසි භාෂාවෙන් වාර්තා සකස් කිරීම පිළිබඳව ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.)

## 10. කාර්යාල සහායක – තනතුරු 01 (නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ, වාරිමාර්ග අංශය – PMU, රාජගිරිය)

1) අ.පො.ස. (සා/ පෙළ) විභාගය, දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/ දෙමළ ඇතුළත්ව, විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් සමත්ව සිටිය යුතුය.
ග්‍රැෆික්, වීඩියෝ එඩිටිං, වීඩියෝ කරණය යතුරු ලියනය හා ලිවීමේ කුසලතා සතුවීම අමතර සුදුසුකමක් වේ.

**පොදු කොන්දේසි**

අ) **වයස් සීමාව :**
අදාළ අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය වන විට වයස අවුරුදු 64 කට වැඩි අයදුම්කරුවන් අයදුම් කිරීමට සුදුසුකම් නොලබති.

ආ) **සේවයේ යෙදවීමේ කොන්දේසි :**
රජයේ සේවයේ නියුතු නිලධාරීන් ද්විතියන පදනමින් බඳවා ගනු ලබන අතර, රජයේ සේවයට පරිබාහිර අයවලුන් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනේ. සියලුම පත් කිරීම්, මූලිකව, එක් වසරක කාලයක් සඳහා වන අතර, සේවා දීර්ඝ කිරීම් කාර්යසාධනය මත සිදු කෙරෙනු ඇත.

ඇ) **වැටුප් :**
එක් එක් තනතුරක් සඳහා වන වැටුප්, 2019.03.05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මත පදනම් වනු ඇත.

ඈ) **සම්මුඛ පරීක්ෂණ :**
සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ඇත.

**අයදුම්පත් :**

සියලුම අයදුම්පත්, ජීව දත්ත සමග ඥාති නොවන නිර්දේශකයන්ගේ විස්තර සහිතව, අදාළ සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත, **2020 ඔක්තෝබර් 31 වන දිනට පෙර** ලැබීමට සැලැස්විය යුතුය.

දැනට රජයේ ආයතනවල/ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය.

අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ, **අයදුම් කරනු ලබන තනතුර හා ව්‍යාපෘති නාමය** පැහැදිලිව සඳහන් කළ යුතුය. පළාත් කාර්ය මණ්ඩල අයදුම්කරුවන්, අදාළ කවරයේ අදාළ පළාත පැහැදිලිව සඳහන් කළ යුතුය.

එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම් වෙන වෙනම අයදුම්පත් වෙන් වශයෙන් කවරවල බහා ඉදිරිපත් කළ යුතුය. ඉහත බඳවා ගැනීම් සම්බන්ධව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් / එක් එක් පළාතේ ප්‍රධාන ලේකම්ගේ තීරණය අවසාන තීරණය හා ඒකාන්ත තීරණය වේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය,**
**කෘෂිකර්ම අමාත්‍යාංශය, 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.**

**2020.07.13 දින පළකරන ලද පුවත්පත් දැන්වීමෙහි 29 පිටුවෙහි සඳහන් ව්‍යාපෘති අධ්‍යක්ෂ (PS-01) තනතුරු - 01 සඳහා බඳවා ගැනීම සම්බන්ධව නිවැරදි කිරීමයි.**

සේවයේ යෙදවීමේ කොන්දේසි පිළිබඳ උපවගන්තිය යටතේ :

එහි සඳහන්, "දැනට මහවැලි කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ විදේශ අරමුදල් සැපයූ ව්‍යාපෘතිවල සේවය කරන ඉහත සුදුසුකම් සහිත නිලධාරීන් අයදුම් කිරීමට සුදුසුකම් ලැබීමට අදාළ ව්‍යාපෘතිව අවම වසර දෙකක සාර්ථක සේවයක් සම්පූර්ණ කොට තිබිය යුතුය." යන කොන්දේසිය ඉවත් කොට ඇත.

ඒ අනුව ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම් කිරීමේ අවසාන දිනය, **2020 ජූලි 31 වන දින සිට 2020 ඔක්තෝබර් 24** වන දින ලෙසට දීර්ඝ කොට ඇත.

**ලේකම්**
**කෘෂිකර්ම අමාත්‍යාංශය, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය,**
**80/5, ගොවිජන මන්දිරය, රජමල්වත්ත, පටුමග,**
**බත්තරමුල්ල.**

(වැවිලි අමාත්‍යාංශය/ පොල්, කිතුල්, තල් හා රබර් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදනය හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය)

# හලාවත වැවිලි සමාගම

## පොල් ගස්, පොල් ලෙලි සහ අභිජනණය හා කෘෂිකාර්මික කටයුතු සඳහා මී ගවයන් අලෙවි කිරීමට මිල ගණන් කැඳවීම

| වත්ත | අලෙවි කරන | | ප්‍රසම්පාදනය විවෘත කරන | | |
|---|---|---|---|---|---|
| | ද්‍රව්‍ය | ප්‍රමාණය | දිනය | වේලාව | ස්ථානය |
| පලුගස්වැව | පොල් ගස් (වැටුනු/ මැරුණු) | 223 | 2020-10-14 | පෙ.ව. 10.30 | හලාවත වැවිලි සමාගම, අංක 165, පුත්තලම් පාර, හලාවත. |
| | පොල් ලෙලි | 268,875 | | | |
| තම්බපණ්ණි | පොල් ගස් (වැටුනු/ කණාටු) | 273 | 2020-10-15 | පෙ.ව. 10.30 | තම්බපණ්ණි වතු කොට්ඨාසය, තම්බපණ්ණි වත්ත, පුත්තලම. |
| | පොල් ලෙලි | 128,382 | | | |
| පලුගස්වැව | මී ගවයන් | 89 | 2020-10-16 | පෙ.ව. 10.30 | පලුගස්වැව වත්ත, රාජකදළුව |
| මාදම්පේ | පොල් ගස් (වැටුණු/ මැරුණු/ කණාටු) | 527 | 2020-10-15 | පෙ.ව. 10.30 | මාදම්පේ වතු කොට්ඨාසය, ගල්මුරුව. |

01. අදාළ ප්‍රසම්පාදනපත් රුපියල් 500/- ක ගාස්තුවක් ගෙවා සතියේ වැඩ කරන දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා සහ ප්‍රසම්පාදනපත් විවෘත කරන දිනයේ **පෙ.ව. 10.15** දක්වා ඉහත සඳහන් ස්ථානවලින් ලබා ගත හැක.

02. වැඩි විස්තර සඳහා දුරකථන අංක 032-5678050 පලුගස්වැව, 032-5741266 මාදම්පේ සහ 032-5741263 තම්බපණ්ණි යන වතු අධිකාරීවරුන් අමතන්න.

**සභාපති - ප්‍රසම්පාදන කමිටුව, හලාවත වැවිලි සමාගම, 165, පුත්තලම් පාර, හලාවත.**

# හැටන් දික්ඔය නගර සභාව

## ටෙන්ඩර් කැඳවීම හා ප්‍රසිද්ධ වෙන්දේසි කිරීම

**ප්‍රසිද්ධ වෙන්දේසිය**

**01. දීපාවලි උත්සව සමයේ තාවකාලික වෙළඳාම් සිදු කිරීම සඳහා ස්ථාන වෙන්කර ලබාදීම.**

2020 වර්ෂයේ නොවැම්බර් මස 14 වන දින සැමරීමට නියමිත දීපාවලි උත්සවය නිමිත්තෙන් 2020 නොවැම්බර් මස 04 වන දින සිට නොවැම්බර් මස 14 වන දින දක්වා තාවකාලික වෙළඳම් කටයුතු සිදු කිරීම සඳහා පහසු වන අයුරින් පහත සඳහන් ස්ථාන සඳහා ප්‍රසිද්ධ වෙන්දේසිය 2020-10-29 වන දින පෙ.ව.10.00 ට හැටන් දික්ඔය නගර සභා ප්‍රධාන ශාලාවේදී පැවැත්වීමට නියමිත වී ඇත.

| අංක | ස්ථානය |
|---|---|
| 1 | තරුචතුරස්‍රය |
| 2 | පැරණි පොදු වෙළඳපොළ සංකීර්ණය පිටුපස (ශක්ති උත්සව ශාලාව ඉදිරිපිට) |

**කොන්දේසි**

01. වෙන්දේසියට සහභාගි වන්නේ නම්, ප්‍රවේශ වීමේ ගාස්තුව වශයෙන් රු.250.00 ක මුදලක් ගෙවා ප්‍රවේශපතක් ලබාගත යුතුය.

02. ප්‍රවේශපත්‍ර 2020 වර්ෂයේ ඔක්තෝබර් මස 22 වන දින සිට ඔක්තෝබර් 28 වන දින දක්වා පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා නිකුත් කරනු ලැබේ.

03. එක් ප්‍රවේශපතකින් එක් ඉඩම් කොටසක් පමණක් වෙන්දේසියේදී ලබාගත හැක.

**ටෙන්ඩර් කැදවීම**

පහත සඳහන් ස්ථාන 2020-11-04 වන දින සිට 2020-11-14 වන දින දක්වා තාවකාලික ව්‍යාපාරික කටයුතු සිදුකිරීම සඳහා ලබාදීම.

| අනු අංකය | ස්ථානය | අවම ලංසු මුදල |
|---|---|---|
| 01 | නගර සභා ශාලාව (දිනකට රු.30000.00 බැගින්) | රු. 300,000.00 |
| 02 | හැටන් ප්‍රධාන මාර්ගයේ ෆුඩ්සිටිය ඉදිරිපිට කොටස | රු. 495,000.00 |
| 03 | දික්ඔය නගර ශාලාව (රු.5000.00 බැගින්) | රු. 50,000.00 |
| 04 | තාවකාලික කඩකාමර සඳහා මූලික පහසුකම් ලබාදීම (කඩයක් සඳහා දිනකට) | රු. 165.00 |

**කොන්දේසිය**

1. ඉදිරිපත් කරන ලද වෙන්දේසි මුදල හා ටෙන්ඩර් මුදල් ආදිය එම අවස්ථාවේදීම රජයේ අනුමත බදු ගාස්තු ඇතුළත්ව (VAT) මුදලින් ගෙවිය යුතුයි.
2. හැටන් නගර ශාලාව හා දික්ඔය නගර ශාලාව තුළ සාරි, පාවහන්, විසිතුරු භාණ්ඩ, ඉලක්ට්‍රෝනික හා විදුලි උපාංග, ගෘහ භාණ්ඩ ආදි වෙළඳම්වල නිරත වීම සඳහා පමණක් අනුමැතිය ලබාදෙනු ලැබේ.
3. ටෙන්ඩර් අයදුම්පත් ඔක්තෝබර් 09 වන දින සිට ඔක්තෝබර් 26 දින දක්වා කාලය තුළ සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා හැටන් දික්ඔය නගර සභා කාර්යාලයෙන් ලබාගත හැකි අතර, ටෙන්ඩර්පත්

   2020-10-27 වන දින පෙ.ව.10.00 ට පෙර සභාවට ලැබීමට හැකි වන පරිදි තැපැල් මගින් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය.
4. ටෙන්ඩර්පත් විවෘත කිරීම ඔක්තෝබර් 27 වන දින පෙ.ව.10.30 ට හැටන් දික්ඔය නගර සභාවේදී සිදුකරනු ලබයි.
5. ඉහත සඳහන් වෙන්දේසියට හා ටෙන්ඩර් කැදවීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීමේ බලය නගර සභාව සතු වේ.

වැඩි විස්තර නගර සභාවේ ලේකම් / සභාවේ ආදායම් පරීක්ෂකගෙන් ලබාගත හැකිය. 051-2222275

**එස්. බාලචන්ද්‍රන්,**
**සභාපති**
**හැටන් දික්ඔය නගර සභාව.**

**2020-10-07 දින**
**හැටන් දික්ඔය නගර සභා කාර්යාලයේදීය**

# ප්‍රසම්පාදන කැඳවීම

# බියගම ප්‍රාදේශීය සභාව

1. බියගම ප්‍රාදේශීය සභාවේ මාකොළ බහු කාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම අදියර iii ව්‍යාපෘතිය සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් කොන්ත්‍රාත් ආයතන වෙතින් ජාතික තරගකාරී ලංසු කැඳවීම යටතේ මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| ලංසු අංකය | ව්‍යාපෘති නාමය | ඇස්තමේන්තුගත පිරිවැය වැට් බදු රහිත (රු. ලක්ෂ) | අවම සුදුසුකම් ශ්‍රේණිය CIDA | ආපසු නොගෙවන ලංසු ලේඛන ගාස්තු රු. | ආපසු ගෙවන ලංසු බැඳුම්කරය රු. |
|---|---|---|---|---|---|
| BPS/C/4 | මාකොළ බහු කාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම අදියර III | 6668651.00 | C-7 (ගොඩනැගිලි) | 1500.00 | 70000.00 |

02. මේ සඳහා ලංසු ඉදිරිපත් කිරීමට **2020-10-10 සිට 2020-10-28 දින** දක්වා සාමාන්‍ය කාර්යාල වැඩකරන දිනයන් හි **පෙ.ව 9.00 සිට පස්වරු 3.00 දක්වා** බියගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පරීක්ෂා කර බලා ඉහත සඳහන් ගාස්තු ගෙවා මිලදී ගත හැකිය.

03. සම්පූර්ණ කරන ලද ලංසුපත් **"මුල් පිටපත්"** හා **"අනු පිටපත්"** ලෙස වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා **2020-10-29 දින පෙරවරු 10.00 ට** හෝ ඊට පෙර **"සභාපති, බියගම ප්‍රාදේශීය සභාව, දෙල්ගොඩ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියේ බහාලීම සිදු කළ හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතිෂේප කරනු ලැබේ.

04. ලංසුපත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ව්‍යාපෘතියේ නම සඳහන් කළ යුතුය. ලංසුපත් ඉදිරිපත් කිරීමේදී CIDA ලියාපදිංචිය තහවුරු කිරීම සඳහා එහි සහතික කළ පිටපතක්ද මුදලින් ලංසු ඇප තැන්පත් කරන්නේ නම් එහි ලදු පත හෝ පිළිගත් මූල්‍ය ආයතනයකින් ලබාගත් ඇප බැඳුම්කරය හෝ ලංසු සමග ඉදිරිපත් කළ යුතු වේ.

05. **2020-10-29 දින පෙරවරු 10.30 ට** ලංසු විවෘත කරන අතර, එම අවස්ථාවට ඔබ හෝ ඔබගේ නියෝජිතයෙකුට සහභාගී විය හැක. ලංසු සම්බන්ධයෙන් අවසාන තීරණ ගැනීමේ අයිතිය බියගම ප්‍රාදේශීය සභාව සතුය.

**විමසීම් - දුරකථන - 0112403311 / 0113112111**

**ජී.ඒ ඒ.සී.ගනේපොල,**
**සභාපති,**
**බියගම ප්‍රාදේශීය සභාව.**

# ප්‍රසම්පාදන දැන්වීම

# ශ්‍රී ලංකා නාවික හමුදාව

## 2021 වර්ෂයේ ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 දක්වා ශ්‍රී ලංකා නාවික හමුදාවට වෛද්‍ය විෂයයන් සැපයීම සඳහා නිෂ්පාදකයන්ගෙන් / ආනයනකරුවන්ගෙන් / සැපයුම්කරුවන්ගෙන් / කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඒකක කොන්ත්‍රාත් මිල ගණන් යටතේ මිල ගණන් කැඳවීම

01. ශ්‍රී ලංකා නාවික හමුදවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා නාවික හමුදව වෙත 2021 ජනවාරි මස 01 වන දින සිට 2021 දෙසැම්බර් මස 31 වන දින දක්වා පහත දක්වා ඇති වෙන් වෙන් මිල ගණන් කැඳවීම්වලට අයත් වෛද්‍ය විෂයයන් එක් මිල කැඳවුමක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඒකක කොන්ත්‍රාත් මිල ගණන් යටතේ සැපයිය හැකි නිෂ්පාදකයන්, ආනයනකරුවන්, සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ. ඉදිරිපත් කරන මිල ගණන්වල වලංගු කාලය 2021 ජනවාරි මස 01 වන දින සිට 2021 දෙසැම්බර් මස 31 වන දින දක්වා විය යුතුයි.

    අ. තෝරා ගන්නා කොන්ත්‍රාත්කරුවන් නාවික හමුදව විසින් ඇණවුම් කරනු ලබන වෛද්‍ය විෂයයන් වෛද්‍ය මාර්ගස්ථ ගබඩාව නාවික හමුද මූලස්ථානය, තැ.පෙ. 593, කොළඹ 01, වෙත සැපයුම් කළ යුතුය.

    ආ. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන් එක් එක් කාණ්ඩයන් සඳහා ආපසු නොගෙවනු ලබන රු. 2000.00 ක අයදුම්පත් ගාස්තුව මුදලින්, අධ්‍යක්ෂ (මුදල්) ශ්‍රී ලංකා නාවික හමුද මූලස්ථානය, තැ.පෙ. 593, කොළඹ 01 වෙත ඉදිරිපත් කර අයදුම්පත් 2020 ඔක්තෝබර් මස 13 වන දින සිට 2020 නොවැම්බර් මස 09 වන දින දක්වා සතියේ වැඩකරන දින වල 1000 පැයේ සිට 1400 පැය දක්වා ලබාගත හැකි අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත දක්වා ඇති පරිදි ඉදිරිපත් කළ යුතුය.

02. 2021 වර්ෂය සඳහා අවශ්‍ය වෛද්‍ය විෂයයන්වල විස්තර සහ අවශ්‍යතා ප්‍රමාණයන් එක් එක් මිල ගණන් කැඳවුම් අනුව අයදුම්පත් සමග නිකුත් කරනු ලැබේ.

**විෂයය කාණ්ඩයන් සහ අංකයන්**

| මිල ගණන් කැඳවුම් කාණ්ඩ අංකයන් | විෂයය කාණ්ඩ විස්තරය | මිල ගණන් කැඳවීම අවසන් වන දින හා විවෘත කරන වේලාව |
|---|---|---|
| එස්එල්එන්/සීඑම්එස්/01/ආර්සී/2021 | ආසාධන තත්ත්ව සඳහා ඖෂධ | 2020 නොවැම්බර් 10, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/02/ආර්සී/2021 | හෘද රෝගී තත්ත්ව සඳහා ඖෂධ | 2020 නොවැම්බර් 10, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/03/ආර්සී/2021 | ස්නායු රෝගී තත්ත්ව සඳහා ඖෂධ | 2020 නොවැම්බර් 10, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/04/ආර්සී/2021 | පෝෂණ සහ රුධිර වර්ධක සඳහා ඖෂධ | 2020 නොවැම්බර් 10, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/05/ආර්සී/2021 | ස්වසන රෝගී තත්ත්ව සඳහා ඖෂධ | 2020 නොවැම්බර් 10, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/06/ආර්සී/2021 | ආමාශයික රෝගී තත්ත්ව සඳහා ඖෂධ | 2020 නොවැම්බර් 10, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/07/ආර්සී/2021 | උගුර ඇස කන සහ නාසය ආශ්‍රිත රෝගී තත්ත්ව සඳහා ඖෂධ | 2020 නොවැම්බර් 10, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/08/ආර්සී/2021 | චර්ම රෝගී තත්ත්ව සඳහා ඖෂධ | 2020 නොවැම්බර් 10, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/09/ආර්සී/2021 | අන්තරාසර්ග රෝගී තත්ත්ව සඳහා ඖෂධ | 2020 නොවැම්බර් 10, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/10/ආර්සී/2021 | අස්ථි සහ සන්ධි රෝගී තත්ත්ව සඳහා ඖෂධ | 2020 නොවැම්බර් 10, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/11/ආර්සී/2021 | අර්ධ ස්වයංක්‍රීය ජෛව රසායන විශ්ලේෂකය සඳහා උත්තේජක | 2020 නොවැම්බර් 11, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/12/ආර්සී/2021 | වෛද්‍ය රසායනාගාර පරීක්ෂණ නළ | 2020 නොවැම්බර් 11, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/13/ආර්සී/2021 | සමුච්චිත පරීක්ෂණය සඳහා උත්තේජක | 2020 නොවැම්බර් 11, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/14/ආර්සී/2021 | සිරින්ජර් සහ කටු | 2020 නොවැම්බර් 11, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/15/ආර්සී/2021 | සැරහුම් උපකරණ | 2020 නොවැම්බර් 11, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/16/ආර්සී/2021 | කැනියුලා සහ කැතීටර | 2020 නොවැම්බර් 11, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/17/ආර්සී/2021 | පාරිභෝගික ශෛල්‍ය උපකරණ | 2020 නොවැම්බර් 11, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/18/ආර්සී/2021 | පාරිභෝගික ශෛල්‍ය විෂයයන් (වෙනත්) | 2020 නොවැම්බර් 11, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/19/ආර්සී/2021 | ශල්‍ය මැහුම් ද්‍රව්‍ය | 2020 නොවැම්බර් 11, 1000 පැය |
| එස්එල්එන්/සීඑම්එස්/20/ආර්සී/2021 | පලිබෝධ පාලන රසායන ද්‍රව්‍ය | 2020 නොවැම්බර් 11, 1000 පැය |

03. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය. (මිල ගණන් ඇගයීමේදී මෙම කරුණු සැලකිල්ලට ගනු ලැබේ)

    අ. වෛද්‍ය විෂයයන් සමාන ධාරිතා බලයක් සහිතව රජයේ / පෞද්ගලික ආයතන වෙත සැපයීම පිළිබඳව වර්ෂ 02 ක සතුටුදයක කාර්ය සාධනයක් තිබෙන බවට වාර්තා

    ආ. විලවුන් උපකරණ සහ ඖෂධ නියාමන අධිකාරිය මගින් දෙනු ලබන සහතිකය.

    ඇ. ස්ථිර මූල්‍යමය හැකියාව.

    ඈ. බදු ගෙවීම පිළිබඳ සතුටුදයක වාර්තා.

    ඉ. ප්‍රමාණවත් පරිදි පණිවුඩ හුවමාරු පහසුකම් තිබීම. (දුරකථන, ජංගම දුරකථන. ෆැක්ස් යන්ත්‍ර, විද්‍යුත් ලිපින)

    ඊ. ප්‍රමාණවත් පරිදි ගබඩා පහසුකම් තිබීම.

    උ. ප්‍රමාණවත් පරිදි කාර්ය මණ්ඩලයක් සිටීම සහ කාර්යාල පහසුකම් තිබීම.

    ඌ. ප්‍රමාණවත් පරිදි ප්‍රවාහන පහසුකම් තිබීම.

    එ. ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීමේ සහතිකයේ හෝ සංස්ථාපිත සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය. එසේ ලියාපදිංචි වීමෙන් පසු ආසන්න වසර 03 ක කාලය තුළ අඛණ්ඩව ව්‍යාපාර කටයුතුවල යෙදී සිටි බවට වාර්තා ඉදිරිපත් කළ යුතුය.

04. අයදුම්කරුවන් තම මිල ගණන් ඉදිරිපත් කිරීමේදී වැට් බදු සඳහා ලියාපදිංචි අංකය සඳහන් කර තිබිම අනිවාර්ය වේ. වැට් බදු සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් දේශීය ආදයම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල් වෙත ලබාගත් වැට් බදු ලියාපදිංචියෙන් නිදහස් බවට සනාථ කරන සහතිකයක් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. තවද, ඉහත අවශ්‍යතාවයන් සපුරා නොමැති මිල ගණන් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අයදුම්කරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා නාවික හමුදවට 2021වර්ෂය සඳහා වෛද්‍ය විෂයයන් සැපයීම සඳහා කොන්ත්‍රාත් මිල ගණන් ඉදිරිපත් කිරීම"** (විෂයය කාණ්ඩය) එස්එල්එන්/සීඑම්එස්/...../ආර්සී/2021 ටෙන්ඩර් පත් විවෘත කරන දිනය, වේලාව සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ පහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් බහාළුම් පෙට්ටියේ තැම්පත් කිරීමට කටයුතු කළ යුතුය.

    **සභාපති,**
    **දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
    **ශ්‍රී ලංකා නාවික හමුදාව,**
    **නාවික හමුදා මූලස්ථානය,**
    **තැ.පෙ. 593, කොළඹ 01.**

06. මිල ගණන් භාරගන්නා අවසාන දිනය හා වේලාව පසුවූ වහාම ලද අයදුම්පත් විවෘත කරනු ලැබේ. අයදුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකු හට මිල ගණන් විවෘත කරන අවස්ථාවට සහභාගි විය හැකිය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, විවෘත කිරීමකින් තොරව ආපසු භාරදෙනු ලැබේ.

07. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද මිල ගණන් පත්‍රිකා හා ලිඛිත සාක්ෂි අවශ්‍ය පරිදි ඉදිරිපත් නොකරන ලද, නිසි පරිදි සහතික නොකරන ලද ටෙන්ඩර් පත්‍රිකා ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම මිල ගණන් පතක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය සභාපති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

08. තෝරාගනු ලබන අයදුම්කරුවන් වෙත ගිවිසුම් අත්සන් කිරීම සඳහා ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දෙනු ලැබේ.

09. ටෙන්ඩර් අයදුම්පත් කිසිදු ගෙවීමකින් තොරව අධ්‍යක්ෂ ජෙනරාල් සැපයුම් හා සේවා, නාවිකා හමුද මූලස්ථානය, කොළඹ 01 යන ස්ථානයේ පරීක්ෂා කර බැලිය හැක.

10. වැඩි විස්තර සඳහා මාණ්ඩලික නිලධාරී (වෛද්‍ය සැපයුම්) දු.ක. 011-7195541 / 0117195543, නාවික හමුද මූලස්ථානය, කොළඹ 01 වෙතින් ලබාගත හැක.

11. මෙම ඒකක කොන්ත්‍රාත් මිල ගණන් කැඳවීම සම්බන්ධ විස්තර නාවික හමුද වෙබ් අඩවිය www.navy.lk මගින්ද ලබාගත හැක.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා නාවික හමුදාව, කොළඹ 01.**

